

දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | තිණමිණ

සාර භූමියේ හරිතාභාවය
අද පත්‍රය සමඟ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ නවම් පුර සැටවක ලත් බුධ දින | කාණ්ඩය 112 | පත්‍රය 54 | පිටු 24 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 පෙබරවාරි 17 බදාදා

ගෝලීය පරිවර්තනයන්ට ශ්‍රී ලංකාව අනුගත විය යුතුයි

මහින්ද අලුත්ගෙදර

ගෝලීය හැලහැප්පීම් සහ පරිවර්තනයන් සමඟ ශ්‍රී ලංකාව වේගයෙන් අනුගත විය යුතු බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අවධාරණය කරයි.

ඒ අනුව අපට පසුගාමී විය නොහැකි බව පෙන්වා දෙන ඒ මහතා වේගයෙන් වෙනස් වන සමාජ තත්ත්වයන් මධ්‍යයේ වුව ද අනුගත විය හැකි අධ්‍යාපනයක් සිසුන්ට ලබාදිය යුතු බව ද එය විශ්වවිද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල අවධානයට ලක් විය යුතු සහ දියුණු විය යුතු අංශයක් බව ද පෙන්වා දෙයි. පිට 06

රෝගී වුණු ලෝකයක් මැද
නීරෝගි සංවර්ධිත රටක් හදාගැනීම බලාපොරොත්තුවයි

වයඹ මහ ඇළ ව්‍යාපෘතියේ වැඩ අරඹමින් අගමැති කියයි

නුවන් කොඩිකාර පොල්පිතිගම සිට...

යුද්ධය පවතිද්දීත් රටේ සංවර්ධන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කළා මෙන් කොවිඩ් වසංගතය හමුවේදීත් රටේ සංවර්ධන කටයුතු කිසි ලෙසකවත් නතර නොකරන බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා ඊයේ (16) පැවසීය.

මේ සියල්ලක්ම සිදු කරන්නේ රටේ සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කරමින් දේශීයත්වයට මුල්තැන දෙන ස්වයංපෝෂිත ආර්ථිකයක් නිර්මාණය කිරීමට බව වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතියේ මහකිතුල හා මහකිරුළ ජලාශවල ඉදිකිරීම් කටයුතු යාපහුව ඉරුදෙණියාය කෝන්ගහ මංසන්ධියේ දී සමාරම්භ කරමින් අගමැතිවරයා අවධාරණය කළේය. පිට 06

භාරතීය ජනතා පක්ෂය මෙරට පිහිටුවීම ගැන නිල ප්‍රකාශයක් කර නෑ

බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි

ශ්‍රී ලංකාව තුළ ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂය පිහිටුවීම සම්බන්ධයෙන් නිල වශයෙන් ප්‍රකාශයක් සිදු කර නැමති බව බලශක්ති ඇමැති හා සම කැබිනට් ප්‍රකාශක උදය ගම්මන්පිල මහතා පවසයි.

භාරතීය ජනතා පක්ෂයේ සභාපති අමිත් ෂා හෝ එම පක්ෂයෙන් තේරී පත් වී සිටින ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතා ඒ සම්බන්ධව පිළිගැනීමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් ගැන ප්‍රකාශ කළ හොත් ඒ පිළිබඳ රජයේ නිල මතය ප්‍රකාශ කළ හැකි බවත් ඇමැතිවරයා කියයි. පිට 06

සෞඛ්‍ය ඇමැතිනියට පූර්ණ සුවය

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 වයිරසය ආසාදනය වීම නිසා රෝහල්ගතව සිටි සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය පූර්ණ සුවය ලබා අයි. බී.එච්. රෝහලෙන් ඊයේ (16) පිටව ගියාය. වයිරසය ආසාදනය වීම නිසා පසුගිය 23 වැනිදා සිට අමාත්‍යවරිය දින 24ක් රෝහල්ගතව ප්‍රතිකාර ලැබුවාය. සුවය ලබා නිවෙසට ගිය ඇයට තවත් සතියක් පමණ ස්වයං නිරෝධායනයට ලක් විය යුතු බවට වෛද්‍ය උපදෙස් ලැබී තිබේ.

කසළ මඟින් විදුලිය නිපදවීමේ පළමු බලාගාරය අගමැති අතින් අද විවෘත කෙරේ

චන්දිමා කරුණාරත්න සහ මැද කොළඹ සමූහ

දෛනිකව කසළ ටොන් 700 කින් මෙගාවොට් 10 ක් ලබාදෙන කසළ මඟින් විදුලිය නිපදවීමේ පළමු බලාගාරය අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ජාතියට අද (17) දායාද කිරීම නියමිතය. පිට 06

චන්නට රොෂාන්ට නව තනතුරු

මහින්ද අලුත්ගෙදර

රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන මහතා වැඩබලන සෞඛ්‍ය ඇමැතිවරයා වශයෙන් පත් කර තිබෙන අතර ඊට අමතරව රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ මහතාට නව රාජ්‍ය ඇමැති ධුරයක් ද පිරිනමා තිබේ. පිට 06

හිජාස් හිස්බුල්ලාගේ රිට් පෙත්සම 24 දා සලකා බැලේ

නෙල්කා මැදගෙදර

පාස්කු දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ ප්‍රහාරය කළ බෝම්බකරු සමඟ සම්බන්ධතා පැවැත්වූ බවට චෝදනා කරමින් අත්අඩංගුවට ගෙන මාස දහයකට ආසන්න කාලයක් රඳවුම් නියෝග මත තබා ගෙන සිටින තමන් වහාම නිදහස් කරන ලෙස පොලිස්පති වරයාට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝග කරන ලෙස ඉල්ලා නීතිඥ හිජාස් හිස්බුල්ලා මහතා ගොනු කළ රිට පෙත්සම මෙම මස 24 වැනිදා සලකා බැලීමට අභියාචනාධිකරණය ඊයේ (16) තීරණය කළේය. පිට 06

දේශපාලන පළි ගැනීම් විමර්ශන කොමිසන් වාර්තාවේ පිටපතක් ලැබුණේ නෑ

පිට 06

විදෙස් සංචාරකයන්ට නිරෝධායන රෙගුලාසි ලිහිලක්

මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා පැමිණෙන විදෙස් සංචාරකයන්ට පනවා තිබූ නිරෝධායන රෙගුලාසි ලිහිල් කිරීමට රජයේ අවධානය යොමුව තිබේ. පිට 06

මුහුදු රළු වෙයි

උපාලි කරුණාරත්න

මන්නාරම සිට ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ආසන්න මුහුදු ප්‍රදේශවල මුහුදු රළු අද (17) පස්වරුව වන තුරු ඉහළ යෑමට සහ ගොඩබිමට පැමිණීමට හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරයි. පිට 06

කෝටි 10ක හෙරොයින් සමඟ නුගේගොඩදී අයෙක් දැලේ

රක්ෂණ ශ්‍රියන්ත

පියල් කෝටි 10ක් පමණ වටිනා හෙරොයින් මත්කුඩු සහ අයිස් මත්ද්‍රව්‍ය තොගයක් සමඟ සැකකරුවකු නුගේගොඩ ගම්සභා හන්දිය ප්‍රදේශයේදී ඊයේ (16) සවස කොළඹ සංවිධානාත්මක අපරාධ නිවාරණ කොට්ඨාස ඒකකයේ නිලධාරීන් පිරිසක් කළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබේ. පිට 06

පාස්කු ඉරිදා ප්‍රහාරය සොයා බැලූ කොමිෂන් වාර්තාව සැකසූ වහාම විශේෂ අමාත්‍ය මණ්ඩල රැස්වීමක්

බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි

පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධ කොමිසමේ වාර්තාවේ පිටපත් සකස් කර අවසන් කළ වහාම විශේෂ අමාත්‍ය මණ්ඩල රැස්වීමක් පැවැත්වීමට නියමිත යැයි, ජනාධිපතිතුමන් කැබිනට් මණ්ඩලය හමුවේ ප්‍රකාශ කළ බව බලශක්ති ඇමැති, සම කැබිනට් මාධ්‍ය ප්‍රකාශක, අමාත්‍ය උදය ගම්මන්පිල මහතා පවසයි. පිට 06

කොවිඩ් රෝගීන්ට වෙන් කළ ඇඳන්වලින් 83%ක් හිස්

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 රෝගීන් සඳහා වෙන් කර ඇති දැඩි සත්කාර ඇඳන්වලින් සියයට 83ක් හිස්ව පවතින නිසා දැඩි සත්කාර ඇඳන් සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් නොවන බව ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග සහ කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය 'දිනමිණ'ට ඊයේ (16) පැවසුවාය. පිට 06

මාධ්‍යවේදීන්ට කොවිඩ් එන්නත කඩිනමින්

සුහාෂිණී සේනානායක සහ මහින්ද අලුත්ගෙදර

මාධ්‍යවේදීන් සඳහා ද කොවිඩ් එන්නත ලබාදීමට කඩිනමින් කටයුතු කරන බව ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා මහතා දිනමිණට පැවැසීය. මේ වනවිට ඇණවුම් කර ඇති ඇස්ට්‍රාසෙනෙකා එන්නත් ලක්ෂ පහ දිවයිනට ළඟා වීමත් සමඟ මේ පියවර ගන්නා බව ලේකම්වරයා කියා සිටියේය. පිට 06

විදේශීය මුදල් මෙරටට අද්දන්න විශේෂ තැන්පත් ගිණුම්වලට ඉඩ පිට 06

පාර්ලිමේන්තුවේ අනුමැතියට යටයි

එජාප මන්ත්‍රීධුරය රනිල්ට දෙන්න ගාල්ලේ යෝජනාව ඒකමතිකව සම්මතයි

ශිරෝමි අබයසිංහ

එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා එම පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී පුරප්පාඩුව සඳහා නම් කළ යුතු බවටත් දිගටම පක්ෂ නායකත්වයේ සිටිය යුතු බවටත් වන යෝජනාවක් ගාල්ල ආසන බල මණ්ඩල රැස්වීමේදී පෙරේදා (13) සම්මත කර ගන්නා ලදී පිට 06

ඊයේ දිනටත් නව කොරෝනා ආසාදිතයෝ 774ක්

මරණ 403 දක්වා ඉහළට

සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත

මෙරටින් කොවිඩ් ආසාදිත පුද්ගලයන් 774 දෙනකු ඊයේ (16) උදෑසන වන විට හඳුනාගෙන ඇති බව කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය සඳහන් කරයි.

එම සියලු දෙනා දේශීයව හඳුනාගත් පුද්ගලයන් ලෙස වාර්තා වේ. හඳුනාගත් ආසාදිතයන් අතරින් වැඩිම ආසාදිතයන් පිරිසක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එම සංඛ්‍යාව 208කි. ඊට අමතරව කොළඹ දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 179ක් සහ රත්නපුර දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 82ක් ලෙස වාර්තා වේ. අනෙක් ආසාදිතයන් 305 දෙනා දිවයිනේ සෙසු දිස්ත්‍රික්කවලින් වාර්තා වේ.

ඊයේ (16) දින උදෑසන වන විට මිනුවන්ගොඩ බැන්ඩික්ස් පොකුරට සහ කොළඹ මත්ස්‍ය වෙළෙඳපොළට සම්බන්ධ පොකුරෙන් වාර්තා වූ කොවිඩ් ආසාදිත සම්පූර්ණ පුද්ගලයන් සංඛ්‍යාව 72,906කි. එයින් පුද්ගලයන් 68,017 දෙනකු මේ වන විට පූර්ණ සුවය ලබා රෝහල්වලින් බැහැරව ගොස් ඇත.

ඊයේ (16) උදෑසන වන විට මෙරට කොවිඩ් ආසාදනය වූ සම්පූර්ණ පුද්ගලයන් සංඛ්‍යාව 76,427ක් වන අතර එයින් පුද්ගලයන් 69,410ක් පූර්ණ සුවය ලබා රෝහල්වලින් බැහැරව ගොස් ඇත. ඊයේ (16) උදෑසන වන විට රෝහල්ගතව සහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානවල ආසාදිතයන් 6,614 දෙනකු තවදුරටත් ප්‍රතිකාර ලබයි.

පෙරේදා (15) උදෑසන 06.00න් අවසන් වූ පැය 24 තුළ රෝහල්ගතව සහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් පුද්ගලයන් 865ක් පූර්ණ සුවය ලබා පිටව ගොස් ඇත.

ඊයේ (16) උදෑසන 6.00න් අවසන් වූ පැය 24 තුළ මෙරටින් කොවිඩ් ආසාදනය වී පුද්ගලයන් 06 දෙනකු මියගොස් ඇත. ඔවුන් දිවුල්නකඩවල, පලලේතනිවින්න, නුගේගොඩ, වත්තල, හුන්නසීගිරිය සහ හංවැල්ල ප්‍රදේශවල පදිංචි අය බව වාර්තා වේ. ඒ අනුව ඊයේ (16) උදෑසන වන විට මෙරටින් කොවිඩ් ආසාදිත සම්පූර්ණ මරණ සංඛ්‍යාව 403ක් දක්වා ඉහළ ගොස් ඇත.

ඊයේ (16) දිනයේදී ත්‍රිවිධ හමුදාවෙන් පාලනය කරන නිරෝධායන මධ්‍යස්ථාන 92ක පුද්ගලයන් 9,152 දෙනකු නිරෝධායනය වෙමින් සිටී.

පෙරේදා (15) දිනයේ පීසීආර් පරීක්ෂණ 15,430ක් සිදු කර ඇති බව ද කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය වැඩිදුරටත් සඳහන් කරයි.

මහින්ද අලුත්ගෙදර

ලොව පුරා කොවිඩ් ආසාදනය වූවන් සංඛ්‍යාව ලක්ෂ 1,096 ඉක්මවා ගොස් තිබේ.

ලෝකයේ රටවල් සහ ස්වයං පාලන ප්‍රදේශ 218කින් වාර්තා වන කොවිඩ් වසංගතය හේතුවෙන් මිය ගිය සංඛ්‍යාව 2,418,989ක් වන අතර මුළු ආසාදිතයන් සංඛ්‍යාව 109,681,129කි. ඒ අතරින් 84,223,808 දෙනකු පූර්ණ සුවය ලබා තිබෙන බව වාර්තා වෙයි.

වැඩිම ආසාදිතයන් පිරිස අමෙරිකාවෙන් වාර්තා වන අතර එම සංඛ්‍යාව දෙකෝටි පනස් ලක්ෂය ඉක්මවා යෑම විශේෂත්වයකි. ඒ අනුව අමෙරිකාවේ ආසාදිතයන් සංඛ්‍යාව 28,317,703ක් වන අතර එරට මරණ සංඛ්‍යාව 490,000 ඉක්මවා ද විශේෂත්වයකි. ඒ අනුව එරට මිය ගිය සංඛ්‍යාව 498,203කි. මේ අතර ඉන්දියාවේ ආසාදිතයන් 10,925,710ක් සහ බ්‍රසීලයේ ආසාදිතයන් සංඛ්‍යාව 9,866,710ක් ලෙස වාර්තා වන අතර රුසියාව, ප්‍රංශය, එක්සත් රාජධානිය, ඉතාලිය, කොලොම්බියාව, මෙක්සිකෝව, ස්පාඤ්ඤය, ආර්ජන්ටිනාව, ජර්මනිය, ඉරානය, පෝලන්තය, දකුණු අප්‍රිකාව, යුක්‌රේනය, පේරු, නෙදර්ලන්තය රටවල ආසාදිතයන් සංඛ්‍යාව ලක්ෂ 10 ඉක්මවා ගොස් ඇත.

මේ වන විට කොවිඩ් ආසාදනය වීම හේතුවෙන් ලොව පුරා මිය ගිය සංඛ්‍යාව දෙලක්ෂයකට වැඩි පිරිසක් අමෙරිකා එක්සත් ජනපදයෙන් වාර්තා වන අතර ඉන්දියාවෙන් සහ බ්‍රසීලයෙන් ලක්ෂයකට වැඩි මරණ සංඛ්‍යාවක් වාර්තා වෙයි. ඒ අනුව බ්‍රසීලයේ මරණ සංඛ්‍යාව 239,895ක් වන අතර ඉන්දියාවේ මරණ සංඛ්‍යාව 155,840කි.

අමෙරිකා එක්සත් ජනපදයේ ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ සංඛ්‍යා ලේඛන අනුව කොවිඩ් හේතුවෙන් ස්පාඤ්ඤයේ 65,449ක්, ඉතාලියේ 93,835ක්, ප්‍රංශයේ 82,226ක්, බ්‍රිතාන්‍යයේ 117,396ක්, බ්‍රසීලයේ 239,895ක්, රුසියාවේ 80,520ක්, බෙල්ජියමේ 21,707ක්, ඉරානයේ 59,028ක්, නෙදර්ලන්තයේ 14,843ක්, මෙක්සිකෝවේ 174,657ක්, කැනඩාවේ 21,311ක් සහ ජර්මනියේ 65,949ක් ලෙස මරණ වාර්තාවී තිබේ.

මේ වන විට ලොව වැඩිම ආසාදිතයන් සංඛ්‍යාවක් වාර්තා වන රටවල් ලැයිස්තුවේ තවදුරටත් පෙරමුණේ පසුවන්නේ අමෙරිකාව වන අතර ඉන්දියාව දෙවැනි ස්ථානයේත්, බ්‍රසීලය තෙවැනි ස්ථානයේත්, රුසියාව සිවු වැනි ස්ථානයේත්, එක්සත් රාජධානිය පස් වැනි ස්ථානයේත් පසු වෙයි.

මේ අතර කොවිඩ් වයිරසයට එරෙහි සටනට සුනඛයන්ගේ දායකත්වය ගැනීමට ලොව පුරා රටවල් රැසක් පියවර ගෙන තිබේ. ඒ අතර අමෙරිකාව, බ්‍රිතාන්‍ය, ප්‍රංශය, ජර්මනිය ඇතුළු රටවල් දැනටමත් ඒ සඳහා සුනඛයන්ගේ සහාය යොදාගෙන තිබේ.

කොවිඩ් වයිරසයට එරෙහි සටනට අමෙරිකාවේ ෆ්ලොරිඩා අන්තර්ජාතික විශ්වවිද්‍යාලය ද සුනඛයකුගේ සහාය යොදාගෙන ඇති අතර විශ්වවිද්‍යාල භූමිය කොවිඩ් වයිරසයෙන් තොර කලාපයක් බව හඳුනාගෙන සිසුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සුනඛයාට පැවරී ඇත.

මේ සුනඛයා සුනඛයන් පුහුණු කිරීම සඳහා වූ විශ්වවිද්‍යාලයේ කාර්ය සාධක බළකායකට සහභාගී වීමෙන් පසු මේ රැකියාවට සුදුසුකම් ලබා ඇත. ඒ පිළිබඳ පර්යේෂණ සිදු කරන විද්‍යාඥයන් විශ්වාසය පළ කරන්නේ සුනඛයාගේ ඉව භාවිත කරමින් කොවිඩ් වයිරසය හඳුනාගැනීමේ ක්‍රමවේදය සාර්ථක එකක් වනු ඇති බවයි. මැලේරියාව, පිළිකා, දියවැඩියාව, පාකින්සන් ආදී රෝග නිසා එම පුද්ගලයන්ගේ සිරුරින් ලාක්ෂණික ගන්ධයක් නිකුත් කරන බව හෙළිවී තිබෙන අතර බොහෝ පිළිකාවලට ප්‍රාථමික අවස්ථාවේ නිකුත් කෙරෙන වාෂ්පශීලී කාබනික සංයෝගයෙන් ඔවුන් හඳුනාගැනීමේ හැකියාවක් සුනඛයන් සතු බව ද අධ්‍යයනවලින් හෙළිවී තිබේ.

හුස්ම ඉවකිරීමෙන් පිළිකා රෝගීන් සහ අප්‍රස්මාර රෝගීන් හඳුනාගැනීමට බ්‍රිතාන්‍යයේ පුණ්‍යායතන දැනටමත් සුනඛයන් යොදාගෙන තිබෙන අතර කොවිඩ් මුල් අවස්ථාවේදීම හඳුනාගැනීමට සුනඛයන් යොදාගැනීම ඉතා වැදගත් පරිවර්තනයක් බව ද වාර්තා වෙයි.

ලොව පුරා කොවිඩ් ආසාදනය වූවන් ලක්ෂ 1,096 ඉක්මවති

බන්ධනාගාර නිලධාරීන්ටත් කොවිඩ් මර්දන එන්නත

බුද්ධිකා ඉඹුලාන

කොවිඩ් මර්දන එන්නත බන්ධනාගාර නිලධාරීන්ට දීම ඊයේ (16) වැලිකඩ බන්ධනාගාර පුහුණු පාසල් මධ්‍යස්ථානයෙන් ඇරඹිය.

බන්ධනාගාර කොමසාරිස් (පාලන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහතා ප්‍රථමයෙන්ම එන්නත ලබා ගත්තේය. මෙහි ප්‍රථම අදියර ලෙස බස්නාහිර පළාතේ බන්ධනාගාරවල සිටින නිලධාරීන් 2000කට ඉදිරි දින තුනේදී මේ එන්නත දීමට නියමිතය. ඊයේ (16) දිනයේ එන්නත බන්ධනාගාර නිලධාරීන් 500 දෙනකුට දී තිබේ.

මේ යටතේ බන්ධනාගාර නිලධාරීන් 5100කට එන්නත්කරණය සිදු කිරීමට බන්ධනාගාර සෞඛ්‍ය අංශය පියවර ගෙන ඇත.

බන්ධනාගාර නිලධාරීන් කොවිඩ් ආසාදිත සිරකරුවන් සිටින බන්ධනාගාරවල මෙන්ම ආසාදිත රැඳවුවන් යොමු කර සිටින ප්‍රතිකාර මධ්‍යස්ථානවල රාජකාරි කිරීමත්, පොදු ප්‍රවාහනයේ රාජකාරියට වාර්තා කිරීමත් ඇතුළු කරුණු රැසක් නිසා මේ කොවිඩ් මර්දන එන්නත දීමේ ප්‍රමුඛතාවක් දෙන බව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙනිය මහතා කියයි.

මේ වන විට බන්ධනාගාර කොවිඩ් ආසාදිත පොකුර 4700 දක්වා ඉහළ ගොස් ඇති අතර 4549ක් දෙනා සුවය ලබා ඇත. මේ වන විට ප්‍රතිකාර ලබන්නේ 168 දෙනකු පමණි. රැඳවුවන් 11 දෙනකු කොවිඩ් ආසාදනය වීමෙන් මියගොස් ඇත.

ඡායාරූපය - සමන් ශ්‍රී වෙදගේ

මසකදී ගාල්ලේ පාසල් සිසුන් 36කට

කොවිඩ් ආසාදනය වෙලා

ගාල්ල දිසා සමූහ

මේ මස 01 වැනිදා සිට මේ දක්වා කාලයේ ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් සිසු දරු දැරියන් 36 දෙනකුට කොරෝනා වයිරසය ආසාදනයවී ඇති බව ගාල්ල දිස්ත්‍රික් ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ වෛද්‍ය වෙනුර කේ. සිංගාරච්චි මහතා පවසයි.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'මේ කාලයේ පාසල් 24ක දරු දැරියන් 36 දෙනකුට කොරෝනා ආසානයවී තිබෙනවා. මේ දරු දැරියන්ගේ පළමු පෙළ ආශ්‍රිතයන් ලෙස සිසු දරු දැරියන් 47 දෙනකු හඳුනාගෙන ඔවුන් නිරෝධායනයට යොමු කර තිබෙනවා.

දෙවැනි කොරෝනා රැල්ල ආරම්භයේ සිට මේ දක්වා කාලයේදී ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් 55ක දරු දැරියන් 111 දෙනකුට සහ ගුරුවරු 03 දෙනකුට කොරෝනා වෛරසය ආසාදනයවී ඇති බවට තහවුරුවී තිබෙනවා.'

කොවිඩ් රීති කැඩූ 14ක් දැලේ

රක්ෂණ ශ්‍රියන්ත

මුහුණු ආවරණ නොපැලඳීම සහ දුරස්ථ භාවය තබා නොගැනීම සම්බන්ධයෙන් පුද්ගලයන් 12 දෙනකු ඊයේ (16) උදෑසන 6න් අවසන් වූ පැය 24ක කාලය තුළ අත්අඩංගුවට ගෙන තිබේ.

මුහුණු ආවරණ නොපැලඳීම සහ දුරස්ථ භාවය තබා නොගැනීම සම්බන්ධයෙන් පුද්ගලයන් 3143 දෙනකු අත්අඩංගුවට ගෙන ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය.

නිරෝධායනයට අදාළ මෙහෙයුම් ශ්‍රී ලංකාව පුරා අඛණ්ඩව සිදු කරන බවත් ඊට අමතරව රාජ්‍ය සහ පුද්ගලික ආයතන නිරෝධායන රීතීන්ට අනුගතව පවත්වාගෙන යන්නේද යන්න පිළිබඳ මෙහෙයුම් සිදුකරන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩි දුරටත් කියා සිටියේය.

කොවිඩ් ආසාදිත වූ නාගරික මන්ත්‍රී ධනසේන මාදුවගේ මිය යයි

කරන්දෙනිය සමූහ සහ අම්බලන්ගොඩ සමූහ

කොවිඩ් ආසාදිතව ප්‍රතිකාර ලබමින් සිටි අම්බලන්ගොඩ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයකු වන ධනසේන මාදුවගේ මහතා පෙරේදා (15) සවස මිය ගිය බව අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පවසයි.

මිය යන විට මන්ත්‍රීවරයා 68 හැවිරිදි වියේ පසු විය. ධර්මසේන මහතා අම්බලන්ගොඩ පොල්වත්තේ පදිංචිකරුවකු වන අතර ඔහු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් අම්බලන්ගොඩ නගර සභාවේ මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළේය.

අම්බලන්ගොඩ පොල්වත්ත කනිෂ්ඨ විද්‍යාලයේ මූලික අධ්‍යාපනය ලැබූ ඔහු පසුව අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයෙන් ද්විතීක අධ්‍යාපනය ලැබීය. ව්‍යාත්තියෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ලබා ඇත. මොහු ශ්‍රී ලංකා නිදහස් පක්ෂ පොල්වත්ත ශාඛාවේ සභාපති සහ අම්බලන්ගොඩ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මධ්‍යම සංවිධානයේ කාරක සභිකයකු ද වේ. පොල්වත්ත වරුණ විතාන වැඩිහිටි සමිතියේ සහ අවමංගල්‍ය ධාර සමිතියේ සභාපති ධුරය ද හොබවා ඇත. පොල්වත්ත අග්ගාරාම විහාරස්ථ දායක සභාවේ සභාපතිවරයකු ලෙස වසර විසි අටක් පුරා මේ දක්වා සේවය කර ඇත. සිවිල් ආරක්ෂක කමිටුවේ සාමාජිකයකු වූ ඔහු දකුණු පළාත් ප්‍රවාහන අධිකාරියේ සභ රුහුණු සංචාරක කාර්යාංශය හිටපු අධ්‍යක්ෂවරයෙකි. මෙවැනි උදාර සමාජ සේවයක් කළ ධනසේන මාදුවගේ මහතාගේ අභාවය පිළිබඳව ප්‍රදේශවාසී මහජනතාව ඉමහත් කම්පාවට පත් ව සිටී. ඔහුගේ ආදාහන කටයුතු සෞඛ්‍ය උපදේශ අනුව හම්බන්තොටදී ඊයේ (16) දින සිදු කරන ලදී.

වැල්ලවායේ කොවිඩ් ආසාදිතයෝ 80ක්

වැල්ලවාය විශේෂ - ජී. අයි. ආර්. ගරුසිංහ

වැල්ලවාය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල බල ප්‍රදේශයෙන් පෙරේදා (15) වාර්තා වූ කෝවිඩ් ආසාදිතයන් දෙදෙනා සමඟ වැල්ලවායේ සමස්ත කොවිඩ් ආසාදිතයන් ගණන 80 දක්වා ඉහළ ගොස් ඇතැයි සෞඛ්‍ය අංශ පවසයි.

වැල්ලවාය අධ්‍යාපන කොට්ඨාසයට අයත් බුදුරුවාගල පාසලේ 11 වසරේ ඉගෙනුම ලබන සිසුවකුට ද කොවිඩ් ආසාදනයවී ඇති අතර ඔහු ඇසුරු කළ ඇතිලිවැව ප්‍රදේශයේ පදිංචි 47 හැවිරිදි අයකුට ද කොවිඩ් ආසාදනයවී ඇති බව සෞඛ්‍ය අංශ තහවුරු කරගෙන තිබේ.

ඉකුත් 13 වැනිදා ගත් පීසීආර් සාම්පල්වලට අනුව වැල්ලවායේ පාසල් දෙකක ඉගෙනුම ලබන දරුවන් දෙදෙනකුට ද කොවිඩ් ආසාදනයවී තිබේ. ඔවුන්ගේ ආශ්‍රිතයන් පීසීආර් පරීක්ෂණ සඳහා යොමු කිරීමට වැල්ලවාය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරීන් ඊයේ (16) දිනයේ කටයුතු යොදා තිබිණි.

කොවිඩ් නව වයිරස් ප්‍රභේදය ව්‍යාප්ත වීම 70%ක වේගයෙන් සිදු වනවා

ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ ලේකම් මහේන්ද්‍ර බාලසූරිය

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් නව වයිරස් ප්‍රභේදය සියයට 70ක වේගයෙන් ව්‍යාප්ත වීම නිසා රෝගීන් වැඩි සංඛ්‍යාවක් ඉදිරියේදී වාර්තා වීමේ අවදානමක් පවතින බව ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ ලේකම් මහේන්ද්‍ර බාලසූරිය මහතා 'දිනමිණට' ඊයේ (16) පැවැසුවේය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'නිරෝධායන මධ්‍යස්ථානවල සිටි පුද්ගලයන් 16කගෙන් මේ නව වයිරස් ප්‍රභේදය වාර්තාවී තිබෙනවා. එසේ වාර්තාවී ඇත්තේ නියැදි 40කින් සිදු කළ පරීක්ෂණ වාර්තාවලින්. කොවිඩ් වයිරසය බහුලව වාර්තා වන ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් වයිරස් ප්‍රභේද සම්බන්ධයෙන් පර්යේෂණ කිරීමේ අවශ්‍යතාවක් පවතිනවා. එසේ සිදු කර නිවැරදි දත්ත වාර්තා කර ගැනීමෙන් වයිරසය තවදුරටත් නිසි ලෙස පාලනය කර ගත හැකියි.

කොවිඩ් නව ප්‍රභේදය වාර්තා වන්නේ නිරෝධායන මධ්‍යස්ථානවලින් පමණක් කියා නිශ්චිතව සිටිය නොහැකියි. වයිරසය ව්‍යාප්තව ඇති ප්‍රදේශ ඉක්මනින් හඳුනා ගැනීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම කාලීන අවශ්‍යතාවක්.

විශේෂයෙන්ම මේ කාලයේදී මංගල උත්සව ඇතුළු සෙනඟ රැස් වන ප්‍රිය සම්භාෂණ හෝ වෙනත් උත්සව පැවැත්වීම සුදුසු නෑ.

වයිරසය ව්‍යාප්ත වීමේ වේගවත්භාවය නිසා එක් අයකුට හෝ වයිරසය ආසාදිතව ඇත්නම් බොහෝ සංඛ්‍යාවකට වයිරසය ව්‍යාප්ත විය හැකියි. පසුගිය කාලයේ වුවද වැඩි වශයෙන් ආසාදිතයන් වාර්තා වීම සිදුව ඇත්තේ උත්සව අවස්ථාවලදී.

වසර 10කට අඩු සේවා කාලයක් ඇති බලවේග පේෂකර්ම සේවකයන්ට මාසික දීමනාවක්

රක්ෂණ ශ්‍රියන්ත

1980/82 වකවානුවේ පෞද්ගලීකරණය කරන ලද බලවේග පේෂකර්ම ආයතනවල සේවය කරන ලද වසර දහයකට වඩා අඩු සේවා කාලයක් සහිත සේවකයන් 3332කට මාසික දීමනාවක් දීමට හැකි වීම මහා පින්කමක් බවත්, එවැන්නක් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහ මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වය සහිත ජනතාවගේ වේදනාව හඳුනන ආණ්ඩුවක් නොතිබුණා නම් ඉටු කර දීමට නොහැකි වන බවත් කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතා පවසයි.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ පසුගියදා (14) කුරුණෑගල වයඹ පළාත් සභා ශ්‍රවණාගාරයේ පැවති ප්‍රතිලාභ දීමේ සමාරම්භක උත්සවයට එක් වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද සඳහන් කළේය.

'ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති ධුරයට පත් වීමෙන් අනතුරුව මා කර්මාන්ත හා කළමනාකරණ සේවා අමාත්‍ය ඇමැති ධුරය දරන අවධියේ දී මහජන දිනයේදී පැමිණි බොහෝ වියපත් අම්මලා තමන්ට සිදු වූ මේ අසාධාරණය ගැන කීවා. ඇතැම් අම්මලා මේ අසාධාරණය ගැන කීවේ ඇස්වල කඳුළු පුරවාගෙන. මේ විදිහට බලාදා දින කිහිපයක් ගත වෙද්දී මා අප අමාත්‍යාංශය යටතේ පැවති පේෂකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමියගෙන් මේ ගැන විමසා කරුණු දැන ගත්තා. මේ පිරිසට අසාධාරණයක් සිදුව ඇති බව ඇයත් පිළි ගත්තා.

ඒ අනුව තමයි අප මීට අවුරුදු 40කට පෙර පැවති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් පෞද්ගලීකරණය කරන ලද බලවේග පේෂකර්ම ආයතනවල සේවය කළ සේවා කාලය වසර 10කට වඩා අඩු සේවකයන්ට විශ්‍රාම වැටුපක් දීමට ඇමැති මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළේ.

ගියොත් කොළයක් - ආවොත් අලියෙක් කියලා තමයි මේ ඇමැති මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කළේ. නමුත් 2020 ජූලි මස 15 වැනිදා තමුන්නාන්සේලාට ලැබුණේ අලියෙක්. එදින එම කැබිනට් පත්‍රිකාවට අනුමැතිය ලැබී තමුන්නාන්සේලාට ලැබුණු සහනය 'අලියෙක්' ලෙසයි මා හඳුන්වන්නේ.

මේ කැබිනට් පත්‍රිකාවෙන් සහන ලැබුණු වැඩිම පිරිසක් සිටින්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ. පේෂකර්ම, දේශීය රෙදිපිළි ක්ෂේත්‍රය භාරව සිටින රාජ්‍ය ඇමැතිවරයා ද කුරුණෑගලින් බිහිව තිබීම දෛවෝපගත සිදුවීමක්. දයාසිරි ජයසේකර මහතා සහ මා ඉමහත් සතුටට පත් වෙනවා මේ මහා පින්කමට දායක වීමට ලැබීම ගැන.

ගෝඨාභය රාජපක්ෂ සහ මහින්ද රාජපක්ෂ මහත්වරුන් වගේ තමුන්නාන්සේලාගේ වේදනාව හඳුනාගන්න පුළුවන් නායකත්වයක් නොතිබුණා නම් අපට මේ දෙය කරන්න ඉඩ ලැබෙන්නේ නෑ. දයාසිරි ජයසේකර ඇමැතිවරයා මට පවසා තිබුණා පැවති ආණ්ඩුව සමයේ තමුන්නාන්සේලාට සාධාරණය ඉටු කරදීමට ගත් වෙහෙස ගැන. නමුත් එවැනි පාලනයකින් අපට සහනයක් ගැනීමට බෑ. අද මුළු ලෝකය පුරාම කොවිඩ් වසංගතය හේතුවෙන් වික්ෂිප්තභාවයක් ඇති වෙලා.

ගෝඨාභය රාජපක්ෂ මහතා බලයට ආවේ සහරාන්ලාගේ කුණාටුව ඇති වුණාට පසුව. ඒ මහතා බලයට ආ පසු කොවිඩ් කුණාටුවත් හැමුවා. මේ කුණාටු දෙකෙන්ම ඇති වූ ඍණාත්මක බලපෑම මැද තමයි ගෝඨාභය රාජපක්ෂ මහතාට මේ රටේ පාලන සුක්කානම හසුරුවන්න සිදු වුණේ. ඒක අභියෝගයක්. ඒ අභියෝගය හරියට ජයගැනීමට නම් ගෝඨාභය රාජපක්ෂ මහතා සෑම අතින්ම ශක්තිමත් කරන්න ඕනෑ. සෑම අතින්ම ශක්තිමත් කිරීම කිවුවාට දේශපාලන වශයෙනුත් ශක්තිමත් කිරීම වැදගත්.

වයඹ පළාත් ආණ්ඩුකාර රාජා කොල්ලුරේ, බතික් අත්යන්ත්‍ර රෙදි, දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය ඇමැති දයාසිරි ජයසේකර මහත්වරු ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

RDB කිරි ශක්ති ණය යෝජනා ක්‍රමය ආරම්භ කිරීමට හැකි වීම සතුටට කරුණක්

අමාත්‍යාංශ ලේකම් එස්. සේනානායක

ජයසිරි මුණසිංහ සහ වාරියපොළ මධ්‍යම සමූහ

දේශීය දියර කිරි නිෂ්පාදනයෙන් ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත කිරීමේ අරමුණින් 2021 අයවැයෙන් යෝජනා කළ සහන පොලී ණය යෝජනා ක්‍රමයක් වන 'RDB කිරි ශක්ති ණය යෝජනා ක්‍රමය' මාස 1 ½කදී ආරම්භ කිරීමට හැකි වීම සතුටට කරුණක් බව පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් එස්. සේනානායක මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා මේ බව පැවැසුවේ වාරියපොළ තානියා උත්සව ශාලාවේ පැවති මේ ණය යෝජනා ක්‍රමය හඳුන්වාදීමේ අවස්ථාවට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'දේශීය දියර කිරි නිෂ්පාදන ඉහළ නැංවීමට අපේ අමාත්‍යාංශය කිරි ගොවීන්ට සහයෝගය දීමට රාජ්‍ය ඇමැති ඩී. බී. හේරත් මහතාගේ මඟපෙන්වීම මත කටයුතු කරනවා.

කිරි ගොවීන්ගේ මූලික ආයෝජන අවස්ථා කිසිදු අපහසුතාවකින් තොරව සපුරාලීමට අයවැයෙන් යෝජනා කළ පරිදි නව ණය යෝජනා ක්‍රමය විශාල ශක්තියක්. මේ මුදල් ප්‍රයෝජනයට ගනිමින් ජාතික කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීමට අප පියවර ගත යුතුයි. දැනට වාර්ෂිකව කිරි ලීටර් මිලියන 420ක් නිෂ්පාදනය කෙරෙනවා. එයින් ස්වයංපෝෂිත වීමට නම් කිරි ලීටර් මිලියන 1200ක් නිපදවිය යුතුයි. මේ සඳහා ශක්තියක් වීමට RDB බැංකුව අප සමඟ එකතු වීම සතුටට කරුණක්.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ (RDB) සභාපති මහින්ද සාලිය මහතා

RDB කිරි ශක්ති ණය යෝජනා ක්‍රමය ආරම්භ කරමින් කිරි ගොවීන් 110 දෙනකුට ණය මුදල් ප්‍රදානය කළා. මේ යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 1000ක් ණය වශයෙන් දීමට වෙන් කර තිබෙනවා.

දේශීය දියර කිරි නිෂ්පාදනය දැනට වඩා තුන් ගුණයකින් ඉහළ නංවා ගැනීමට ජාතික ප්‍රතිපත්තියකට අනුගතව කිරි ගොවි ප්‍රජාව බලගැන්වීම සිදු කළ යුතුයි. කිරි ඇතුළු ආහාර ද්‍රව්‍ය පිටරටින් ගෙන්වීමට වාර්ෂිකව විශාල මුදලක් වැය වෙනවා. මේ මුදල් කන්දරාව අප රටේම ඉතිරි කර ගැනීමට දේශීය කෘෂි නිෂ්පාදන, සත්ත්ව නිෂ්පාදන ඉහළ නැංවීමෙන් හැකියාව ලැබෙනවා. එය ළඟා කර ගැනීම තමයි අපගේ අරමුණ විය යුත්තේ.'

වාරියපොළ ප්‍රාදේශීය සභාවේ සභාපති ඩී. එම්. තිලකරත්න බණ්ඩාර, වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් ගීතා ධර්මසිරි, සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් රංජනී හෙට්ටිආරච්චි, සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍ය සාගරිකා, වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෛද්‍ය බී. සී. එස්. පෙරේරා, කෘෂිකර්ම හා ගොවි රක්ෂණ මණ්ඩලයේ මහව කලාපයේ සහකාර අධ්‍යක්ෂ ටී. එම්. ප්‍රේමරත්න, සීමාසහිත කුඩා කිරිපට්ටි ගොවි සංවිධානයේ සභාපති ලයනල් ධර්මසිරි, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී බී. එම්. ටී. එස්. කුමාර, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වයඹ පළාත් ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී බී. ආර්. ඩී. පුෂ්පකුමාරි, සහකාර සාමාන්‍යාධිකාරී ජයලත් අමරසිංහ මහත්ම මහත්මීන් ඇතුළු කිරි ගොවි සමිති නියෝජිතයෝ ද, ව්‍යවසායක කිරි ගොවීහු ද මේ අවස්ථාවට සහභාගි වී සිටියහ.

ඡායාරූපය - වාරියපොළ සමූහ

දිනකට රට පුරා රිය අනතුරු 120ක්

ගත වූ පැය 24ට මරණ 11ක්

මෙය අසාමාන්‍ය තත්ත්වයක් අනතුරු අවම කර ගැනීමට උනන්දු වන්න

පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජනතාවට කියයි

රක්ෂණ ශ්‍රියන්ත

ශ්‍රී ලංකාව තුළ දිනකට වාර්තාවන රිය අනතුරු සංඛ්‍යාව 120ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, ඊයේ (16) උදෑසන 6න් අවසන් වූ පැය 24ක කාලය තුළ රිය අනතුරුවලින් මරණ 11ක් වාර්තා වී ඇති බව පොලිසිය පැවසීය.

සිදුවූ මරණවලින් 9ක් පෙරේදා (15) සිදුවූ රිය අනතුරුවලින් සිදුව ඇති අතර, තවත් මරණ 2ක් ඊට පෙර සිදු වූ අනතුරුවලින් රෝහල්ගත කර සිටියදී සිදු වූ මරණ බවත්, යතුරුපැදිකරුවන් 5ක් සහ පදිකයන් 4ක් මෙසේ මිය ගොස් ඇති බවතක් පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා ප්‍රකාශ කෙළේය.

රිය අනතුරුවලින් දිනකට 10ක් හෝ 11ක් මිය යෑම සාමාන්‍ය තත්ත්වයට වඩා වැඩි බව පෙන්වා දෙන පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා, ඒ හේතුවෙන් රිය අනතුරු වළක්වා ගැනීමට ජනතාව මීට වඩා වැඩි අවධානයකින් කටයුතු කළ යුතු බව අවධාරණය කළේය.

රිය අනතුරුවලින් දිනකදී තුවාල ලබන සංඛ්‍යාව 40ක් දක්වා වර්ධනය වී ඇති බවද, අධික වේගය, බීමත්ව රිය පැදවීම, මාර්ග සංඥා නොතකා කටයුතු කිරීම මෙම අනතුරුවලට මූලික හේතුව ලෙස හඳුනාගෙන ඇති බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

කැබිනට් තීරණ

■ මහල් නිවාස ඉදිකිරීම ප්‍රවර්ධනය උදෙසා සමුළු නිවාස පරිශ්‍රය සංවර්ධනය කිරීම

කොළඹ නගරයේ පවතින ඉඩම් හිඟය හේතුවෙන් වැඩි වෙමින් පවතින නිවාස ඉල්ලුම සපුරාලීම සඳහා සුදුසු ඉඩම් හඳුනාගෙන මහල් නිවාස ඉදි කිරීම පිණිස රජය විසින් අවධානය යොමු කර ඇත. අක්කර 12ක පමණ භූමි භාගයක, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පාලනය වන කොළඹ 05, කැප්පෙටිපොළ පාරේ පිහිටි 1976 වර්ෂයේදී ඉදි කරන ලැබ ඇති නිවාස ඒකක 170කින් සහ බංගලා 15 කින් යුතු සමුළු නිවාස දැනට රජයේ සේවකයින්ගේ නිල නිවාස අවශ්‍යතා සඳහා භාවිත කරයි. එකී නිවාස බොහොමයක් මේ වන විට අබලන් තත්ත්වයේ පවතින අතර, සම්පූර්ණයෙන් අලුත්වැඩියා කළ යුතු බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් නිර්දේශ කර ඇත. තවද මේ වන විට රජයේ සේවකයින් 700ක් පමණ පොරොත්තු ලේඛනගතව නිල නිවාස අපේක්ෂාවෙන් සිටී. එම කරුණු සැලකිල්ලට ගෙන ප්‍රථම අදියර වශයෙන් එම අක්කර 12ක භූමියේ අක්කර 02ක රජයේ සේවකයන් සඳහා නිල නිවාස 400ක් ඉදි කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය සහ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය අතර, එකඟතාවක් ඇති කර ගෙන ඇත. යෝජිත ව්‍යාපෘතිය යටතේ දැනට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකෙරෙමින් පවතින මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රමවලින් නිවාස 100ක් ද රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත පවරා දෙනු ඇත. ඒ අනුව ඉතිරි වන අක්කර 10ක භූමි ප්‍රමාණය සංවර්ධනය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දෙනු ඇත. යෝජිත පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස ඇමැති වශයෙන් අගමැතිවරයා සහ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන ඇමැති ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාවට අනුමැතිය ලැබිණි.

■ කොළඹ විශ්වවිද්‍යාලය-පකිස්තානයේ ලාහෝර් ආර්ථික විද්‍යායතනය අතර අවබෝධතා ගිවිසුමක්

දෙපාර්ශ්වයට අන්‍යෝන්‍ය ප්‍රතිලාභ හිමි වන පර්යේෂණ ද්‍රව්‍ය, ප්‍රකාශන සහ තොරතුරු හුවමාරු කර ගැනීම, ආයතන දෙකෙහි ඒකාබද්ධ හා තනි පර්යේෂණ ව්‍යාපෘති සඳහා දිරිමත් කිරීම, කුසලතා හා හැකියාවන් සහිත සිසුන් හුවමාරු කිරීමේ වැඩසටහන් මඟින් අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සලසා දීම ආදී අරමුණු සහිතව කොළඹ විශ්වවිද්‍යාලය සහ පකිස්තානයේ ලාහෝර් ආර්ථික විද්‍යායතනය (Lahore School Economics) අතර, අවබෝධතා ගිවිසුමකට එළඹීම පිණිස යෝජනා වී ඇත. යෝජිත අවබෝධතා ගිවිසුම පිළිබඳ විද්වත් කමිටුවක් අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර, විදේශ අමාත්‍යාංශයේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ එකඟතාව ද ලැබී ඇත. ඒ අනුව එකී අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස අධ්‍යාපන ඇමැති ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි.

■ සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

සාම්ප්‍රදායික කර්මාන්තයන්හි නිරත කර්මාන්තකරුවන්ට ඔවුන්ගේ නිෂ්පාදන කටයුතු පුළුල් කිරීම සඳහා සහාය වීමට සහ විශේෂිත භාණ්ඩ වෙළෙඳපොළවල් වෙත පිවිසීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා 2021 අය වැය මඟින් රුපියල් මිලියන 2000ක ප්‍රතිපාදන වෙන් කරනු ලැබ ඇත. ඒ අනුව, වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 – 2025 කාල සීමාව තුළ ක්‍රියාත්මක කිරීම පිණිස වැඩසටහනක් සැලසුම් කර ඇත. එකී වැඩසටහන යටතේ එම අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති හඳුනාගෙන ඇති අතර, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස කර්මාන්ත ඇමැති ඉදිරිපත් කළ යෝජනාවට කැබිනට් අනුමැතිය ලැබිණි.

■ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම

යම් මහේස්ත්‍රාත්වරයකු පත් කර ඇති අධිකරණ කොට්ඨාසයේ පිහිටි පොලිසියේ පොලිස් අත්අඩංගුවේ රඳවා සිටින සැකකරුවකු අධීක්ෂණය කිරීම පිණිස එම පොලිස් ස්ථානයට අවම වශයෙන් මසකට එක් වරක්වත් පැමිණීමට අදාළ මහේස්ත්‍රාත්වරයාට බලය පැවරෙන පරිදි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව නීති කෙටුම්පත් සම්පාදක විසින් පනත් කෙටුම්පතක් සකස් කර ඇති අතර, එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ ඇමැති ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබිණි.

බුද්ධිකා සහ සිතාරා

ආදරවන්තයන්ගේ දිනයට පැවැත්වූ සුපිරි මත්පැන් සාද 3ක් විටලයි

ලක්ෂ 10ක රට අරක්කු සමඟ සැකකරුවෝ 3ක් දැලේ

සුභාෂිණී සේනානායක

වැලන්ටයින් දිනයේදී (14) සමාජ මාධ්‍ය ඔස්සේ සුප්‍රසිද්ධ හෝටල්වල සංවිධාන කළ මත්පැන් සාද 3ක් වැටලූ සුරාබදු වැටලීම් ඒකකය රුපියල් ලක්ෂ 10ක් පමණ වටිනා විදේශීය මත්පැන් ලීටර 49,300ක් සහ සැකකරුවන් තිදෙනකු අත්අඩංගුවට ගෙන ඇත.

මොරටුව, බොරලැස්ගමුව හා උනවටුන යන ප්‍රදේශයන් හි දී මේ වැටලීම් සිදු කර ඇත. අත්අඩංගුවට පත් සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇති බව සුරාබදු කොමසාරිස් ජනරාල් එම්. ජේ. ගුණසිරි මහතා පැවැසීය.

මෙම සාද සඳහා සහභාගී වීමට ප්‍රවේශපත්‍ර කලින් වෙන්කර ගැනීමෙන් පසු සුරාබදු නිලධාරීන් උපාය දූතයන් ලෙස සහභාගී වී තිබෙන බවත්, මෙම සාද සඳහා සහභාගී වූ පෙම්වතුන් හට විදේශ මත්පැන් අධික මිල ගණන් යටතේ විකිණීම සිදු කර ඇති බවත් මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ සුරාබදු කොමසාරිස් කපිල කුමාරසිංහ මහතා පැවැසීය.

මෙම සාද සියල්ලම සංවිධානකර තිබුණේ සුරාබදු බලපත්‍ර ලබා ගැනීමකින් තොරව වූ අතර, මෙම හෝටල් පරිශ්‍රයන් සඳහා ද කිසිදු සුරාබදු බලපත්‍රයක් ලබා නොතිබුණු බවත් එම සාද තුන සංවිධාන කළ සැකකරුවන් තිදෙනා උනවටුන, අනුරාධපුර හා නුගේගොඩ ප්‍රදේශවල පදිංචි වයස අවුරුදු 20 හා 25 අතර පසුවන පුද්ගලයන් වන බවත් කියා සිටි ඒ මහතා, ඔවුන් ගාල්ල, මොරටුව හා ගල්කිස්ස යන මහේස්ත්‍රාත් අධිකරණයන් වෙත ඉදිරිපත් කිරීමට නියමිත බව කීවේය.

උඩුත්තුරෙයි - උප්පුකුලම් ප්‍රදේශවලින්

මිලියන 15ක කේරළ ගංජා තොගයක් අත්අඩංගුවට

රක්ෂණ ශ්‍රියන්ත

ශ්‍රී ලංකා නාවික හමුදාව යාපනය උඩුත්තුරෙයි සහ මන්නාරම උප්පුකුලම් ප්‍රදේශයන්හී පෙරේදා (15) සිදු කළ විශේෂ සෝදිසි මෙහෙයුමකින් රුපියල් මිලියන 15කට අධික වටිනාකමකින් යුතු කිලෝග්‍රෑම් 16 කට අධික කේරළ ගංජා ප්‍රමාණයක් සමඟ සැකකරුවන් තිදෙනෙක් නාවික හමුදා භාරයට ගැනීමට කටයුතු කර තිබේ.

මුහුදු මාර්ගයෙන් සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම සහ නීති විරෝධී කටයුතු මැඩ පැවැත්වීම සඳහා නාවික හමුදාව නිරන්තර අවධානයෙන් යුතුව මෙහෙයුම් සිදු කරන අතර, පෙරේදා (15) උතුරු නාවික විධානය යාපනය උඩුත්තුරෙයි ප්‍රදේශයට ඔබ්බෙන් වූ මුහුදු ප්‍රදේශයේ සිදු කළ සෝදිසි මෙහෙයුමකදී උඩුත්තුරෙයි වෙරළට පැමිණි සැක කටයුතු ඩිංගි යාත්‍රාවක් නිරීක්ෂණය කර සිදු කළ පරීක්ෂාවේදී එම යාත්‍රාවෙන් රැගෙනවිත් සැඟවීමට උත්සාහ කළ පාර්සල් 5ක ඇසුරු කේරළ ගංජා කිලෝ 11 ග්‍රෑම් 905ක් සහ සැකකරුවන් දෙදෙනෙක් යාත්‍රාව ද සමඟ නාවික හමුදා භාරයට ගෙන තිබේ.

උතුරු මැද නාවික විධානය මඟින් මන්නාරම උප්පුකුලම් ප්‍රදේශයේ එදිනම සිදු කළ තවත් සෝදිසි මෙහෙයුමකදී අලෙවි කිරීමට උත්සාහ කළ කේරළ ගංජා කිලෝ 4 ග්‍රෑම් 460ක් සමඟ සැකකරුවු නාවික හමුදා භාරයට ගෙන ඇත.

නාවික හමුදා භාරයට ගත් සැකකරුවන් වයස අවුරුදු 25ත් 40ත් අතර වයසේ පසුවන පේදුරුතුඩුව සහ මන්නාරම යන ප්‍රදේශයන්හී පදිංචිකරුවන් බවට හඳුනාගෙන ඇති අතර, සැකකරුවන් සමඟ කේරළ ගංජා හා ඩිංගි යාත්‍රාව ඉදිරි පරීක්ෂණ කටයුතු සඳහා පලෙයි සහ මන්නාරම පොලිස් ස්ථාන වෙත භාර දීමට කටයුතු කළ බව නාවික හමුදාව පැවසීය.

ශ්‍රීකාන්තගේ ශ්‍රීදූපත

හොරෙන් ගෙනා කහ තොගයක් කොටු වෙයි

රක්ෂණ ශ්‍රියන්ත

නීති විරෝධී ලෙස මෙරට ආනයනය කළ කහ කිලෝ 1,164ක් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවකු හලාවත පොලිස් ස්ථානයේ නිලධාරීන් පෙරේදා (15) කළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබේ. අත්අඩංගුවට ගත් පුද්ගලයා 26 හැවිරිදි අයකු වන අතර ඔහු සමඟ ලොරි රථයක් ද අත්අඩංගුවට ගත් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය. අත්අඩංගුවට ගත් සැකකරු ඊයේ (16) හලාවත මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

අද තැන්න

තැන තැන ගිහින් බොරුවට හිස් වචන දොඩා
නැත කිසි පලක් වෙහෙසී හැදූ කැදලි කඩා
මේ ගැන හිතනු මැන යොමුකොට මොළය කුඩා
තනතුර මොනවටද? ජනපතිකමට වඩා!

අපමණ ගැටලූ තිබියදී හැම පළාතෙම
කටයුතු නොකළ යුතු පැනලා වැටේ ඉම
නැත අඩුවෙලා අයියයි -මල්ලිගේ පෙම
අභයාරාමෙ පිහිටයි! මේ හැමෝටම

රටේමුල්ලේ මුදන්නායක

ගුරුධාඉෂ

බඩු විසි හතක මිල අඩු පැත්තට අල්ලා
සතොසෙහි අය පැත්ත ඉහළට ගෙනැවිල්ලා
බන්දුල කියනවා ඇති තොල් අග හොල්ලා
පුළුවන් නම් දැනුත් ඇදයක් හොයපල්ලා

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 පෙබරවාරි 17 බදාදා

ඉන්දීය හෙළිදරව්ව දේශපාලන විහිළුවක් ද?

ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂය විසින් ජනගත කරන ලද අදහසක් නිසා දකුණු ආසියානු දේශපාලනය තුළ යම් කැලඹීමක් ඇති වී තිබේ. මේ අදහසින් කියවෙන්නේ ශ්‍රී ලංකාව තුළ ද, නේපාලය තුළ ද භාරතීය ජනතා පක්ෂයට සම්බන්ධ දේශපාලන ව්‍යාපාර ඇතිකොට කලාපීය බලය එම පක්ෂය වෙත කේන්ද්‍රගත කර ගැනීමට සැලසුමක් ක්‍රියාත්මක වන බවය. මෙය සුළුකොට තැකිය නොහැක්කේ අගමැති මෝදිගේ මෑතකාලීන මහජන කතා ද උක්ත අදහස සමඟ මනාව ගැළපෙන බැවින්ය. මීට දින කිහිපයකට පෙර චෙන්නායි නුවරදී දෙමළ ජනතාව ඇමතූ ඉන්දීය අගමැතිවරයා කියා සිටියේ ශ්‍රී ලංකාවේ ජීවත් වන සහෝදර දෙමළ ජනතාවගේ නිදහස, සාමය හා සුභ-සාධනය සම්බන්ධයෙන් ඉන්දීය රජය කැපවන බවය.

ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පවත්නා දේශපාලනික සහ සම්බන්ධය විවිධාර්ථ සහිතව විවරණය වී ඇත. එක අතෙකින් එය නොවැළැක්විය හැකි භූ-දේශපාලනික සබඳතාවකි. තව අතෙකින් ඓතිහාසික හා සාංස්කෘතික බැඳීමක් හැටියට එය විග්‍රහ වෙයි. තවත් අතෙකින් අසල්වැසියා, සහෝදරයා හා මිත්‍රයා ලෙසින් ද මේ සම්බන්ධය විග්‍රහ වෙයි. කලාපීය දේශපාලනය ගැඹුරින් විග්‍රහ කරන විශ්ලේෂකයන්ට අනුව කලාපීය බලවතා ලෙස ඉන්දියාව නිරූපණය කරන භූමිකාවක් තිබේ. එම භූමිකාවට අනුව සාගර කලාපයේ අයිතිය, කලාපීය වෙළෙඳ කටයුතුවල ආධිපත්‍යය ඉන්දියාවට හිමි විය යුතුය. එසේ නැතහොත් එකී කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඉන්දියාව නිරන්තර උත්සාහයක යෙදී සිටී.

භාරතීය ජනතා පක්ෂයේ ප්‍රබලයකු සේම මෝදි කඳවුරේ ප්‍රධානයකු ද වන අමිර් ෂා නම් මහ ඇමැතිවරයා ඉදිරිපත් කළ ඉහත හෙළිදරව්ව බැලූ බැල්මට නම්; අතිශය භයානකය. ස්වාධීන රාජ්‍ය දෙකක් අල්ලා ගැනීම සඳහා ක්‍රියාත්මක වන දේශපාලන කුමන්ත්‍රණයක් එහි තිබේ. එහෙත් මෙය හිතන තරම් පහසුවෙන් ජය ගත නොහැකිය. රටක අභ්‍යන්තර දේශපාලනයට අත පෙවීමේ අයිතියක් වෙනත් රටවලට නැත. ශ්‍රී ලංකාව, ස්වාධීන රාජ්‍යයකි. නේපාලය ද ස්වාධීන රාජ්‍යයකි. එක්සත් ජාතීන්ගේ සම්මුතිවලට අනුව නම්; ඉහත ප්‍රකාශයට පවා විරෝධය දැක්විය යුතුය. ඉන්දීය කොංග්‍රසය මෙන්ම ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය ද ඉහත සැලසුමට එරෙහිව දැඩි විරෝධයක් දක්වා ඇත. ඉහත අදහසට ඉන්දියාව තුළින්ම විරෝධයක් මතු වීම වඩාත් සුබදායකය.

සිද්ධිය සම්බන්ධයෙන් දේශීය මත කිහිපයක් කරළියට පැමිණ තිබේ. එක මතයකට අනුව මීට හේතුව වරායේ නැගෙනහිර පර්යන්තය ඉන්දියාවට නොදීමය. තව මතයකට අනුව ජන විරෝධයකට ලක් වී ඇති අගමැති මෝදි යළි සිය ජනප්‍රියත්වය රැකගැනීම සඳහා මෙබඳු උපායමාර්ග භාවිත කරයි. තවත් මතයකට අනුව ඉන්දියන් සාගරයේ චීන ආධිපත්‍යයට එරෙහිව අමෙරිකාව හා ඉන්දියාව විසින් මෙහෙයුමක් දියත් කර තිබේ. දිගුකාලීන වූ මේ මෙහෙයුමේදී ශ්‍රී ලංකාව මෙන්ම නේපාලය ද වටිනා මර්මස්ථාන දෙකක් ලෙස පවතී. චීනය සැලසුම් කර ඇති සේද මාවතේ දෙවන කොටසට ශ්‍රී ලංකාව මෙන්ම නේපාලය ද අයත්ය. මේ රාජ්‍යයන් දෙකම ඉන්දියාවට පක්ෂපාති රාජ්‍යයෝ වෙති.

ශ්‍රී ලංකාවේ දේශපාලන බලය පිළිබඳ සරල විග්‍රහයකට ගියහොත් එය ක්‍රියාවලියකි. දේශපාලන පක්ෂයක් පිහිටුවා ගැනීම, නායකයන් තෝරාගැනීම, ලියාපදිංචි වීම, මැතිවරණ සඳහා ඉදිරිපත් වීම, මැතිවරණ ජය ගැනීම ඒ අතර පවතී. පක්ෂයක් ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් සපිරිය යුතුය. කොයි ආකාරයෙන් බැලුව ද විදේශීය දේශපාලන ව්‍යාපාරයක් රට තුළ තහවුරු කිරීම පහසු නැත. ඒ හැරත් ආණ්ඩු බලය ගැනීම සඳහා බහුතර ජන්ද ප්‍රමාණයක් ගත යුතුය. ශ්‍රී ලංකාවේ බහුතර බලය යනු සිංහල ප්‍රජාවගේ කැමැත්ත හා ජන්දය ලෙස ද විග්‍රහ කළ හැකිය. ඉන්දියාව කෙරෙහි ගෞරවයක් ද අගමැති මෝදි කෙරෙහි ආකර්ෂණයක් ද මෙරට තුළ තිබෙන්නට පුළුවන. එහෙත් එය ඉන්දීය දේශපාලන ව්‍යාපාරයක් ශ්‍රී ලංකාව තුළ තහවුරු කිරීමට තරම් ප්‍රමාණවත් නැත.

ඉහත අදහසට එරෙහිව පවතින මත දෙකක් ගැන ද සැලකිල්ල යොමු කිරීම වටී. ඉන් එක මතයකට අනුව දෙමළ ජාතික සන්ධානය ස්වාධීනයැයි කියුව ද එය ක්‍රියා කරන්නේ ඉන්දීය දේශපාලනයේ වුවමනා-එපාකම් අනුවය. වතුකරයේ දෙමළ පක්ෂ මෙරට ප්‍රධාන දේශපාලන ධාරා දෙක සමඟ සම්බන්ධතා පැවැත්වුව ද ඔවුන් උපදේශන ගන්නේ ඉන්දියාවෙන්ය. එහි මූලික තර්කයක් වන්නේ ඉන්දියාවට අවශ්‍ය නම් දේශපාලන වශයෙන් ශ්‍රී ලංකාවට බලපෑමක් කළ හැකි බවය. අනෙක් අතින් ආධාර හා ණය ඔස්සේ ද, සාගර ආධිපත්‍යය ඔස්සේ ද, ජාත්‍යන්තර වෙළෙඳාම ඔස්සේ ද ඉන්දියාවට ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑමක් කළ හැකිය. කොවිඩ් එන්නත දීමේ දී ද මෙබඳු බලපෑමක් සිදු වූ බව කියනු ලැබේ.

කොයි අතින් බැලුව ද ශ්‍රී ලංකාවේ ස්වාධිපත්‍යයට හා නිදහසට අත තැබීමට ඉඩක් නොදිය යුතුය. ඉන්දියාව, චීනය, අමෙරිකාව, ජපානය අපට හිතවත් රාජ්‍යයන් බව සැබෑවකි. ඔවුන් අපට වඩා බලවත් බව ද සැබෑවකි. එහෙත් අපේ ස්වාධිනත්වයට හා නිදහසට බලපෑමක් කිරීමට අයිතියක් කිසිදු රාජ්‍යයකට නැත. රටේ නායකයන් ඒ බව වටහාගෙන රාජ්‍ය පාලනය ගෙන යා යුතුය. රාජ්‍ය පාලනයේදී විදේශ සබඳතා යන්න වැදගත් විෂය පථයකි. නූතන ලෝකයේ කිසිදු රාජ්‍යයකට හුදෙකලාවේ ගමනක් නැත. එහිදී රාජ්‍ය පාලකයන් කළ යුත්තේ විදේශ සබඳතා කළමනාකරණය කර ගැනීමය. මේ කළමනාකරණය පහසු කටයුත්තක් නොවේ. ජනතාව පවා භූ-දේශපාලනික තත්ත්වයන් වටහාගෙන ක්‍රියා කළ යුතුව තිබේ.

භාරතීය ජනතා පක්ෂයේ හෙළිදරව්ව සම්පූර්ණ ඇත්තක් වන්නට පුළුවන. එසේ නැතහොත් දේශපාලන වශයෙන් යොදන ලද උපාය මාර්ගයක් වන්නටත් පුළුවන. රටේ නායකයන් දෙපැත්ත ගැනම කල්පනා කොට තීන්දු-තීරණ ගැනීම වඩාත් සුබදායකය.

දිල්රුගෙ සිංදු

බේරී ඉන්නට පුළුවන් හොර බොරු නොකළොත්	විතරකි
වැලි ගැහුවොත් නීති ඇසට මාරයාට රස	අහරකි
මේක නිමාවක් වන තුරු යන හැම පාරෙම	අතුරකි
මංගල්ලෙට පනස් දෙනයි මරණෙට පැය විසි	හතරකි

අපට විදෙස් ණය පියවන්න පුළුවන් ද?

ප්‍රවීණ ආර්ථික විශ්ලේෂක
වින්සන් මර්වින් ප්‍රනාන්දු



නිදහස් ශ්‍රී ලංකාවේ ආර්ථිකය මුහුණ දෙන දරුණුතම සහ අසීරුතම අවදිය කරා පැමිණ ඇතැයි ඇතමෙක් සඳහන් කරති. එපමණක් නොව මේ දිනවල ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රධාන ප්‍රශ්න 2කට මුහුණ දෙමින් සිටින බව බොහෝ දෙනා පවසති. ඔවුන් නඟන පළමු ප්‍රශ්නය ශ්‍රී ලංකාව විදේශ ණය ගෙවා ගැනීම සඳහා අරමුදල් සොයා-ගැනීමේදී දැඩි අර්බුදයකට මුහුණ දී ඇති බවය. දෙවැන්න, ආණ්ඩුව මේ වන විට රටේ ආර්ථිකය මෙහෙයවන්නේ හිතුමනාපයට මුදල් අච්චු ගසමින් බවය.

මෙම කරුණු ඇතුළු ශ්‍රී ලංකා ආර්ථිකයේ මුහුණ දෙන ගැටලු මොනවාද? නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ ගමන් මඟ යොමුව ඇත්තේ කුමන දෙසකට ද? යන්න පිළිබඳව මෙම ලිපියෙන් පැහැදිලි කෙරේ.

බොහෝ දෙනෙක් කතා කරන ඉහත ප්‍රශ්න 2ක පිළිබඳ කරුණු දැක්වීමට පෙර ශ්‍රී ලංකා ආර්ථිකයේ 73 වසරක ගමන් මඟ පිළිබඳ යම් විශ්ලේෂණාත්මක විග්‍රහයක යෙදිය යුතුය.

ශ්‍රී ලංකා ආර්ථිකය නිදහසින් පසු පසුගිය වසර 73 ක කාලය තුළ එනම් 1948 – 2021 දක්වා සාමාන්‍යයෙන් 4% ක වර්ධන වේගයක් වාර්තා කළ අතර, නිදහසින් පසු ප්‍රථමවරට 8.2% ක් වාර්තා වූයේ 1968 දීය. ඊට වසර 10 කට පසු එනම් 1978 දී යළිත් 8.2% ක් වාර්තා විය.

නිදහසින් පසු ප්‍රථම වරට රටේ ආර්ථික වර්ධන වේගය ඍණ 1.5% ක් වාර්තා වූයේ 2001 දීය. වසර 30 ක් තුළ ඇදී ගිය ජන-වාර්ගික අර්බුදය හා යුදමය වාතාවරණය හමුවේ ශ්‍රී ලංකාවට ලෝකයේ පොහොසත් රටක් වීමේ අවස්ථාව මඟහැරී ගියේය. ඒ නිසාම ශ්‍රී ලංකාව නිදහසින් පසු වසර 50ක් වන තුරු ලෝකයේ පහළම ආදායම් ලබන රටවල් කාණ්ඩයට අයත් විය. ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් රටක් බවට පත් කිරීමට විශාලතම බාධකය වූ වසර 30 ක යුද්ධයට තිත තබමින් 2010 සිට පිට පිට වසර 3 ක් එක දිගටම පිළිවෙළින් 8% ක්, 8.4% ක්, 9.1% ක් ලෙස 2012 දක්වා ඉහළ වර්ධන වේගයක් වාර්තා කළ ද 2013 සිට ආර්ථික වර්ධන වේගය දුර්වල විය. එය වඩාත් කැපී පෙනුණේ 2015 සිට 2019 දක්වා වසර 5 ක කාලයක් තුළ පිළිවෙළින් 5%, 4.5%, 3.6%, 3.3% හා 2.3% ක් ලෙස නිදහසින් පසු ප්‍රථම වතාවට එක දිගටම වසර 5 ක් වර්ධන වේගය අඩු වී යෑමය.

■ ආර්ථිකයේ වර්ධන වේගය

යළිත් වැටුණු රට ගොඩ ගැනීමේ බලාපොරොත්තු ඇති නව ජනපතිවරයකු පත් විය. ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශය වූ "සෞභාග්‍යයේ දැක්ම" හරහා 2020 - 2025 කාලය තුළ සාමාන්‍ය වාර්ෂික වර්ධනය 6.5% ක් බවට පත් කිරීම අපේක්ෂා කෙරේ. එනමුත් වසර 30ක යුද්ධයට වඩා දරුණු Covid වසංගතයෙන් මුළු ලෝකයේම රටවල ආර්ථික වර්ධන වේගය (චීනය හැර) ඍණ බවට පත් කළ නිසාම ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධන වේගය ද 2020 දී ඍණ 3.9% ක් බවට පත් විය. සෑම රටකම ආර්ථික වර්ධන වේගය පමණක් නොව ආර්ථිකයේ සෑම අංශයක්ම දෙදරුම් කෑමට Covid හේතු විය. එය අප රටට ද එලෙසම බලපෑවේය.

පළමුව Covid නිසා ලෝකයේ හැම රටකම කුටුම්භ අංශය දරුණු අර්බුදයකට ලක් විය. සමාජ දුරස්ථභාවය, රැකියාවලට යෑමට අපහසුවීම, පාසල් වසා දැමීම නිසා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාළ වීම, එදිනෙදා ජීවත්වීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා ගැනීමට අපහසුවීම, ගැනීමට හැකි භාණ්ඩ හා සේවාවල මිල ගණන් අධික ලෙස ඉහළ යෑම, ජීවන වියදම වැඩි වී ජනතාවගේ ජීවන තත්ත්වය පිරිහීම එම අංශය මුහුණ දුන් දරුණුතම ගැටලුය. එය ශ්‍රී ලංකා ආර්ථිකය තුළ පමණක් නොව ලෝකයේ සෑම රටකම කුටුම්භ මුහුණ දුන් ගැටලු බව අමතක නොකළ යුතුය. මේ අංශයේ ඇතැම් කොටස්වලට සහන දීමට රජය විශාල වියදමක් ද කළේය.

දෙවනුව Covid නිසා මුළු ලෝකයේම ව්‍යාපාරික අංශය ද දෙදරුම් කෑවේය. නිෂ්පාදනවල අලෙවිය අඩු විය. ව්‍යාපාරවල රැකියා කළ බොහෝ පිරිස්වලට රැකියා අහිමි විය. ගත් ණය ගෙවා දැමීමට නොහැකි විය.

තෙවනුව Covid නිසා මුළු ලෝකයේම "ආණ්ඩු" දෙදරුම් කෑවේය. "රාජ්‍ය ආදායම" අඩු විය. ශ්‍රී ලංකාවේ ආර්ථිකය නැංවීමට ව්‍යාපාරික අංශය දිරිමත් කිරීමට 2020 මුල සිටම ව්‍යාපාරිකයින්ට බදු සහන දීම නිසා රාජ්‍ය ආදායම 50% කින් පමණ අඩු විය. ඒ මතට Covid පැමිණීම රාජ්‍ය ආදායම තවත් අඩු වී රාජ්‍ය වියදම් නොසිතූ ලෙස ඉහළ යෑම නිසා රාජ්‍ය අයවැය හිඟය 10% කට ආසන්න විය. හිඟය පියවීමට ශ්‍රී ලංකාවේ රජයට දේශීය ණය ගැනීම ද දුෂ්කර විය. ඊට හේතුව 2020 සඳහා අයවැයක් 2019 දී සම්මත වීමට තිබුණ ද 2020 සැප්තැම්බර් දක්වා එවැනි සම්මතයක් ඇති කර ගැනීමට නොහැකි වීමය. ඒ වෙනුවට 2020 ජනවාරි සිට අප්‍රේල් දක්වා වියදම් කිරීමට අතුරු සම්මත ගිණුමක් (Vote on Account) සම්මත කර ගත්තත් මැයි සිට එවැන්නක් පවා සම්මත කර ගැනීමට පාර්ලිමේන්තුවක් ද නැති විය. මන්ද මාර්තු මාසයේදී පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසාය. ඒ නිසා ජනාධිපතිවරයාට රටට අවශ්‍ය වියදම් කිරීමට භාණ්ඩාගාර බිල්පත් මහ බැංකුවට අලෙවි කොට මුදල් අච්චු ගසා සල්ලි ලබා ගැනීමට සිදු විය.

අප දැන් රටේ ප්‍රධාන වශයෙන් නැගෙන විවේචනයක් පිළිබඳව කතා කරමු. එනම් ශ්‍රී ලංකාවට ඉදිරියේදී විදේශ ණය ගෙවා දැමීම සඳහා අරමුදල් ගැනීම පිළිබඳව ගැටලුවක් පවතින බවය. නමුත් එය වෙනත් අයට ගැටලුවක් වුවත්, ගැටලුවක් සේ පෙනුණත් ශ්‍රී ලංකා මහ බැංකුව මෑතකදී පැවැත්වූ විශේෂ මාධ්‍ය හමුවේදී ප්‍රකාශ කළ පරිදි එය ගැටලුවක් නොවන බව පැහැදිලි කෙරිණි.

■ ආර්ථිකයට සිදු වන බලපෑම

මන්ද මුළු ලෝකයේම ආර්ථිකයන් සමඟ බිඳවැටුණු ශ්‍රී ලංකා ආර්ථිකය ද වසර 2021දී යළි නැගිටින තත්ත්වයක් තුළ ඉදිරියේදී 5% ඉක්මවූ ආර්ථික වර්ධන වේගයක් ළඟා කර ගනු ඇතැයි පුරෝකථනය කර තිබෙන බැවිනි. අප රට සමඟ ලෝකයේ සෙසු රටවල් ද මේ වසරේදී ආර්ථිකයන්හි පිබිදීමක් ළඟා කර ගනු ඇත. බිඳවැටුණු අංශ යළි ශක්තිමත්ව පිබිදෙනු ඇත. සංචාරක ඉපැයීම්, මැදපෙරදිග රැකියා කරන්නන්ගෙන් ලැබෙන ප්‍රේෂණ යළි යථා තත්ත්වයට පත් වනු ඇත. එමෙන්ම ආනයන ද යළි පණගැන්වී දේශීය කර්මාන්තවලට නව පණක් ලැබී රටට වාසිදායක ලෙස එතෙර, මෙතෙර වෙළඳාම සිදු වනු ඇත. ඒ සමඟින් නැවත ණය ගෙවීම පිළිබඳව යහපත් තත්ත්වයක් ඇති වනු නිසැකය.

ශ්‍රී ලංකා ආණ්ඩුව මේ දිනවල මුදල් අච්චු ගසමින් ආර්ථිකය ගෙන යන බවට ඇතමෙක් චෝදනා නඟයි. නමුත් අප සලකා බැලිය යුත්තේ මුදල් අච්චු ගැසීමෙන් ආර්ථිකයට සිදු වන බලපෑම පිළිබඳවය. මුදල් අච්චු ගැසීම නිසා උද්ධමනයේ වැඩි වීමක් සිදුවෙයි. උද්ධමනයේ වැඩි වීමට කරුණු දෙකක් බලපායි. එකක් නම් ඉල්ලුමෙන් ඇදෙන උද්ධමනයයි. දෙවැන්න සැපයුමෙන් උද්ධමනය වැඩි වීමයි. මේ වන විට ඉල්ලුමෙන් ඇදෙන උද්ධමනයක් රටේ සිදු නොවන බව මේ වසරේ ජනවාරි මාසයේ උද්ධමනය 3%ක් තරම් පහළ අගයක් ගැනීමෙන් පැහැදිලි වේ.

අපි මෙය තවදුරටත් විග්‍රහකොට බලමු.

මුදල් අච්චු ගැසීම සම්බන්ධයෙන් නැගෙන චෝදනාවේ සත්‍ය කුමක්දැයි රටවැසියන් දැනගත යුතුය. වසර 2019 අග වන විට මහ බැංකුව සතුව තිබූ රුපියල් බිලියන 75 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය වසර 2020 අග වන විට රුපියල් බිලියන 725 ක් දක්වා වැඩි විය. වසර 2021 පෙබරවාරි මැද වන විට එය රුපියල් බිලියන 745 දක්වා වැඩි වී ඇත. මේ නිසා රට දුවන්නේ සල්ලි අච්චු ගසා ගන්නා මුදල්වලින්යැයි කෙනකුට පෙනී ගියත් රටට අවශ්‍ය වියදම් කිරීමට රජයට මුදල් දීමට මහ බැංකුවට සිදු වී තිබේ.

■ දළ දේශීය නිෂ්පාදිතය

අනෙක් අතට අයවැය හිඟය පියවීමට විදේශ ණය ලබාගැනීමට ද දුෂ්කර විය. ඊට හේතුව ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිය CCC මට්ටමකට අඩු කර තිබූ නිසාය. ආර්ථික වර්ධනය වැඩි කර ගැනීමට ස්ථාවර පොළී අනුපාතිකයක් පවත්වාගෙන යෑමට, විදේශ විනිමය ආර්ථිකය ස්ථාවරව තබාගැනීමට, උද්ධමන අනුපාතිකය 4% - 6% ක මට්ටමකට පවත්වාගෙන යමින් වැටුණු රට යළි එසවීමට මහ බැංකුවේ විශාල අපේක්ෂාවක් තිබූ නිසා විදේශ ණය ගැනීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පිහිට පැතීම ද සිදු නොකළේය.

මන්ද යහපාලන ආණ්ඩුව සමයේ ආර්ථිකය දරුණු ලෙස බිඳ වැටුණේ මූල්‍ය අරමුදලෙන් ණය ගැනීමට ඔවුන් කියන විදියේ කොන්දේසි මාලාවකට යටත් වීමට සිදු වූ නිසාය. කෙසේ වුව ද මේ වන විට රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් 100% කට ආසන්න වී තිබේ. මෙයින් 42% ක් (ඩොලර් බිලියන 36) විදේශ ණයයි. දැන් බොහෝ දෙනෙක් මතු කරන ප්‍රශ්නය වන්නේ ඉදිරියේදී ගෙවීමට තිබෙන විදේශ ණය වාරික සහ පොළී (එනම් විදේශ ණය සේවා) ගෙවා දැමීමට ශ්‍රී ලංකාවට හැකිවේ ද යන්නයි. එය අප මුලින් පැවසුවාක් මෙන් ගැටලුවකින් තොරව කරගෙන යාමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබෙනුයේ ඉදිරියේදී සිදු වනු ඇතැයි අපේක්ෂිත වර්ධන තත්ත්වයන් මතය.

සිවුවනුව Covid 19 නිසා දරුණු ලෙස බිඳ වැටුණේ මුළු ලෝකයේම විදේශ අංශයයි. ශ්‍රී ලංකාවේ විදේශ අංශය තුළ අපනයන ආදායම් විශාල වශයෙන් දුන් ඇඟලුම් අපනයන බිඳ වැටුණි. සේවා ලැබීම් විශාල වශයෙන් දුන් සංචාරක ඉපැයීම් බිඳ වැටුණි. ද්විතීයික ආදායම් ලෙස සලකන විදේශ ප්‍රේෂණ අඩපණ විය. එසේම ඍජු විදේශ ආයෝජන අඩු විය. ඒ නිසාම විදේශ ඉපැයීම් විශාල වශයෙන් අඩු වීම නිසා ඊට සරිලන ආකාරයට ආනයන විශාල වශයෙන් අඩු කිරීමට පියවර ගත්තේය. මේ වන විට දළ වශයෙන් විදේශ විනිමය අනුපාතිකය එක්සත් ජනපද ඩොලර් 1කට ගෙවිය යුතු ශ්‍රී ලංකා මුදල් ප්‍රමාණය රුපියල් 194 ක මට්ටමකට ඉහළ ගොස් ඇත. එසේ තිබියදී ශ්‍රී ලංකාව ඉන්දියාව සමඟ ඇති කර ගත් විදේශ විනිමය හුවමාරු ගිවිසුම (SWAP ගනුදෙනුව) යටතේ ඉන්දියාවෙන් ගත් ඩොලර් මිලියන 400 ක මුදල නියමිත දිනයට බේරුම් කොට ශ්‍රී ලංකාව ණය බේරා දැමීම අකුරටම කිරීම අතින් නමක් දිනාගෙන ඇත.

මේ වර්ෂය (2021) අග වන විට ඇමෙරිකන් ඩොලර් බිලියන 5.9 ක ණය සේවා ගෙවීමට රජයට සිදු වනු ඇත. නමුත් මහ බැංකුව සතුව විදේශ සංචිත ඇත්තේ ඩොලර් බිලියන 5 කි. ශ්‍රී ලංකාව මුහුණ දෙන මෙම බරපතළ ගැටලුවට මුහුණදීමට අවශ්‍ය පියවර ගත යුතුය. මේ සම්බන්ධයෙන් වඩාත් සුබවාදීව කරුණු දැක් වූ ශ්‍රී ලංකා මහ බැංකුව මෑතකදී ප්‍රකාශ කළේ වසර 2020 ලෝක ආර්ථිකය බිඳ වැටීම සමඟ බිඳ වැටුණු ශ්‍රී ලංකා ආර්ථිකය වසර 2021 දී ලෝක ආර්ථිකය ශක්තිමත් වීමත් සමඟ යළි පිබිදෙනු ඇති බවය. ඒ සඳහා කොවිඩ් වයිරසය මැඩලීම සඳහා හඳුන්වා දුන් එන්නත් භාවිතය ශීඝ්‍රයෙන් ලොව පුරා පැතිර යන තත්ත්වයක් තුළ ශ්‍රී ලංකාවේ ජනතාවට ද එය දීමෙන් සෞඛ්‍ය අංශයේ ආරක්ෂිත සහ ඉණදායක තත්ත්වයක් ළඟා කර ගනු ඇත. එවන් සෞඛ්‍ය සම්පන්න ජාතියක් බවට රටේ මානව සම්පත යළි පත් වීමත් සමඟ මෙරට ආර්ථිකයට ද යළිත් හිස එසවීමට හැකියාව ලැබෙන බව අවසාන වශයෙන් සඳහන් කරනු කැමැත්තෙමු.

ජයසිරි මුණසිංහ

> **Covid නිසා ලෝකයේ හැම රටකම කුටුම්භ අංශය දරුණු අර්බුදයකට ලක් විය. සමාජ දුරස්ථභාවය, රැකියාවලට යෑමට අපහසු වීම, පාසල් වසා දැමීම නිසා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාළ වීම, එදිනෙදා ජීවත්වීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා ගැනීමට අපහසු වීම, ගැනීමට හැකි භාණ්ඩ හා සේවාවල මිල ගණන් අධික ලෙස ඉහළ යෑම, ජීවන වියදම වැඩි වී ජනතාවගේ ජීවන තත්ත්වය පිරිහීම එම අංශය මුහුණ දුන් දරුණුතම ගැටලුය.**



කාටවත් හිතුමතේට වනාන්තර එළි කරන්න බැ

වන සංරක්ෂක ජනරාල් කේ. එම්. ඒ. බණ්ඩාර

මේ දිනවල සමාජ මාධ්‍ය හරහා වැඩිපුරම කතා බහ කරන මාතෘකාවක් බවට වන විනාශය පත්ව තිබේ. ඇතමුන් මෙම චෝදනාවට ජනාධිපතිවරයාගේ ගම සමඟ පිළිසඳර ද ඈදාගෙන තිබේ. ශ්‍රී ලංකාවේ වනාන්තර පිළිබඳ දැඩි අවධානයකට ලක්ව ඇති මොහොතක මේ කතා බහ වන සංරක්ෂක ජනරාල් කේ. එම්. ඒ. බණ්ඩාර මහතා සමඟයි.

● ශ්‍රී ලංකාවේ මේ වන විට පවතින වන ආවරණය කොපමණද?

මේ වන විට ශ්‍රී ලංකාව පුරා වන ආවරණය සියයට 29.2ක් තිබෙනවා.

● මේ වන ආවරණය යටතට ගැනෙන්නේ මොන වගේ වනාන්තරද? ඒවා සංරක්ෂණය කෙරෙන්නේ කොහොමද?

ස්වභාවික වනාන්තර ආවරණය තමයි ඒ යටතට ගැනෙන්නේ. ඒවා සංරක්ෂණයට අපට ඉතා හොඳ ජාලයක් හා ක්‍රමවේදයක් පවතිනවා. ඒවා අපි දිස්ත්‍රික්ක මට්ටම, අඩවි මට්ටම, බිට්ටු මට්ටම සහ වන ක්ෂේත්‍ර සහකාර මට්ටම වශයෙන් බෙදාගෙන සංරක්ෂණය කෙරෙනවා. ඊට අමතරව දිස්ත්‍රික්ක මට්ටමෙන් උඩටත් විවිධ තල යටතේ අපි බෙදාගෙන සංරක්ෂණය කරනවා. මෙයින් පහළම මට්ටම ගත්තොත් අපේ එක් නිලධාරියකුට හෙක්ටයාර 2,000ත්, 5,000ත් අතර ප්‍රමාණයක් ලැබෙනවා. වන අවරණය වන සියයට 29.2 සැලකීමේදී හෙක්ටයාර මිලියන 1.3ක් වගේ ප්‍රමාණයක් අපේ වනජීවී දෙපාර්තමේන්තුවෙන් සංරක්ෂණය කෙරෙනවා.

● මෙතරම් වපසරියක් සංරක්ෂණයට වනජීවී දෙපාර්තමේන්තුව සතුව සම්පත් පවතිනවාද?

ඉතා අඩු නිලධාරීන් ප්‍රමාණයක් තමයි ඉන්නෙ. නිලධාරීන් 1,000ක් වගෙයි දැනට අප සතුව සිටින්නේ. එය අපට ගැටලුවක් වුණත් අප එය මඟහරවා ගනිමින් වැඩකටයුතු කරගෙන යනවා.

● අපේ රටේ වනාන්තර වර්ග කිහිපයක් අපි හඳුනාගන්නවා නේද? ඒවායේ වෙනස මොකක්ද?

ඔව්. සංරක්ෂිත වනාන්තර, රක්ෂිත වනාන්තර හා අවශේෂ වනාන්තර වශයෙන් ඒවා බෙදා වර්ග කර දැක්වෙනවා. ඒවා අර අපේ සීමිත නිලධාරීන් යටතේ කාණ්ඩ කරගෙන සංරක්ෂණයට පියවර ගනිමින් ඉන්නවා.

● කොතරම් වන සංරක්ෂණයක් ගැන කතා කළත් හැමදාම අපට තැන් තැන්වල සිදුවන වන විනාශයන් ගැන අහන්න ලැබෙනවා. ඒකට දෙන පිළිතුර මොකක්ද?

ඔය කියන විදියට කැලෑවල වුණත් ගස් ඉවත් කිරීම මහා පරිමාණයෙන් සිදුවන දෙයක් නොවෙයි. කිසිසේත් මහා පරිමාණ වන විනාශයක් සිදු වෙන්නෙ නෑ. ස්වභාවික වනාන්තර කැපීම නම් සිදු වෙන්නේම නෑ. නමුත් මම පිළිගන්නවා යම් මට්ටමක වන විනාශයන් යම් යම් ස්ථානවල යම් යම් කාලවලදී සිදු වන බව. අපේ නිලධාරීන් නිරන්තරයෙන් ක්ෂේත්‍ර චාරිකා කරමින් ක්ෂේත්‍රය ආවරණය කර ගනිමින් සිටිනවා. එකම ප්‍රශ්නය මේ නිලධාරීන් හිඟකම නිසා එක් නිලධාරියෙකුට ආවරණයට ලැබෙන වපසරිය වැඩියි. එතකොට යම් යම් අවස්ථාවල මේ ආකාරයේ ගස් කැපීම් මේ නිලධාරීන්ගේ ඇසට හසු නොවී සිදුවන අවස්ථා තිබෙනවා. ඒ හැර මහා පරිමාණයේ වන විනාශයන් සිදු කරන්න නම් දැන් අපි කොහෙත්ම ඉඩ දෙන්නේ නෑ.

● එවැනි වන විනාශයන් දුටු විට ඔබ ආයතනික මට්ටමින් ගන්නා පියවර මොනවාද?

අනිවාර්යයෙන්ම එවැනි අනවසර වනාන්තර හෙළිපෙහෙළි කිරීමක් හෝ වන විනාශයක් හඳුනා ගත් වහාම අප නීතිය තදින් ක්‍රියාත්මක කරනවා. යම් ආකාරයක වන අපරාධයක් වුණොත් අපේ වන ආඥා පනතට අනුව කටයුතු කරමින් නීතියට පමුණුවලා දඬුවම් දීමට කටයුතු කරනවා. වන ආඥා පනතෙ එවැනි දඬුවම් ප්‍රමාණයක් සටහන්ව තිබෙනවා. ඒ වගේම අපේ සීමාව යටතේ දඬුවම් පමුණුවන්නත් පියවර ගන්නවා. ඒ වගේම මේ අනවසර කැපීම් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන අතරේ අපේ නිලධාරීන්වත්, ප්‍රජාවත් දැනුම්වත් කරමින් එවැනි විනාශයක් දුටු තැන දන්වන්න සහ ක්‍රියාත්මක වෙන්නත් ක්‍රමවේදයක් මේ වන විට සකස් කර තිබෙනවා. ඒ ක්‍රමය අපට සම්පූර්ණ වනාන්තර ආවරණය වන පරිදි ක්‍රියාත්මක කළ හැකිව තිබෙන නිසා වන විනාශයන් ඉක්මනින් හඳුනාගෙන ඒ විනාශකාරීන්ව නීතිය හමුවට ගෙන ඒම පහසු වී තිබෙනවා.

● හැමදාමත් වන විනාශයන්ට දඬුවම් දීම පමණයි සිදු වෙන්නෙ. මේ විනාශයන් වෙන්න කළින් වළක්වා ගන්න පියවර ගන්න බැරිද?

අප ඒ සඳහා ගෙන ඇති ප්‍රධාන ක්‍රියා මාර්ගය තමයි වන නිලධාරීන් ඒ ඒ තනතුරු අනුව එක් එක් ප්‍රදේශවලට අනුයුක්ත කිරීම. ඔවුන් නිරන්තරයෙන් මුර සංචාර කරමින් ඒ ප්‍රදේශ බලා ගැනීම සිදු කළ යුතුයි. එක කෙරෙන්නෙ නීත්‍යනුකූලව. ඊට අමතරව අප මේ නිලධාරීන්ට වසරක, දෙවසරක ආදී වශයෙන් නිත්‍ය පාඨමාලා ලබා දෙමින් වනාන්තර සංරක්ෂණය සහ වන විද්‍යාව ආශ්‍රිත දැනුම ලබා දීම සිදු කරනවා. මේ දැනුම්වත් කිරීම හරහා අප වෙන් කරගෙන තිබෙන විශේෂ දුරකථන අංකවලට ඒ තොරතුරු ක්ෂණිකව ලැබෙනවා. මේ ක්‍රියාමාර්ගය හරහා පෙරට වඩා ඉක්මනින් වන විනාශයන් සිදු වීමට පෙර ඒ පිළිබඳ තොරතුරු අපට ලබා ගැනීමට හැකියාව ලැබෙනවා. ඒ තොරතුරු ලැබුණු වහා අපි ක්‍රියාත්මක වෙනවා. නමුත් එතැනදීත් මේ නිලධාරී හිඟය හා තිබෙන භෞතික සම්පත්වල හිඟකම හේතුවෙන් ඇතැම් විනාශයන් සිදු වීමට පෙර නවතා ගැනීම මඟ හැරී තිබෙන බව අපි පිළිගන්නවා.

● මේ දේවල්වලට වනජීවී දෙපාර්තමේන්තුවට අමතර සහාය වෙන්නෙ කවුද?

අපට මේ සඳහා පොලිසිය, හමුදාව ලබා දෙන සහාය ඉතා වටිනවා. උදාහරණයක් විදියට ගුවන් හමුදාව ඔවුන්ගේ ඩ්‍රෝන කැමරා ආශ්‍රයෙන් ලබා දෙන තොරතුරු අපට ක්ෂණිකව ක්‍රියාත්මක වීමට විශාල සහායක් ලබා දෙනවා. මොකද ඉතා විශාල කැලෑ ආවරණය අපේ නිලධාරීන්ට තනිව සිදු කිරීම අපහසුයි. එහිදී තමයි යම් යම් මඟහැරීම් සිදු වන්නේ. නමුත් ගුවන් හමුදාවෙන් ඒ ලැබෙන සහාය නිසා අපට ඒ ගැටලුවට යම්තාක් දුරකට විසඳුම් සොයා ගත හැකිව තිබෙනවා.

● විශේෂ කාර්ය බලකායේ දිගු දුර විහිදුම් බලකායකුත් අලුතින් ස්ථාපිත කරන්න යෝජනා වී තිබෙනවා යටතේත්, පෞද්ගලික අංශයෙනුත් කරනවා. ඒ සඳහා අපේ දෙපාර්තමේන්තුවෙන් සහාය දෙනවා. ඒවාට මුදල් ලැබෙනවා. වනාන්තරයක නම් ඒ පරිනත බවට ආවට පස්සෙ අපි ඒ ගස් හඳුනාගෙන අස්වැන්න ගැනීම සිදු කරනවා. එය බොහෝ දුරට සිදු වන්නේ දැව සංස්ථාව මඟිනුයි. අප දෙපාර්තතමේන්තුවට ඒ ගස්වල වට ප්‍රමාණය මැනලා ඒ අනුව ගෙවීම් සිදු කිරීමට දැව සංස්ථාව පියවර ගන්නවා. වනාන්තර කපා වගා කිරීම හිතුමනාපයට සිදු කරන්න දෙන්නෙ නෑ. එසේ අනවසරයෙන් යමක් සිදු වුණොත් අපි අනිවාර්යයෙන් දඬුවම් ලබා දෙනවා.

● මේ වන සම්පත සුරකින්න. ඒ පිළිබඳ ඔබ මොකද හිතන්නෙ?

ඔවුන් කොහොමත් අපට කළින් ඉඳන්ම සහාය දුන්නා. ඔය කියන විදියේ ශක්තිමත් වැඩපිළිවෙළක් පිළිබඳවත් දැනට සාකච්ඡා මට්ටමේ සිටිනවා. ඔවුන් කළිනුත් ගිහින් එවැනි විනාශයන් හඳුනාගෙන අපව දැනුම්වත් කර ඒවා වළක්වන්න විශාල සහායක් ලබා දී තිබෙනවා. ඒ තත්ත්වය වැඩිදියුණු කිරීමට තමයි මේ යෝජනා වී තිබෙන්නේ. එය අපට විශාල ශක්තියක්.

● වගා කටයුතු වෙනුවෙන් තමන් සිටින ප්‍රදේශය අවට භූමි හෙළි පෙහෙළි කර ගන්න ජනාධිපතිවරයාත් ගොවින්ට යම් සහනයක් දුන්නා. ඒ දේවල් සිදුවන්නේ මොන වගේ සීමාවන් යටතේද?

එහිදීත් කිසිසේත් ස්වභාවික වනාන්තර කැපීම හෝ හෙළිපෙහෙළි කිරීම සිදු වන්නේ නෑ. දැව අස්වැන්නක් හෝ වෙනත් අස්වැන්නක් ස්වභාවික වනාන්තරවලින් කිසිම විදියකට ගන්න බෑ කියන එක රජයේ නීතියක්. ඊට අවසර දීමක් සිදු වුණොත් නෑ. ඒවායින් අස්වැන්න ගැනීම කිසිසේත් සිදු වන්නේ නෑ. නමුත් වන වගාවන් සඳහා තෝරා ගත් ප්‍රදේශ තිබෙනවා. ඒවායේ වවන්නෙත් වානිජ වන වගා ව්‍යාපෘති යටතේයි. එතකොට ඒවායේ වගා කරලා, අස්වැන්න ලබාගෙන නැවත වැවීම සිදු කරනවා. ඒවා අපේ දෙපාර්තමේන්තුව නිරන්තර නිරීක්ෂණයට ලක් වෙනවා. කවදාවත් ඒ දඬුවම් පැහැර හරින්න වරදකරුවන්ට බුරුලක් ලැබෙන්නේ නෑ. බොහෝ වෙලාවට සාක්ෂි මෙහෙයවන්නෙත් අපේ නිලධාරීන්මයි. අධිකරණයේ වැරදිකරුවකු වුණොත් ඒ වරදට දෙන දඬුවම හරියට ක්‍රියාත්මක වෙනවාද යන්න නිසි පරිදි සොයා බලනවා.

● ඔබ මේ ධුරයේ වැඩ භාර ගැනීමෙන් අනතුරුව ආයතනික වශයෙන් හඳුනාගත් ගැටලු මොනවාද?

වන සංරක්ෂණයේ දී මම හඳුනාගත් විශාලම ගැටලුව තමයි ක්ෂේත්‍ර නිලධාරීන්ගේ අඩුකම. පුරප්පාඩුත් විශාල සංඛ්‍යාවක් පවතිනවා. ඒ වගේම වාහන වැනි භෞතික සම්පත් හිඟයත් තදින්ම දැනෙන දෙයක්. නිලධාරීන්ට තවදුරටත් සේවාස්ථ පුහුණු ලබා දිය යුතු බවත් මම හඳුනාගෙන තිබෙනවා. අර කළින් කියපු ජාලය හරහා සංරක්ෂණ කටයුතු සිදු කරන අතරේ දෙපාර්තමේන්තුව විදියට හදිසි වැටලීම් අංශයකුත් ක්‍රියාත්මක කර තිබෙනවා. එයත් කඩිනමින්ම තවදුරටත් ශක්තිමක් කළ යුතුයි. ඒ ගැන සාකච්ඡා මේ වන විටත් පැවැත්වෙනවා. ඒ සමඟම ක්ෂේත්‍ර මට්ටමේ අධීක්ෂණ ග්‍රාමීය මට්ටමේ කාර්යාල හරහා සිදු කිරීමටත් අවධානය යොමුව තිබෙනවා. එතකොට අනවසර වන විනාශයන් හඳුනා ගැනීම පහසුයි. ඒ වගේම මේ නිලධාරීන් 24 පැයේම සේවයක යෙදෙන අය. ඒ අයගේ ගෙවීම් ශක්තිමත් කරන්නත්, ඔවුන්ගේ සුබසාධන කටයුතු වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කරන්නත් බලාපොරොත්තු වෙනවා. ඒ විතරක් නෙවෙයි යම් වන විනාශයක් සිදු වුණොත් පොලිසිය වැටලීමකට යන විදියට අපේ නිලධාරීන්වත් එක් ස්ථානයක සිට කණ්ඩායමක් වශයෙන් ඒවාට යැවීමේ ක්‍රමවේදයකුත් සකස් විය යුතුයි.

● මේ සඳහා තාක්ෂණික සහාය ලබා ගැනීම අපහසුද?

ඒකත් දැනට ආරම්භ කර තිබෙනවා. ජීපීඑස් තාක්ෂණය ඔස්සේ වන විනාශයන් හඳුනාගෙන ඒවා වැළැක්වීමත් අප සිදු කරනවා. ඒ වගේම 'Globle Watch'කියලා මෘදුකාංගයක් අප සකස් කර තිබෙනවා. එයින් යම් ප්‍රදේශයක වනාන්තරයේ වෙනසක් සිදු වුණත් අපට හඳුනා ගන්න පුළුවන්. ඒවා කඩිනමින් ක්ෂේත්‍රයට යවන්නත් උත්සාහ කරමින් සිටිනවා.

● වන විනාශයන් සම්බන්ධයෙන් දැනට පවතින නීති මොනවාද?

කළින් කිව්වා වගේ වගේ අප වනාන්තර ප්‍රධාන කොටස් 4කට බෙදාගෙන තිබෙනවානෙ. ඒ වනාන්තර වර්ගවල කළ හැකි හා නොකළ යුතු දේ පැහැදිලිව දක්වා තිබෙනවා. උදාහරණයක් විදියට සංරක්ෂිත වනාන්තරයක කළ හැකි වන්නේ ඇතුළුවීම, නැරඹීම හා පර්යේෂණ කටයුතු සිදු කිරීම පමණයි. ඉන් පිට කිසිවක් කරන්න බෑ. පැළැටියක් කැපුවත්, ගවයෙක් ඇතුළු කළත්, බිත්තරයක් ගත්තත්, ගින්නක් ඇති කළත් දඬුවම් ලැබෙනවා. හැබැයි රක්ෂික වනාන්තරවල වල වන සංරක්ෂක ජනරාල්ගේ අනුමැතිය යටතේ යම් යම් දේ සිදු කළ හැකියි. අනෙක් වනාන්තරවලත් එසේමයි. ඊට පරිභාහිරව නොකළ යුතු ක්‍රියා කළොත් ඒ සඳහා වන ආඥා පනතේ පරිදි දඬුවම් දෙනවා. මූල්‍යමය හා සිර දඬුවම් වශයෙන්. මේක හරි ප්‍රබල ආඥා පනතක්.

● මේවාට රජයෙන් ලැබෙන සහාය මොනවගේද?

රජය පැත්තෙන් යම් යම් නිලධාරීන් ලබා දෙමින්, උදාහරණයක් විදියට ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරීන්, හමුදා නිලධාරීන්, පොලීසිය වගේ ආයතන හරහා නිලධාරීන් දෙමින් අපට විශාල සහායක් දෙනවා. ඒ වගේම වැටුප් ඇතුළු ප්‍රතිපාදන ලබා දීමත් සිදු කරනවා. රජය දෙන සහාය නිසා අපේ කාර්යයයන් පහසු වී තිබෙනවා.

කිසිසේත් මහා පරිමාණ වන විනාශයක් සිදු වෙන්නෙ නෑ.

නිලධාරී හිඟය, තිබෙන භෞතික සම්පත්වල හිඟකම නිසා ඇතැම් විනාශයන් මඟහැරී තිබෙනවා

වනාන්තර කපා වගා කිරීම හිතුමනාපයට සිදු කරන්න දෙන්නෙ නෑ.

24 පැයේ සේවයේ යෙදෙන නිලධාරීන්ගේ ගෙවීම් ශක්තිමත් කරනවා

රජය දෙන සහාය නිසා අපේ කාර්යයයන් පහසු වී තිබෙනවා

අපට ඉතා හොඳ ජාලයක් හා ක්‍රමවේදයක් පවතිනවා.

යාන් ඔය කතා වස්තුව!

අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මායිමේ පිහිටි යාන් ඔය උතුරු පළාත දක්වාම ගොවිතැනටත් ජනතාවටත් පිරිසුදු පානීය ජලයත් සැපයෙන මහා වාරි ව්‍යාපෘතියකි. ඉකුත්දා එහි නිමිනවාසීන්ට තවත් සෙතක් අත් විය.

ඒ අක්කර 500ක් රසායනික ද්‍රව්‍යයක් හෝ එවැනි කිසිම පළිබෝධ නාශකයක් යොදා නොගෙන වගා කළ යුතු බවට නැඟෙනහිර පළාත් ආණ්ඩුකාර කාර්යාලය මගින් තීරණය කිරීමෙනි. එම පළාතේ සහකාර ගොවිජන කොමසාරිස් වරුණි සරවානන්දන් මහත්මිය ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මියට කළ විශේෂ යෝජනාවකට අනුව එම තහනම පැනවිණි.

පෙර විවිධත්වය ආරක්ෂා කර ගනිමින් පරිසර හිතකාමී ගොවිතැනක් කරා රටක් වශයෙන් යෙදෙන ගමනට ඉතා වටිනා ආදර්ශයක් වශයෙන් නැඟෙනහිර පළාතෙන් ගනු ලැබූ මේ තීරණය විද්වතුන්ගේ ඇගැයීමට ලක් වන්නකි.දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් මෙරට විශිෂ්ට වාරි ඉංජිනේරුවරුන්ගේ අධීක්ෂණය යටතේ ගොඩනැංවූ යාන් ඔය අක්කර අඩි 140,000 කින් යුතු මෙරට වියළි කලාපයට දායාද වූ මහඟු සම්පතකි.

මේ සඳහා රුපියල් මිලියන 36,850ක් වෙන් කෙරුණේ ඉඩම් පවරා ගැනීම්වලට වන්දි සඳහා රුපියල් මිලියන 6000ක්ද ඇතුළුවය. සින්නක්කර ඔප්පු අහිමි පදිංචිකරුවන් කෙරෙහිද මානුෂිකව සළකා බලමින් ඉහළ වන්දි මුදලක් රජය මගින් ගෙවීමෙන් ඔවුන්ගේ දිවිපෙවෙත ඉහළ නැංවිණි. ඊට අමතරව මේ හරහා සිදුවූ සංවර්ධනය හේතුවෙන් අමතර ආදායම් මාර්ග රැසක් ජනතාවට හිමිව තිබේ.

අපේ මේ සූදානම ඒ නිමිත්ත ඔස්සේ යාන් ඔයේ තවත් ඈතට සංචාරයක යෙදෙන්නටය. ඉඳින්, ඒ උපදින්නේ සීගිරියෙනි. යකල්ලදී හුරුළු වැවට මුහුවන ඒ දිය දහර එතැනින් පහළට ලැසි ගමනින් ගලා එන්නේ මහසොරොව්ව, පඹුරුගස්වැව ආදී ගම්දනව් පසු කරමිනි.

නොවැම්බරයේදීත් දෙසැම්බර් මාසයේදීත් දෙගොඩතළා වාන් දමනා යාන් ඔය පෙබරවාරියේදීත් අගෝස්තුවේදීත් ඉරි තළා වියළේ. 1940 සිටම එය එසේය. ගොවිතැන්බත් එක් කන්නයකට පමණක් සීමා කරන්නට ගොවින්ට සිදු වූයේ එහෙයිනි.

එහෙත් 2018 නොවැම්බර් පළමුවැනිදායින් ඒ යුගය නිමා විය. ඒ 2013 වර්ෂයේදී මුලපිරූ මේ මහා ව්‍යාපෘතිය එදින ජනතාවට තිළිණ වූ හෙයිනි. ඊට මාසයකට පසුව ඇද හැළුණු අනෝරා වැසි හමුවේ යාන් ඔය වාන් දමන්නට වූයේ ගොවි නෙතේ සතුටු කඳුළු නංවමිනි.

යාන් ඔය තවත් එක් වාරි ව්‍යාපෘතියක් නොවූ තවත් කරුණු වේ. එය සහජීවනයට අලුතින් තවත් නව අරුතක් එක් කෙරුණකි. සැබැවින්ම මෙරට සහජීවනයට ඉන් ලැබෙන පන්නරය අපමණය.

යාන් ඔයේ දකුණු ඇළෙහි මුල් කිලෝමීටර් 8ක් දිවෙන්නේ මහ වන රොද මැදිනි. ඒ වෙනුවෙන් කපා බිම හෙලූ ගස් වෙනුවෙන් අලුතින් කුඹුක් සහ මී ගස් සිටුවමින් සොබාදහමට කෘතගුණ දැක්වීමක් වනු ඇත. නීලපනික්කන්කුලම සහ මහඇලන්කුලම වැව්වලට දිය පුරවමිනි. ඒ අවට වෙසෙන්නෝ දෙමළ ජාතික ගොවිහු ය.

වකුගඩු රෝගය තදින් පැතිරෙන හොරොව්පොතාන මැදිකර ගත් මෙයින් වාහල්කඩ, කැබිතිගොල්ලෑව සහ පදවිය ආදී ගම්මානවල ජනතාවගේ කෙත්වතුවලට දිය සැපයෙන්නේ පැන් පවස නිවන පිරිසුදු දිය දෝතක් බවටද පත් වෙමිනි.

එපමණක් නොවේ. ගොවිතැනින් බඩවියත රැක ගන්නා මුස්ලිම් ජාතික ගොවි ගෙවිලියන් කරා යාන් ඔයේ අමුණින් හැරවෙන ජලයෙන් ඒ අවට අක්කර 1500ක් පමණ ගොවිබිම් සරු කර ගනිති.

දෙනෝදාහකගේ සුබසිද්ධිය වෙනුවෙන් යාන්ඔය ව්‍යාපෘතිය දියත් කෙරුණේ වනසතුන්ගේ ඇතැම් වාසභූමි අත්පත් කර ගනිමිනි. එහෙත් ඉන් සතුන්ට අවැඩක් නොවන්නට වාරි ව්‍යාපෘතියේ කළමනාකාරිත්වය වග බලාගනු ලැබීය.

මොරගහකන්ද - කළු ගඟ ව්‍යාපෘතියේදී සතුන්ගේ දිවි ගැලවීමේ යෙදුණු වනජීවියේ අත්දැකීම් බහුල කණ්ඩායම්වල සහාය යාන් ඔයටද ලැබිණ. වළස්සු රිලවි සහ වඳුරන් වාසභූමිවලින් සුරක්ෂිතව ඉවත් කරන්නට මේ කර්තව්‍යයේ නිරත පිරිසට විශාල කාලයක් මිඩංගු වූ බව මේ ව්‍යාපෘතිය භාර ජ්‍යෙෂ්ඨ වාරි ඉංජිනේරු උදය හේමකුමාර මහතා පවසයි.

එයිනුත් නිම නොවන යාන් ඔයේ කතාව මෙරට සංචාරක කර්මාන්තයටත් නව මානයක් විවර කරන්නකි. ඒ සිරියාව හැන්දැකරේ යාන්ඔයේ ත්‍රිකුණාමලය දෙසට වන්නට නිදහසේ සැරිසරන 250ක් පමණ වන අලි ඇතුන්ගෙන් මෙන්ම ඔබමොබ සැරිසරනා මුව පොව්වන් සේම අනේකවිධ කුරුලු රෑන් කියාපායි.

නුවන් මහේෂ් ජයවික්‍රම

චාමිකා මුණසිංහ

දේශපාලන පළි ගැනීම් විමර්ශන කොමිෂන් වාර්තාවේ පිටපතක් ලැබුණේ නෑ

ලක්ෂ්මන් කිරිඇල්ල

පහන් විජේසේකර

දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කළ ජනපති කොමිෂන් සභා වාර්තාවේ පිටපතක් ලබා දෙන්නැයි ඉකුත් ජනවාරි 28 දා කථානායකවරයාගෙන් ඉල්ලීමක් කළ ද එහි පිටපතක් තවම ලැබී නැතැයි විපක්ෂයේ ප්‍රධාන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ප්‍රකාශ කළේ ය.

එම කොමිෂන් සභා වාර්තාව අනුව යම් යම් නීති කඩ කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රජා අයිතීන් අහෝසි කිරීමට සූදානමක් පවතින බව සඳහන් කළ හෙතෙම කවුරුන් හෝ වැරදි වැඩ කර ඇත්නම් දඬුවම් දිය යුතු බව ද පෙන්වා දුන්නේ ය.

පළි ගැනීමට ලක් වූ අය සම්බන්ධයෙන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා යහපාලන රජය සමයේදීත් යෝජනා ලැබුණු නමුත්, ඒවා ප්‍රතික්ෂේප කරමින් ඒ පිළිබඳ සොයා බැලීමට පොලීසියට හා අධිකරණයට භාර දුන් බව ද ඔහු වැඩිදුරටත් කීවේය.

විදේශීය මුදල් මෙරටට අද්දන්න විශේෂ තැන්පත් ගිණුම්වලට ඉඩ

පාර්ලිමේන්තුවේ අනුමැතියට යවයි

බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි

විදේශීය මුදල් මෙරටට ප්‍රේෂණය කිරීම උනන්දු කරවීම සඳහා 'විශේෂ තැන්පත් ගිණුම්' විවෘත කිරීමට ඉඩ දී ඇති කාල සීමාව 2020 ඔක්තෝබර් 08 වැනි දින සිට මාස 06ක කාලයක් සඳහා දීර්ඝ කිරීමට විදේශ විනිමය පනත යටතේ නිකුත් කර ඇති අංක 2202/07 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් නිකුත් කර ඇති නියෝග පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට රජය තීරණය කරයි.

මුදල් විෂය භාර ඇමැතිවරයා වශයෙන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යෝජනාවට ඇමැති මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.

විදේශීය මුදල් මෙරටට ප්‍රේෂණය කිරීම උනන්දු කරවීම සඳහා 'විශේෂ තැන්පත් ගිණුම්' විවෘත කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර, එම ගිණුම්වල පවතින තැන්පතු තවදුරටත් රඳවාගැනීම සඳහා අතිරේක පොළියක් ගෙවීම සඳහා ද මීට පෙර ඇමැති මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි.

ඒ අනුව, විශේෂ තැන්පත් ගිණුම් විවෘත කිරීමට ඉඩ දී ඇති කාල සීමාව 2020 ඔක්තෝබර් මස 08 දින සිට තවත් මාස 06ක කාලයක් සඳහා දීර්ඝ කිරීම සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020-11-17 දිනැති අංක 2202/07 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් නියෝග නිකුත් කර ඇත.

එකී නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට මුදල් විෂය භාර ඇමැතිවරයා වශයෙන් ඇමැති මහින්ද රාජපක්ෂ මහතා අදාළ යෝජනාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබේ.

1 පිටුවෙන් ...

විදෙස් සංචාරකයන්ට ...

ඒ අනුව මෙරටට පැමිණෙන විදෙස් සංචාරකයන්ට පනවා ඇති ඇතැම් දැඩි රෙගුලාසි කිහිපයක් ලිහිල් කිරීම කෙරෙහි මේ වනවිට රජයේ අවධානය යොමුව තිබෙන අතර ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ නිර්දේශ ලබා ගනිමින් රෙගුලාසි ලිහිල් කිරීමට හැකි බවට හඳුනාගෙන ඇති බව සංචාරක අමාත්‍යාංශයේ ලේකම් එස්. හෙට්ටිආරච්චි මහතා පවසයි.

සංචාරක නියමු ව්‍යාපෘතියේ දී හඳුනාගත් ඇතැම් ගැටළුවලට විසඳුම් ලබා ගෙන ඇති බව පෙන්වාදෙන ලේකම්වරයා නියමු ව්‍යාපෘතිය ජනවාරි මාසයේ 31 දක්වා ක්‍රියාත්මක කළ බවද එහිදී යුක්රේන ජාතිකයන් වෙනුවෙන් පමණක් නොව වෙනත් රටවල සිට ද මෙරටට සංචාරකයින් පැමිණි බවද පෙන්වාදෙයි.

පවතින අඩුපාඩු මොනවාද යන්න සම්බන්ධයෙන් එහිදී අවධානය යොමුකළ බව සඳහන් කරන ලේකම්වරයා එම අඩුපාඩු සඳහා අවශ්‍ය පිළියම් යොදන්න ද හැකියාව ලැබුණු බව කියාසිටී. විශේෂයෙන් මුහුදු වෙරළ තීරයේ සිටින හෝටල්වල සිට මහනුවර තිබෙන හෝටලයක් කරා යනවිට ඔවුන්ට වැසිකිළි යාමට හෝ තේ පානය කිරීමට ඉඩ ලබාදිය යුතු බව පෙන්වාදෙන ඒ මහතා එහිදී සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර තීරණයක් ගත් බවද පවසයි.

ඔවුන් ගමන් කරනු ලබන මාර්ගය අනුව යම් ස්ථානයක් තෝරා ගෙන ප්‍රදේශයේ සෞඛ්‍ය බලධාරීන් සමඟ සාකච්ඡා කොට අවශ්‍ය පහසුකම් සැපයීමට එහිදී තීරණය කළ බවද එස්. හෙට්ටිආරච්චි මහතා සඳහන් කරයි.

මේ අතර සංචාරක අමාත්‍යාංශයේ ලේකම් එස්. හෙට්ටිආරච්චි මහතා පැවසුවේ සංචාරකයන් රැඳී සිටින හෝටල්වල සේවකයන් නිරෝධායනය වියයුතු කාල සීමාව සම්බන්ධයෙන් ද අවධානය යොමුව ඇති බවයි. එබැවින් කිසියම් හෝටලයක රැඳී සිටින සංචාරකයන්ට කොරෝනා වයිරසය ආසාදනය වී නොමැති නම් එම සංචාරකයන් හෝටලයෙන් පිටව ගොස් තවත් දින 14ක් හෝටල් සේවකයන් එම හෝටලයේම නිරෝධායනය වියයුතු බවට ඇති රෙගුලාසි ලිහිල් කිරීම කෙරෙහි ද අවධානය යොමුව ඇති බව හෙතෙම කියාසිටී.

මේ අතර තමන් සමග පැමිණෙන කුඩා දරුවන්ගේ PCR පරීක්ෂණ සිදුනොකරන ලෙසට මෙරටට පැමිණෙන සංචාරකයන් ඉල්ලා සිටි බව සඳහන් කළ ලේකම්වරයා තමන්ව PCR පරීක්ෂණ සඳහා ලක්වන බැවින් එහිදී තම දරුවන්ව පරීක්ෂා කිරීම අවශ්‍ය නොවන බවට සංචාරකයන් පෙන්වාදුන් බවද ඒ අනුව වයස අවුරුදු 12 ට අඩු දරුවන්ගේ PCR පරීක්ෂණ සිදුනොකරන්න තීරණය කළ බව ද කියාසිටී.

කොවිඩ් එන්නත්කරණ වැඩපිළිවෙළ ආරම්භ කිරීමත් සමග විදේශීය සංචාරකයන් වැඩි වශයෙන් මෙරටට ගෙන්වා ගැනීමට හැකිවනු ඇති බවට හෙතෙම විශ්වාසය පළකරයි.

පාස්කු ඉරිදා ...

මෙය දැවැන්ත වාර්තාවක් බවත්, එම පිටපත් කැබිනට් මණ්ඩලයට අවශ්‍ය ප්‍රමාණය සකස් කිරීම මේවන විට සිදු කරන බවත්, එය අවසන් වූ වහාම එම විශේෂ කැබිනට් මණ්ඩල සාකච්ඡාව පැවැත්වීමට අපේක්ෂිත බවත් ඇමැතිවරයා කියයි.

මෙම වාර්තාව ඇමැති මණ්ඩලයට ලබා දී තීන්දු කළ පසු එම වාර්තාවේ පිටපත් පාර්ලිමේන්තුවට ලබා දෙන අතර එයට සමගාමීව නීතිපතිවරයාටත්, අවශ්‍ය නම් කාදිනල් තුමන්ටත්ලබා දීමට කටයුතු කරන බව ද ඇමැතිවරයා අවධාරණය කරයි.

ඊයේ (16) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේනත්තුවේ පැවැති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී, ජනාධිපතිතුමන් මෙවර කැබිනට් රැස්වීමේදී 'පාස්කු කොමිසම සම්බන්ධයෙන් කිසිවක් ප්‍රකාශ කළ නොහැකිය' යනුවෙන් ප්‍රකාශයක් කළේ දැයි මාධ්‍යවේදියකු නැඟූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා පැවැසුවේ ජනාධිපතිතුමන් එවැනි ප්‍රකාශයක් කිසිවිටෙකත් සිදු නොකළ බවයි.

මේ සම්බන්ධයෙන් පෙරේදා(15) දිනයේ කැබිනට් රැස්වීමේදී දී අමාත්‍ය විමල් වීරවංශ මහතා ජනාධිපතිතුමාගෙන් විමසුවේ, පාස්කු ප්‍රහාරය සම්බන්ධ කොමිසමේ වාර්තාව පිළිබඳ විශේෂ කැබිනට් සාකච්ඡාවක් පැවැත්වෙන දිනය ගැන බවත් ඒ සඳහා ජනාධිපතිතුමන් මෙම පිළිතුරු ලබා දුන් බවත් ගම්මන්පිල මහතා වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

නීරෝගී සංවර්ධිත ...

මහවැලි ජලය වයඹට රැගෙන එන මෙම දැවැන්ත වාරි ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කිරීම සංකේතවත් කරමින් මහකිරුළ හා මහකිතුළ ජලාශ ඉදිකිරීමේ සමරු ඵලකය රාජපක්ෂ මහතාගේ සුරතින් නිරාවරණය විය.

රෝගී වුණු ලෝකයක් මැද නීරෝගී සංවර්ධනයක් වුණු රටක් හදාගැනීම සිය රජයේ බලාපොරොත්තුව බව අගමැතිවරයා මෙහිදී කියා සිටියේය.

අපි ලෝකයේ දරුණුතම ත්‍රස්තවාදයට එරෙහිව යුද්ධ කළත් රටේ සංවර්ධන කටයුතු එක මොහොතකට අතහැරියේ නැහැ. යුද්ධය කරනකොටත් රටේ සංවර්ධනය අපි කරගෙන ගියා. නැගෙනහිර බේරගෙන උතුරට හමුදා මෙහෙය වනකොට නැගෙනහිර පළාත වේගයෙන් සංවර්ධනය කළා. උතුරේ යුද්ධය නිමා කරලා ඒ රණවිරුවන් දකුණට ආවේ සංවර්ධනය කරපු, ගොඩනගපු පළාත් හරහා බව රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේය.

වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය යටතේ කිලෝමීටර් 90ක් දිග ඇළ මාර්ගයක්, මීටර් 25ක් පමණ උසැති වැව් බැම් සහිත මහකිරුළ සහ මහකිතුළ ජලාශ දෙකක්, උමං ජල මාර්ග පහක් මගින් ගලේවෙල, පොල්පිතිගම, මහව සහ ඇහැටුවැව යන ප්‍රදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිතව පවතින මහා වැව් හතකට හා කුඩා වැව් 350කට දෙකන්නයේම වගා කිරීම සඳහා අවශ්‍ය ජලය 2024 වර්ෂය වන විට ලබාදීමට අපේක්ෂිතය.

ව්‍යාපෘතියේ වාර්ෂිකව ජලය අක්කර අඩි 105,000ක් පමණ කුරුණෑගල දිස්ත්‍රික්කයේ උතුරු ප්‍රදේශයට හරවා යල-මහ දෙකන්නයේම වගා කටයුතු සඳහා ගොවිබිම් හෙක්ටයාර 13,000කට වාරි ජලය සපයමින් දැනට පවතින වකුගඩු රෝගයට හේතුවන පානීය ජල ගැටලුව අවම කිරීම වෙනුවෙන් වාර්ෂිකව ජලය අක්කර අඩි 8100ක් ද මෙහි ඉලක්ක ප්‍රදේශවලට සපයාදීම සිදු වේ.

වසර 3ක් වැනි කෙටි කාලයක් තුළ වැඩ අවසන් කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් වියදම රුපියල් බිලියන 10.8 කි.

ඇමැතිවරුන් වන චමල් රාජපක්ෂ, ජොන්ස්ටන් ප්‍රනාන්දු, එස්.එම්. චන්ද්‍රසේන, රාජ්‍ය ඇමැතිවරුන් වන අනුරාධ ජයරත්න, සිරිපාල ගම්ලත්, දයාසිරි ජයසේකර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගුණපාල රත්නසේකර, අසංක නවරත්න, ශාන්ත බණ්ඩාර, චරිත හේරත්, යූ.කේ. සුමිත් උඩුකුඹුර, ජයරත්න හේරත්, මංජුලා දිසානායක, වයඹ පළාත් ආණ්ඩුකාර රාජා කොල්ලුරේ මහත්ම මහත්මීන් හා වාරි මාර්ග අමාත්‍යාංශ ලේකම් අනුර දිසානායක මහතා ඇතුළු උසස් රාජ්‍ය නිලධාරීහු ඇතුළු විශාල පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

කසළ මඟින් විදුලිය නිපදවීමේ ...

සෑම දිස්ත්‍රික්කයකටම ප්‍රධාන බලාගාරයක් බැගින් ඉදි කිරීමටත්, ප්‍රශ්නයට විදුලියෙන් විසඳුම් ගෙනෙන බවත් විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා පැවැසී ය.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ස්ථාපිත කෙරෙන කසළ යොදා ගනිමින් විදුලිය නිපදවීමේ පළමු බලාගාරය, හැඳල කෙරවලපිටිය ප්‍රදේශයේදී ජාතික විදුලිබල පද්ධතියට එක් කෙරේ.

මෙම බලාගාරය මගින් දෛනිකව කසළ ටොන් 700 ක් යොදා ගනිමින් මෙගාවොට් 10 ක් නිපදවීමට සැලසුම් කර ඇති අතර ප්‍රදේශයේ ඉවතලන කසළ එක්රැස් කර එමගින් මෙම බලාගාරය ක්‍රියාත්මක කෙරේ.

මේ ආකාරයෙන් සමස්ත දිස්ත්‍රික්කය තුළ එක්රැස් වන කසළ විදුලි උත්පාදනය වෙනුවෙන් යොදාගැනීම, පාරිසරික වශයෙන්ද වැදගත් වන බව ඇමැතිවරයා වැඩිදුරටත් පැවැසී ය. මීට අමතරව දිරාපත්වන කසළ යොදා ගනිමින්, බයෝගෑස් මගින් විදුලිය නිපදවීමේ පළමු ව්‍යාපෘතිය මාතර දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් ආරම්භ කිරීමට ද විදුලිබල අමාත්‍යාංශය සැලසුම් කර ඇත.

මාතර දිස්ත්‍රික්කයේ කොටවිල ඉදිවන මෙම ව්‍යාපෘතිය මගින් දෛනිකව කසළ ටොන් 40 ක් යොදාගනිමින්, කිලෝවොට් 400 ක් ජාතික පද්ධතියට එක්කිරීමට සැලසුම් කර ඇති අතර, මේ වසරේ ඔක්තෝම්බර් මස වන විට මෙම ව්‍යාපෘතිය සක්‍රීය තත්ත්වයට පත් කරමින් ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීමට බලාපොරොත්තු වේ.

ගෝලීය පරිවර්තනයන් ...

ජනාධිපතිවරයා මේ බව සඳහන් කළේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ඊයේ (16) පැවැති ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය උපාධි ප්‍රදානෝත්සවයට එක්වෙමිනි. මෙම උපාධි ප්‍රදානෝත්සවයේ දී දර්ශන ආචාර්ය උපාධි 05ක්, පශ්චාත් උපාධි හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා 263 ක්, ප්‍රථම උපාධි 1111 ක් ප්‍රදානය කෙරිණි.

ආරක්ෂක අධ්‍යයන විෂය, කළමනාකරණ, ව්‍යාපාර කළමනාකරණය, නීති, වෛද්‍ය, ඉංජිනේරු, ප්‍රවර්ධන කළමනාකරණ, කාර්මික විද්‍යා, සමාජ විද්‍යාව, හමුදා විෂයයන් සහ ගුවන් සේවා අධ්‍යයනය සඳහා වූ ආචාර්ය උපාධි, පශ්චාත් උපාධි සහ උපාධි මෙහිදී ප්‍රදානය කිරීම සිදුවිය.

එහිදී වැඩිදුරටත් අදහස් පළකරමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පෙන්වා දුන්නේ ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය කෙටිකාලයක් තුළ ඉහළ සුදුසුකම් සපුරන පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත්වීම පිළිබඳ සිය ප්‍රශංසාව පළකරන බවත් වෛද්‍ය, ඉංජිනේරු, නීති වැනි විෂය ක්ෂේත්‍රවල විශිෂ්ටයන් බිහිකිරීමට සමත්වීම විශ්වවිද්‍යාලයේ ව්‍යාප්තියට හේතු වූ බවත්ය. අවම වශයෙන් පරිගණක හැසිරවීම සඳහා අවශ්‍ය විෂය දැනුම තිබීම සාර්ථක අනාගතයක් ගොඩනැගීමට ඉවහල් වනු ඇතැයි ද සඳහන් කළ ජනාධිපතිවරයා අධ්‍යයන ක්ෂේත්‍රය කුමක්වුවත් සියලු සිසුන්ට තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව හඳුන්වාදෙන ලෙස සියලු විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන්ගෙන් ජනාධිපතිවරයා ඉල්ලීමක් කළේය.

සෑම විශ්වවිද්‍යාලයකම පාලක මණ්ඩලයට, උපකුලපතිට, පීඨ සහ කාර්ය මණ්ඩලවලට ඔවුන්ගේ අධ්‍යයන වැඩසටහන් තීරණය කිරීමට, සැලසුම් කිරීමට හා කළමනාකරණයට අවශ්‍ය නිදහස තිබිය යුතු අතර ඔවුන්ට තම ආයතන තුළ ඉගෙනීමට සුදුසු ශිෂ්‍යයන් තෝරා ගැනීමට ද නිදහස තිබිය යුතු යැයි පැවසූ ජනාධිපතිවරයා සියලු දෙනා එක්ව කැපවුවහොත් ලෝකය වේගවත් වෙනස්කම්වලට භාජනය වුවද අපේ විශ්වවිද්‍යාල ගෝලීය වශයෙන් තරගකාරී ආයතන බවට පත්කර ගතහැකි බවත්, ඉන් තරුණ තරුණියන්ගේ අනාගත අභිවෘද්ධිය සලසමින් රටේ ආර්ථිකය ද ශක්තිමත් කළහැකි බවත් කීවේය.

මෙම උපාධි ප්‍රදානෝත්සවයේ දී අංක 33 හි දක්ෂතම යුද හමුදා නිලධාරියා වශයෙන් දෙවන ලුතිනන් ආර්.එම්.ටී.පී රත්නායක, දක්ෂතම නාවික හමුදා නිලධාරියා වශයෙන් උප ලුතිනන් වී.එස් පලිහවඩන, දක්ෂතම ගුවන් හමුදා නිලධාරියා වශයෙන් පියාසර නිලධාරි ආර්.ජී.එස්. ගමගේ සහ 2020 වසරේ අතිශූර නිලධාරියා වශයෙන් දෙවන ලුතිනන් ආර්.එම්.ටී.පී. රත්නායක සම්මාන හිමිකර ගත්හ.

පාර්ලිමේන්තු මන්ත්‍රී යදාමිණී ගුණවර්ධන, ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න, අගමැති ආර්යා ශිරන්ති රාජපක්ෂ, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කුලපති ජෙනරාල් හෙක්ටර් ද සිල්වා, යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා, නාවික හමුදාපති අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න, ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ, පොලිස්පති චන්දන වික්‍රමරත්න, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උප කුලපති මේජර් ජෙනරාල් මිලින්ද පීරිස්, නියෝජ්‍ය උප කුලපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්. චන්ද්‍රසිරි මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

භාරතීය ජනතා පක්ෂය ...

භාරතීය ජනතා පක්ෂයේ සභාපති අමිත් ෂා මෙවැනි ප්‍රකාශයක් කළ බවට නිශ්චිත සාක්ෂියක් ලැබී නොමැති බවද, ඉන්දීය මාධ්‍ය වාර්තා කර ඇත්තේ ඔහු එවැනි ප්‍රකාශයක් කළ බවට ත්‍රිපුර මහ ඇමැතිවරයා පැවසූ බව යැයිද කී ඇමැතිවරයා, එබැවින් 'එයා මෙහෙම කිව්වා ලු' යනුවෙන් 'ලු' භාෂාවෙන් කී කතාවක් සම්බන්ධයෙන් ආණ්ඩුවේ නිල මතය ප්‍රකාශ කළ නොහැකි බවද ඇමැතිවරයා කියයි.

ඇමැති උදය ගම්මන්පිල මහතා මේ බව පැවසුවේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (16) පැවති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදීන් මේ සම්බන්ධයෙන් මතු කරන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමිනි.

කෙසේ වෙතත් මෙරට දේශප්‍රේමී ජනතාව විදේශීය පක්ෂයකට මෙරට දේශපාලනය කිරීම හරහා බලය අත්පත් කර ගැනීමට ඉඩ ලබා දෙනු ඇතැයි තමන් විශ්වාස නොකරන බවද ඇමැවරයා කීය.

එහිදී මාධ්‍යවේදීන් මතුකරන ලද ප්‍රශ්නවලට ඇමැතිවරයා මෙසේ පිළිතුරු දුන්නේය.

මාධ්‍යවේදියා- ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂයේ ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයකු වන අමිත් ෂා පවසා තිබෙනවා, භාරතීය ජනතා පක්ෂයේ දේශපාලන කටයුතු ශ්‍රී ලංකාවේ සහ නේපාලයේ කළ යුතුයි කියලා. ඒ අනුව 20 වන සංශෝධනය යටතේ ද්විත්ව පුරවැසියන්ට අවස්ථාව දී තිබෙනවා නේද දේශපාලනය කරන්න?

ඇමැති උදය ගම්මන්පිල මහතා-

භාරතීය ජනතා පක්ෂයේ සභාපති අමිත් ෂා එවැනි ප්‍රකාශයක් කළ බවට නිශ්චිත සාක්ෂියක් නෑ. ඔහු විසින් ආහාර ගන්නා අවස්ථාවකදී එවැනි ප්‍රකාශයක් කළ බවට ත්‍රිපුර මහ ඇමැතිවරයා තමයි ප්‍රකාශ කර තිබෙන්නේ. ඒ නිසා අමිත් ෂා එවැනි ප්‍රකාශයක් කිරීම පිළිබඳ වීඩියෝ පටයක් හෝ ඔහු එවැනි ප්‍රකාශයක් කළ බවට නිවේදනයක් හෝ තවම මාධ්‍යවලට ලැබී නෑ. මෙයා මෙවැනි ප්‍රකාශයක් කළා කියලා තුන්වෙනි පාර්ශ්වයක් විදිහට ත්‍රිපුර මහ ඇමැතිවරයා කළ ප්‍රකාශයක් තමයි ලැබී තිබෙන්නේ.

අපි දන්නවා කාලයක් කොමියුනිස්ට් පක්ෂයේ ශාඛාවන් වෙනත් රටවල පිහිටුවීම සිදුවුණා. භාරතීය ජනතා පක්ෂය ශ්‍රී ලංකාවේ බලය ඇල්ලීමේ අරමුණින්, ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂයක් පිහිටුවීමට ඇත්තටම කටයුතු කරනවාද, එසේ කරනවා කියලා එම පක්ෂය තවම නිල වශයෙන් කියලා නෑ. නිල වශයෙන් එවැනි ස්ථාවරයක සිටියත් මේ රටේ දේශප්‍රේමී ජනතාව විදේශීය පක්ෂයකට මේ රටතුළ දේශපාලනය කිරීම හරහා බලය අත්පත් කර ගැනීමට ඉඩ ලබා දේවි යැයි අපි විශ්වාස කරන්නේ නෑ.

ඒ වගේම, ජනාධිපතිතුමා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ද්විත්ව පුරවැසියන්ට දේශපාලනය කිරීමේ අයිතිය අහිමි කරන බවට පක්ෂ දහයකට පසුගිය සැප්තැම්බර් මසදී ප්‍රතිඥාවක් ලබා දී තිබෙනවා. නව ව්‍යවස්ථාවේ කටයුතු ඉතාම වේගයෙන් සිදුවෙමින් පවතිනවා. ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් තිබෙන නව ව්‍යවස්ථා සම්පාදක කමිටුව මේ දිනවල රටේ දේශපාලන පක්ෂ හමුවෙමින් නව ව්‍යවස්ථාව පිළිබඳ එම පක්ෂවල මතය ලබා ගනිමින්, සාකච්ඡා කරමින් සිටිනවා. ඒ නිසා විශ්වාස කරනවා ජනාධිපතිතුමා ප්‍රතිඥාව ලබා දුන් ආකාරයෙන් ම වසරක් ඇතුළත නව ව්‍යවස්ථාව සම්මත කර ගැනීමට අපට හැකි වේවි කියලා.

මාධ්‍යවේදියා-

ඉන්දියාවේ පුවත්පත්වල සඳහන්ව තිබෙනවා, ඉන්දීය පාලක භාරතීය ජනතා පක්ෂය කියනවා කියලා ශ්‍රී ලංකාවේ පක්ෂයක් ස්ථාපිත කර මැතිවරණයකටත් ඔවුන් ඉදිරිපත් වෙනවා කියලා. ඉන්දීය රජය අපට මේ කරන්නේ බලපෑමක් නෙවෙයි ද? මෙතැන තිබෙන්නේ ජැටියේ ප්‍රශ්නය නේද?

ඇමැති උදය ගම්මන්පිල මහතා-

ඔබ ඔය කරන ප්‍රකාශය කවුද කරලා තිබෙන්නේ? මම ආණ්ඩුවේ මාධ්‍ය ප්‍රකාශක විදිහට හොඳට පර්යේෂණ කරලා තොරතුරු අරගෙන ඇවිත් තමයි ප්‍රකාශ කරන්නේ. මා කියන සෑම වචනයකට මා වගකියනවා. ඒ නිසා ඔබෙන් මම අහනවා අමිත් ෂා කළ ප්‍රකාශයක් ඔබ දැක්කා ද? භාරතීය ජනතා පක්ෂය විසින් කරන ලද ප්‍රකාශයක් ඔබ දැක්කා ද? භාරතීය ජනතා පක්ෂයේ සභාපති අමිත් ෂා විසින් කරන ලද ප්‍රකාශයක් තිබෙනවා නම් මට පෙන්වන්න. එවිට මට ඒ ගැන මතයක් ඉදිරිපත් කරන්න පුළුවන්.

මාධ්‍යවේදියා-

ඉන්දීය රජය මේ ප්‍රකාශය සම්බන්ධයෙන් ඔවුන්ගේ පිළිතුරක් මේ වනතෙක් ලබා දී නෑ. මෙය හිතාමතා කළ ප්‍රකාශයක්ද, සාවද්‍ය ප්‍රකාශක් ද, කැම කනවිට කළ ප්‍රකාශයක් ද කියලා. ඒ අය යම් බලයක් ඇතිව කළ ප්‍රකාශයක් විදිහට තමයි හැඟෙන්නේ. මෙහෙම ගියොත් ඉදිරියේදී පාලන පක්ෂය ඉන්දියාව ගනී. රජයට විපක්ෂයේ ඉන්න වෙයි?

ඇමැති උදය ගම්මන්පිල මහතා-

ඔබම ප්‍රකාශ කළා භාරතීය ජනතා පක්ෂය මේ ගැන කිසි දෙයක් කියලා නෑ කියලා. දැන් ඔබ මට යෝජනා කරන්නේ කටකතාවක් පිළිබඳ ආණ්ඩුවේ නිල මතය කියන්න කියලාද? මම මෙතැන වාඩිවී සිටින්නේ ආණ්ඩුවේ නිල මතය ප්‍රකාශ කරන්න. එවැනි භාරදූර වගකීමක් කටකතා මත කියන්න බෑ. මොන මාධ්‍යයේදී ද අමිත් ෂා එවැනි ප්‍රකාශයක් කළේ කියලා කිව්වොත් එතැනින් එහාට මේ සංවාදය ගෙන යන්න ලේසි වෙනවා. ත්‍රිපුර මහ ඇමැති විසින් කරන ලද ප්‍රකාශයක් තමයි දැනට ඉන්දියානු මාධ්‍ය වාර්තා කර තිබෙන්නේ. 'එයා මෙහෙම කිව්වා ලු' කියලා 'ලු' භාෂාවෙන් ඔහු කියා තිබෙනවා. ආණ්ඩුවේ නිල මතය ප්‍රකාශ කරන්න බෑ කටකතා පිළිබඳ.

මාධ්‍යවේදියා-

'එහෙම වුණොත්' රජයේ ස්ථාවරය කුමක්ද?

ඇමැති උදය ගම්මන්පිල මහතා -

එහෙම වුණොත් රජයේ ස්ථාවරය අනිවාර්යයෙන් කියනවා. එහෙම වෙලා නැනෙ තවම. එහෙම වුණාම එදාට අපි කතා කරමු.

1 පිටුවෙන් ...

හිජාස් හිස්බුල්ලාගේ ...

තමන් තවදුරටත් රඳවා තබා ගැනීමට අදාළව ඉකුත් ජනවාරි මස 11වැනිදා ලබා ගන්නා ලද රැඳවුම් නියෝගය බල රහිත කරන සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ද මෙම පෙත්සම මගින් ඉල්ලා ඇත. සෝභිත රාජකරුණා සහ ධම්මික ගනේපොල යන අභියාචනාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ මෙම පෙත්සම කැඳවනු ලැබිණි . එහිදී නීතිපතිවරයාට වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජෙනරාල් නෙරින් පුල්ලේ මහතා සඳහන් කළේ මෙම පෙත්සම සම්බන්ධයෙන් කරුණු දැක්වීමට පෙර එය අධ්‍යයනය කළ යුතු බව ය. එ බැවින් ඒ සඳහා කල් ලබා දෙන ලෙස ඔහු අධිකරණයෙන් ඉල්ලා සිටියේ ය. එම ඉල්ලීමට අවසර දීම ට අධිකරණය තීරණය කළේය. පොලිස්පතිවරයා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ නීතිපති මෙහි වගඋත්තරකරුවෝ වෙති. පාස්කු දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ බෝම්බ ප්‍රහාරයක් එල්ල මොහොමඩ් ඊබ්‍රාහිම් ඉන්සාෆ් අහමඩ් නමැත්තා සමග සමීප සම්බන්ධතා පැවැත්වීමෙන්

පාස්කු ප්‍රහාරයට සම්බන්ධ බවට සැක පිට පෙත්සම් කරු ඉකුත් 2020 වසරේ අප්‍රේල් මස 14වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගත් බව පෙත්සමෙහි සඳහන් වේ. අධිකරණයට ඉදිරිපත් නොකර දිගින් දිගටම රැඳවුම් නියෝග ලබා ගනිමින් තමා අත්අඩංගුවේ තබා ගැනීමට වගඋත්තරකරුවන් කටයුතු කරන බවට පැමිණිලිකරමින් මෙම පෙත්සම ඉදිරිපත් කර තිබේ. නීතිඥ සනත් විජේවර්ධන මහතාගේ උපදෙස් මත ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටියේය.

කෝටි 10ක හෙරොයින් ...

සැකකරු සන්තකයේ තිබී හෙරොයින් කිලෝ 05 ග්‍රෑම් 125ක් සහ අයිස් කිලෝ 05ග්‍රෑම් 25ක් මුදල් රුපියල් 36,500ක් සැකකරු සන්තකයේ තිබී සංවිධානාත්මක අපරාධ නිවාරණ කොට්ඨාසය බාරයට ගෙන ඇත. නුගේගොඩ ගම්සභා හන්දියේ පිහිටි කාමර හතකින් යුත් නවාතැන් පොළක කළමනාකරුගේ භාරයේ තිබී මෙම මත්ද්‍රව්‍ය සහ මුදල් සොයාගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 29ක තරුණයකු වන අතර මොහුට මෙම මත් කුඩු ලැබුණේ කෙසේද මොහු සංවිධානාත්මක මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු ද නැතහොත් මත්ද්‍රව්‍ය ජාවාරම් ජාලයකට සම්බන්ධ අයකු ද යන්න පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරයි.

මොහු විසින් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් කොතරම් මුදලක් උපයා ගෙන තිබේද එම මුදල් තැන්පත් කර ඇත්තේ කුමන ස්ථානවලද ඔහුට මේ සම්බන්ධයෙන් ආධාර අනුබල දුන්නේ කවුරුන්ද යන්න ගැනද විමර්ශන සිදු කෙරෙමින් පවතී.

සැකකරු සහ මත්ද්‍රව්‍ය තොගය කොළඹ සංවිධානාත්මක අපරාධ නිවාරණ කොට්ඨාසය වෙත රැගෙන විත් වැඩිදුර විමර්ශන සිදු කරයි. සැකකරු ඉදිරියේදී අධිකරණය වෙත ඉදිරිපත් කර දින හතක රැඳවුම් නියෝග ලබාගෙන වැඩිදුරටත් විමර්ශන කිරීමට නියමිත බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පැවසීය.

කොවිඩ් රෝගීන්ට ...

කොවිඩ් රෝගීන්ට ප්‍රතිකාර සඳහා පවතින ඇඳන්වලින් සියයට 17 ක් පමණක් මේ වන විට භාවිතයට ගන්නා බව ද ඇමැතිවරයා කීවාය.

කොවිඩ් - 19 නව වයිරස් ප්‍රභේදය මෙරටින් වාර්තා වුවත් ඒ සම්බන්ධයෙන් ජනතාව අනියත බියක් ඇති කර නොගත යුතු බවත් මෙම වයිරස් ප්‍රභේදය සම්බන්ධයෙන් මෙතෙක් ගැටලුවක් මතුව නොමැති අතර අවශ්‍ය වුවහොත් දැඩි සත්කාර පහසුකම් කළමනාකරණයට හැකි බවත් ඇමැතිවරිය ප්‍රකාශ කළාය.

රෝගීන් වාර්තා වීමේ අවශ්‍යතාව අනුව රෝහල් සූදානම් කරන ආකාරය සම්බන්ධයෙන් සැලසුම් සහගත වැඩපිළිවෙළක් රජය සතු වන්නේ යැයි ද ඇමැතිවරිය පැවසුවාය.

එජාප මන්ත්‍රීධුරය ...

එහිදී ගාල්ල නියෝජ්‍ය නගරාධිපති ෆවුසුල් නියාස් මහතා මෙම යෝජනාව ඉදිරිපත් කරන ලද අතර ජීලිත් නිශාන්ත මහතා සම්මත කිරීමෙන් පසු සභාවේ සියලු දෙනාම අත ඔසවා ඒකමතිකව සම්මත කරන ලදී. මෙම රැස්වීමට එ.ජා.ප.සභාපති වජිර අබේවර්ධන නියොජ්‍ය නායක රුවන් විජේවර්ධන, මහලේකම් පාලිත රංගේ බණ්ඩාර, සමන් රත්නප්‍රිය, ආනන්ද කුලරත්න මහත්වරු න්ද ශාන්තිනී කෝන්ගහගේ මහත්මිය, අශෝක ධනවංශ, සංජීව් කරුණාතිලක මහත්වරුන් සහ එ.ජා.ප. ආසන ප්‍රධාන සංවිධායකවරු සහ ගාල්ල මහා නගර සභා ප්‍රාදේශීය සභා මන්ත්‍රී මන්ත්‍රිනී කණ්ඩායම සහභාගී වූහ .

මුහුද රළු ...

එහෙයින් ධීවර සහ නාවුක ප්‍රජාව මෙන්ම වෙරළාසන්නයේ ජීවත්වන ජනතාව මේ පිළිබඳ සැලකිලිමත් වන ලෙස දෙපාර්තමේන්තුව ඉල්ලා සිටී. ඒ පිළිබඳව අවවාදාත්මක නිවේදනයක් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඊයේ (16) පෙරවරු 9.00ට නිකුත් කළ අතර අද පස්වරුව දක්වා එම තත්ත්වය පැවැතිය හැකිබව එම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශකයෙකු පැවසීය.

දෙපාර්තමේන්තුව තවදුරටත් ප්‍රකාශ කරනුයේ, ඉහත මුහුදු ප්‍රදේශවල මුහුදු රළ මීටර් දෙකක් හෝ දෙකයි දශම පහක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතින බවයි. එහෙත් එම රළ එතරම් උසකින් ගොඩබිමට නොපැමිණෙනු ඇති බවද මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැකි බවද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

මාධ්‍යවේදීන්ට කොවිඩ් ...

ජනතාව සමග නිරන්තරයෙන් කටයුතු කරන මාධ්‍යවේදීන් එන්නත් කිරීම සිදු කළ යුතු බව කියා සිටි විශේෂඥ වෛද්‍යවරයා කොවිඩ් ව්‍යාප්තිය පාලනය සහ ඉන් වැළකී සිටීමට ගත යුතු ක්‍රියාමාර්ග ජනගත කිරීමේ කටයුත්ත මාධ්‍ය විසින් සිදු කළේ අභියෝගාත්මක තත්ත්වය සිට බව ද කියා සිටියේය.

ඇණවුම් කළ එන්නත දෙවන කොටස මෙරටට පැමිණි පසුව ලබා දිය යුතු පිරිස් මේ වනවිට සකස් කර අවසන් බවත් ඉන් ප්‍රමුඛතාවයන් අනුව එම එන්නත්කරණය සිදු කරන බව ද ඒ මහතා දිනමිණ සිදු කළ විමසීමකට පිළිතුරු දෙමින් ඒ මහතා වැඩිදුරටත් කියා සිටියේය.

චන්නට රෝෂාන්ට ...

සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය යළි සේවයට වාර්තා කරනතෙක් සෞඛ්‍ය ඇමැතිධූරයෙහි වැඩ බැලීම සඳහා මහාචාර්ය චන්න ජයසුමන මහතා පත්කර තිබෙන අතර ඒ අනුව වැඩබලන ඇමතිවරයා ඊයේ (16) පෙරවරුවේ ජනාධිපති කාර්යාලයේ දී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරියේ දිවුරුම් දුන්නේය. චන්න ජයසුමන මහතා ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය ඇමැතිවරයා වශයෙන් ද කටයුතු කරයි.

මේ අතර රොෂාන් රණසිංහ මහතා පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය ඇමැතිධූරයට පත්කර තිබෙන අතර ඒ මහතා මීට පෙර ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර, ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය ඇමැතිධූරය හෙබවීය.

රොෂාන් රණසිංහ මහතා ද ඊයේ පෙරවරුවේ ජනාධිපති කාර්යාලයේ දී ජනාධිපතිවරයා ඉදිරියේ නව රාජ්‍ය ඇමැතිධූරයේ දිවුරුම් දුන්නේය.

NiSACO 011-2744444 බොරැල්ල පාර, අතුරුගිරිය. ෆැක්ස් - 011-2560535
www.nisaco.lk E-mail- nisacofurniture@gmail.com සියලුම ප්‍රදර්ශනාගාර සෑම දිනකම විවෘතයි
කළුබෝවිල | නුගේගොඩ | පන්නිපිටිය | නාරාහේන්පිට | විද්‍යාල හන්දිය

සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

තනතුරු ඇබෑර්තු

"කළමනාකරණ සහකාර" - (තාක්ෂණ) සේවා ගණය පුස්තකාලයාධිපති තනතුර සඳහා බඳවාගැනීමට අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා විනිශ්වයකාරවරයන්ගේ ආයතනයේ "කළමනාකරණ සහකාර" - (තාක්ෂණ) සේවා ගණය පුස්තකාලයාධිපති තනතුර (01) සඳහා බඳවාගැනීම පිණිස ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා www.judgesinstitute.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත්‍ර 2021.03.25 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් පමණක් මතු සඳහන් ලිපිනයට එවිය යුතුය.

අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය,
අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12.

ගොවි සෙත

නිල ප්‍රතිඵල

දිනුම් වාරය	2694	දිනුම් අදින ලද දිනය	2021 / 02 / 15

ඉංග්‍රීසි අක්ෂරය	ජයග්‍රාහී අංක			
L	11	29	38	59

	සංයෝගය	තෑගි මුදල	ජයග්‍රාහකයන් ගණන
1 ත්‍යාගය	අංක 4 ම නිවැරදි	රු. 1,000,000.00	01
2 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමග අංක 3 ක් නිවැරදි	රු. 100,000.00	07
3 ත්‍යාගය	අංක 3 ක් පමණක් නිවැරදි	රු. 2,000.00	187
4 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමග අංක 2 ක් නිවැරදි	රු. 1,000.00	403
5 ත්‍යාගය	අංක 2 ක් පමණක් නිවැරදි	රු. 100.00	10119
6 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමග අංක 1 ක් නිවැරදි	රු. 40.00	6704
7 ත්‍යාගය	අංක 1 ක් පමණක් නිවැරදි	රු. 20.00	165805
8 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි	රු. 20.00	30362

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන **213,588**

මෙවර දිනා ඇති මුළු තෑගි මුදල
රු. **7,680,400.00**

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය
රු. **63,690,686.00**

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6කෙ කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 ට වැඩි ත්‍යාග රජයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

ඔබ සොයන වාහනය තෝරාගන්න බලන්න
දිනමිණ වටපිට
කල් දුරින් - කල් කරන්න

රැකියා ඇබෑර්තු

තනතුරු පුරප්පාඩු

සීමාසහිත ගම්පොල විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මධ්‍යම සමුපකාර සේවක කොමිෂන් සභාවේ අංක 02/2019 චක්‍රලේඛ අනුව මූලික සුදුසුකම් සපුරා ඇති සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) - II හා I තනතුරු සඳහා මධ්‍යම පළාත තුළත්, අභ්‍යන්තර විගණක II හා I තනතුරු සඳහා මහනුවර දිස්ත්‍රික්කය තුළත් ස්ථිර පදිංචිය ඇති වයස අවුරුදු 18 – 45 අතර අයවලුන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ. (දැනට සමුපකාර සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව බලපානු නොලැබේ)

සියලුම අයදුම්කරුවන් 2021.03.08 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **ගරු සභාපති, සී/ස ගම්පොල විවිධ සේවා සමුපකාර සමිතිය, 1/78, නුවර පාර, ගම්පොල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැකි අතර, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුයි.

මූලික සුදුසුකම්, සියලු විස්තර සමිති කාර්යාලයෙන් හෝ ආසන්න විවිධ සේවා සමුපකාර සමිතියකින් ලබාගත හැකිය.

01. සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) - II හා I
වැටුප් පරිමාණ අංකය - එස්.ඊ.එම්.එල්. 02 : 01
වැටුප් පරිමාණය - 22,000-470x10-570x10-720x10 = 39,600/-

02. අභ්‍යන්තර විගණක II හා I
වැටුප් පරිමාණ අංකය - එස්.ඊ.එම්.එල්. 02 : 05
වැටුප් පරිමාණය - 19,600-450x10-550x10-700x10 = 36,600/-

මෙයට අමතරව සියලුම තනතුරු සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් අනුමත දීමනා හා විශ්‍රාම දයකත්වය වැටුප් හිමිකම්ද ලබා දෙනු ඇත. සියලුම අයදුම්කරුවන් සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතික, උප්පැන්න සහතිකය, සේවා සහතිකය හා අනෙකුත් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතු අතර, ප්‍රමාද වී ලැබෙන හා අසම්පූර්ණ ඉල්ලුම්පත් නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙයට,
සභාපති.

ගරු සභාපති,
සී/ස ගම්පොල විවිධ සේවා සමුපකාර සමිතිය,
1/78, නුවර පාර, ගම්පොල.

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය

රත්මලාන / මොරටුව අපජල බැහැර කරලීමේ ව්‍යාපෘතිය - පියවර 2 - අදියර 1

ඇබෑර්තු

(ව්‍යාපෘති කොන්ත්‍රාත් පදනමින්)

රත්මලාන / මොරටුව අපජල බැහැර කරලීමේ ව්‍යාපෘතිය – පියවර 2 – අදියර 1 හි පවත්නා පහත සඳහන් ඇබෑර්තුව පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සහිත අය විය යුතුය.

ජ්‍යෙෂ්ඨ සමාජ විද්‍යාඥ තනතුර - (තනතුරු 01)

වැටුප් ක්ෂේතය : PS 3

ව්‍යාපෘති වර්ගීකරණය : ඇමරිකන් ඩොලර් මිලියන 100 ට වැඩි හා ඇමරිකන් ඩොලර් මිලියන 250 ට අඩු

සුදුසුකම් හා පළපුරුද්ද : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ විශේෂ ප්‍රථම උපාධියක්,

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්,

හෝ

පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,

සහ

ජල හා සනීපාරක්ෂක අංශයේ, ජ්‍යෙෂ්ඨ තලයේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද. මලාපවහන ව්‍යාපෘතිවල / යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ප්‍රජා ඒකරාශි කිරීම් ක්‍රියාකරකම්වල පළපුරුද්ද සහිත අයවලුන්හට ප්‍රමුඛතාව හිමිවේ.

පොදු කොන්දේසි :

වයස් සීමාව :

අයදුම්පත් භාර ගැනීම අවසන් කරනු ලබන දිනය වන විට වයස අවුරුදු 64 ට අඩුවිය යුතුය.

සේවා නියමයන් හා කොන්දේසි :

අදාළ පත්කිරීම්, මූලිකව, කොන්ත්‍රාත් පදනමින් එක් වසරක් සඳහා වන අතර, සතුටුදයක කාර්ය සාධන අගැයුම් මත වාර්ෂිකව අලුත් කළ හැක. අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි සඳහන් කොන්දේසි මෙම පත් කිරීමට අදාළවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, එහිදී දක්වනු ලබන කාර්ය සාධනය මත තෝරා ගැනීම සිදු කෙරේ.

සම්පූර්ණ ජීවදත්ත ඇතුළත් අයදුම්පත්, සියලුම අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම්වල හා පෙර පළපුරුද්ද ආදිය සම්බන්ධව සහතිකවල පිටපත් සමග, ලියාපදිංචි තැපැලෙන්, පහත සඳහන් ලිපිනය වෙත 2021 මාර්තු 10 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. රජයේ / ආයතනික අංශ සංවිධානවල අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ.

ව්‍යාපෘති අධ්‍යක්ෂ,
රත්මලාන / මොරටුව අපජල බැහැර කරලීමේ ව්‍යාපෘතිය,
පියවර 2 - අදියර 1,
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
අංක 213ඒ, ටෙම්ප්ලර්ස් පාර, ගල්කිස්ස.
දිනය : 2021.02.15

2021-02-15 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු ත්‍යාග ලාභීන් සංඛ්‍යාව 768,100

ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල 32,419,120.00

රු. 2,000,000.00 ත්‍යාග 02 රු. 1,000,000.00 ත්‍යාග 02 රු. 100,000.00 ත්‍යාග 28

www.nlb.lk

වාසනා සම්පත

வாசனா சம்பத Vasana Sampatha
එදත් අදත් සුරයා

නිල ප්‍රතිඵල

දිනුම් වාරය	1667
දිනය	2021.02.15

Z	04	31	42	81

Prize	Prize Structure	Prize Money	No. of Winners
01 Prize	අංක 4 පමණක් ගැළපේ නම්	500,000/-	-
02 Prize	අංක 3ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	100,000/-	02
03 Prize	අංක 3ක් පමණක් ගැළපේ නම්	1,000/-	52
04 Prize	අංක 2ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	200/-	193
05 Prize	අංක 2ක් පමණක් ගැළපේ නම්	100/-	4,455
06 Prize	අංක 1ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	40/-	3,639
07 Prize	අංක 1ක් පමණක් ගැළපේ නම්	20/-	91,421
08 Prize	ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම්	20/-	20,958

මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල
රු. **3,129,240.00**

මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය
රු. **26,815,860.30**

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
32, දේශමාන්‍ය N.W.J. මුදලිගේ මාවත, කොළඹ 01.

රුපියල් ලක්ෂ 5 ට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6කෙ කාල සීමාවකට පමණි.

මෙගා පවර්

ත්‍රිපල් ජෝවුන් Mega POWER மெகா பவர்

දිනුම් වාරය 766

නිල ප්‍රතිඵල

දිනය: 2021.02.15

ඔබේ දිනුමට ඔබේ විශ්වාසය

ඉංග්‍රීසි අකුර | සුපිරි අංකය | ජයග්‍රාහී අංක

I	04	21	40	43	59

	ත්‍යාග රටාව	ත්‍යාග මුදල රු.	ජයග්‍රාහකයන් සංඛ්‍යාව
1 වන ත්‍යාගය	අංක 4 ක් පමණක් ගැළපේ නම්	1,000,000.00	-
2 වන ත්‍යාගය	අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	100,000.00	05
3 වන ත්‍යාගය	අංක 3 ක් පමණක් ගැළපේ නම්	1,000.00	90
4 වන ත්‍යාගය	අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	500.00	225
5 වන ත්‍යාගය	අංක 2 ක් පමණක් ගැළපේ නම්	100.00	5101
6 වන ත්‍යාගය	අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	40.00	3368
7 වන ත්‍යාගය	අංක 1 ක් පමණක් ගැළපේ නම්	20.00	84384
8 වන ත්‍යාගය	ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම්	20.00	15316

ලංකාවේ විශාලතම සුපිරි ත්‍යාගය පිරිනමනු ලොතරැයියේ...

මීළඟ මෙගා සුපිරි ත්‍යාගය
රු. **116,414,995.60**

මීළඟ පවර් සුපිරි ත්‍යාගය	මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය
රු. 20,938,204.80	රු. 32,869,777.60

දිනා ඇති මුළු මුදල
රු. **3,341,320.00**

- රු. ලක්ෂ 5 වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

මහජන සම්පත

දිනුම් වාරය - 4399 නිල ප්‍රතිඵල

දිනය: 2021-02-15

ජයග්‍රාහී අක්ෂරය	ජයග්‍රාහී අංක					
V	9	8	0	1	8	6

ත්‍යාග රටාව - අග සිට මුලට

	රටාව	ත්‍යාගය	ජයග්‍රාහකයන් ගණන
1 වැනි ත්‍යාගය	9 8 0 1 8 6	රු. 2,000,000/-	02
2 වැනි ත්‍යාගය	8 0 1 8 6	රු. 100,000/-	12
3 වැනි ත්‍යාගය	0 1 8 6	රු. 10,000/-	126
4 වැනි ත්‍යාගය	1 8 6	රු. 1,000/-	1,286
5 වැනි ත්‍යාගය	8 6	රු. 100/-	12,816
6 වැනි ත්‍යාගය	6	රු. 20/-	127,183

ත්‍යාග රටාව - මුල සිට අගට

	රටාව	ත්‍යාගය	ජයග්‍රාහකයන් ගණන
7 වැනි ත්‍යාගය	9 8 0 1 8	රු. 10,000/-	11
8 වැනි ත්‍යාගය	9 8 0 1	රු. 1,000/-	127
9 වැනි ත්‍යාගය	9 8 0	රු. 100/-	1,261
10 වැනි ත්‍යාගය	9 8	රු. 50/-	12,790
11 වැනි ත්‍යාගය	V	රු. 20/-	50,828

දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු. 13,590,420.00

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිටමාස 06ක කාලසීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය
රු. **17,427,824.00**

ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk

ධන නිධානය

නිල ප්‍රතිඵල

දිනය - 2021/02/15
දිනුම් වාරය - 436

ඉංග්‍රීසි අක්ෂරය	ජයග්‍රාහී අංක			
B	28	31	33	43

	සංයෝග	තෑගි	ජයග්‍රාහකයන් ගණන
1 ත්‍යාගය	අංක 04 ගැලපේ නම්	රු. 1,000,000.00	01
2 ත්‍යාගය	අංක 3 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම්	රු. 100,000.00	02
3 ත්‍යාගය	අංක 3 ක් ගැලපේ නම්	රු. 3,000.00	94
4 ත්‍යාගය	අංක 2 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම්	රු. 1,000.00	243
5 ත්‍යාගය	අංක 2 ක් ගැලපේ නම්	රු. 100.00	5,423
6 ත්‍යාගය	අංක 1 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම්	රු. 60.00	3,712
7 ත්‍යාගය	අංක 1 ක් ගැලපේ නම්	රු. 20.00	91,983
8 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම්	රු. 20.00	17,403

දිනා ඇති මුළු ත්‍යාග මුදල රු 4,677,740.00
බිහිවූ මුළු ජයග්‍රාහකයන් ගණන 118,861

මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය
රු. **82,172,814.40**

- රු. ලක්ෂ 5 ට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන 011 460 7000 011 232 4324



පුද්ගලයන්ගේ කායික, මානසික සුවය සඳහා වූ දෙදිනක නේවාසික භාවනා වැඩසටහනක් පසුගිය 12 සහ 13 වැනිදා පොල්ගස්ඕවිට, රිලාවල, ශ්‍රී සුසීමාරාම විහාරස්ථානයේ දී එහි විහාරාධිපති සේදවත්තේ පඤ්ඤාවාස හිමිගේ අනුශාසකත්වයෙන් පැවැත්විණි.

නිරෝධායන නීතිරීති අනුගමනය කරමින් පැවැත් වූ මෙම වැඩසටහන සුජාත පුත්‍ර ජාත්‍යන්තර විපස්සනා භාවනා මධ්‍යස්ථානාධිපති, අභිධර්ම විශාරද, ත්‍රිපිටකාචාර්ය, කම්මට්ඨානාචාර්ය, සිත හදන මග සංවිධානයේ අනුශාසක කිරුළපන ධම්මවිජය හිමි මෙහෙය වූහ.

නැගෙනහිරට අලිවැට පුහුණු කිරීමේ බළකායක්

මහින්ද අලුත්ගෙදර

අලි - මිනිස් ගැටුම පාලනය කර, මිනිස් ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම සඳහා ඉදිකරන අලි වැට ආරක්ෂා කිරීම වෙනුවෙන් "අලිවැට පුහුණු කිරීමේ බළකායක්" නැගෙනහිර පළාත තුළ ස්ථාපනය කිරීමට පියවර ගෙන තිබේ.

ඒ සඳහා වන මූලික සාකච්ඡාවක් පසුගියදා සංරක්ෂණ පර්යේෂණ ආයතනයේ ආචාර්ය පෘතිවිරාජ් ප්‍රනාන්දු මහතා ඇතුළු පිරිසකගේ සහභාගීත්වයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පැවැත්විණි. මේ සඳහා දිස්ත්‍රික්කය නියෝජනය කරන සියලු ප්‍රාදේශීය ලේකම්වරුන් එක්ව සිටියහ.

විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරමින් ඉදිකරන මෙම අලිවැට නිසිලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් අලි - මිනිස් ගැටුම උත්සන්න වීමට හේතුව බව සංරක්ෂණ පර්යේෂණ ආයතනයේ මතය වී තිබේ. ඊට අමතරව විදුලි වැට නිසියාකාරයෙන් ඉදි නොකිරීම ද මේ සඳහා හේතුවක් වී ඇත. මීට පිළියමක් ලෙස අලිවැට ආරක්ෂා කිරීමේ විශේෂ බළකායක් ප්‍රාදේශීය මට්ටමින් ඇති කිරීමට සංරක්ෂණ පර්යේෂණ ආයතනයේ මැදිහත් වීම මත නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මිය පියවර ගෙන තිබේ.

මෙම බළකාය සඳහා ගොවි සම්මති නියෝජිතයෙක්, සිවිල් ආරක්ෂක බළකායෙන් සාමාජිකයන් දෙදෙනකු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල නියෝජිතයකු, ග්‍රාම නිලධාරී සහ වනජීවී දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරියකු පත් කර ඇත. එම බළකායේ අධීක්ෂණ කටයුතු සිදුවන්නේ අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහායි.

නැගෙනහිර පළාතේ ස්ථාපනය කර ඇති එම අලිවැට පුහුණු කිරීමේ බලකාය සඳහා ලබාදෙන විශේෂ පුහුණුව ලබන මාර්තු මස 2 සහ 3 යන දිනවල කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සහ කුඹුරුපිටිය අලිවැට පරිශ්‍රයේ දී ආචාර්ය පෘතිවිරාජ් ප්‍රනාන්දු මහතා සිදු කිරීමට නියමිතය.

දෙවැනි සහ තුන්වෙනි අදියර යටතේ මෙම බළකාය අම්පාර සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල ද ස්ථාපනය කිරීමට ආණ්ඩුකාරවරිය උපදෙස් දී තිබෙන අතර, මේ අවස්ථාවට ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් සමන් දර්ශන පාඩිකෝරාල සහ ආණ්ඩුකාර ලේකම් එල්.පී. මදනායක මහත්වරු ද එක්ව සිටියහ.

සාමාන්‍ය පෙළ සිසුන්ට අද සිට අධ්‍යයන නිවාඩු

සිතාරා සේනානි

ලබන මාර්තු මස අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින සිසුන් වෙනුවෙන් අද (17) සිට 25 වැනිදා දක්වා අධ්‍යයන නිවාඩු ලබාදීමට පියවර ගන්නා ලෙස අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතා සියලුම පළාත්, කලාප, කොට්ඨාස අධ්‍යාපන බලධාරීන්, පරිවේණාධිපතිවරුන් හා විදුහල්පතිවරුන් වෙත උපදෙස් දී තිබේ.

එමෙන්ම, විභාගයට පෙනී සිටින සිසුන් සඳහා විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේදී අධ්‍යයන නිවාඩු ලබාදීම බාධාවක් කර නොගත යුතු බවද ලේකම්වරයා වැඩි දුරටත් දන්වා තිබේ.

පසුගිය වසරේ දෙසැම්බර් මස පැවැත්වීමට නියමිතව තිබූ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය මේ වසරේ මාර්තු 1 සිට 10 වැනිදා තෙක් පැවැත්වීමට නියමිතය.

පාසල්වල සියලු උත්සව යළි දන්වන තුරු අත්හිටුවයි

සිතාරා සේනානි

පාසල්වල සියලු ආකාරයේ උත්සව පැවැත්වීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවන ලෙස අධ්‍යාපන ලේකම්වරයා සියලුම පළාත්, කලාප හා කොට්ඨාස අධ්‍යාපන බලධාරීන්, පරිවේණාධිපතිවරුන් හා විදුහල්පතිවරුන් වෙත දැනුම්දී තිබේ.

කොවිඩ් 19 වසංගත තත්ත්වය මත පවතින අවදානමකාරී හා අනාරක්ෂිත බව නොසලකා ඇතැම් පාසල්වල විවිධ උත්සව පැවැත්වීම හා ඊට අදාළ සංවිධාන කටයුතු සිදු කෙරෙන බවට තොරතුරු වාර්තා වී ඇති බවත්, එළඹ ඇත්තේ දරුවන් ඇතුළු සමස්ත පාසල් ප්‍රජාවගේ සෞඛ්‍යාරක්ෂාව සම්බන්ධයෙන් දැඩි වගකීමෙන් සහ අවධානයෙන් කටයුතු කළ යුතු කාල පරිච්ඡේදයක් බවත්, අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතා අවධාරණය කර සිටී.

ඒ අනුව මෙලෙස පාසල්වල සියලු උත්සව පැවැත්වීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවන ලෙස අධ්‍යාපන ලේකම්වරයා ලිපියක් මඟින් අදාළ අංශ වෙත දැනුම්දී තිබේ.

ඒ අනුව, දැනට යම් පාසලක උත්සව පැවැත්වීම සඳහා කටයුතු සංවිධාන කරමින් පවතී නම් ඒ සියල්ල, ඉදිරියේ සැලසුම්කර ඇති උත්සව ද නැවත දැනුම් දෙන තුරු අත්හිටුවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අධ්‍යාපන ලේකම්වරයා අදාළ ලිපියෙන් වැඩි දුරටත් අවධාරණය කර සිටී.

වි.ජ.මු.

නවමු රස බසක් ඇසුණේ ඔබ — මුවිනි
නියමුවා වුණේ මැති සබයෙහි — නැණිනි
අසමු ඔබ පුවත දුක් බර වූ — හදිනි
විජමු අප අතැර ගියෙ නො සිතූ — ලෙසිනි

පොඩි මිනිහකු ලෙසින් හපුතල් කන්ද — බැස
දැඩි අදිටනින් දුක් කරදර විඳ — වෙහෙස
අඩියෙන් අඩිය නැඟුණේ ඔබ නො සිතූ — ලෙස
මඩියෙන් නො වේ එඩියෙනි ඔබ ලැබුවෙ — යස

ළ-දී නිබඳ බස - රැස - දෙස — තෙරුවනට
නො දී කිසි ඉඩක් බස — කෙලෙසුවනට
වදී ඔබ කියූ බස් වදිනා — තැනට
ඇදී යයි ම-සිත ඔබ කළ — මෙහෙවරට

ජනතා පුතකු රට වෙනුයෙන් කළ — යුත්ත
සනසා දනන් රැකුම යි නො ගෙන ම — පැත්ත
දිනවූ මෙහෙවරින් හැම දන හද — ගත්ත
පින - පව හැඳින ඔබ එය කළ බව — ඇත්ත

කුමරතුඹු මඟට දී පණ — හැම දා ම
පවුර බිඳ බෙදන මිනිසා — වනසා ම
පවර කළ මෙහෙය දක්නෙමු — මතු කෝම
අතැර ඔබ ගියා හිරු බැස යන — සේ ම

තිරිකුණාමලේ ආනන්ද මහනාහිමි

සීතාවක ප්‍රාදේශීය සභාව - හංවැල්ල

ටෙන්ඩර් දැන්වීම හා උපලේඛනය

සීතාවක ප්‍රාදේශීය සභාව සතු දේපළ 2021.03.02 සිට 2021.12.31 කාලයට අදලව බදු දීම සඳහා 2021.01.08 දින දිනමිණ සහ තිතකරන් පුවත්පත්වල පළවූ කොන්දේසි සහ නියමයන්ට යටත්ව පහත සඳහන් දේපළ සඳහා ටෙන්ඩර් කැඳවනු ලබයි.

අ.අ.	ව්‍යාපාරයේ නම	ටෙන්ඩර් ඇප මුදල රුපියල්	ටෙන්ඩර් පෝරම ගාස්තු රුපියල්	අවම ටෙන්ඩර් මුදල
01	**පාදුක්ක නව වෙළඳපල මාළු කඩ අංක 01** (කොන්දේසි - මාළු අපද්‍රව්‍ය බදුකරු විසින් බැහැර කළ යුතුයි. ජල හා විදුලි බිල්පත් බදුකරු විසින් පියවිය යුතුය. බදුකරු විසින් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අපද්‍රව්‍ය බහාලුම් ගලියක් සීතාවක ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ සකස් කර පවත්වාගෙන යා යුතුය)	15,000.00	500.00	66,350.00
02	**පාදුක්ක උෂ්ණ මස් කඩය** (කොන්දේසි - බදුකරු විසින් ජල හා විදුලි බිල්පත් පියවිය යුතුය. බදුකරු විසින් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අපද්‍රව්‍ය බහාලුම් ගලියක් සීතාවක ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ සකස් කර පවත්වාගෙන යා යුතුය. විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මස් පසු දින අලෙවි කිරීම නොකළ යුතුය.)	100,000.00	1,500.00	743,300.00

ටෙන්ඩර්පත් නිකුත් කිරීම - 2021.02.25 දින ප.ව. 3.00 දක්වා
ටෙන්ඩර්පත් භාර ගැනීම - 2021.03.01 දින පෙ.ව. 10.00 දක්වා
ටෙන්ඩර්පත් විවෘත කිරීම - 2021.03.01 දින ටෙන්ඩර්පත් භාරගෙන අවසන් වූ වහාම

2021.02.12 වන දින
ප්‍රධාන කාර්යාලයේදීය.

ජී. ජයන්ත රෝහණ
සභාපති, සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.

ප්‍රසම්පාදන දැන්වීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා භාණ්ඩ ප්‍රසම්පාදනය

1. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් භාණ්ඩ සඳහා යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටිනු ලැබේ.

අනු අංකය	ටෙන්ඩර් අනන්‍යතා අංකය	විස්තරය	ලංසු අවසන්වන / විවෘත කරන දිනය සහ වේලාව	නැවත නොගෙවනු ලබන ලංසු ගාස්තුව (රු.)
01	AHQ/21/PUB/CLO/1002	ගුවන් හමුදා ගුවන් භටයන් සහ ගුවන් කාන්තාවන් සඳහා ශාරීරික අභ්‍යාස පාවහන් මිළ දී ගැනීම (Jogging Shoes)	2021 මාර්තු 8, පැය 1030	24,000.00

2. ලංසු කැඳවීම ජාතික තරඟකාරීත්ව ලංසු (NCB) පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.

3. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වෙබ් අඩවිය වන **www.airforce.lk** වෙතින් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය පරීක්ෂා කළ හැකි අතර **2021 පෙබරවාරි 15 සිට 2021 මාර්තු 05 තෙක් පැය 10.00 සිට පැය 14.00 දක්වා** සෑම වැඩ කරන දිනකම කොළඹ, ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ සරප් වෙත නැවත නොගෙවනු ලබන ගාස්තුව ගෙවා එය මිලදී ගත හැකිය. ගෙවීම් රිසිට්පත නොමැති ඉදිරිපත් කිරීම්වලදී ලංසු පිළිගනු නොලැබේ.

4. පිටපත් දෙකකින් යුතු මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් "**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**" වෙත එවිය යුතු අතර නැතහොත් අවසන් දිනට පෙර ප්‍රධාන ආරක්ෂක කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. සේව්‍යයන්ගේ අවසර ලිපි සහ ජාතික හැඳුනුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසුව ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණීමට අවසර දෙනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වීමෙන් පසුව කිසිදු ලංසුකරුවෙකුට හෝ නියෝජිතයෙකුට ලංසු විවෘත කිරීමට සහභාගි වීමට ඉඩ දෙනු නොලැබේ.

5. ලංසු ලේඛනයේ "**මිල උපලේඛනය**" තුළ දක්වා ඇති අයිතම සහ අදාළ ගාස්තු එහි දක්වා ඇති එක් එක් අයිතමය සඳහා දැක්විය යුතු ය. ඉදිරිපත් කරනු ලබන ගාස්තු කිසිදු හේතුවකින් වෙනස් නොකළ යුතු ය.

6. සැපයුම්, කටුනායක ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයට සැපයිය යුතු අතර ලංසුකරුවන් අදාළ භාණ්ඩ සඳහා සියලු බදු සහ ගාස්තු මෙන්ම ප්‍රවාහන වියදම් ද දැරිය යුතු ය. මිල උපලේඛනය තුළ අදාළ වැට් බද්ද වෙනමම දැක්විය යුතු ය.

7. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී (දුර 011 -2325468 දිගුව 23550) හෝ ප්‍රසම්පාදන නිලධාරී ටෙන්ඩර (දුර 011-2441553 හෝ 011-2441044 දිගුව 23569, ෆැක්ස් 011-2441553 සහ 01102347694) වෙතින් වැඩි දුර තොරතුරු ලබාගත හැකිය.

8. ඉහත සඳහන් කළ ලිපිනය වන්නේ :-

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය
තැ.පෙ. 1592
කොළඹ 02

ගුවන් හමුදාධිපති

නම් වෙනස් කිරීම

කොළඹ දිස්ත්‍රික්කය කොල්ලුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 16/3, රොටුන්ඩා ගාර්ඩන්ස්, කොළඹ 03 ලිපිනයේ පදිංචි **ශිරෝමි අලුවිහාරේ රත්වත්තේ** වන මා විසින් මාගේ දරුවන් දෙදෙනා වන **දියා අලුවිහාරේ ප්‍රනාන්දු** සහ **සෙත් අලුවිහාරේ ප්‍රනාන්දු** මෙතැන් පටන් දියා **අලුවිහාරේ රත්වත්තේ** සහ සෙත් **අලුවිහාරේ රත්වත්තේ** යනුවෙන් හඳුන්වනු ලබන බව ශ්‍රී ලංකා රජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මෙයට මව වන
ශිරෝමි අලුවිහාරේ රත්වත්තේ

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය සිසුන්ට නියමිත වෛද්‍ය සායන පුහුණුව කුලියාපිටිය ශික්ෂණ රෝහලේදී පෙරේදා (15) ආරම්භ කෙරිණි. වෛද්‍ය සිසුන් 72කුගෙන් මෙහි පළමු කණ්ඩායම සමන් විත වේ. වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපති විශේෂඥ වෛද්‍ය සංජීව බෝවත්ත, කුලියාපිටිය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ප්‍රභාත් වේරවත්ත, විශේෂඥ ශල්‍ය වෛද්‍ය ඇෂ්මෝ රණසිංහ, වයඹවිශ්ව විද්‍යාලීය වෛද්‍ය පීඨයේ වෛද්‍ය ශිෂ්‍ය ජනුත් සේනාධිර, කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී වෛද්‍ය ප්‍රමිතා ශාන්තිලතා යන මහත්ම මහත්මිහු මීට සහභාගී වූහ.

ඡායාරූපය - කුලියාපිටිය විශේෂ ඩබ්ලිව්. රණසිංහ

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

පොල් සංවර්ධන අධිකාරිය

පොල් සංවර්ධන අධිකාරිය සඳහා රසායනාගාර උපකරණ සපයා, සවිකර, ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම සඳහා ලංසු කැඳවීම

ලංසු අංක - CDA/1/2021

පොල් සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පොල් සංවර්ධන අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පොල් සංවර්ධන අධිකාරියේ රසායනාගාරය සඳහා අවශ්‍ය පහත සඳහන් රසායනාගාර උපකරණ සපයා, සවිකර, ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම පිණිස සුදුසුකම් ලත් ආයතන වලින් මුද්‍රා, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

	Item	Qty
01	Magnetic Stirrer (With Hot Plate)	02
02	pH Meter	02
03	Autoclave	01
04	IR Thermometer	02
05	Electric Conductivity Meter	01

01. ලංසු, ආපසු ගෙවනු නොලබන රු. 1,000.00 ක මුදලක් ගෙවා, ලදුපත ඉදිරිපත් කර ලබා ගන්නා ලද ආකෘති පෝරමය මගින් ඉදිරිපත් කළ යුතු අතර, එම ආකෘති පෝරම හා කොන්දේසි ඇතුළත් ඉංග්‍රීසි බසින් යුත් ලංසු පත්‍රිකා 2021.02.17 දින සිට 2021.03.15 දින දක්වා ප.ව. 3.00 තෙක් සතියේ වැඩ කරන දින වලදී අධ්‍යක්ෂ (පාලන) රා. ආ. වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ලබාගත හැක.

02. ලංසු භාර ගැනීම 2021.03.16 දින ප.ව. 2.00 ට අවසන් වන අතර, ඒ විගසම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට මෙම අවස්ථාවට සහභාගිවිය හැක.

03. අනු පිටපතක් සහිත මුද්‍රා, තබන ලද ලංසු, ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් රැගෙනවිත් මේ සඳහා මෙම අධිකාරියේ පරිපාලන අංශයේ තබා ඇති අංක 06 දරන ටෙන්ඩර් පෙට්ටිය වෙත බහාලිය හැකිය. මිල ගණන් ඇතුළත් ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර "**CDA/1/2021 - රසායනාගාර උපකරණ සපයා සවි කර ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම සඳහා ලංසු කැඳවීම**" යනුවෙන් සඳහන් කරන්න.

04. ලංසු භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය පොල් සංවර්ධන අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, මෙම ලංසු සම්බන්ධයෙන් පැන නගින සියලු කරුණු පිළිබඳව මෙම කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

05. ලංසු එවිය යුතු ලිපිනය පහත දැක්වේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
පොල් සංවර්ධන අධිකාරිය,
අංක 54, නාවල පාර,
නාරාහේන්පිට, කොළඹ 05.
2021.02.16

107

ටොයොටා කාර් රථ
විකිණීම

CP - CAX - 6579 - Toyota - DAA - NKE165 - AXIO - කාර් රථය, 2017 සුදු, ඉහළම ඉල්ලුමට. CBC ෆිනෑන්ස් සමාගම, 187, කටුගස්තොට පාර, මහනුවර. දු.ක. 081-2200272 012565



318

ඇබෑර්තු
රියදුරු

ප්‍රමුඛපෙළේ ප්‍රවාහන ආයතනයකට (10 Wheel Full Body) රියදුරන් බඳවා ගැනීම සඳහා පහත සඳහන් ලිපිනයට හෝ දුරකථන අංකයට සතියේ දිනවල රියදුරු බල පත්‍රය සමග පැමිණෙන්න. ඩබ්මාක් ලොජිස්ටික්, 520, අවිස්සාවේල්ල පාර, කඩුවෙල. 0777-771074. 011982

යුද්ධය අවසන් කරන්න ඉඩ නොදී කකුලෙන් ඇද්ද පිරිස් කොවිඩ් වසංගතයේදීත් ඒකම කරනවා

අගමැති මහින්ද රාජපක්ෂ කියයි

නුවන් කොඩිකාර පොල්පිතිගම සිට...

යුද්ධය අවසන් කිරීමට ඉඩ නොදී අපේ කකුලෙන් ඇද්ද පිරිස් කොවිඩ් වසංගතයේදීත් කකුලෙන් අදිමින් එය වැළැක්වීමට කටයුතු කරමින් සිටින බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා ඊයේ (16) පැවසීය.

කොවිඩ් වසංගතය තුරන් කරන ඖෂධය මෙරටට ගෙන්වීමට සූදානම් වනවිට අපට එය ගෙන්වා ගැනීමට බැහැයි කියා අනාවැකි කීවා පමණක් නොව, අප බෙහෙත ගේන්න සූදානම් වන විට ගේන බෙහෙතට වඩා හොඳ බෙහෙතක් යුරෝපා රටවල තිබෙන බව කියනවා යැයි අගමැතිවරයා කීවේය.

රෝගී වුණ ලෝකයක් මැද නිරෝගී සංවර්ධනයක් වූ රටක් හදා ගැනීම සිය රජයේ බලාපොරොත්තුව බව වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතියේ මහකිතුල හා මහ කිරුළ ජලාශවල ඉදිකිරීම් කටයුතු යාපහුව ඉරුදෙණියාය කෝන්ගහ මන්සන්ධියේ දී සමාරම්භ කරමින් අගමැතිවරයා මෙසේ පැවසීය.

මහවැලි ජලය වයඹට රැගෙන එන මෙම දැවන්ත වාරි ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කිරීම සංකේතවත් කරමින් මහ කිරුළ හා මහකිතුල ජලාශ ඉදිකිරීමේ සමරු ඵලකය රාජපක්ෂ මහතාගේ සුරතින් නිරාවරණය විය.

අප ලෝකයේ දරුණුතම ත්‍රස්තවාදයට එරෙහිව යුද්ධ කළත් රටේ සංවර්ධන කටයුතු එක මොහොතකට අතහැරියේ නැහැ. යුද්ධය කරන විටත් රටේ සංවර්ධනය අප කරගෙන ගියා. නැගෙනහිර බේරගෙන උතුරට හමුදා මෙහෙය වනකොට නැගෙනහිර පළාත වේගයෙන් සංවර්ධනය කළා. උතුරේ යුද්ධය නිමා කර, ඒ රණවිරුවන් දකුණට ආවේ සංවර්ධනය කළ පළාත් හරහා බවද රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේය.

වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය යටතේ කිලෝමීටර් 90ක් දිග ඇළ මාර්ගයක්, මීටර් 25ක් පමණ උසැති වැවි බැම්ම සහිත මහ කිරුළ සහ මහකිතුල ජලාශ දෙකක්, උමං ජල මාර්ග පහක් මඟින් ගලේවෙල, පොල්පිතිගම, මහව සහ ඇහැටුවැව යන ප්‍රදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිතව පවතින මහා වැවි හතකට හා කුඩා වැවි 350 කට දෙකන්නයේම වගා කිරීම සඳහා අවශ්‍ය ජලය 2024 වර්ෂය වන විට ලබාදීමට අපේක්ෂිතය.

ව්‍යාපෘතියේ වාර්ෂිකව ජලය අක්කර අඩි 105000ක් පමණ කුරුණෑගල දිස්ත්‍රික්කයේ උතුරු ප්‍රදේශයට හරවා යල-මහ දෙකන්නයේම වගා කටයුතු සඳහා ගොවිබිම් හෙක්ටයාර 13000කට වාරි ජලය සපයමින් දැනට පවතින වකුගඩු රෝගයට හේතුවන පානීය ජල ගැටලුව අවම කිරීම වෙනුවෙන් වාර්ෂිකව ජලය අක්කර අඩි 8100ක් ද මෙහි ඉලක්ක ප්‍රදේශවලට සපයාදීම සිදු වේ.

වසර 3ක් වැනි කෙටි කාලයක් තුළ වැඩ අවසන් කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් වියදම රුපියල් බිලියන 10.8කි.

මීට මසකට පමණ පෙර අගමැති මහින්ද රාජපක්ෂ මහතා දුන් පොරොන්දුවක් ඉටු කරමින් ප්‍රදේශවාසීන්ගේ ඉඩම් හිමිකම් ගැටලු නිරාකරණය කිරීම සංකේතවත් කරමින් මෙම උත්සවයට සමගාමීව අගමැතිවරයා අතින් ඉඩම් හිමිකම් ඔප්පු ප්‍රදානය ද සිදු විය.

මෙයට අමතරව කොවිඩ්-19 හමුවේ වයඹ පළාතේ පෙර පාසල්වල දරුවන්ගේ ආරක්ෂක තත්ත්වය වෙනුවෙන් සෞඛ්‍ය ආරක්ෂක උපකරණ හා ද්‍රව්‍ය ප්‍රදානය කිරීමේ අවස්ථාවට ද අගමැතිවරයා එක් විය.

අගමැතිවරයා වැඩි දුරටත් මෙසේද කියා සිටියේය.

කුරුණෑගලට මේ වගේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න ලැබීම ගැන මම ඇත්ත වශයෙන්ම සතුටු වනවා. පසුගිය මහ මැතිවරණයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාව ඡන්දේ දුන්නේ කුරුණෑගලට වෙනසක් බලාගෙනයි. මේ දිස්ත්‍රික්කයේ ඒ වෙනස ඇති කරන්න අප සියලු දෙනා අධිෂ්ඨාන කරගෙන ඉන්නවා. ඒ වෙනස ඇති කරන යෝධ පියවරක් හැටියට මේ වාරි ව්‍යාපෘතිය අප හඳුන්වා දෙනවා.

ජලය කියන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයට අත්‍යාවශ්‍ය දෙයක්. අද අප සම්පූර්ණ කරන්න හදන ව්‍යාපෘතියෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ විශාල පිරිසකට දැවැන්ත සේවයක් වනවා.

මේ ව්‍යාපෘතියෙන් පවුල් හතළිස් දහසකට පමණ ප්‍රතිලාභ ලැබෙනවා. යල-මහ දෙකන්නයේම හෙක්ටයාර දොළොස් දහස් පන්සීයකට (12500) වැඩි ප්‍රමාණයක් අස්වැද්දීමට හැකියාව ලැබෙනවා. වයඹ පළාත තුළ පවතින වකුගඩු රෝගයට හේතු වන උගුර පානීය ජල ගැටලුවටත් මෙම ව්‍යාපෘතියෙන් පිළියම් ලැබෙනවා කියා අප විශ්වාස කරනවා. වයඹ ඇළ ව්‍යාපෘතියෙන් ප්‍රදේශයේ ප්‍රධාන ජලාශ 7ක් සහ කුඩා වැවි 326ක් පෝෂණය වන නිසා, මේ ප්‍රදේශයේ මිරිදිය මත්ස්‍ය වගාවත් දියුණු වනවා. ඒ වගේම පාරිසරික සංචාරක කර්මාන්තය දියුණුවීමෙන් රැකියා අවස්ථා ඇති වන බවත් ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වගේම වාරි ක්ෂේත්‍රය සංවර්ධනය තුළින් ජාතික ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීමත් කටයුතු කරන්න අප සූදානම්.

මූලික මහවැලි මහ සැලැස්මෙන් වයඹ පළාතට ජලය ලබාදීම සඳහා සැලසුම් සකස් කර තිබුණේ නැහැ. කුරුණෑගල සංවර්ධනය කරන්න මේ පළාතෙ ජනතාව වගේම දේශපාලන නායකත්වය ඉල්ලපු දේ අද අප ලබා දෙන්න තීරණය කර තිබෙනවා.

2019 ජනාධිපති මැතිවරණයේදි සහ 2020 පැවති මහ මැතිවරණයේදී රට පුරා රැස්වීම්වලට යනකොට ජනතාවගේ ලොකුම ඉල්ලීම වුණේ විශේෂයෙන්ම පානීය ජල ප්‍රශ්නයට විසඳුම් දෙන්න කියන එකයි. අපේ රජය යටතේ මේ රටේ ජනතාවගේ පානීය ජල ගැටලුවට විසඳුම් ලබාදීමට අප සැලසුම් කර තියෙනවා.

ඒ වගේම කෘෂිකර්මාන්තයට මූලිකත්වය දෙන ආර්ථික සැලසුම් අප සකස් කර තිබෙනවා. කෘෂිකර්මාන්තය සඳහා වන ජලය ලබාදීමේ වාරි සැලසුම් පිළිබඳත් අප සැලසුම් සකසා තිබෙනවා. **"වාරි සෞභාග්‍ය"** ජාතික වැඩසටහනෙන් කරන්නේ ඒ කාර්යයයි.

මගේ ගම රුහුණේ හම්බන්තොට යේ මැදමුදලන කියන ගමේයි. මේ වගේම ග්‍රාමීය ප්‍රදේශයක්. අප හැමදාමත් ඡන්දය ඉල්ලුවේ හම්බන්තොටින්. මා විතරයි හම්බන්තොටින් එළියට ඇවිත් මේ දිස්ත්‍රික්කයෙන් ඡන්දය ඉල්ලුවේ. මා මේ පළාත ගැන තියපු විශ්වාසය පනුගිය ජනාධිපතිවරණයේදී මේ දිස්ත්‍රික්කයේ ජනතාව ඒ විදිහටම තහවුරු කළ එක ගැන මා ඔවුන්ට ස්තූතිවන්ත වනවා. ඒ විතරක් නෙමෙයි. 2015 පරාජය වුණාට පස්සේ ඉතාම දුෂ්කර කාලයක මා කුරුණෑගල ප්‍රදේශයේ ජනතාව ගැන විශ්වාසය තියා ඡන්දය ඉල්ලුවා. ඒ මොහොතෙත් මේ කුරුණෑගල ජනතාව අප කෙරෙහි විශ්වාසය තිබ්බා. ඒ නිසා දුෂ්කර මොහොතේ මට වගේම අපේ රජයට උපකාර කළ ජනතාවගේ දුෂ්කරතා තුරන් කරන්න අප ඉදිරියටත් කැප වන බව කියන්න ඕනෑ.

මේ ව්‍යාපෘතිය වගේම අංග සම්පූර්ණ පාසල්, තවත් ජල ව්‍යාපෘති , රැකියා සම්පාදන ව්‍යාපෘති ආදී බොහෝ දේ අප සම්පූර්ණ කරන්න බලාපොරොත්තු වනවා.

යුද්ධය තියෙනකොට තමයි අප හම්බන්තොට වරාය හදන්න වැඩ කටයුතු කළේ. යුද්ධය තියෙනකොට තමයි අප මත්තල ගුවන්තොටුපළ හදන්න වැඩකටයුතු කළේ. යුද්ධය තියෙනකොට තමයි අප නොරොච්චෝලේ විදුලි බලාගාරය හදන්න පටන් ගත්තේ.

යුද්ධය ජයග්‍රහණය කර මේ වැඩ කරන්න හිතුවා නම් ඒ එකක්වත් අපට කරන්න ලැබෙන්නේ නැති බව ඔබ දන්නවා. ඒ නිසා මා කියන්න ඕනෑ, කොවිඩ් වසංගතය තිබුණත් අපට සංවර්ධන කටයුතු නතර කරන්න බැහැ. අප නතර වෙන්නේත් නැහැ. අපේ බලාපොරොත්තුව රෝගී වුණ ලෝකයක් මැද නිරෝගී සංවර්ධනයක් වුණ රටක් හදා ගන්නයි.

පසුගිය යහපාලන ආණ්ඩුව මොකක් හෝ ප්‍රශ්නයක් ආවහම ඒ ප්‍රශ්නය පිට දාලා රටේ සංවර්ධනය අතපසු කළා. රටේ ජනතාවගේ ජීවන තත්ත්වය ගොඩනැඟීමේ කාර්යය අතරමඟ අතහැර දැම්මා. මේ කොවිඩ් වසංගතය ආවහම විපක්ෂයේ

යෝධ සංවර්ධනයක් රට පුරා ක්‍රියාත්මකයි

ඇමැති චමල් රාජපක්ෂ

සංවර්ධන වැඩ අඩාළ කිරීම විපක්ෂයේ වැයමයි

ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු

බොහෝදෙනෙක් කිව්වේ පාර්ලිමේන්තුව කැඳවන්න එපා කියායි. ඡන්ද තියන්න එපා කියායි. නමුත් අප පාර්ලිමේන්තුවත් කැඳෙව්වා. ඡන්දෙත් තිබ්බා.

අප දැන් කොවිඩ් වසංගතය තුරන් කරන්න අවශ්‍ය ඖෂධය ගෙනත් ඉවරයි. දැන් මොකක්ද විපක්ෂය කියන්නේ. දැන් විපක්ෂය කියනවා මේ බෙහෙත ජනතාවට දෙන්න හොඳ නැති අසාර්ථක බෙහෙතක් කියලා. මතක තියාගන්න. යුද්ධෙදි අපේ කකුලෙන් ඇද්ද අයම තමයි, කොවිඩ් වසංගතයෙදීත් අපේ කකුලෙන් අදින්නේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වයඹ පළාතේ ජනතාවගේ දූ දරුවෝ තමයි වැඩිපුරම එදා යුද්දෙට ඉදිරිපත් වුණේ. යුද්ධය ජයග්‍රහණය කළාට පස්සේ ගෙවුණු යහපාලන ආණ්ඩුව මේ රටේ රණවිරුවන්ට විරුද්ධව මානව හිමිකම් යෝජනාවලට එකඟතාව පළ කළා කියාත් ඔබට මතක ඇති.

අප වසංගතය මැද වේගයෙන් වැඩ කරගෙන යනවා. මේ ප්‍රදේශවල ජනතාවගේ ප්‍රශ්න වේගයෙන් නිරාකරණය කරගෙන යනවා. දැනටමත් ජනාධිපතිතුමා ගමින් ගමට, නගරයෙන් නගරයට ඇවිදිමින් ජනතාව අතරට ඇවිත් ප්‍රශ්න හඳුනා ගනිමින් ගැටලුවලට විසඳුම් දෙමින් සිටිනවා.

තිහව දස්සන් දළපොත හා නාගොල්ල රජමහා විහාරය යන උභය විහාරාධිපති, පොල්පිතිගම ශාසනාරක්ෂක බල මණ්ඩලයේ හිටපු ලේඛකාධිකාරී, හිරියාල හත්පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක ගනේගොඩ ශ්‍රී සිද්ධාර්ථ රතනජෝති නාහිමියෝ - පරාජිත වුණාට පස්සේ කිසිම ජනාධිපති කෙනෙක්ව හොයාගෙන මිනිස්සු වැල නොකැඩි ගෙදරට ගිහින් නෑ. හැබැයි ඔබ තුමා ගෙදර ගිය මොහොතේ සිට ලංකාව පුරා ජනතාව ඔබ තුමාගේ ගෙදරට ගියා. නැවත එන්න කියා ආරාධනා කළා. ඒ සියලු ජනතාවගේ ආරාධනය පිළි අරගෙන මේ රට කරවන්න පුළුවන් දක්ෂ විධායක ජනාධිපතිතුමෙක් ඔබතුමා අපට ලබා දුන්නා. ඒ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමායි. මේ රටට වැඩක් කළෙත්, කරන්නෙත් රාජපක්ෂවරු බව අප දන්නවා. ඔවුන්ට අභියෝග කළ හැකි නායකත්වයක් මේ පෙනෙන තෙක් මානයක දකින්න නැහැ.

වාර්මාර්ග ඇමැති චමල් රාජපක්ෂ මහතා- අද වන විට අපේ රජය දැවැන්ත සංවර්ධනයක් රට පුරා ක්‍රියාත්මක කරමින් ඉන්නවා. එහි එක් පියවරක් ලෙස වැවි 5000ක් සංවර්ධනය කිරීමේ වැඩ සටහනක් ආරම්භ කර තිබෙනවා. මට මතකයි මීට පෙර මම මේ වගේ සංවර්ධනයන් නිර්ක්ෂණය කරන්න පැමිණි අවස්ථාවක ඇතැම් පිරිසක් උද්ඝෝෂණයක නැයැළෙමින් එය වළක්වන්න උත්සහ ගත්තා. පොලිස් වාහනවලට හානි කළා. හැබැයි ඉන් අප වැටුණේ නැහැ. තව තවත් ධෛර්යය අරන් වැඩ කළා. අදත් මම හිතුවා ඒ වගේ දේවල් කරාවි කියලා. එහෙම වුණානම් වැඩ කරන්න තව තවත් ශක්තියක් එනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ විශාල වැවි සංඛ්‍යාවක් තිබෙනවා. ඉන් විශාල සංඛ්‍යාවක් සංවර්ධනය කර ජනතාවට අවශ්‍ය පානීය ජලය සහ කෘෂිකර්මයට අවශ්‍ය ජලය ලබාදෙන්න කටයුතු කරනවා.

මහින්ද රාජපක්ෂ මහත්මයා ජනාධිපතිවරයා බවට පත් වුණාට පස්සේ තමයි අපේ රටේ වාරි කර්මාන්තය දියුණු වෙන්න ගත්තේ. විශාල ප්‍රමාණයකට බීමට ජලය ලබාදුන්නේ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජනාධිපතිවරයා බවට පත්වුණාම එතුමා මෙම ක්ෂේත්‍රයට වෙනමම රාජ්‍ය ඇමැතිවරයෙක් පවා පත් කර වගකීම් බාර දුන්නා.

මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා - අගමැතිවරයා සහ වාරිමාර්ග ඇමැතිවරයා මෙම මහ කිතුල සහ මහ කිරුළ ජලාශ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පැමිණීම ගැන මා සතුටු වනවා. දැනට මාස එකහමාරකට පමන පෙර ගරු අග්‍රාමාත්‍යතුමා මේ ඉරුදෙණියාය ගම්මානයට පැමිණ වසර 30ක් තිස්සේ නොවිසඳුණු ඉඩම් ප්‍රශ්නයට විසඳුම් ලබා දුන්නා. එදා අග්‍රාමාත්‍යතුමා මෙම ඉරුදෙණියාය ගමේ ජනතාවට පොරොන්දුවක් දුන්නා. එදා දුන් පොරොන්දුව අද යථාර්ථයක් බවට පත්වෙලා තියෙනවා. රටේ ජනතාවට රාජපක්ෂවරුන් පිළිබඳ ලොකු විශ්වාසයක් තියෙනවා. ඒ නිසා තමයි 2015 පැරදුණු මහින්ද මහත්තයාව වසර හතරහමාරක් යන්න පෙර නැවත රටේ අග්‍රාමාත්‍යතුමා බවට පත් කළේ. මහින්ද රාජපක්ෂ මහතා කිසිම දිනක මේ රටේ ජනතාව මුලා කළේ නෑ.

විපක්ෂය රටේ සංවර්ධන ව්‍යාපෘතින් අඩාල කිරීමට නොයේකුත් කට කතා පතුරවනවා. ඔවුන් දැන් හැසිරෙන්නේ පිස්සුවෙන් වගේ. දැන් ගහක් අල්ලගෙන උද්ඝෝෂණය කරනවා. මේ හැම මඩ ප්‍රචාරයක්ම කරන්නේ ප්‍රේමදාස කල්ලිය සහ දිසානායක කල්ලියයි. ඔවුන්ට අවශ්‍ය වන්නේ රටේ සංවර්ධනය අඩාල කරන්නයි. ඔවුන් බලයේ සිටි කාලයේ මේ රටේ කිසිම සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කළේ නැහැ. එම නිසා ඔවුන් අපේ සංවර්ධන ව්‍යාපෘතින් අඩාල කරන්න පුදුම කැප කිරීමක් කරනවා.

රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න මහතා - මෙම වයඹ පළාත් මහ ඇළේ අවසන් අදියරේ වැඩ ආරම්භ කිරීමට ලැබීම අප ලැබූ විශාල ජයග්‍රහණයක්. වාරි සෞභාග්‍ය වැඩසටහනට සමගාමීව වාරි සෞභාග්‍ය කාර්යසාධක බළකාය පිහිටුවා වඩා කාර්යක්ෂම වැවි පිළිසකර කිරීමේ ක්‍රියාමාර්ග අප ගෙන තිබෙනවා. වැවි පිළිසකර කිරීමේදී ඒවාට අදාළ එල්ලංගා පද්ධති හඳුනාගෙන ඒවාට හානි නොවන අයුරින් ප්‍රතිසංස්කරණ කටයුතු කිරීමටත් සියලුම වැවි මිනුම්ගත කර අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමටත්, වැවේ ආරක්ෂාව සඳහා ගමේ පන්සල, පාසල, ගොවි සමිතිය, තරුණ පිරිස හා එක්ව රාජ්‍ය නිලධාරීන් ඇතුළු වාරි කමිටුවක් පිහිටුවා ඒ අයට වැව රැක ගැනීම සම්බන්ධව අවශ්‍ය දැනුම අප වාරිමාර්ග ඉංජිනේරු අංශය මඟින් ලබා දීමට කටයුතු සිදු කරමින් යනවා.

"ගම සමඟ පිළිසඳරක් සමඟින් වැඩ සමඟ යළි ගමට" වැඩසටහනේ දී, කුරුණෑගල පොල්පිතිගම ප්‍රදේශයේ ජනතාව අගමැතිවරයාගෙන් කළ ඉල්ලීමකට අනුව පොල්පිතිගම වනජීවී කලාපය තුල ඇති කළමඩුවාව වැව ප්‍රතිසංස්කරණ කටයුතු දැනටමත් අප ආරම්භ කර තිබෙනවා. එසේම මෙම වැවි ප්‍රතිසංස්කරණයේදී ප්‍රදේශවාසීන්ගේ පානීය ජල ගැටලු සඳහා ද විසඳුම් ලැබෙන පරිදි වඩාත් ප්‍රායෝගික වැවි තෝරා ගැනීමට අප කටයුතු කරනවා.

වයඹ පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක, දික්වැහෙර දෙමටමළු උභය විහාරාධිපති, රැකව ජිනරතන නාහිමි ප්‍රමුඛ මහා සංඝරත්නය, ඇමැති එස්.එම්. චන්ද්‍රසේන, රාජ්‍ය ඇමැතිවරුන් වන සිරිපාල ගමලත්, දයාසිරි ජයසේකර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගුණපාල රත්නසේකර, අසංක නවරත්න, ශාන්ත බණ්ඩාර, චරිත හේරත්, යූ.කේ. සුමිත් උඩුකුඹුර, ජයරත්න හේරත්, මංජුලා දිසානායක, වයඹ පළාත් ආණ්ඩුකාර රාජා කොල්ලුරේ මහත්ම මහත්මීන් හා වාරි මාර්ග අමාත්‍යාංශ ලේකම් අනුර දිසානායක මහතා ඇතුළු උසස් රාජ්‍ය නිලධාරීන් ඇතුළු විශාල පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

ජාතික ලොතරැයි මණ්ඩලය බිහි කළ සුපිරි ත්‍යාගලාභීන්ට චෙක්පත් අගමැති සුරතින්

ජාතික ලොතරැයි මණ්ඩලය බිහි කළ සුපිරි ත්‍යාගලාභීන් සඳහා චෙක්පත් ප්‍රදානය අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී පෙරේදා (15) සිදු කෙරිණි.

මාස 3ක් වැනි කෙටි කාලයක් තුළ ජාතික ලොතරැයි මණ්ඩලය බිහි කළ සුපිරි ත්‍යාගලාභීන් 9 දෙනකු සඳහා රුපියල් කෝටි 52ක් ඉක්ම වූ මුදල් චෙක්පත් අගමැතිවරයාගේ සුරතින් අදාළ ත්‍යාගලාභීන් වෙත පිරිනැමීය.

ජාතික ලොතරැයි මණ්ඩලයේ මෙගා පවර්, ගොවිසෙත, මහජන සම්පත, සුපිරි වාසනා, ධන නිධානය යන ලොතරැයිවලින් මෙම ත්‍යාගලාභීන් බිහි වී තිබේ.

මෙම අවස්ථාවට ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපති නිහීඳු ලලිත් පියුම් පෙරේරා, ප්‍රධාන කළමනාකාර ජී.එම්.වයි.කේ. ශිරෝමි ජීවමාලා, අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝජනය කරමින් අධ්‍යක්ෂ ඩී.ඩී. ජයසිරි මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

පක්ෂයේ ගැටලු පක්ෂය තුළම විසඳා ගන්නවා

ශ්‍රීලපොපෙ සභාපති, ඇමැති, මහාචාර්ය පී. එල්. පීරිස්

චන්ද්‍රිමා කරුණාරත්න

විවැනි ව්‍යවස්ථා සංශෝධනයේදී මීට වඩා මත ගැටුම් පැවතුණු බවත් එම ගැටලු පක්ෂයේ අභ්‍යන්තර යේදීම විසඳා ගත් බවත්, ඉදිරියේදී පක්ෂයේ ගැටලු පක්ෂය තුළ විසඳා ගැනීමට සියලු දෙනා කටයුතු කරනු ඇති බවත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සභාපති අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා පැවසීය.

දුර්වල විපක්ෂයට වාසි සැලසෙන අයුරින් ක්‍රියාකාරිම සුදුසු නොවන බවද මහාචාර්ය ජී එල් පීරිස් මහතා කියා සිටියේය.

පොදුජන පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පසුගිය (15) වැනිදා පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමින් මහාචාර්යවරයා මේ බව පැවසීය.

අපේ සන්ධානය තුළ මත ගැටුම් ඇතිවීම් අමුතු දෙයක් නෙවේ. පසුවිපරමක් ගන්නවා නම් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ආරම්භය අප මතක් කළ යුතුයි. විවිධ අභියෝගවලට මුහුණ දී තමයි, පක්ෂය පිහිටුවන්න පුළුවන් වුණේ. ප්‍රබල මතයක් ඉදිරිපත් වුණා අලුත් පක්ෂයකට අවශ්‍යතාවක් නෑ කියා. ඒකාබද්ධ විරුද්ධ පක්ෂයක් පමක් ප්‍රමාණවත් කියා.

බැසිල් රාජපක්ෂ මහතා විශාල වෙහෙසක් දක්වා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය බිහි කළා. එතුමා එක කළේ පැහැදිලි ප්‍රතිපත්තියක් මත පිහිටයි. අපට නිවහනක් අවශ්‍යයි. එතන හිඩැසක් තියෙනවා. ඒ හිඩස පිරවීම අවශ්‍යයයි කියන ස්ථාවර මතසිට බැසිල් රාජපක්ෂ මහතා අපේ පක්ෂය බිහි කිරීමට දැඩි උත්සහයක් දැරුවා. මාස 15ක් තුළ පළාත් පාලන මැතිවරණය පැවැත් වුණා. ඒක ප්‍රාතිහාර්යක් වුණා. දීප ව්‍යාප්ත මට්ටමින් කොට්ඨාස සියයට 71ක් ජයග්‍රහණය කිරීමට අපේ අලුත් පක්ෂයට හැකි වුණා.

දුර්වල විපක්ෂයට වාසි ලෙස ක්‍රියා කිරීම සුදුසු නැහැ

2020 පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඡන්ද කොට්ඨාසවල අපේක්ෂකයන් සංඛ්‍යාව තීරණය කිරීම අතිශය දුෂ්කර වුණා. විවිධ මත ප්‍රකාශ වුණා. මේ සියලුම ගැටුම් පක්ෂය හා අභ්‍යන්තරව සාකච්ඡා කර සුහදව විසඳා ගැනීමට අපට හැකි වුණා. ඒ සම්ප්‍රදාය දිහින් දිගටම තිබ්බා. ශ්‍රී ලංකා අණ්ඩ්‍රක්‍රම ව්‍යවස්ථාවට 20 වැනි සංශෝධනය ඇතුළත් වෙද්දි ඒ වගේ ත්ත්වයක් මතු වුණා. සමහර අවස්ථාවල දී තියුණු මත ගැටුම් සන්ධානය තුළ ඇති වුණා. ඒවා සාකච්ඡා මාර්ගයෙන් එකඟත්වයට පැමිණීමට අපට හැකි වුණා. අනාගතයේදීත් අප කටයුතු මෙහෙයවීමට බලාපොරොත්තු වන්නේ ඒ විදිහයි. මේ සියලු දෙනාම දේශපාලන අත්දැකීම්වලින් පිරිපුන් පුද්ගලයන්.

කැබිනට් මණ්ඩලයේ හා රජය තුළ සාමූහික වගකීම කියන ප්‍රතිපත්තිය අපෙ අවිවාදයෙන් පිළිගන්නවා. එක රජයක් කියන්නේ අනිවාර්යෙන් එක හඬක්. පරස්පර ස්ථාවරයක් රජය තුළ මතු වන්න බෑ. කැබිනට් මණ්ඩලය යම්කිසි ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තීරණයක් ගත්විට, ඒ ප්‍රතිපත්තිය උල්ලංඝනය කළොත් දුර්විපාක රාශියක් ක්ෂේත්‍ර කිහිපයක අනිවාර්යෙන් උත්ගත වනවා. එමඟින් ආයෝජකයන් අධෛර්යවත්වීම වළක් වන්න බෑ. එකෙන් රටේ ආර්ථිකයට විශාල හානියක් ඇති වනවා. ඒ වගේම විදේශ සම්බන්ධතා පිළිබඳ ව්‍යාකූලතාවක් ඇති වෙනවා. එය රජයට අහිතකරයි.

එන සතියේ ජිනීවා කවුන්සිලයේ න්‍යාය පත්‍රය ඇතුළත් වනවා. අභ්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ දුර්වලම විරුද්ධ පක්ෂය තමයි අද කියෙන්නේ. පාක්ෂිකයන්ගේ සිත් තුළ දෙගිඩියාවක්, විපක්ෂයට කිසිම වාසියක්, ලබා දීම කොහෙත්ම අවශ්‍ය නෑ. මෙවන් තත්වය තුළ විනය තීරණාත්මක වැදගත්කමින් යුක්ත වනවා. අපේ සන්ධානය තුළ මෙවැනි ප්‍රශ්නවලට සාකච්ඡා කර විසඳුම් ලබා ගැනීමට යන්ත්‍රණයක් තියෙනවා. අප සියලු දෙනාගේ සහයෝගය වන්නේ දැඩි ශ්‍රමයකින් අප හදාගත්ත මේ රජය ආරක්ෂා කිරීමයි. ජනතාවට පොරොන්දු වූ සියලු දේ ඉෂ්ට කරන්න ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැටියට, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති තුමා සහ මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍ය තුමා ඇප කැප සිටින බව ජනතාව ඉදිරියේ සපථ කරනවා.

රට පුරා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනයට තුන් අවුරුදු සැලැස්මක්

මහින්ද අලුත්ගෙදර

රට පුරා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට රජය තීරණය කරයි. ග්‍රාමීය ආර්ථිකය නංවාලීමේ ජාතික වැඩසටහන යටතේ එය ක්‍රියාත්මක බව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

ඒ අනුව දිවයින පුරා සෑම ග්‍රාම සේවා වසමකම පවතින පාසල්, ග්‍රාමීය රෝහල්, ක්‍රීඩා පිටි හා බහු කාර්ය ගොඩනැගිලි මෙන්ම සෞඛ්‍ය, අධ්‍යාපන හා ක්‍රීඩා හා තරුණ ක්ෂේත්‍රයන්ට අදාළ පහසුකම් පුළුල් කිරීමට අපේක්ෂා කරන බවද ඇමැතිවරයා පෙන්වා දෙයි.

අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි දිවයින පුරා පැවැත්වෙන ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ජාතික වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික් සමාජීය යටිතල පහසුකම් කමිටු රැස්වීමේ දී ඇමැතිවරයා මේ බව සඳහන් කළේය. නාමල් රාජපක්ෂ, ප්‍රසන්න රණතුංග ඇමැතිවරුන්ගේ ප්‍රධානත්වයෙන් මෙම රැස්වීම පැවැත්විණි.

මෙම සාකච්ඡාවේ දී ගම්පහ දිස්ත්‍රික්කයේ ගුරු පුරප්පාඩු 1032 ක් පවතින බව අනාවරණය විය. අවසන් වරට බස්නාහිර පළාත් සභාව මඟින් පැවැත් වූ ගුරු විභාගයෙන් සමත් වූවන් මෙම ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පියවර ගන්නා ලෙස ඇමැති ප්‍රසන්න රණතුංග මහතා මෙහිදී උපදෙස් දුන්නේය. පළාත් ප්‍රධාන ලේකම් ජයන්ති විජේතුංග මහත්මිය පැවසුවේ ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බවයි. දිවයින පුරා පාසල් වල පවතින ගුරු පුරප්පාඩු පිරවීමට ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක බව ඇමැති නාමල් රාජපක්ෂ මහතා කීවේය. ඔහු පෙන්වා දුන්නේ ඒ අනුව ඉදිරියේ දී ගුරු පුරප්පාඩු වලට විසඳුම් ලැබෙන බවයි.

දැනට ක්‍රියාත්මක නොවන පළාත් සභා ව්‍යුහ කමිටු නැවත ක්‍රියාත්මක කිරීමට ද මෙහි දී තීරණය කෙරිණි. පාසල් වල අඩක් නිමකර ඇති ගොඩනැගිලි නිම කිරීම හා අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් මිලියන 109.6 ක් වෙන් කර තිබේ. පාසල්වල වැසිකිළි, කැසිකිළි අවශ්‍යතා කඩිනමින් සම්පූර්ණ කිරීමට ද අපේක්ෂිතය. දිස්ත්‍රික්කය පුරා වෘත්තීය පුහුණු වැඩසටහන් විධිමත් කෙරේ. ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට ද ප්‍රදීප් ඇතුළු දිස්ත්‍රික්කයේ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ප්‍රාදේශීය ලේකම්වරු, අමාත්‍යාංශ ලේකම්වරු රැසක් සහභාගී වූහ.

පොලිසියට ජපාන රජයේ පරිත්‍යාගයක් ලෙස

ජීප් රථ 31ක්, බස් රථ 04ක් සහ වෑන් 10ක්

රක්ෂණ ශ්‍රියන්ත

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහා ජපාන රජය පරිත්‍යාග කළ ජීප් රථ 31ක්, බස් රථ 04ක් සහ වෑන් 10ක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත සංකේතාත්මකව භාරදීම ඊයේ (16) පෙරවරුවේ ජනාධිපති කාර්යාලයේ දී සිදු විය.

වාහන භාරදෙනු ලැබුයේ ශ්‍රී ලංකාවේ ජපාන තානාපති අකිර සුගියාමා මහතා විසිනි. වාහනවල තත්ත්වය විමසා බැලූ ජනාධිපතිවරයා තානාපතිවරයා සමග සුහද කතා බහක නිරත විය.

ශ්‍රී ලංකා පොලීසිය සිදු කරන විමර්ශන පහසු කිරීම සඳහා ජපාන රජය මේ පරිත්‍යාගය කර ඇත. රුපියල් මිලියන 1250ක පූර්ණ ප්‍රදානයක් ලෙස ලැබෙන පරිත්‍යාගයේ පළමු පියවර ලෙස රුපියල් මිලියන 775ක් වටිනාකමින් යුත් වාහන 45ක් අද භාර දෙනු ලැබිය.

දෙවැනි පියවර ලෙස තවත් වාහන සහ අනි නවීන සෝදිසි උපකරණ තොගයක් ඉදිරි කාලයේ දී ලැබෙයි. ජීප් රථ 25, මෝටර් බයිසිකල් 150ක්, Search Gates 7ක්, Total Search Machine 01ක් , Handheld Metal Detector 80ක් ඊට අයත්ය.

මහජන ආරක්ෂක අමාත්‍ය විශ්‍රාමික රියර් අද්මිරාල් ආචාර්ය සරත් වීරසේකර, අමාත්‍යාංශ ලේකම් විශ්‍රාමික මේජර් ජෙනරාල් ජගත් අල්විස්, පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න යන මහත්වරු ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීහු, ජපාන ක්‍රවුන් නියෝජිත ආයතනයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත ජී.ඩබ්.යූ. දුමින්ද චන්ද්‍රරත්න මහතා ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

ඡායාරූප : ජනාධිපති මාධ්‍ය අංශය

රජපිහිල්ල උද්‍යානය රැක ගැනීමට කොළඹදී උද්ඝෝෂණයක්

බුද්ධිකා ඉඹුලාන

කුරුණෑගල රජපිහිල්ල උද්‍යානයේ පැරණි ගස් කිහිපයක් කපා දැමීම හා එම ඉඩම පෞද්ගලික ආයතනයකට පැවැරීමට යන්නේ නම් ඒ සම්බන්ධව ඇමැති මණ්ඩලය දැනුම්වත් කර අවශ්‍ය පියවර ගන්නා බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පවසයි.

කුරුණෑගල රජපිහිල්ල උද්‍යානයේ පැරණි ගස් කිහිපයක් කපා දැමීම හා එම ඉඩම පෞද්ගලික ආයතනයක් ඉදි කිරීම සඳහා බදු දීමටත් යන බව පවසමින් ඊයේ දින (16) පරිසර අමාත්‍යාංශය ඉදිරිපිට දී පිරිසක් නිහඬ උද්ඝෝෂණයක නිරත වූහ.

එම විරෝධතාකරුවන් පිරිස අසලට ගිය පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා රජපිහිල්ල උද්‍යානයේ ගස් කපා දැමීම සම්බන්ධව ජනාධිපතිතුමන් වෙත වාර්තාවක් ලබා දෙන ලෙස තමන් මධ්‍යම පරිසර අධිකාරියට දැනුම් දුන් බවත්,එම වාර්තාවට අනුව කිසිසේත්ම මෙම ස්ථානය පුද්ගලික අංශයට පැවරීමට යන බවක් සඳහන් ව නොමැති අතර එම කාරණය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයට ඉදිරියේ දී කරුණු ඉදිරිපත්කරන බවත් ප්‍රකාශ කළේය.

මෙම ඉඩම අක්කර දෙකකට අඩු නිසා එවැනි ඉඩමක් සංවර්ධනයේ දී ඇතැම් ගස් ඉවත් කිරීමට සිදුවන්නේ නම් ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර වාර්තාවක් ලබා ගැනීම අවශ්‍ය නොවන බවත්, මෙහිදී සිදුව ඇත්තේ එම කාරණය වන නමුත් පසුව මේ සම්බන්ධව මතු වූ කාරණාවන් සැළකිල්ලට ගනිමින් ඒ සඳහා සොයා බැලීමට පරිසර අමාත්‍යාංශය මැදිහත් වූ බවත් ඇමැතිමවරයා මෙහිදී කීය.

එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය මැදිහත් වීමෙන් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩ සටහන් බහුතරයක් ඉතාමත් සාර්ථක ව්‍යාපෘති බවත්, වත්මන් ජනාධිපතිතුමා ආරක්ෂක ලේකම්වරයා වශයෙන් කටයුතු කරද්දී සාර්ථකව නාගරික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ බවත් වර්තමානයේ බොහෝ දෙනෙක් ඒවා අගය කරන බවත් ඇමැතිවරයා පෙන්වා දුන්නේය.

කෙසේ වුවද රජපිහිල්ල උද්‍යානයේ සිදු කරන ලද පරිසර හානිය තමන් කිසිසේත්ම අනුමත නොකරන බවත්, එහි වටිනා ගස් කිහිපයක් කපා දැමීම නොකළ යුතුව තිබූ දෙයක් බවත් ඇමැතිවරයා අවධාරණය කළේය.විරෝධතා දැක් වූ පිරිස් ඇමැති වරයා වෙත ඔවුන්ගේ ගැටලුව ඉදිරිපත් කරමින් ලිපියක් බාර දුන් අතර මේ සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය දැනුම්වත් කිරීමට තමන් පියවර ගන්නා බවට ඇමැතිවරයා පොරොන්දුවක් ලබා දීමෙන් පසුව ඔවුහු විසිර ගියහ.

සමඟි ජනබලවේගයේ හරීන් මනුෂ, හේෂා, මුජිබර් කොවිඩ් එන්නත ප්‍රතික්ෂේප කරති

සුභාෂිණී සේනානායක

සමඟි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන හරීන් ප්‍රනාන්දු, මනුෂ නානයක්කාර, හේෂා විතානගේ සහ මුජුබර් රහුමාන් යන අය කොවිඩ් එන්නත ලබාගැනීම ඊයේ 16 ප්‍රතික්ෂේප කර තිබේ.

කොවිඩ් එන්නත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හට ඊයේ (16) දිනයේ නාරහේන්පිට යුද හමුදා රෝහලේ දී ලබා දීම සිදු කෙරිණු අතර එම අවස්ථාවට එක් වීම එම මන්ත්‍රීවරුන් ප්‍රතික්ෂේප කර ඇත. මේ අතර කොවිඩ් එන්නත රටේ ජනතාවගෙන් මිලියනකටවත් එන්නත්කරණය සිදු කිරීමෙන් පසුව තමන් එන්නත ලබාගැනීමට කටයුතු කරන බව හරීන් ප්‍රනාන්දු මහතා ඔහුගේ ට්විටර් ගිණුමේ ට්විටර් පණිවිඩයක් නිකුත් කරමින් සඳහන් කර ඇත.

විමල් ඇතුළු 7කට එරෙහි නඩුව ජූනි 21 යළි කැඳවයි

සිරන්ජනි කුමාරි

ජගත් මානව හිමිකම් පිළිබඳ හිටපු මහ කොමසාරිස් සෙයිද්‍රාද්අල් හුසේන් කුමරු දිවයිනට පැමිණීමට විරෝධය දක්වමින් උද්ඝෝෂණයක් පවත්වමින් මහජන පීඩාවක් ඇති කිරීමේ චෝදනාවක් සම්බන්ධයෙන් ඇමැති විමල් වීරවංශ මහතා ඇතුළු 7 දෙනකුට එරෙහි නඩු විභාගය ජුනි මස 21 වැනි දින යළි කැඳවීමට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් බුද්ධික ශ්‍රී රාගල මහතා පෙරේදා (15) නියෝග කළේය.

ඇමැති විමල් වීරවංශ, පාර්ලිමේන්තු මන්ත්‍රී වීරකුමාර දිසානායක, ජයන්ත සමරවීර, ජාතික නිදහස් පෙරමුණේ මාධ්‍ය ප්‍රකාශක මොහොමඩ් මුසම්මිල්, බස්නාහිර පළාත් සභාවේ හිටපු මන්ත්‍රී රොජර් සෙනෙවිරත්න සහ පියසිරි විජේනායක යන අයට එරෙහිව මේ නඩුව පවරා තිබේ.

2016 පෙබරවාරි මස 06 වැනි දින එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ හිටපු මහ කොමසාරිස් සෙයිද්‍රාද්අල් හුසේන් කුමරු ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදී බෞද්ධාලෝක මාවත සහ හැවිලොක් මාර්ගය අවහිර වන පරිදි සැකකරුවන් විසින් විරෝධතා පැවැත්වූ බවට කුරුඳුවත්ත පොලිසිය අධිකරණය හමුවේ චෝදනා ගොනු කර තිබුණි.

මංමාවත් පනත සහ පොලිස් ආඥා පනත අදාළ කර ගනිමින් කුරුඳුවත්ත පොලිසිය සැකකරුවන්ට එරෙහිව චෝදනා ගොනු කර තිබූ අතර සැකකරුවන් අදාළ චෝදනාවලට නිවැරදිකරුවන් බවට පැවැසීමෙන් අනතුරුව පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ට සිතාසි නිකුත් කරමින් නඩුව විභාගය සඳහා අධිකරණය දින නියම කර තිබිණි.

ප්‍රථම නියෝජ්‍ය පොලිස්පතිනියගේ උසස්වීමට එරෙහි පෙත්සම සලකා බැලීම මැයි 18ට

නෙල්කා මැදගෙදර

ශ්‍රී ලංකාවේ ප්‍රථම නියෝජ්‍ය පොලිස්පතිනිය ලෙස බිම්ශානී ජාසින් ආරච්චි මහත්මියට ලබා දුන් උසස්වීම බලරහිත කරන ලෙස ඉල්ලා ගොනුකර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සමක් සලකා බැලීම සඳහා මැයි මස 18 වනදා කැඳවන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය දින නියම කළේය.

එම පෙත්සම මගින් ඉල්ලා ඇති අතුරු තහනම් නියෝගයට එරෙහි සීමිත විරෝධතා සති තුනක් තුළ දී ගොනු කරන ලෙස බිම්ශානී ජාසින්හ ආරච්චි මහත්මිය ඇතුළු වගඋත්තර කරුවන් ට නියම කෙරිණ.

මුර්දු ප්‍රනාන්දු, ශිරාන් ගුණරත්න සහ අචල වෙංගප්පුලි යන මහත්ම මහත්මීන්ගෙන් සමන්විත ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල ඉදිරියේ මෙම පෙත්සම කැඳවනු ලැබිණි.

එහිදී ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා පෙත්සම් කරුවන් වෙනුවෙන් අධිකරණය හමුවේ කරුණු දක්වමින් කියා සිටියේ වගඋත්තරකාර නියෝජ්‍ය පොලිස්පතිවරියගේ උසස්වීම ක්‍රියාත්මක කිරීම වළක්වාලන අතුරු තහනම් නියෝගයක් අධිකරණයෙන් ලබා ගැනීමට තමා අපේක්ෂා කරන බවය.

එහිදී වගඋත්තරකාර නියෝජ්‍ය පොලිස්පතිවරිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ ක්‍රිෂ්මාල් වර්ණසූරිය මහතා සඳහන් කළේ මෙම පෙත්සම සම්බන්ධයෙන් කිසිදු ලියවිල්ලක් තමන් ට ලැබී නැති බව ය.

මෙම පළමුවන පෙත්සම්කරු වන ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී, රුවන් ගුණසේකර මහතා පොලිස් නීති අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන අතර මෙම නඩුවට අදාළ ලේඛන මේ දක්වා තමන්ට ලබා දී නොමැති බැවින් පෙත්සමෙන් ඉල්ලා සිටින සහන වලට එරෙහිව

විරෝධතා ඉදිරිපත්කිරීම සඳහා කල් ලබාදෙන ලෙස නීතිඥ වර්ණසූරිය මහතා අධිකරණයෙන් ඉල්ලා සිටියේය. එම ඉල්ලීම පිළිගත් ශ්‍රේෂ්ඨාධිකරණය අදාළ විරෝධතා සති තුනක් ඇතුළත ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස වගඋත්තරකාර පාර්ශවයට දැනුම් දුන්නේය.

මෙම පෙත්සම හෝ ඒ සම්බන්ධ ලියකියවිලි නීතිපති ඇතුළු වගඋත්තර කරුවන් කිහිප දෙනෙකු ටද ලැබී නැති බව සඳහන් කෙරිණ.

විරෝධතාවලට ප්‍රතිවිරෝධතා තිබේ නම් ඒවා ද එතැන් සිට සතියක් තුළ ගොනුකිරීමට පියවර ගන්නා ලෙසද පෙත්සම්කාර පාර්ශවයට නියම විය .

සම්මත උසස් වීම් පටිපාටියට පටහැනි ආකාරයට යමින් බිම්ශානී ජාසින්හ ආරච්චි මහත්මිය ට මෙම උසස් වීම ලබා දී ඇති බැවින් එය නීතිවිරෝධී බවට තීන්දුකරන ලෙස ඉල්ලමින් මෙම පෙත්සම ඉදිරිපත් කර තිබේ.

රුවන් ගුණසේකර ඇතුළු ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරිවරුන් 32 දෙදෙනකු මෙහි පෙත්සම් කරුවන් වේ.

පොලිස්පතිවරයා, ජාතික පොලිස් කොමිසම, නීතිපතිවරයා සහ මෑතකදී නියෝජ්‍ය පොලිස්පති ධුරයට පත් වූ බිම්ශානී ජාසින් ආරච්චි ඇතුළු පිරිසක් මෙහි වගඋත්තර කරුවන් ලෙස නම් කර තිබේ.

මෑතකදී සිදුකරන ලද උසස්වීම්වලදී මෙරට ප්‍රථම නියෝජ්‍ය පොලිස්පතිනිය ලෙස බිම්ශානී ජාසින් ආරච්චි මහත්මිය උසස් කිරීමට වගඋත්තරකරුවන් කටයුතු කළ බව පෙත්සමෙහි සඳහන්වේ.

එහෙත් උසස් කිරීම්වලට අදාළ රෙගුලාසි වල කාන්තා යන වචනය සඳහන් නොවන හෙයින් මෙරට කිසිදු පොලිස් නිලධාරිනියකට නියෝජ්‍ය පොලිස්පති ධුරයට පත්විය නොහැකි බව එම පෙත්සමේ සඳහන් වේ.

එබැවින් මෙම උසස් කිරීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර තිබෙන සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන බවට තීන්දුවක් ලබාදෙන ලෙසත් නීතිවිරෝධී අයුරින් සිදුකර ඇති එම උසස්වීම බලරහිත කරන ලෙසත් පෙත්සම මගින් ඉල්ලා ඇත.

පාස්කු බෝම්බ ප්‍රහාරයක් එල්ල කළ මරාගෙන මැරෙන බෝම්බකරුගේ පියා රිමාන්ඩ්

සිරන්ජනි කුමාරි

පාස්කු ඉරුදින කොච්චිකඩේ සාන්ත අන්තෝනි දේවස්ථානයට මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කළ බෝම්බ කරුගේ පියාවන අහමඩ් ලෙබ්බේ අලවිදීන් නැමැත්තා ලබන මස දෙවන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් බුද්ධික ශ්‍රී රාගල මහතා ඊයේ (16) නියෝග කළේය

රහස් පොලිසිය අධිකරණයට වාර්තාවක් ඉදිරිපත් කරමින් සඳහන් කළේ බෝම්බ කරුගේ පවුලේ සාමාජිකයන් සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශන සිදුකරන බවය.

මෙම පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් වෙනම විමර්ශනයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පවත්වන බවට අධිකරණයට කරුණු වාර්තා කර තිබිණි.

අදාළ කරුණු සලකා බැලූ මහේස්ත්‍රාත් වරයා සැකකරු ලබන මස දෙවන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියෝග කළේය.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ වර්ධනයක්

- මහ බැංකුව

මහින්ද අලුත්ගෙදර

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පසුබෑමට ලක්ව තිබෙන සේවා අංශය තවදුරටත් යථා තත්ත්වයට පත්වෙමින් ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වර්ධනයක් පෙන්නුම් කරන බව ශ්‍රී ලංකා මහ බැංකුව පවසයි.

ඒ අනුව 2021 ජනවාරි මාසයේ දී නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය 60.2 ක් වාර්තා කරමින් වර්ධනය වී තිබෙන අතර, නව ඇණවුම් සහ නිෂ්පාදනවල සිදුවූ වර්ධනය මේ සඳහා හේතු වූ බවද තොග මිලදී ගැනුම් උප දර්ශකයේ ඉහළ යාමද සමස්ත දර්ශකයේ වර්ධනය කෙරෙහි දායක වී තිබෙන බවද ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ නවතම වාර්තාවක් මඟින් පෙන්වාදෙයි.

ධනාත්මක ලෙස වසර ආරම්භ කරමින්, සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 ජනවාරි මාසයේ දී 56.2ක් ලෙස වාර්තා වී තිබෙන අතර ටකොවිඩ් -19 වසංගතයෙහි දෙවන රැල්ල හේතුවෙන් පසුබෑමකට ලක් වූ සේවා අංශය තවදුරටත් යථා තත්ත්වයට පත්වීමක් මෙමින් පෙන්නුම් කරයි. නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් හි දක්නට ලැබුණු ඉහළ යෑම මෙම වර්ධනය සඳහා දායක වී තිබේ.

ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා, ප්‍රවාහන සහ තොග සහ සිල්ලර වෙළඳාම උප අංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමඟ සේවා අංශයේ නව ව්‍යාපාර 2021 ජනවාරි මාසයේ දී ඉහළ ගොස් ඇති අතර උත්සව සමයෙන් පසුව ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශක යහපත් මට්ටමක පැවතිණි.

මුහුණු ආවරණය කළ හිස් වැසුම් පලඳින යතුරුපැදිකරුවන්ට නඩු බෑ

නෙල්කා මැදගෙදර

සම්පූර්ණයෙන්ම මුහුණු ආවරණය කළ ආරක්ෂිත හිස් වැසුම් පලඳින යතුරුපැදිකරුවන්ට එරෙහිව නීතිමය පියවර නොගන්නා ලෙස නීතිපති දප්පුල ද ලිවේරා මහතා පොලිස්පතිවරයාට උපදෙස් ලබාදී ඇතැයි නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් පාරින්ද රණසිංහ මහතා ඊයේ (16) අභියාචනාධිකරණයට දන්වා සිටියේය.

සම්පූර්ණයෙන්ම මුහුණු ආවරණය කළ ආරක්ෂිත හිස් වැසුමක් පැලඳ ගමන් කළේ යැයි චෝදනා කරමින් පොලිසිය විසින් තමාට එරෙහිව වැල්ලවාය මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ නඩුවක් ගොනු කිරීමට එරෙහිව යතුරු පැදි කරුවකු ගොනු කළ පෙත්සමක් කැඳවූ අවස්ථාවේදී මෙම දැනුම්දීම කරන ලදී.

සෝහිත රාජකරුණා සහ ධම්මික ගනේපොල යන අභියාචනාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ මෙම පෙත්සම් කැඳවනු ලැබිණි.

වැල්ලවාය ප්‍රදේශයේ පදිංචි නාමල් ප්‍රසංග මෙම පෙත්සම්කරු වේ.

එහිදී පෙත්සම් කරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ දර්ශන වේරදූවගේ මහතා සඳහන් කළේ 2017 වසරේ අංක 2 දරණ මෝටර් යතුරුපැදි ආරක්ෂක හිස්වැසුම් රෙගුලාසි යටතේ පෙත්සම්කරු ට එරෙහිව මෙම නඩුව ගොනු කර ඇති බව ය.

එම රෙගුලාසි නිසි පරිදි පාර්ලිමේන්තු මගින් අනුමත කර නොමැති බවත් එය නීතියට පටහැනි බවත් ඔහු සඳහන් කළේය.

ඒ අනුව එම රෙගුලාසි යටතේ නඩු පැවරීම නීතියට පටහැනි බවද ඔහු පෙන්වා දුන්නේය.

එහිදී නීතිපති වරයාට වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් පාරින්ද රණසිංහ මහතා සඳහන් කළේ සම්පූර්ණ මුහුණු ආවරණ හිස් වැසුම් පළඳින යතුරු පැදි කරුවන්ට එරෙහිව එම නීතිය ක්‍රියාත්මක නොකරන ලෙස නීතිපතිවරයා දැනටමත් පොලිස් පති වරයාට උපදෙස් දී ඇති බව ය.

ඒ අනුව මෙම පෙත්සම්කරුට එරෙහිව වැල්ලවාය මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ ගොනුකර තිබෙන නඩුව ඉල්ලා අස්කර ගන්නා ලෙස ද පොලිසිය වෙත නීතිපතිවරයා විසින් උපදෙස් ලබාදී ඇති බව නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා අධිකරණයට දන්වා සිටියේය.

ඒ අනුව මෙම කරුණු සම්බන්ධයෙන් සැහීමකට පත්වන බව සඳහන් කළ පෙත්සම්කාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ දර්ශන වේරදුවගේ මහතා මෙම පෙත්සම ඉල්ලා අස්කර ගැනීමට අවසර ඉල්ලා සිටි අතර විනිසුරු මඩුල්ල ඊට අවසර ලබා දුන්නේය.

පාර්ලිමේන්තු පරිශ්‍රයේ පීසීආර්1800ක් ආසාදිතයෝ 11ක්

ස්වර්ණා විජේකෝන්

පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ මේ වනවිට පී.සී.ආර් පරීක්ෂණ 1800 ක් පමණ සිදුකර ඇතැයි චෛත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා කීය. ඊයේ (16) දිනයේදීත් පී.සී.ආර් පරීක්ෂණ එකසිය පනහකට ආසන්න ප්‍රමාණයක් සිදුකළ බවත් චෛත්‍රධාරීවරයා පැවැසීය .

පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ මෙලෙස වරින් වර සිදුකළ පී.සී.ආර් පරීක්ෂණ අනුව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ හත්දෙනකු හා ආරක්ෂක අංශ සාමාජිකයන් සිවු දෙනකුට කොවිඩ් ආසාදිත බවට අනාවරණය වූ බවද නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා පැවැසීය.

කොවිඩ් පාලනය වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය ලබාදී ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව පාර්ලිමේන්තුවේ කටයුතු පවත්වාගෙන යෑම සිදු කරන අතර දැඩි ආරක්ෂිත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක බවද චෛත්‍රධාරීවරයා සඳහන් කළේය.

එමෙන්ම පාර්ලිමේන්තු මැති ඇමතිවරු මහජනතාව සමඟ නිතර කටයුතු කරන හෙයින් කොවිඩ් එන්නත ලබාදීම ඊයේ (16) ආරම්භ වූ අතර එය සිකුරාදා (19) දක්වා ක්‍රියාත්මක බවද ඒ මහතා පැවැසීය.

කොළඹ යුද හමුදා රෝහලට පැමිණ අදාළ එන්නත ලබාගන්නා ලෙස සියලු මැති ඇමතිවරුන්ට දැනුම් දෙන බවද නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා වැඩිදුරටත් පැවසීය.

යතුරු පැදියක් බස් රියක ගැටී පොලිස් කොස්තාපල් මරුට

ඩී. එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

බිබිල මොනරාගල මාර්ගයේ කනුල්වෙල ප්‍රදේශයේදී ඊයේ (16) අලුයම පෞද්ගලික මගී ප්‍රවාහන බස් රථයක යතුරු පැදියක් ගැටීමෙන් යතුරු පැදියේ ගමන් කළ පොලිස් කොස්තාපල්වරයකු ජීවිතක්ෂයට පත්වී ඇතැයි බිබිල පොලිසිය පවසයි.

මෙලෙස ජීවිතක්ෂයට පත්ව ඇත්තේ ඇමැති ආරක්ෂක සේවයේ කොළඹ මූලස්ථානයේ සේවය කළ බිබිල නන්නපුරාව දෙකේ කණුව අසල පදිංචි පොලිස් කොස්තාපල් 7638 බලපිටිය ලියනගේ ධනුෂ්ක කුමාර පියදාස (35) නැමති දෙදරු පියෙකි.

හෙතෙම කොළඹ සේවා ස්ථානයේ සිට නිවාඩු ලබා සිය යතුරු පැදියෙන් නිවෙසට පැමිණෙමින් සිටියදී බිබිල මොනරාගල මාර්ගයේ කනුල්වෙල ප්‍රදේශයේදී කතරගම සිට යාපනය දක්වා ධාවනය වෙමින් තිබූ පෞද්ගලික බස් රථයක ඉදිරිපස මේ යතුරු පැදිය ගැටී ඇත. අනතුරෙන් බරපතළ තුවාල ලැබූ පොලිස් කොස්තාපල්වරයා බිබිල මූලික රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව මිය ගොස් ඇත.

බස් රථය සමඟ එහි රියැදුරු පොලිසියෙන් අත්අඩංගුවට ගෙන ඇත.

බිබිල පොලිසියේ රථවාහන අංශයේ ස්ථානාධිපති එච්. එම්. කෝලිත ධර්මසිරි මහතා සිද්ධිය පිළිබඳ පරීක්ෂණ පවත්වයි.

උතුරේ සමහර දෙමළ පුවත්පත් ත්‍රස්තවාදයට උඩගෙඩි දෙනවා

● ඇමැති කෙහෙළිය රඹුක්වැල්ල

අසේල කුරුළුවංශ

උතුරේ ඇතැම් දෙමළ පුවත්පත් ත්‍රස්තවාදයට උඩගෙඩි දෙමින් සිටින බවත් මාධ්‍ය නියාමනයකට යනවාට වඩා ඔවුන් තමන්ගේ සීමාවන් හඳුනාගෙන කටයුතු කිරීම වැදගත් බවත් ජනමාධ්‍ය ඇමැති කෙහෙළිය රඹුක්වැල්ල මහතා පවසයි.

ත්‍රස්තවාදයට උඩගෙඩි දෙන කල්ලි හා සංවිධාන ගණනාවක් මතු වුනද ත්‍රස්තවාදයට යළි හිස එසවීමට කිසිදු ඉඩක් නොදෙන්යේ යැයි ඒ මහතා කීය.

මහනුවර මැණික්හින්නේ දී පසුගියදා (14) පැවති ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු කාන්තා නියෝජිත හමුවෙන් අනතුරුව මාධ්‍ය හමුවේ ප්‍රකාශයක් කරමින් ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේය.

වසර තිහක් තිස්සේ පැවැති ත්‍රස්තවාදය හේතුවෙන් මෙරට සිවිල් ජනතාව බෙහෙවින්ම පීඩාවට පත්ව සිටි බවද රඹුක්වැල්ල මහතා කීය.

ත්‍රස්තවාදය මුළුමනින්ම පරාජය කිරීමෙන් පසු ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ලෙස කැටිපෝලයක් හෝ එසවීමට ඉඩක් නොතිබූ නමුත් යහපාලන සමයේ බුද්ධි අංශ දුර්වල කිරීම නිසා පාස්කු ප්‍රහාරය එල්ල වූ බවත් කී ඒ මහතා දැන් යළිත් මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කර තිබෙන බවද අවධාරණය කළේය.

ආණ්ඩුවට එරෙහි බලවේග එක්ව සිටින විට වෙනදාටත් වඩා ශක්තිමත්ව අපේ ගමන යා යුතුයි

● ඇමැති ජනක බණ්ඩාර තෙන්නකෝන්

මහින්ද අලුත්ගෙදර

ආණ්ඩුවට එරෙහි බලවේග සියල්ල එක කඳවුරකට එක්වී සිටින මේ මොහොතේ වෙනදාටත් වඩා ශක්තිමත්ව අපේ ගමන යා යුතු බව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන ඇමැති ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා ප්‍රකාශ කරයි.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ කිලෝ මීටර 6.5ක දුරකින් යුතු මොරගොල්ල හංදියේ සිට දඹගොල්ල දක්වා වූ මාර්ගය සංවර්ධනය කිරීමේ අවස්ථාවට එක් වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'ජනතාවගේ බහුතර කැමැත්තෙන් බලයට පත් වූ වත්මන් රජයේ ජනතාවාදී ගමන් මඟ නොරිස්සන පිරිසක් මේ රටේ සිටිනවා. මේ උදවියගේ දේශපාලන අනාථ වීම වළක්වා ගන්න අද විශාල පරිශ්‍රමයක් දරනවා.

ආණ්ඩුවට එරෙහි මේ ප්‍රතිගාමී බලවේග සියල්ල තමන්ගේ දේශපාලනික මතවාද පසෙක දමා අද රජයට එරෙහි ප්‍රචාරක කටයුත්තක නිරතව සිටිනවා. මේ සියල්ලන් එක මිටට තබා පරාජය කිරීමට මේ රටේ ප්‍රගතිගාමී ජනතාව වෙනදාට වඩා ශක්තිමත්ව එක් වීමේ අවශ්‍යතාවක් පවතිනවා.

රජය විසින් ක්‍රියාත්මක කරන ග්‍රාමීය මාර්ග කිලෝ මීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ මේ මාර්ගය සංවර්ධන කිරීම සිදු වෙනවා. මේ සංවර්ධනයත් සමඟ අවට ගම්මාන 6ක ජනතාවට සෙත සැලසෙනවා. අප රජයක් විදියට සෑම තීන්දුවක් ගන්නේ ජනතාවගේ පැත්තේ ඉඳලා. අද ජනාධිපතිවරයා ගම එක්ක සංවාදයක නිරත වෙමින් ගමේ ජනතාවගේ ගැටලු දැසින්ම දැක ඊට නිසි විසඳුම් දෙමින් ඉන්නවා. අප ඇමැතිවරුන් විදියට රජයේ ප්‍රතිපත්ති ජනතාවාදී මුහුණුවරකින් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. කොහොම වුණත් පරාජය වූ කොළ, රතු දේශපාලන පසමිතුරන් සියල්ලෝමත්, රටට ද්‍රෝහී දෙස් විදෙස් පිරිස් සියල්ලනුත් සමාජ මාධ්‍ය, විශාල වශයෙන් භාවිත කරමින් අසත්‍ය ප්‍රචාර ජනගත කරමින් ඉන්නවා.

අපට වුවමනා ස්වයං පෝෂිත ගමක් නිර්මාණය කිරීම. ඒ සඳහා මේ දමා තිබෙන අත්තිවාරම විශාල පිටිවහලක් වෙනවා.

පාස්කු වාර්තාව කාදිනල් හිමිපාණන්ට පිළිගැන්වීමට කටයුතු කරනවා

රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා

මහින්ද අලුත්ගෙදර

පාස්කු කොමිෂන් වාර්තාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කාදිනල් හිමිපාණන් වෙත ලබා දීමට කටයුතු කරන බව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා ප්‍රකාශ කරයි.

පාස්කු කොමිෂන් වාර්තාව ඉදිරි සතියේ දී කැබිනට් මණ්ඩලයට යොමු කිරීමෙන් පසු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් වෙත ලබාදෙනු ඇති බව ඒ මහතා සඳහන් කරයි.

රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා මේ බව සඳහන් කළේ දිවුලපිටිය, මාර්ග සංවර්ධන වැඩසටහන් ජනතා අයිතියට පත්කිරීමේ අවස්ථාවන්ට සහභාගී වෙමින් මාධ්‍යවේදීන් නැඟූ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා පෙන්වා දුන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ යනු අන්තවාදී හෝ ජාතිවාදී පක්ෂයක් නොවන බවත් සියලු ජාතීන් හා සියලු දෙනා එකතු කරගෙන යන පක්ෂයක් බවත්ය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ගමේ ජනතාව එක්ක ඉන්න පක්ෂයක් බව පෙන්වා දුන් ඇමැතිවරයා එනිසා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ දිනෙන් දින ඉහළට යන පක්ෂයක් බවද රටේ ජනතාවගේ ප්‍රශ්නවලට සවන් දී වැඩකරන පක්ෂයක් බවද සඳහන් කළේය. ලෝකයේ කිසිදු රටක්, කිසිදු ජාතියක්, කිසිදු පුද්ගලයකු තරහ කරගෙන යන පක්ෂයක් නොවන බවද හෙතෙම පෙන්වා දුන්නේය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අලුතින් පත්වුනු පසුපෙළ මන්ත්‍රීවරුන් පක්ෂයේ නායකත්වයේ අනුමැතිය මත තමා කණ්ඩායමක් විදියට එකතුවී සිටින බව සඳහන් කළ නිමල් ලාන්සා මහතා ඔවුන්ගේ ප්‍රශ්න ජනාධිපතිවරයාට, අගමැතිවරයාට, කැබිනට් අමාත්‍යවරුන්ට ඉදිරිපත් කර ජනතාව වෙනුවෙන් අවස්ථාවක් ගන්න එකතුවී සිටින බවද පැවසීය.

හැම ආණ්ඩුවකම මල්බෙරි කණ්ඩායම්, ඉඟුරු කල්ලි සිටි බව සිහිපත් කළ රාජ්‍ය ඇමැතිවරයා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මේ කණ්ඩායම එකතුවුනේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ශක්තිමත් කරන්න, ආණ්ඩුව ශක්තිමත් කරන්න මෙන්ම ජනාධිපතිවරයාට ශක්තියක් වීමට සඳහන් කළේය.

කොවිඩ් මර්දනයෙන් ආණ්ඩුව අසාර්ථකයි

● වෛද්‍ය නලින්ද ජයතිස්ස

ආණ්ඩුව කොරෝනා සමඟ ව්‍යාපාරයක් සිදු කරන බව ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික, වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා පැවසීය.

පසුගිදා පැවැති මාධ්‍ය සාකච්ඡාවකට එක්වෙමින් ජයතිස්ස මහතා මේ බව අවධාරණය කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ හිටපු මන්ත්‍රීවරයා මෙසේ ද කිවේය.

ආණ්ඩුව එක පැත්තකින් වෛරස මර්දනය අත්හැර ඇති බව ජනතාවට පේනවා. අනික් පැත්තෙන් ව්‍යාපාරික වළල්ලකට ජාවාරමක් කරගන්න ඉඩදීලා වෛරසය මර්දනය කිරීම සම්බන්ධයෙන් කිසිම වගකීමක් දරන්නේ නැහැ. මේ නිසාම පාසල්වල ඉඳලා විශ්වවිද්‍යාල දක්වා අධ්‍යාපනය බිඳවැටිලා. අන්තර්ජාල අධ්‍යාපනය කොළඹ දිස්ත්‍රික්කයට පවා ප්‍රවේශ වීමේ නොහැකියාවක් තිබෙනවා. මේ තත්ත්වය යටතේ අර්බුදකාරී අවස්ථාවක දරුවන්ට අත්‍යාවශ්‍ය මූලික අධ්‍යාපනය ලබාදීමට විෂය නිර්දේශ සංශෝධනය කළ යුතුව තිබෙනවා. කොවිඩ්වලට කලින් පවා තිබුණු අධ්‍යාපනයේ විෂමතාවය දැන් ඉතා වේගයෙන් වැඩිවෙලා. අධ්‍යාපනය සඳහා දරුවන්ගේ ප්‍රවේශය සහතික කරන එක ආණ්ඩුවේ වගකීමක්.

එන්නත ලංකාවට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් මිස මූලික ක්‍රියාමාර්ගවත් මේ වනවිට අරගෙන නැහැ. එය ලංකාවට ලබාගැනීම සහ බෙදාහැරීම කියන මූලික කරුණු දෙක ගැන අවධානය යොමුකළ යුතුයි. 2021 වසරේදී එන්නත් බිලියන 08ක් නිෂ්පාදනය කරන්න නියමිත බව ලෝක සෞඛ්‍ය සංවිධානය කියනවා. ලෝකයේ අඩු ආදායම් ලබන රටවල ජනගහනයෙන් 20%ක් ලබාදෙන්න කියලා එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉල්ලීමක් කර තිබෙනවා. අපේ රටට එන්නත් ගෙන්වාගෙන ජනතාවට ලබාදීම සඳහා සෞඛ්‍ය කාර්ය මණ්ඩල සූදානම් කරන්න ඕනෑ. එන්නත ලබාගන්නා විට ඊට අදාල සියලුම පසුබිම් කටයුතු සූදානම් කර තියන්න ඕනෑ. නමුත් වෙනත් කරුණුවලදී ආණ්ඩුව අසාර්ථක වෙලා තියෙනවා වගේම කොවිඩ් මර්දනයේදී අසාර්ථක බව පැහැදිලියි. නමුත් කළ යුතු වන්නේ රාජ්‍ය යාන්ත්‍රණයට නායකත්වය දීම සෞඛ්‍ය අංශත් එක්ක ජනතාව මේ වෙනුවෙන් පෙළ ගැස්වීමයි.

කොරෝනා ඇතිවූ අවස්ථාවේ ඒ පිළිබඳව තිබුණු දැනුම ඉතාම අවමයි. උදාහරණයක් හැටියට මේ වෛරසය වාතයට නිරාවණයවී කොතරම් වෙලාවක් තියෙනවාද කියලා නිශ්චිත අදහසක් තිබුණේ නැහැ. නමුත් මේ වනවිට පර්යේෂණ පත්‍රිකා අසූදාහක් අනූදාහක් විතර සකස් වී තිබෙනවා. ඒ වගේම මේ වෙලාවේදී ගන්නා නිගමන ඉදිරියේදී වෙනස් වෙන්නත් පුළුවන්. විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුව තීන්දු ගැනීමේදී, වෛරසයේ ස්වභාවය අනුවත් කලින් ගත් තීන්දු වෙනස් නොකර ඉන්න හේතුවක් නැහැ. මේ නිසා මළ සිරුරු භූමදානය කරනවාද කියන එක ගැන දේශපාලන තීන්දුවක් ගන්න බැහැ. මේක වෛරස විද්‍යාඥයන් සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාඥයන් වගේම ප්‍රතිශක්තිකරණය පිළිබඳ විද්‍යාඥයන් එකතුවී ගතයුතු සාමූහික තීරණයක්. ආණ්ඩුවක් විසින් ක්‍රියාත්මක කළ යුත්තේ මේ ගන්නා තීරණයි.

යහපාලන නඩය දේශපාලන වාසි ගන්න කාන්තාවන් වෙනුවෙන් කිඹුල් කදුළු හෙළනවා

● රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත

මල්වාන සමූහ මහානාම විතානගේ හා දෙල්ගොඩ සමූහ සුදත් පුබුදු කීර්ති

පසුගිය යහපාලන රජය කාලයේ මේ රටේ කාන්තාවන්ගේ අභිවෘද්ධිය උදෙසා කිසිම වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොකළ එම උදවිය අද දේශපාලන වාසි ලබා ගෙන ශක්තිමත්වීම සඳහා කාන්තාවන් වෙනුවෙන් කිඹුල් කදුළු හෙළීමට පටන් ගෙන ඇතැයි ද නමුත් ඒවාට කාන්තාවන් මුලා නොවිය යුතු යැයි ද කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත මහතා පැවසීය.

රාජ්‍ය ඇමති වරයා එසේ පැවසුවේ පෙරේදා (14) පස්වරුවේ සියඹලාපේවත්ත ටැමරින් උත්සව ශාලාවේ පැවති ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ බියගම ආසන කාන්තා සම්මේලනයට ප්‍රධාන ආරාධිතයා ලෙස එක් වෙමිනි.

මෙහිදී රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

මෙතෙක් බලයට පත් වූ සෑම රජයක් මෙන්ම දේශපාලකයන් මැතිවරණ කාලයට කාන්තාවන් ගැන විවිධ පොරොන්දු දෙමින් ඔවුන්ගේ ජන්දය ලබා ගන්නවා. නමුත් බලයට පත් වීමෙන් පසුව කාන්තාව අමතක කර දමනවා. මේ බව වටහාගත් වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් සිය සෞභාග්‍යය දැක්ම තුළින් කාන්තාවන් ශක්තිමත් කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙනවා. ඒ සඳහා එතුමා විසින් විද්‍යානුකූලව කාන්තා අමාත්‍යාංශය නිර්මාණය කළා.

ඉතින් මේ කාන්තා අමාත්‍යාංශය මට ලබා දුන්නා.මා සිතන හැටියට මගේ මේ අමාත්‍යාංශය විතරක් නෙමෙයි එතුමා විසින් සියලුම අමාත්‍යාංශ නිර්මාණය කෙළේ ද විද්‍යානුකූලවයි.මේ රටේ දරුවකුට හෝ කාන්තාවකට යම් සිද්ධියක් සිදු වූවානම් මා එතැන ඔවුන් වෙනුවෙන් පෙනී සිටිනවා. ඊට හේතුව මේ රටේ බලය ලබා ගැනීම සඳහා කාන්තාවන්ගේ පූර්ණ දායකත්වය ලැබී තිබෙන නිසයි. ඒ නිසා මගේ මේ අමාත්‍යාංශය කටයුතු කරන්නේ දරුවන් හා කාන්තාවන් වෙනුවෙන් හෙට දිනයේ ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ ගැනයි.

ඉතින් මා මේ කාන්තා සම්මේලනයට ආවේ දේශපාලනය ගැන කතා කරන්නට නෙමෙයි. මගේ අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන එම වැඩපිළිවෙළ ගැන කතා කරන්නටයි.

අපි කාන්තාවන් වෙනුවෙන් කතා කරන්නට ඕනේ ජාතික කාන්තා දිනයට පමණක් නෙමෙයි. අපි වසරේ 365 දිනයම කාන්තාවන් හා දරුවන් වෙනුවෙන් අවධානය යොමු කරන්නට ඕනෑ. ඒ අනුව මේ වසරේ ජාතික කාන්තා දිනය එදිනට පමණක් සීමා නොකොට කාන්තාවන් වෙනුවෙන් වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කර තිබෙනවා. ඒ තුළින් මේ රටේ කාන්තාවන්ගේ ආර්ථිකය ශක්තිමත් කරමින් අභිමානවත් කාන්තා පරපුරක් බිහි කිරීමට රජය කටයුතු කරනවා.

මේ රටේ වවිනාම සම්පත වන්නේ දරු පරපුරයි. ඒ නිසා දරුවන් තුළ දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය කරන්නට ඕනෑ. එසේ නොකළහොත් රට මහත් විනාශයකට පත් වෙනවා. ඒ නිසා දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවන්නට ද පියවර ගෙන තිබෙනවා. ඒ අනුව මගේ අමාත්‍යාංශය මඟින් දිවයිනේ තෝරාගත් පාසල් 250 කට වසරක් සඳහා සනීපාරක්ෂක භාණ්ඩ හා ප්‍රථමාධාර ලබා දීමට කටයුතු කර තිබෙනවා.

තවද කාන්තාවන්ගේ ගෘහ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඔවුන් ස්වයං රැකියාවලට යොමු කරනවා. ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය වන ව්‍යාත්තීය පුහුණුව ලබා දෙනවා. ණය ආධාර හා පහසුකම් ලබා දෙනවා. ඒ වගේම විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ට ද විශේෂ හැකියාවන් තිබෙනවා. එම කාන්තාවන් ද අපි හඳුනාගෙන ඔවුන් සමාජයෙන් කොන්වීමට ඉඩ නොතබා ඔවුන් ද ඉදිරියට ගෙන ඒමට කටයුතු කරනවා. සෑම පළාතකම කාන්තා රැදවුම් මධ්‍යස්ථාන ආරම්භ කරනවා.

අද කාන්තාවන් අපයෝජනයට ලක්වන අවස්ථාවන් ගැන ද අපට නිතරම පාහේ අසන්නට ලැබෙනවා. එම කාන්තාවන්ට නීතියේ පිහිට කඩිනමින් ලබා දීමට කටයුතු කරනවා. ඒ සම්බන්ධව අධිකරණයේ පවතින නඩුවල ප්‍රමාදයන් අවම කිරීමට කටයුතු කරනවා. මේ ආකාරයට කාන්තාවන් බලගන්වන වැඩ පිළිවෙළකට අවධානය යොමු කරමින් මුලු රටේම කාන්තාවන්ට සුබ අනාගතයක් නිර්මාණය කිරීමට රජය කටයුතු කරනවා. එපමණක් නොව විදේ දරුවන් හා අපයෝජනයට ලක් වන දරුවන් ද එයින් මුදා ගෙන ඔවුන් සඳහා ද ලොකු වෙනසක් ඇති කිරීමට රජය පියවර ගන්නවා.

බියගම පාදේශීය සභාවේ සභාපති ආනන්ද ගනේපොල , හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ඩුලීප් විජේසේකර , හා හිටපු බස්නාහිර පළාත් සභා මන්ත්‍රී ගුණසිරි ජයනාත් යන මහත්වරුන් ද කාන්තා හා ළමා සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික කාන්තා කමිටු සභාපතිනි බියුටිස් දිසානායක , ශ්‍රී ලංකා කජු සංස්ථාවේ නියෝජ්‍ය සභාපතිනි අශෝකා ලංකාතිලක හා බියගම කාන්තා බල මණ්ඩලයේ උප ලේකම් රොෂේන් වැලිෂීයා කර්න් යන මහත්මිහු ද කතා කළහ.

බියගම ප්‍රාදේශීය සභාවේ උප සභාපති අජිත් කුමාර මහතා ඇතුළු පාදේශීය සභා මන්ත්‍රීවරුන් ද රාජ්‍ය ඇමැතිවරයාගේ බිරිය ඉෂාරා නිශාන්ත හා කෝටේ මහා නගර සභාවේ නාගරික මන්ත්‍රීනී මදුෂා ගුණසේකර යන මහත්මිහු ද මේ අවස්ථාවට සහභාගී වුහ.

චීනයෙන් - සෝවියට් දේශයෙන් කොවිඩ් ආධාර එන්නත් ලැබුණේ නැහැ

● මහරගම එජාප ප්‍රධාන සංවිධායක නීතිඥ සුදත් ජයසුන්දර

මැදකොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ

චීනය සහ සෝවියට් දේශය යන රටවල් දෙකෙන් ද අප රටේ ජනතාව සඳහා ගෝඨාභය රාජපක්ෂ මහතා එම රටවල්වල නායකයින්ගෙන් ඉල්ලා සිටියත් මේ දක්වා අපේ රටට ආධාරයක් ලෙස මෙතෙක් ලැබී නැත්තේ ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් එම කොවිඩ් නිපැයුම් කිසිවක් මේ වනතෙක් අනුමැතියක් ලබා නොදීමෙන් ශ්‍රී ලංකාවට එම ආධාර එන්නත් නොලැබී ඇතැයි මහරගම එජාප ප්‍රධාන සංවිධායක නීතිඥ සුදත් ජයසුන්දර මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා මෙම ප්‍රකාශය කළේ පිටකෝට්ටේ සිරිකොත මන්දිරයේ පැවැති මාධ්‍ය හමුවේදීය.

මාධ්‍යවේදියෙකුගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් නීතිඥ සුදත් ජයසුන්දර මහතා මෙසේ ද කීය.

කොවිඩ් 19 වසංගතයට ප්‍රතිකාර ලෙස ඉන්දියාවෙන් ගෙන්වන ලද එන්නත දෙන්න පටන් ගත්තා. මුලින්ම සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රධාන සෞඛ්‍ය ක්ෂේත්‍රයටත්, යුද හමුදාව ප්‍රධාන ත්‍රිවිධ හමුදාවට පොලිසියට එන්නත ලබා දී තිබෙනවා. වයස අවුරුදු 60න් ඉහළ රටේ සෑම ජනකොටසකටම ලබාදීමට මේ වන විට පියවරගෙන තිබුණත් තවම වැඩපිළිවෙළක් නොමැති බව ද හෙතෙම පෙන්වා දුන්නේය.

ඔක්ස්ෆර්ඩ් එන්නත පිළිබඳව අපට තිබෙන ගැටලුව නම් මෙතෙක් එය ලබාදීමට ගන්නා ලද පියවරයන් ප්‍රමාදව පවතින බව සඳහන් කළ මහරගම එජාප ප්‍රධාන සංවිධායකවරයා චීන ජනරජයෙන් ද කොවිඩ් 19 එන්නත් ලක්ෂ 03ක් දෙන බව කීවත් මෙතෙක් ලැබී නොමැති බව ද හෙතෙම සඳහන් කළේය.

මුළු බස්නාහිර පළාතටම කොවිඩ් 19 එන්නත් ලබාදෙන බව ප්‍රකාශකොට ඇතත් එය ජනතාවට ලබාදෙන්නේ කොහොමද? ඒ සඳහා වැය කරන්නේ කවුද? යන්න තවමත් පැහැදිලිව ප්‍රකාශකොට නැතත් දිනපතාම අසාදිතයන් 500කට ඉහළ ප්‍රමාණයක් දිනපතා මරණ තුනක් හෝ පහක් ඇතිවන බව ද නීතිඥ සුදත් ජයසුන්දර මහතා කියා සිටියේය.

මෙරටට ගෙන්වන ලද කොවිඩ් 19 එන්නතෙන් 12,000ක ප්‍රමාණයක් මේ වන විට පාවිච්චි කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව තිබෙන බවට ආරංචියක් ලැබී තිබෙන බවත්, එම සියලුම එන්නත් පිළිබඳව අපේ රට දැනුවත් කිරීමක් නැහැ. එන්නත් බස්නාහිර පළාතේ සෑම ජනකොටසකටම ලබාදෙන බව කීවත් එය ලබාදෙන ආකාරය පිළිබඳව මෙතෙක් පැහැදිලි කිරීමක් නොමැති බව ද කොවිඩ් එන්නත ලබාගැනීම සඳහා පැවසූ ලියාපදිංචි කිරීමේ කාර්යයන් ගැනවත් රටේ ජනතාව මේ දක්වා දැනුම්වත්කොට නැති බව ද හෙතෙම සඳහන් කළේය.

විස්ස නැතිව බෑ කී ආණ්ඩුව දැන් වැඩ කරනවාද ?

● පාර්ලිමේන්තු මන්ත්‍රී ජේ. සී. අලවතුවල

මල්ලවපිටිය සමූහ අනුර දිසානායක

ජනාධිපතිවරයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අගමැති එක්සත් ජාතික පක්ෂයේ නිසා මේ රටේ වැඩ කරන්න බැහැ කිව්ව. ජනාධිපති අගමැති දෙන්න දෙපැත්තේ ඉන්න නිසා වැඩ කරන්න බැහැ කිව්ව. එදා එහෙම කියලා බලය ලබා ගත්තා.

මේ රජය දැන් මොකද කියන්නේ. ජනතාවට පසුගිය ජනාධිපතිවරණය දක්වාම කිව්වේ ඔය කතාව. අද ජනාධිපතිවරණය ජය ගෙන ඒත් මදි කියලා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් ලබාගෙන ඊට පස්සේ 20 සංශෝධනය නැතුව බෑ කියලා පාර්ලිමේන්තුවේ 20 සම්මත කරගෙන වැඩ කරන්න පුළුවන් කිව්ව රජයට මොකද වෙලා තියෙන්නෙ යැයි සමඟි ජන බලවේගය කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කේ. සී. අලවතුවල මහතා පසුගියදා (14) කුරුණෑගල දී පැවැති මාධ්‍ය හමුවකදී පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් රට තුළ පවතින ගැටලු කීපයක් පිළිබඳව මෙසේද පැවසීය.

ජනතාව රවටවන බොරු කන්දරාවක් කියා බලය ලබා ගත්ත රජය කොරෝනා වසංගතයට පැණියක් හදලා ඒක රට වටේ අරගෙන ගියා. රටේම ජනතාව ඒ දෙසට අවධානය යොමු කළා. කාලෙන් කාලෙට එක එක නාටක අරගෙන මේ රජය ජනතාව රවටවනවා. ඊට පස්සේ නැගෙනහිර ජැටිය සම්බන්ධ නාටකයක් රඟ දැක්වුවා. දැන් වීරවංශ නාටකය රඟදක්වනවා. විමල් වීරවංශ ප්‍රසිද්ධ රංගනයක යෙදෙනවා. මේ ජනතාවගේ ප්‍රශ්න අමතක කරවන්න. දැන් කාටද බැරි. අයියට ද බැරි මල්ලිටද බැරි . රටේ ප්‍රශ්න විසඳන්න සියලු බලය ලැබිලා තියෙනවා. රට අමාරු තැනකට වැටිලා. 1 ට ද බැරි 2ටද බැරි කියලා අපි රජයෙන් අහනවා. ජනතාව රවටවන බොරු සන්දර්ශන එපා. දැන් ජනතාව කබලෙන් ලිපට වැටිලා ඉන්නේ. ජනතාවට සිද්ධ වෙලා තියෙනවා දැන් නායකයන්ගේ ප්‍රශ්න විසඳන්න.

දැන් රජයට ගැසට් ගැහිල්ල ඇර වෙන වැඩක් නැහැ බඩුමිල සම්බන්ධයෙනුත් එහෙමයි.ජනතාවට සහනයක් ලැබුණේ නැහැ. නමුත් නායකයන්ගෙ ගජ මිතුරන්ට වාසි ලැබුණා. සතපහක්වත් සීනි මිල අඩු වුණේ නැහැ. ටයිල් වලටත් එහෙමයි ගැසට් එකක් ගැහුවා පැය ගානකින් ඉවත් කරගත්තා. සාමාන්‍ය මනුස්සයෙක් නිවසක් හදන්න ගියොත් ගොඩනැගිලි ද්‍රව්‍ය තුන් හතර ගුණයකින් ඉහළ ගිහින්. රැකියා විශාල සංඛ්‍යාවක් අහිමි වෙලා. ඒ සියල්ල අතරේ ඊයේ පෙරේදා අගමැති මුදල් ඇමතිවිදිහට වෙළඳ ඇමතිගේ ඉල්ලීමක් අනුව භාණ්ඩ 27 කට පාලන මිලක් දාලා ගැසට් එකක් ගැහුවා. ඒ භාණ්ඩ වෙළඳපොළේ ගන්නත් නැහැ. ඒ මිලට භාණ්ඩ ගන්නත් නෑ. ඒ භාණ්ඩ කොහෙන්ද ගන්න තියෙන්නෙ කියලා වෙළඳ ඇමැතිගෙන් අහන්න වෙනවා. රුපියල් 2500 කන්න පුළුවන් කියපු වෙළඳ ඇමැති බන්දුල ගුණවර්ධන මහතා දැන් ඉන්නේ. එතුමාගෙන් අපිට අහන්න සිද්ධ වෙනවා ඔය භාණ්ඩ කොහෙද ගන්න තියෙන්නෙ කියලා.

නොයෙකුත් දේවල් ජනතාවට කියලා බලයට ආපු රජය දැන් කණ්ඩායම් තුනකට බෙදිලා. ජනතාවගේ ප්‍රශ්න පැත්තක තියලා ඒ අය ප්‍රශ්න විසඳගන්න බැරුව බල අරගලයක යෙදිලා. ඒ නිසා අපි රජයේ ලොකු කුඩා කණ්ඩායම් සියල්ලටම කියනවා නායකයන්ගේ බල අරගලය පැත්තක තියලා අසරණ ජනතාව ජීවත් කරවන්න කියන එක.

දේශීය නිෂ්පාදකයන් නගාසිටුවන්න ඕන. ආරක්ෂා කරන්න ඕන. අපි කැමතියි ඒකට සහාය දෙන්න. ටයිල් නිෂ්පාදකයෝ ඉන්නෙ සුළු ප්‍රමාණයක්. කීප දෙනයි ඉන්නේ. රටේ අවශ්‍යතාවයෙන් 50% ක් වත් මේ රටේ නිෂ්පාදනය වෙන්නේ නෑ. එතකොට ඉතිරි අවශ්‍යතාවය සපුරා ගන්නේ කොහෙන්ද. ඒ නිසා අද ටයිල් මිල තුන් හතර ගුණයකින් වැඩිවෙලා. ඒකෙන් වෙන්නේ පාරිභෝගිකයා හූරන් කන එක .දේශීය නිෂ්පාදන මුවාවෙන් ගජ මිතුරන් කීප දෙනකුට ජනතාව හූරන් කන්න ඉඩ දීලා බලාගෙන ඉන්නවා. මෙවැනි කාරණා හැම ක්ෂේත්‍රයකින්ම වර්තමානයේ අපිට දකින්න තියෙනවා.

භාණ්ඩ මිල ඉහළ යාම නිසා ජනතාවට තුන්වේල තියා එක වේලක්වත් කන්න බැරිවෙලා තියෙනවා. බන්දුල ගුණවර්ධන භාණ්ඩ 27 ක මිල අඩු කරල කියලා සතොසෙන් ගිහින් ගන්න කියනවා. සතොසක් හොයාගෙන කිලෝමීටර් 10 ක් 15 ක් යන්න වෙලා. සාමාන්‍ය වෙළඳපොළේ මේ භාණ්ඩ ගන්න නැහැ. එතකොට අද ජනතාව මිල නිසා පීඩාවට පත්වෙනවා.අනෙක් පැත්තෙන් ගැසට් සෙල්ලම නිසා භාණ්ඩ හිගයක් නිර්මාණය වෙලා. නැත්නම් එම භාණ්ඩ වෙනත් වෙළඳසලකින් ගන්න නැති තැනකට පත් වෙලා. මේ නිසා ජනතාව දැඩි අසහනකාරී තත්ත්වයකට පත්වෙලා තියෙනවා කියන එක රජයට අවධාරණය කරනවා.

sports.dinamina@lakehouse.lk

පුහුණුවකින් තොරව තරග කිරීමේ අභියෝගය ජය ගැනීමට

මෝටර් රථ සහ යතුරුපැදි ක්‍රීඩකයෝ 27 දා එළියකන්දට යති

ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ ප්‍රධාන අලෙවි නිලධාරි ප්‍රභාත් දහනායක මහතා සඳර්න් මෝටර්ස් ස්පෝර්ට්ස් සංගමයේ සභාපති ආචාර්ය සංජය සේදර සෙනරත් මහතාට තරගාවලියේ අනුග්‍රාහකත්වය පිරිනැමූ අයුරු. ටෙලිකොම් සමාගමේ නියෝජ්‍ය ප්‍රධාන අලෙවි නිලධාරි රෝහණ එල්ලාවල, සඳර්න් මෝටර්ස් ස්පෝර්ට්ස් සංගමයේ හිටපු සභාපති අෂ්හර් හම්මී මහත්වරු ද මෙහි වෙති.

ඡායාරූපය-සාලිය රූපසිංහ

ෆවුස් මොහොමඩ්

25 වැනි වරටත් පැවත්වෙන එළියකන්ද කඳු තරණය මෝටර් රථ සහ යතුරු පැදි තරගාවලියේදී ක්‍රීඩකයන්ට පුහුණුවීමට අවස්ථාවක් නොලැබීම අභියෝගයක් බවට පත් වී ඇතැයි එම තරගාවලි ඉතිහාසයේ මෝටර් රථ තරග අංශයේ වේගවත්ම ධාවන ශූරයා වන ඩිලාන් සෙනෙවිරත්න පවසයි. කොවිඩ් වසංගතය හේතුවෙන් පසුගිය වසරේ දැඩි පසුබෑමකට ලක් වූ මෙරට මෝටර් රථ සහ යතුරු පැදි ක්‍රීඩාව නැවත පණ ගන්වමින් මේ මස 27 සහ 28 දෙදින පැවත්වෙන එළියකන්ද කඳු තරණයේදී මීට පෙර පළමු දිනය කාල ගණනය සහ පුහුණුවීම් සඳහා වෙන්කර තිබුණත් මෙවර කොවිඩ් වසංගතය හේතුවෙන් මෝටර් රථ සහ යතුරු පැදි තරග වෙන් වෙන්ව පැවැත්වීමෙන් එම දින දෙකම තරග සඳහා වෙන් කර තිබේ. ඒ අනුව ක්‍රීඩකයන්ට තරගයට එක්වීමට සිදු වී ඇත්තේ පුහුණුවීමකින් තොරවය.

එළියකන්ද කඳු තරණයේ ඉතිහාසයේ වේගවත්ම මෝටර් රථ ධාවකයාගේ වාර්තාව උසුලන ඩිලාන් සෙනෙවිරත්න ඒ සඳහා වැය කළ කාලය තත්පර 32.42කි. එහි වේගවත්ම යතුරුපැදි ධාවකයාගේ වාර්තාවට හිමිකම් කියන සංගීත් සූරියගේ ඒ සඳහා තත්පර 33.75ක් වැය කර තිබේ.

සෞඛ්‍ය නීති රෙගුලාසි මත සියලු තරගකරුවන්ගේ සහායක කණ්ඩායම් දෙදෙනකුට පමණක් සීමා කර ඇති අතර, ඊට කාර්මික ශිල්පියා සහ තවත් සහායකයකුට අවසර ලැබෙනු ඇත. එමෙන්ම සංවිධායක මණ්ඩලයේ සාමාජිකයන් ප්‍රමාණයත් සීමා කර ඇති අතර, ජයග්‍රාහකයන්ට සහතිකපත් පවා එම අවස්ථාවේ ප්‍රදානය නොකෙරේ. එම සහතිකපත් පසුව තැපැල් මඟින් යැවීමට සංවිධායකයන් වන සඳර්න් මෝටර්ස් ස්පෝර්ට්ස් සංගමය තීරණය කර ඇත.

කොවිඩ් වසංගතය හේතුවෙන් මෙරට මෝටර් රථ ක්‍රීඩාව පසුගිය වසරේ පසුබෑමකට ලක් වුවද, එළියකන්ද කඳු තරණය පමණක් පැවැත්වීමට සඳර්න් මෝටර්ස් ස්පෝර්ට්ස් සංගමයට හැකි වූයේ එම තරගාවලිය කොවිඩ් වසංගතයට පෙර නිමාවට පත්වීම හේතුවෙනි.

සෞඛ්‍ය අංශ ලබා දී ඇති මාර්ගෝපදේශ යටතේ පැවත්වෙන එළියකන්ද කඳු තරණයට අටවැනි වරටත් අනුග්‍රාහකත්වය ලබා දීමට ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම ඉදිරිපත් වී සිටී. ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් ස්පීඩ්අප් සන්නාමය යටතේ පැවත්වෙන එළියකන්ද කඳු තරණය පිළිබඳ ඊයේ ටෙලිකොම් සමාගමේ ශ්‍රවණාගාරයේදී පැවති මාධ්‍ය හමුවට එක් වූ වේගවත්ම යතුරුපැදි ධාවකයාගේ වාර්තාවට හිමිකම් කියන සංගීත් සූරියගේ පවසා සිටියේ වසරක කාලයක් කිසිදු තරගාවලියක් නොපැවත්වූ බැවින් මෝටර් රථ සහ යතුරුපැදි ක්‍රීඩකයන් මෝටර් රථ තරග ඉසව් 17ක් සහ යතුරුපැදි තරග ඉසව් 16ක් ඇතුළත් එළියකන්ද කඳු තරණයට එක් වීමට දැඩි උනන්දුවකින් පසු වන බවය.

පිහිනුම් ශූරයා අත්අඩංගුවට

ඔස්ට්‍රේලියානු ඔලිම්පික් රිදී පදක්කම් ලාභී පිහිනුම් ශූරයකු වූ ස්කොට් මිලර් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ චෝදනාවකට සිඩ්නි පොලිසිය මඟින් ඊයේ අත්අඩංගුවට ගත්තේය.

1996 ඇට්ලන්ටා ඔලිම්පික් උලෙළේදී මීටර් 100 සමනල ආර ඉසව්වෙන් රිදී පදක්කමක් සහ මීටර් 100 සහාය මෙඩ්ලි තරග ඉසව්වෙන් ලෝකඩ පදක්කමක් දිනූ 45 හැවිරිදි මිලර් අමෙරිකානු ඩොලර් මිලියන 2ක වටිනාකමකින් යුතු 'අයිස්' මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරමින් සිටියදී සිඩ්නි පොලිසියට හසු විය.

ඉන්දියාව ටෙස්ට් තරගමාලාව සම කරයි

අක්ෂාර් පටේල්

පන්දුවෙන් සහ පිත්තෙන් රවිචන්ද්‍රන් අශ්වින් දැක්වූ විශිෂ්ට දස්කම් සහ සිය මංගල ටෙස්ට් තරගයේදීම අක්ෂාර් පටේල් සුපිරි පන්දු යැවීමක නිරත වීම නිසා සංචාරක එංගලන්ත පිලට එරෙහිව චෙන්නායි නුවර පැවති දෙවැනි ටෙස්ට් තරගයේ දිනයක් ඉතිරිව තිබියදීම ලකුණු 317ක දැවැන්ත ජයක් අත්කර ගැනීමට ඉන්දියාව සමත් විය. ඉන්දීය පිල ලබා දුන් ලකුණු 482ක ඉලක්කය හඹා ගිය එංගලන්ත පිල ඊයේ ලකුණු 164කට දැවී ගියේය.

එංගලන්ත පළමු ඉනිමෙන් කඩුලු 5ක්ද, දෙවැනි ඉනිමෙන් කඩුලු 3ක්ද උදුරාගත් අශ්වින් ඉන්දීය දෙවැනි ඉනිම වර්ණවත් කරමින් විශිෂ්ට ශතකයක් වාර්තා කළ අතර, එංගලන්ත දෙවැනි ඉනිම සුනුවිසුනු කළ වමතින් දඟපන්දු යවන 27 හැවිරිදි අක්ෂාර් පටේල් මංගල ටෙස්ට් තරගයේදීම කඩුලු 5ක් දවාලමින් ජයග්‍රහණයට කදිම දායකත්වයක් දුන්නේය.

මේ ජයග්‍රහණයත් සමග තරග 4කින් සමන්විත දෙපිල අතර ටෙස්ට් තරගමාලාව 1-1ක් ලෙස සමකර ගැනීමට ද ඉන්දීය පිලට හැකි විය.

තරගයේ තුන්වැනි දිනය වූ පෙරේදා ලකුණු 53කට එංගලන්ත පිලේ කඩුලු 3ක් බිඳ වැටී තිබූ අතර, ඊයේ දිවා ආහාරයට පෙර තවත් කඩුලු 4ක් බිඳ වැටීමෙන් දැඩි අසරණ තත්ත්වයට පත්ව තිබිණි. දිවා ආහාරයෙන් මොහොතකට පසු එංගලන්ත දෙවැනි ඉනිම ලකුණු 164කට සීමා කරමින් පටේල් ලකුණු 60කට කඩුලු 5ක් දවාලූ අතර, අශ්වින් කඩුලු 3ක් බිඳ දැමුවේ ලකුණු 53කටය.

තරගය පුරා කඩුලු 8ක් දවාලමින් පන්දුවෙන් ද, ඉන්දීය දෙවැනි ඉනිමේදී ශතකයක් රැස් කරමින් පිත්තෙන් ද අශ්වින් දැක්වූ දක්ෂතා හේතුවෙන් තරගයේ විරයා සම්මානයෙන් පිදුම් ලැබුවේය.

දෙපිල අතර තුන්වැනි ටෙස්ට් තරගය මේ මස 24 වැනිදා අහමදාබාද් නුවරදී ආරම්භ වන්නේ දිවා රාත්‍රී තරගයක් ලෙසිනි.

එංගලන්තය 'සික්ස් නේෂන්ස්' පළමු ජය ලබයි

ජොනී මේ තැබූ විස්මිත උත්සාහක දිනුම

ජොනී මේ තැබූ විස්මිත උත්සාහක දිනුමකින් වර්ණවත් වූ සික්ස් නේෂන්ස් රග්බි තරගාවලියේ ඉතාලිය සමඟ ටිවික්නැම් නුවර පැවැති තරගය ලකුණු 41-18කින් ජය ගැනීමට එංගලන්තය සමත් විය. එංගලන්තය, ඉතාලිය, අයර්ලන්තය, ස්කොට්ලන්තය, ප්‍රංසය සහ වේල්සය තරග වදින සික්ස් නේෂන්ස් රග්බි තරගාවලියේ එංගලන්තය ලැබූ මේ ජයග්‍රහණයත් සමඟ ප්‍රසාද ලකුණු සටහනේ දෙවැනි තැනට පත් විය. ගෝල් 4ක්, උත්සාහක දිනුම් 2ක් සහ දඬුවම් පහරක් එංගලන්ත පිලට එක් වූ අතර, ඉතාලිය ලැබුවේ ගෝලයක්, උත්සාහක දිනුමක් සහ දඬුවම් පහර 2ක් පමණි. තරගයේ 3 වැනි මිනිත්තුවේදීම මොන්ට් ලෝන් උත්සාහක දිනුමක් තබමින් ඉතාලිය ඉදිරියට රැගෙන ගියත්, පළමු භාගය නිමා වන විට ලකුණු 20-8කින් පෙරමුණ ගත් සත්කාරක එංගලන්තයට තරගය ජය ගැනීමට විශිෂ්ට දායකත්වයක් දුන් ජොනී හිල්, ජොනී මේ, ජැක් විලිස්, එලියට ඩැලේ සහ ඇන්තනී වොට්සන් සමත් වූහ. තරගයේ 26 වැනි මිනිත්තුවේදී සහ 50 වැනි මිනිත්තුවේදී එංගලන්තය වාර්තා කළ උත්සාහක දිනුම් දෙකම තබනු ලැබුවේ වොට්සන් විසිනි. එංගලන්ත පිලේ නායක ඔවන් ෆැරල් උත්සාහක දිනුම් 4ක් ගෝල බවට පත් කළ අතර, දඬුවම් පහරක් ද සාර්ථක කර ගත්තේය.

කිංග්ස් පන්ජාබි අලුත් වෙයි

අයිපීඑල් තරගාවලියේ ප්‍රබල කණ්ඩායමක් වන කිංග්ස් XI පන්ජාබ් කණ්ඩායමේ නම වෙනස් කිරීමට එහි හිමිකරුවන් කටයුතු කර තිබේ. ඒ අනුව මෙවර තරගාවලියේ සිට එම කණ්ඩායම හඳුන්වනු ලබන්නේ පන්ජාබ් කිංග්ස් නමිනි.

අයිපීඑල් තරගාවලියේ ක්‍රීඩක වෙන්දේසිය හෙට පැවැත්වීමට නියමිතව ඇති අතර, සිය කණ්ඩායමේ නම වෙනස් කරනු ලැබුවේ හදිසියේ නොවන බවත්, දිගු කාලයක සිට එම අදහසින් පසු වූ බවත් එහි හිමිකරුවෝ පවසති.

මෝහිත් බර්මන්, නෙස් වාඩියා, කරන් පෝල් සහ බොලිවුඩ් නිලි ප්‍රීටි සින්ටා කිංග්ස් පාන්ජාබ් පිලේ හිමිකරුවෝ වෙති. වසර 13ක අයිපීඑල් ඉතිහාසයේ 2014 වසරේදී අනුශූරතාව දිනූ පන්ජාබ් කිංග්ස් පිල තවත් තරගවාරයකදී තුන්වැනි තැන ලබා ගත්තේය.

අවසන් පූර්ව වටයේදී සෙරීනා ඔසාකා හැප්පෙති

තායිවානයේ හ්සායි සු වෙයි මිනිත්තු 66ක් ඇතුළත පරාජය කළ ජපානයේ නයෝමි ඔසාකා සහ රොමේනියාවේ සිමෝනා හැලේප් පරාජය කළ සෙරීනා විලියම්ස් ඔස්ට්‍රේලියානු විවෘත ටෙනිස් ශූරතාවලියේ අවසන් පූර්ව වටයේ දී එකිනෙකා සමග තරග වැදීමට නියමිතය.

ඊයේ පැවැති අර්ධ අවසන් පූර්ව වටයෙන් ජය ලැබූ ඔසාකා වසර 2019 ඔස්ට්‍රේලියානු ශූරිය වන අතර, ඇය ඊට පෙර 2018දී අමෙරිකානු විවෘත ටෙනිස් ශූරතාව දිනා ගත්තේ සෙරීනා විලියම්ස් පරාජය කරමිනි.

ඔසාකා සමග අවසන් පූර්ව වටයට එක්වී සිටින සෙරීනා විලියම්ස් මේ හඹා යන්නේ වාර්තාගත 24 වැනි ග්‍රෑන්ඩ් ස්ලෑම් ශූරතාවය. 39 හැවිරිදි සෙරීනා සහ 23 හැවිරිදි ඔසාකා 2018 අමෙරිකානු විවෘත ටෙනිස් ශූරතාවලියේ අවසන් මහා තරගයෙන් පසු හමුවන්නේ පළමුවරටය. ඔස්ට්‍රේලියානු විවෘත ටෙනිස් ශූරතාවලියේ කාන්තා තරග ඉසව්වේ තවත් අර්ධ අවසන් පූර්ව තරග දෙකක් අද පැවැත්වෙයි. සත්කාරක ඔස්ට්‍රේලියාවේ ඇෂ්ලයි බර්ටි තරග වැදීමට නියමිතව ඇත්තේ චෙක් රාජ්‍යයේ කැරොලිනා මුචෝවා සමගය. ජෙනිෆර් බ්‍රැඩි සහ ජෙසිකා පෙගුලා අතර අනිකුත් අර්ධ අවසන් පූර්ව තරගය පැවැත්වෙයි. මේ දෙදෙනාම අමෙරිකානු ක්‍රීඩිකාවෝ වෙති.

කොරෝනා අර්බුද මැද පාපන්දු පුහුණුකරු සංවර්ධනය ඇරඹෙයි

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ පුහුණුකරු, අධ්‍යයන කළමනාකරු සම්පත් පෙරේරා මහතා මෙහෙයවන පාපන්දු පුහුණුකරු සංවර්ධන වැඩසටහන කොරෝනා අර්බුද මැද යළිත් රටපුරා පැවැත්වීම ආරම්භ කරයි. කොළඹින් පිට පළාත්වල පාපන්දු පුහුණුකරු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මොණරාගල හා වවුනියා යන ප්‍රදේශවල පාපන්දු පුහුණුකරුවන්ට 'ඩී' බලපත්‍ර පාඨමාලාව පසුගියදා සාර්ථකව නිමකළ අතර, පුහුණුකරුවන් 32ක් එක්ව සිටියහ. පාඨමාලාව නිමාවීමෙන් පසු පුහුණුකරු, අධ්‍යයන කළමනාකරු සම්පත් පෙරේරා මහතා සමග වවුනියාවේ 'ඩී' පුහුණුකරු බලපත්‍රලාභීන් ඡායාරූපයකට එක් වූ අයුරු.

ඇඹිලිපිටියේ ප්‍රභාත්ගෙන් කෙසෙල්වලට අලුත් වැඩක්

ප්‍රභාත් ප්‍රසංග ජයවර්ධන



මාතර ඉඳලා අධිවේගී මාර්ගයේ මත්තලට යනකම්ම තිබුණේ කෙසෙල් වගාවන්. මෙපමණ කෙසෙල් ප්‍රමාණයක් අපේ රටේ ඉන්න හැමෝටම දවස ගානේ බෙදුවත් වැඩියි කියලයි මට හිතුනේ. ඇඹිලිපිටිය සෙවණගල දක්වාත් කෙසෙල් වගාවන් මේ වගේමයි. මගේ කුතුහලයට හේතුව මට සොයා දුන්නේ ප්‍රභාත් ප්‍රසංග ජයවර්ධන. ඔහුට තවම අවුරුදු 26යි. අවුරුදු 20 ඉඳලා තමයි මේ කෙසෙල් වැඩේ කරගෙන යන්නේ. කඩ පිල්වල කුණු වෙවී නාස්ති වෙන කෙසෙල්වලට ඔහු අගය එකතු කිරීමක් කරලා පිටරට යවනවා. මේ නිසා ඒ පළාතේ ගොවියන් විතරක් නෙවෙයි හැමෝම කෙසෙල් වවන්න පටන් අරගෙන. කෙසෙල් වවන හැමෝටමත් හොඳ ආදායමක් ලැබෙනවා වගේම මේ වැඩේට බොහෝ පිරිසක් එකතු කරගෙන ඒ අයටත් හොඳ වැටුපක් දෙන්නත් ප්‍රභාත්ට පුළුවන් වෙලා තිබෙනවා.

● **ඔබ හොඳින් ඉගෙන ගෙන හොඳ රැකියාවක් කරන්නේ නැතිව ඇයි මේ කෙසෙල් ගොඩට වැටුණේ?**

මගේ තාත්තා තමයි කෙසෙල් වවන්න පටන් ගත්තේ. ඔහු කෙසෙල් තොග මිලට විකිණීම කළේ. මම කල්පනා කළා හැමෝම කරන දේ කරන්නේ නැතිව කෙසෙල්වලට කරන්න අමතර දෙයක් තිබෙනවද කියලා. ඒ පිළිබඳව සොයා බැලුවා, අත්හදා බැලීම් කළා. අන්තිමට මට හැකි වුණා මේවා ඩිහයිඩ්‍රේට් කරලා (විජලනය) කිසියම් දෙයක් කරන්න. විජලනය කරන ආහාර පිටරට යවන පිරිසකුත් මට මුණ ගැහුණා. ඉතින් මම ඒ වැඩේට බැස්සා.

● **ඔබ විජලනය කරන කෙසෙල් වර්ග මොනවා ද? ඒ වගේම කෙසෙල් හැරුණාම තව පලතුරු වර්ග තිබෙනව ද?**

ඇඹුල් කෙසෙල් සහ සීනි කෙසෙල් තමයි වැඩි වශයෙන් කරන්නේ. ඒ වගේම විදෙස් වෙළෙඳපොළේ වරකාවලට හොඳ ඉල්ලුමක් තිබෙනවා. මම ඉන්නේ ඇඹිලිපිටිය සෙවණගල. අපේ ප්‍රදේශයේ ගස් යට වරකා වැටිලා කුණු වෙලා විනාශ වෙලා යනවා. ඒවා මුදල් බවට පත් කරන්න පුළුවන් නම් කොපමණ හොඳයි ද කියා මට සිතුණා. මම වරකා වගේම අඹ, පැපොල් එහෙමත් විජලනය කරලා පිටරට යවනවා. අන්නාසිවලටත් ඉල්ලුමක් තිබෙනවා. ඒවා වෙනත් ප්‍රදේශවලින් ගෙන්වා ගෙන අවශ්‍ය අයට සපයනවා. ලංකාවේ කාබනික වගාවන්ට විදේශිකයන් කැමතියි.

යුරෝපීය රටවල් තමයි මගේ නිෂ්පාදන බොහොමයක් මිලදී ගන්නේ. ඒ වගේම අමෙරිකාව ඉදිරියේදී ඩුබායි රටත් මේ සඳහා එකතු වේවි.

● **තව මොනවද කරන්නේ?**

පලතුරු බීම හදනවා. ඒවා නම් ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළටත් දානවා. සියයට සියයක් ස්වාභාවිකවයි ඒවා හදන්නේ. ඒ වගේම මෙහේ කෝමාරිකා වවන ගොවියන්ගේ කෝමාරිකා පසුගිය කාලයේ විකුණා ගන්න බැරිව අපතේ ගියා. මම ඒවාත් මිලදී අරගෙන කෝමාරිකා ඩ්‍රින්ක් එකක් හදනවා. ඒකට අපේ රටේ හොඳ ඉල්ලුමක් තිබෙනවා. කෝමාරිකා ටිකත් වැඩකට ගන්න පුළුවන් වුණා වගේම ඒ ගොවියනුත් සතුටින්.

● **මේවා සකස් කරන්නේ කොහොම ද?**

කෙසෙල් සහ අනෙක් පලතුරු ඩිහයිඩ්‍රේට් කරලා කැබලිවලට සහ පවුඩර් බවටත් පත් කරනවා. ඒවා ඒ ආකාරයෙන්ම ඇසුරුම් කරනවා. කිසිම කල් තබා ගන්නා රසායනික ද්‍රව්‍ය හෝ වර්ණකාරක යොදන්නේ නැහැ. ඒවායින් ඕනෑම කෑමක් හදා ගන්නත් පුළුවන් වගේම කැබලි කරන ලද කෙසෙල් සහ අනෙක් පලතුරු අයිස් ක්‍රීම් සමඟ ආහාරයට ගන්නත් පුළුවනි. පවුඩර් එක කේක් සහ ජෙලි වර්ග සකස් කරන්න යොදා ගන්නත් පලතුරු බීමක් ලෙස සකස් කරගන්නත් පුළුවනි.

● **ඔබටත් කෙසෙල් වගාවක් තිබෙනව ද?**

ඔව් මට අක්කර 13ක කෙසෙල් වගාවක් තිබෙනවා. ඒ වගේම මා වටා කෙසෙල් වගා කරන ගොවියන් 450ක් සිටිනවා. මම ඒ අයට වගාව සඳහා පොහොර සහ අවශ්‍ය කෘෂි උපදෙස් සහ අනෙකුත් දෑ නොමිලේ සපයා දෙනවා.

● **ඔබ මේ දේවල් කිරීමෙන් සෑහීමට පත් වෙනව ද?**

ඔව්. මගේ මේ වැඩපිළිවෙළ නිසා මේ ප්‍රදේශයේ 60 දෙනකුට රැකියා දීලා තිබෙනවා. ඒකත් රටේ ආර්ථිකයට ශක්තියක්. රටට විදේශ විනිමය ලැබෙනවා වගේම රටේ පලතුරු නාස්තිය අවම වී තිබෙනවා. වරකා ගෙඩිය බිම වැටී අපතේ යා නොදී මිනිස්සු මා ළඟට එය අරගෙන එනවා. ඔවුන්ටත් කිසියම් මුදලක් අතට ලැබෙනවා. මම හිතනවා මේ වැඩෙන් මටත් මා වටා සිටින අනෙක් අයටත් සතුටක් ලැබෙනවා කියා.

ඒ වගේම ගිය වසරේ අයි.ඩී.බී. ආයතනයෙන් උගේ හොඳම ව්‍යවසායකයාට හිමි සම්මානය Food and Beverage (ආහාර සහ පාන වර්ග) වෙනුවෙන් මට ලැබුණා. එය ලොකු මට සතුටක්.

ඔබටත් කෙසෙල් හෝ වරකා අපතේ යා නොදී ඒවාට අමතර අගයක් දීමට අවශ්‍ය නම් හෝ ඒ පිළිබඳ වෙනත් ඕනෑම උපදෙසක් ලබා ගැනීමට අවශ්‍ය නම් p.jayawardhana94@gmail.com ඊ මේල් ලිපිනය ඔස්සේ ඔහු හා සම්බන්ධ විය හැකියි.

චතුමී පිටිපන

2021 පෙබරවාරි 17 කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.



සහෝදරයා දිය කෙළි මාකෙළු කොමළු

විදිය බණ්ඩාර සෙනෙවියාගේ බිසෝවරුන් දිය කෙළින නිසාත්, විදිය බණ්ඩාර සෙනෙවියාගේ රාජාභරණ නිදන්ව ඇතැයි පවතින ජනප්‍රවාද නිසාත් පමණක් නොව කුකුළේගම ජල විදුලි බලාගාරය හා යුද හමුදා නිවාඩු නිකේතනය නිසා මාකෙළිය ඇල්ල ඓතිහාසිකවත්, පාරිසරිකවත් ජනාදරය දිනා ගෙන තිබේ. කළතර දිස්ත්‍රික්කයේ පාරිසරික සෞන්දර්යය සොයන කා අතරත් මුලින්ම කියැවෙන මාකෙළිය ඇල්ල දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය දිනා ගන්නට සමත්ව ඇත.

දක්ෂිණ අධිවේගී මාර්ගයේ වැලිපැන්න පිවිසුමෙන් හෝ ගාලු පාරේ කළුතර, මඹුගම හරහා අගලවත්ත, කලවාන මාර්ගයේ ලන්පඳුර හන්දියට පිවිසීම ඉතා පහසුය. විදිය බණ්ඩාර පාලන සභයේ ප්‍රධාන කටයුතු සිදු කළ ඓතිහාසික මරුට ඇතුළු පාරිසරික වට පිටාව දැක බලා පරිසර සුව විඳ කිලෝමීටර් හයක් හතක් දුරින් හමු වන මෝල්කාව නගරයට පිවිසිය හැකිය.

අගුනුවර සිට 120 මාර්ගයේ හොරණටත් එහාන් සිට ඔලුත්සිංහල හරහා මෝල්කාව නගරයටත් ගමන් කිරීමට ඉතා දියුණු මාර්ග පද්ධතිය පහසුව සලසනු ඇත. මෝල්කාව නගරයෙන් කුකුළේ ගඟ මාර්ගයේ කිලෝමීටර් හතරක දුරක් පසු කරන විට දැනෙන සිසිලස කියා දෙන්නේ මාකෙළිය ඇල්ලේ පහස නෙත් සිත් පැහැර ගන්නා බවය.

නිරිත දිග මෝසම් වර්ෂාවෙන් වර්ෂය පුරා මිලිමීටර් 400 ක වර්ෂාපතනයක් ලබන මාකෙළිය ඇල්ලේ උස මීටර් පහළොවක් වේ. ලංකාවේ දිය ඇලි අතර ජනප්‍රියත්වයෙන් 17 වන ස්ථානය හිමි වන මාකෙළිය ඇල්ල උස අනුව 143 වන ස්ථානයේය. වර්ග කිලෝමීටර් එකොළහක ජල පෝෂක ප්‍රදේශයකින් යුතු සිංහරාජ මාධ්‍යමේ ඇති මාකෙළි ඇල්ල පාරිසරික අසිරිය කියා දෙන්නේ ඇඟ කිළිපොලා යන සිසිලසත් සමගිනි.

බස්නාහිර පළාත් පාරිසරික හා සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදනයෙන් ඉදි කර ඇති මුර කුටි, වැසිකිළි, කැසිකිළි පහසුකම් මෙන්ම ආරක්ෂිත පියගැට පෙළ, ආගන්තුක පරිසර ලෝලීන්ට මහඟු සහායක් සපයනු ලබයි. කළතර දිස්ත්‍රික්කයේ ආකර්ෂණීයම දිය ඇල්ල මාකෙළිය ඇල්ල වන අතර වැඩිම ජීවිත ප්‍රමාණයක් බිලි ගත් දිය ඇල්ල ද මෙය බව එහි යන ඔබ අමතක නොකළ යුතුය. ඒ සියලු ජීවිත බිලිව ඇත්තේ ඇල්ලේ වරදින් නොව අසංවේග, අසිහියෙන් යුතුව ඇල්ල අසල හැසිරීමෙන් වග නැවත නැවත සිහි කළ යුතුය. පාලින්ද නුවර ප්‍රාදේශිය සභාවෙන් ලබා දෙන අවසර පතිනි යාන වාහනවලට රැකවරණය සැපයෙන අතරම ඇල්ලේ සිරි නැරඹීමට ලැබෙන උපදෙස් ජීවිත රැක ගැනීමට ද හේතු වේ.

ප්‍රධාන මාර්ගයේ සිට ඉතා පහසුවෙන් ඇල්ල පාමුලට බැසීමට ඇති පියගැට පෙළ අවසානයේ ඇති ඇල්ල නැරඹුම් පීඨිකාව රිසි සේ මාකෙළිය ඇල්ලේ සිහිවටන ඔබ සතු කරගැනීමට සුදුසුම ස්ථානය වේ. පීඨිකාව පහළ ගල් තලාව ලිස්සනසුළු නිසා ඉතා අනතුරුදායක බව පළමුවරට එහි යන ඔබ සිහි තබා ගත යුතුය. කුකුළේ ගඟ හරහා සිංහරාජයේ සිසිලස රැගෙන විත් ඇල්ල අසල සිටින අප මිදුමෙන් සිප සනහාදුන නිසාම ඉන් මිදී යෑමට සිත් නොදේ. පසුගිය දශක කිහිපය තුළ මාකෙළිය ඇල්ල පාමුල දිය නෑමට ගිය හතළිස් දෙනකු පමණ තවමත් නැවත අප අතරට පැමිණි නැත. එම නිසා සිත් සේ දිය නෑම සඳහා පියගැට පෙළින් ආසන්න ප්‍රධාන මාර්ගයට පැමිණ මිටර් තුන්සීයක් ඉදිරියට පැමිණිය යුතුය. ගිමන් හල්, වැසිකිළි කැසිකිළි නිසි ලෙස පවත්නා නොකිරීමෙන් අපවිත්‍ර වී තිබුණ ද එහි ඇති ගල්තලාව අසල නොගැඹුරු ජල තටාකය බාල මහළු සැමට රිසි සේ දිය නෑමට සොබාදහම ලබා දුන් අපූරු දායාදයකි.

මාකෙළිය ඇල්ල නරඹා දිය නෑමට එන සැමට පිරිසුදු කිතුල් හතුරු, කිතුල් පැණි, වෙනිවැල් ගැට, කෑර දඬු, බට පොතු වර්ධනී ඇතුළු ගමේ නිපැයුම් ලබා දෙන්නට පුදේශයේ ජනතාව බොහෝ විට සූදානමින් සිටිති. ගත සිත කුල්මත් කරන නිසාම කාලය සොරා ගන්නට මාකෙළි කොමළිය සමත්ය. ඇල්ලේ සිට ඉහළට ගමන් කර කුකුළේ ගඟ බලාගාරය මෙන්ම මාර්ගයේ කෙළවර පිහිටි ජලාශය දැක බලා ගැනීමේ අවස්ථාව මාකෙළිය ඇල්ලට එන දෙස් විදෙස් සංචාරකයන්ට උදා කර ගත හැකිය.

පී. සෝමරත්න

මකර පලතුරේ නොරතුරු

වවා නඩත්තු කළහොත් වාණිජමය වටිනාකම ඉහළය. ලාභදායි ද වේ.

දැනට මෙම පලතුර වවනු ලබන රටවල් අතර ශ්‍රී ලංකාව, මැලේසියාව, වියට්නාමය, පිලිපීනය, කාම්බෝජය, තායිලන්තය, තායිවානය, ඉන්දුනීසියාව සහ බංග්ලාදේශය මුල් තැනක ඇති. මෙය දැන් ලොව පුරා බහුල ලෙස වගා කරන පලතුරක් බව කියැ වේ.

එමෙන්ම ඩ්‍රැගන් ෆ්‍රූට් පාංශු වර්ග ගණනාවක වගා කළ හැකි. උෂ්ණ සහ අර්ධ උෂ්ණ කලාපය ප්‍රිය කරන, ඉතා අඩු ජල ප්‍රමාණයක් අවශ්‍ය වන, ආඩියාතික දේශගුණයට ඔරොත්තු දෙන ශාකයකි. එහා කර දෙවැනි තෙවැනි වසරවල පල දරයි. ඇට සහ අතුවලින් පැළ කර ගත හැකිය. ඇටවලින් පැළ ලබා ගැනීමට වසර හයක පමණ කාලයක් ගත වේ. මේ නිසා අතු පැළ කර ගැනීම පහසුය. පොළොව මට්ටමේ සිට මීටර එකහමාරක් පමණ උස කම්බි කණුවක හතර පැත්තේ පැළ හතරක් සිටුවීම සුදුසුය. ආධාරක සඳහා ලී කණු වුවද භාවිත කළ හැකිය.

ඩ්‍රැගන් ෆ්‍රූට්වල අන්තර්ගත ගුණය වෙනත් පලතුරක නැති තරමිය. වියපත්වීම පාලනය කරයි. සම පිපිරීම වළක්වයි. සමට ශීත කරය. සම පැහැපත් කරයි. සමේ සොඳුරු රක දෙයි. සමට ඇවැසි තෙතමනය සපයයි. හිසකේ වර්ධනය කරයි. සිරුරේ

බර අඩුවීම වළකයි. කොලෙස්ටරෝල් මට්ටම පාලනය කරයි, උදරයේ සංකූලතා සමනය කරයි. රුධිරයේ සීනි මට්ටම පාලනය කරයි. පපුවට ඉණදායකය. රුධිරයේ හිමොග්ලොබින් වැඩි දියුණු කරයි. සිරුරේ බර අඩුවීම වළක්වයි. ඇතැම් වර්ගවල පිළිකා වළක්වයි. ක්ලාන්ත ගතිය සමනය කරයි. සිරුරේ ප්‍රතිශක්තිය වඩවයි. සන්ධි වේදනා සමනය කරයි. ගැබිනි මාතාවන්ට ඉණදායකය. වකුගඩු රෝගවලට හිතකරය. අස්ථි රෝග තත්ත්ව සමනය කරන අතර ඩෙංගු රෝගීන්ට සහනය සලසයි. සිරුරේ දුර්වල සෛල යථා තත්ත්වයට පත් කරයි. ආහාර රුචිය වඩවයි. ඇස්වල රෝග තත්ත්වයන්ට ගුණ දෙයි. මොළයේ ක්‍රියාකාරිත්වය දියුණු කරයි. එමෙන්ම මෙම පලතුර හුස්ම ගැනීමේ අපහසුතා ද සමනය කරයි.

දැනට ඩ්‍රැගන් ෆ්‍රූට් ප්‍රභේද හතරක් පමණ ජනප්‍රිය වී තිබේ. රතු පොත්ත සහ සුදු මදය සහිත, රතු පොත්ත සහ රතු මදය සහිත, මැක් දහි පැහැති මදය සහ රතු පිට පොත්ත සහිත මෙන්ම කහ පොත්තක් සහ සුදු මදය සහිත වර්ග බහුලව වගා කෙරේ.

මෙය හිරු එළිපට ලැදි ශාකයකි. වර්ෂාපතනය අඩු තත්ත්වයක් ඇවැසි වේ. අධික පින්න සහිත දේශගුණය අකැකරය. ජලය අධික වුව හොත් මුල් කුණු වීමට ඉඩ ඇත. පස් වර්ග ගණනාවක හොඳින් වගා කළ හැකිය. හොඳින් ඛකසන ලද පස මෙම ශාකයට ගිතකරය. ජලය වැඩියෙන් රඳෙන ස්ථාන වගාවට සුදුසු නැත. දුර්වල පසට අවශ්‍ය තරම් වැලි කවලම් කිරීම සුදුසුය.

මෙම ශාකය ගල් මොරළ සහිත පසට ද ඔරොත්තු දෙයි. වසර අග දී වගාව ආරම්භ කිරීම සුදුසුය. ආරම්භයේදී නයිට්‍රජන් වැඩිපුර යෙදීමට නිර්දේශ කෙරේ. මල් හට ගැනෙන සහ පල දරන කාලයට පොස්ෆරස් සහ පොටෑසියම් වැඩියෙන් ඇතුඵිය. පොළොව මට්ටමේ සිට මීටර එකහමාරක් පමණ උස කම්බි කණුවක වවා පැළ හතරක් වගා කිරීම සුදුසුය.

වගාවේ වල් නෙළීම ක්‍රමවත්ව කළ යුතුය. පල දරන කාලයට කුරුල්ලන්ගෙන් සහ වෙනත් සතුන්ගෙන් ආරක්ෂා කර ගත යුතුය. පඳුරක සිට පඳුරකට ඇති දර මීටර 3ක් පමණ අවශ්‍යය. සිටුවන කණුවක උස එය සිටුවීමෙන් පසු මීටර් එකහමාරක් පමණ විය යුතුය. සිටුවීමට තෝරා ගන යුත්තේ වසර 2ක් 3ක් පමණ වයසැති අතු කැබලි වන අතර මේවා සෙන්ටිමීටර 45-50 පමණ දිගින් යුක්ත විමත් ඒවා සිටුවීමට මාසයකට පමණ පෙර දිලීර නාශකයක් යොදා නිබීමත් යෝග්‍යය. දළු වශයෙන් කණු 300 ක් සහිත ඩ්‍රැගන් ෆ්‍රූට් වගාවකින් වාර්ෂිකව අක්කරයකින් සැලකිය යුතු ආදායමක් ලබා ගත හැකිය.

නිමල් විජයතුංග

මධ්‍යම

අමෙරිකාව, මෙක්සිකෝව සහ දකුණු අමෙරිකාව නිජබිම කර ගත් ශ්‍රී ලංකාව තුළ ද යම් ප්‍රමාණයක විහිරි - පැතිරි ගිය ඉගනා ශාකයක් වන 'ඩ්‍රැගන් ෆ්‍රූට්' ශාකය එහි ඵලවල තිබෙන අසාමාන්‍ය ගුණ ප්‍රමාණය හේතුවෙන් මෙබඳු ශාක වගා කරන අයගේ අවධානය දිනා ගෙන සිටී. 'පිටහාය' සහ 'පිටාය' යන නම්වලින් ද හඳුන්වන මෙය හයිලෝසිරස් (Hylocereus undates) කුලයේ කැක්ටස් හෙවත් පහොක් පවුලේ සාමාජික ශාකයකි.

මේවායේ මල් රාත්‍රී කාලයට විකසිත වන අතර සුදු හෝ රෝස පැහැයිය. කෙළවර සිනු හැඩයෙන් හා අග කොටස ක්‍රමයෙන් සිහින් වී ඇති ටියුබ් එකක හැඩය ගනී. අපූරු සුවඳකින් ද යුක්ත වේ. මල ගෙඩියක් බවට පත් වූ විට එහි මැදු මසින් යුතු මදය රතු, සුදු, කහ හෝ රෝස පැහැතිය. ඉතා කුඩා ඇට කළු පැහැතිය. මුලදී නද කොළ පැහැති ගෙඩි මකරෙකුගේ හිසක හැඩය ගන්නා නිසා දෝ මේවා 'මකර පලතුර' යන අරුත ගත් 'ඩ්‍රැගන් ෆ්‍රූට්' යනුවෙන් හැඳින් වේ. මෝරා ඉදෙන විට තරමක් රතු පැහැය ගන්නා ගෙඩිය ග්‍රෑම් 200 සිට කිලෝ ග්‍රෑම් 1 දක්වා බරින් යුක්තය. මෙම ශාකය මැනවින්

Sri Lanka Institute of Architects

වාර්ෂික සැසිය 2021/21

වාස්තු විද්‍යාඥයකුගේ සමාජීය මෙහෙවර

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ සභාපතිතුමාගේ පණිවුඩය

නැවත වරක් ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ සංගමයේ වාර්ෂික සැසිවාර සඳහා කාලය එළැඹිලා.

නමුත් මෙය තවත් හුදු වසරක් නම් නොවෙයි. පසුගිය වසර සියවසක් තරම් ඇතයි. ඇසට නොපෙනෙන වයිරසයක් අපේ සුව පහසු ජීවිත උඩු යටිකුරු කරලා. අපි තවමත් යථා තත්ත්වයට අවතීර්ණ වෙන්න වෙර දරනවා. මෙම වයිරසය ඇති කළ සහ තවමත් සිදු කරමින් පවතින විනාශය ගණනය කිරීම අසීරුයි.

උද්ගත වී ඇති තත්ත්වයට හුරු වීමේ එක්තරා ක්‍රමවේදයක් වන්නේ දෙමුහුන් උපාය මාර්ග අනුගමනය කිරීමයි. අවාසනාවකට වගේ මේවා උත්සවශ්‍රීයෙන් තොර සැමරුම් සඳහා අපව පොළඹවාලන අතර මිනිසා යනු සමාජජීවී සත්ත්වයෙක්ය යන යථාර්ථය මූළුමනින්ම බැහැර කරනවා. අපට මේ ආකාරයෙන් කොතෙක් දුර යා හැකි දැයි කිව හැක්කේ කාලයාට පමණයි. මෙවන් වාතාවරණයක් තුළ මෙම වාර්ෂික සැසිවාරවලට අදාළ සියලු සැමරුම් සකස් කිරීමට වෙහෙස වූ සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා. සමහර සැමරුම් අත්‍යාවශ්‍යම අංගවලට පමණක් සීමා කිරීමට සිදු වුණත් ඒ අසීරු තීරණ ගැනීමට විශාල ආත්ම ශක්තියක් අවශ්‍ය වෙනවා. ඔවුන් සොයා ගත් ඇතැම් විකල්ප සම්මත ක්‍රියාකාරකම්වලටත් වඩා විශිෂ්ටත්වයෙන් ඉහළයි

සියලුම කමිටු නියෝජිතය කරන සාමාජිකයන්ට බොහොමත්ම ස්තුතියි!

මේ සැමරුම් වෙනදාටත් වඩා සාර්ථක වෙවා!යි ප්‍රාර්ථනා කරනවා.

වරලත් වාස්තු විද්‍යාඥ වෙරන්ජත් කුරුකුලසූරිය, **FIA (SL)**
B.Sc. (Built E nvironment); M.Sc. (Architecture), FITP (SL)

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ ජ්‍යෙෂ්ඨ උප සභාපතිතුමාගේ පණිවුඩය

නව සාමාන්‍යයක් වෙත ගමන් කරන මෙවන් වකවානුවක මෙම පණිවුඩය ඔබ වෙත ගෙන ඒමට හැකි වීම පිළිබඳව හුදෙක්ම සතුටට පත් වෙමි. ධනාත්මක දර්ශනයක් මත අනාගත පෙරගමනක නවමු මාර්ගය ආරම්භ කළ රටේ ප්‍රධානතම ආයතනයක් වන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ අප, විශේෂ ඒකාබද්ධ සහ අන්තර්ජාලය යන මාධ්‍ය ද්විත්වය ඔස්සේ අපගේ වාර්ෂික ක්‍රියාකාරකම් මාලාව මෙවර ද පැවැත්වීමට තීරණය කළෙමු.

එහෙයින්, අපගේ සමාරම්භක උලෙළ ඉතා උත්කර්ෂවත් අන්දමින් ඒකාබද්ධ ක්‍රියාකාරකමක් ලෙස පැවැත්වීමට කටයුතු කර ඇති අතර, මේ පිළිබඳව උනන්දුවක් දක්වන විශාල පිරිසකගේ සහභාගිත්වය මෙමඟින් තහවුරු කරනු ලබයි. මෙම සමාරම්භක උලෙළේ සුවිශේෂී අංගයක් ලෙස සඳහන් කළ හැක්කේ වාස්තු විද්‍යාඥ ටෝනි ටොං සහ වාස්තු විද්‍යාඥ තානා චිරාපිටවාත් විසින් සිදු කරනු ලබන ප්‍රධාන දේශනයයි. එම වාස්තු විද්‍යාඥයන් දෙපළ ARCASIA කොවිඩ් - 19 මාර්ගෝපදේශයන් වන නිර්මිත පරිසරයක් නවෝත්පාදනය කිරීම යන මැයෙන් දේශන සිදු කිරීමට නියමිතය. සමාජ දුරස්තභාවය වෙනුවට සමාජ අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි වශයෙන් සිදු කිරීමට හැකි වන සහ නව සාමාන්‍යකරණය වෙනුවට අපට නැවතත් අපගේ සුපුරුදු ජීවන රටාවට අනුගත විය හැකි වාතාවරණයක් හැකි ඉක්මනින් නිර්මාණය වේය යන්න ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ අපේක්ෂාවයි. නව රජයේ ප්‍රතිපත්තීන්ගෙන් ලැබෙන ධනාත්මක සහයෝගයත් සමඟ දීප්තිමත්, වඩා සුබදායී සහ වඩා නව්‍යකරණය වූ නිර්මිත පරිසරයන් ශ්‍රී ලංකාවේ ඉදි වේය යන්න සහ නව අවස්ථාවන් රාශියක්ම එමඟින් උදා වේය යන්න අපගේ බලපොරොත්තුවයි.

වරලත් වාස්තු විද්‍යාඥ රසල් දන්දෙණිය, **FIA (SL), RIBA, Int. Asso. AIA.**

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ උප සභාපති සහ වාස්තු විද්‍යා 2021 ප්‍රදර්ශන කමිටුවේ සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ ඉතිහාසය තුළ පැවැත්වුණු සාර්ථකම ප්‍රදර්ශනයක් වන Architect 2020 ප්‍රදර්ශනයෙන් පසුව, 39වන වරටත් පැවැත්වෙන ශ්‍රී ලංකාවේ පැරණිතම සහ වැඩිම පිරිසක් සහභාගී වන ඉදිකිරීම් ආශ්‍රිත ප්‍රදර්ශනය වන, ශ්‍රී ලාංකේය ප්‍රදර්ශන කලාවේ ප්‍රගමනය උදෙසා වාස්තු විද්‍යාව සහ ඉදිකිරීම් කර්මාන්තය සමඟ සුසංයෝගීව Architect 2021 අතිඋත්කර්ෂවත්ව පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කොට තිබුණි.

වාස්තු විද්‍යාඥයන් සහ ඒ ආශ්‍රිත ගොඩනැඟිලි ද්‍රව්‍ය අලෙවිකරුවන් ඉදිරිපත් කරන නවතම නිෂ්පාදන හා සේවාවන්, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ සංගමයේ සාමාජිකයන් දායක වූ ව්‍යාපෘතිවල පැවති සුවිශේෂී නිර්මාණ සහ ගොඩනැඟිලි ආකෘති ආදියෙන් Architect 2021 අසමසම ප්‍රදර්ශනාත්මක අත්දැකීමක් වනු ඇති බවට කිසිදු සැකයක් නැත.ඉදිකිරීම් ක්ෂේත්‍රයේදී දෛනිකව මුහුණපාන ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීමට පොදු සමුළුවක් ද වාස්තු විද්‍යාඥයන්ට එකිනෙකාගේ අත්දැකීම් බෙදා හදා ගැනීමට සාමාජිකයන්ට සුවිශේෂ වූ සමුළුවක් ද, කර්මාන්තය වර්තමානයේදී මුහුණ පා සිටින ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ශ්‍රී ලංකා ඍත්තියවේදීන්ගේ සංගමය හා ඒකාබද්ධ වුණු ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඍත්තිකයන්ගේ සමුළුවක් ද සංවිධානය කිරීමට Architect 2021 බලාපොරොත්තු වනු ඇත.

මෙම සැසියෙහි Architect 2021 ප්‍රදර්ශනයේ මූලික තේමාවක් වන්නේ " වාස්තු විද්‍යාඥයකුගේ සමාජ වගකීම" යන්නයි. නමුත් සෞඛ්‍ය අංශවල උපදෙස් සහ වාරණයන් හේතුවෙන් ප්‍රදර්ශනය නියමිත දිනට නොපැවැත්වෙන අතර වඩාත් ආරක්ෂිත වකවානුවකදී සෞඛ්‍ය අංශවල අනුමැතිය ඇතිව පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

කෙසේ වුවද, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය "The Architect" නමින් ඩිජිටල් මාධ්‍යයේ වෙළෙඳ ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට අභිමානයෙන් ජනතාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. මෙය ගොඩනැඟිලි ආශ්‍රිත නිෂ්පාදන සහ සේවාවන් මහජනතාව වෙත ප්‍රදර්ශනය සහ අලෙවිකරුවන් සමඟ සම්බන්ධ වීමටත් ඒ පිළිබඳව තොරතුරු දැන ගැනීමටත් අනගි අවස්ථාවක් වනු ඇත. මෙම කර්තව්‍යය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අප තීරණය කර ඇති අතර එය BMICHහිදී පැවැත්වීමට නියමිත දිනය වූ පෙබරවාරි 19වනදා ආරම්භ කරනු ඇත. මෙම විද්‍යුත් ව්‍යාපෘතියේ ප්‍රතිලාභ අත්විඳීමට වාස්තු විද්‍යාව සහ ගොඩනැඟිලි සඳහා උනන්දුවක් දක්වන ජනතාවට මහත් අස්වැසිල්ලක් වනු නොඅනුමානය.

වරලත් වාස්තු විද්‍යාඥ රෝහණ බන්ඩාර හේරත්, **FIA (SL)**
FIIM (HK), FCPM, IAIA (USA), AP (GBCSL),M.Sc. (Arch.), B.Sc. (BE)

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ ගරු ලේකම්තුමාගේ පණිවුඩය

අපි අද පසුකරමින් සිටින්නේ අපේ රටට අතිශයින්ම තීරණාත්මක අවදියක්. මීට දශකයකට ඉහතදී අපි මුළු රටම කම්පා කළ තිස් වසරක කුරිරු යුද්ධය නිමා කර සාමකාමී රාජ්‍යයක් ස්ථාපනය කළත් වර්ගවාදී සහ ආගමිවාදී ගිනි පූපුරු පැන නගිමින් පවතින සාමකාමී වාතාවරණයට වරින් වර බාධා පැමිණී බව නොරහසකි. කෙසේ වෙතත් ඒ අභ්‍යන්තර අර්බුද සියල්ල යටපත් කරමින් ස්වාභාවික ව්‍යසනයක් වූ ගෝලීය වසංගතයක් පසුගිය වසරේ පැවැති ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥන්ගේ ආයතනයෙහි වාර්ෂික සැසිවාරය නිම වී යෑමත් සමඟම රටම ගිල ගත් නිසා මේ වසරේ පැවැත්වීමට නියමිත 39 වන සැසිවාරය උත්සවශ්‍රීයෙන් යුතුව සැමරීමේ අවස්ථාව අපට අහිමි වී ඇත. නමුත් වාස්තු විද්‍යාව යම් ආකාරයේ ගැටලු විසඳීමේ ක්‍රියාවලියක් නිසා වාස්තු විද්‍යාඥයන් වන අපි, "නව ජීවන රටාවට" සරිලන ආකාරයෙන් මෙම වසංගතයට මුහුණ දෙමින් එය කළමනාකරණය කර ගනිමින් සිටිමු.

වාස්තු විද්‍යාව හුදෙක් පරිකල්පන මතම සිදු වන කටයුත්තක් නොවන බව ඉතිහාසය සාක්ෂි දරයි. වාස්තු විද්‍යාඥන්ගේ කාර්යභාරය හුදෙක් ගොඩනැඟිල්ලක් සැලසුම් කිරීමට සීමා නොවී වඩාත් යහපත් නිර්මිත පරිසරයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය සමාජ වගකීමක් වී හමාරය. වාස්තු විද්‍යාවට සමාජයීය බලපෑමක් එල්ල කළ හැකි බවත්, ප්‍රජාවගේ ජීවන රටාව වඩාත් හිත කර කිරීමට ඊට හැකියාව පවතින බවත් ඉතා පැහැදිලිය. එපමණක් නොව වාස්තු විද්‍යාඥයන් සමාජයට මෙන්ම ස්වාභාවික පරිසරයට ද ඉටු කළ යුතු සුවිශේෂී කාර්යභාරයක් ඇත. මේ නිසා වාස්තු විද්‍යාව යනු හුදෙක් ගොඩනැඟිලි නිර්මාණකරණයට සීමා වූවක් නොව ප්‍රජාවගේ රුචිකත්වයට, ජීවන රටාවට සමාජ ආර්ථික ව්‍යුහයන්ට බාහිර සහ අභ්‍යන්තර පරිසරයට සරිලන නිර්මාණ සිදු කරන අතරම දැකුමට ප්‍රිය උපදවන වඩාත් උචිත සැලසුම් තෝරා ගැනීම හා බැඳුණු සිතිමේ ක්‍රියාවලියක් ලෙස ද මෙය හඳුන්වා දිය හැකිය. නිර්මාණයක අභ්‍යන්තර වාතාවරණය, ආරක්ෂාව සහ ස්වාභාවික උවදුරුවලින් සැලකිය යුතු මට්ටමේ රැකවරණයක් සපයමින් නිවැසියන්ගේ යහපත් පැවැත්ම සහතික කෙරෙන පරිශ්‍රමයක් ලෙස ද වාස්තු විද්‍යාඥන්ගේ කාර්යභාරය තවත් පැතිකඩකින් බලා විස්තර කළ හැකිය.

වරලත් වාස්තු විද්‍යාඥ රත්ජන සුරවිර, **FIA (SL)**
M.Sc. (Arch.), B.Sc.(BE)

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ පාලක මඩුල්ල වාර්ෂික සැසිවාරය 2020/2021

ඉදිරිපෙළ වමේ සිට දකුණට :

වරලත් වාස්තු විද්‍යාඥ, නන්දක ජයසිංහ AIA (SL) (ගරු උප ලේකම්), වරලත් වාස්තු විද්‍යාඥ උපේන්ද්‍ර රන්දෙණිය, FIA(SL) (සභාපති - PAB), වරලත් වාස්තු විද්‍යාඥ නෙලා ද සොයිසා, FIA (SL) (සභාපති - BAE) වරලත් වාස්තු විද්‍යාඥ රන්ජන සුරවීර, FIA (SL) (ගරු ලේකම්), වරලත් වාස්තු විද්‍යාඥ ඩී. එච්. විජේවර්ධන, FIA (SL),(හිටපු සභාපති පාලක සභා), වරලත් වාස්තු විද්‍යාඥ වෙරජන් කුරුකුලසූරිය, FIA (SL) (සභාපති), වරලත් වාස්තු විද්‍යාඥ රසල් දන්දෙණිය, FIA (SL) (ජ්‍යෙෂ්ඨ උප සභාපති), වාස්තු විද්‍යාඥ රෝහණ බණ්ඩාර හේරත්, FIA (SL) (උප සභාපති), වරලත් වාස්තු විද්‍යාඥ දිලුම්ණි ද මෙල්, FIA (SL) (ගරු භාණ්ඩාගාරික), වරලත් වාස්තු විද්‍යාඥ චින්තක නිකපිටිය (සභාපති - BAP), වරලත් වාස්තු විද්‍යාඥ මිගාර අල්විස්, FIA (SL) (සභාපති - BOM), වරලත් වාස්තු විදඥ දමිත් ප්‍රේමතිලක, AIA (SL)(ගරු උප භාණ්ඩාගාරික)

පසු පෙළ වමේ සිට දකුණට :

වරලත් වාස්තු විද්‍යාඥ තිලාත් කොත්තිගොඩ, AIA (SL) (පාලක සභා සාමාජික), වාස්තු විද්‍යාඥ සී. ජී. සමරසිංහ, (පාලක සභා සාමාජික) වරලත් වාස්තු විද්‍යාඥ ආචාර්ය නිශාන් රසාංග විජේතුංග, FIA (SL) (පාලක සභා සාමාජික), වරලත් වාස්තු විද්‍යාඥ සුරිදු බස්නායක, AIA (SL) (පාලක සභා සාමාජික), වරලත් වාස්තු විද්‍යාඥ කෝසල වීරසේකර, AIA (SL) (පාලක සභා සාමාජික), වරලත් වාස්තු විද්‍යාඥ අනුක වේතසිංහ, AIA (SL) (පාලක සභා සාමාජික) වරලත් වාස්තු විද්‍යාඥ විශාකා රත්නායක, AIA (SL) (පාලක සභා සාමාජික), වරලත් වාස්තු විද්‍යාඥ ජයනාත් සිල්වා, FIA (SL) (පාලක සභා සාමාජික)

Colorup
COLOR MY LIFE

සාම්ප්‍රදායික පෙනුමත් නවීන නිමාවත් සමව මුසු වූ
කලර් අප් ස්ට්‍රිප් සීලිම සමඟ ඔබේ නිවසට
දැකුම්කලු මනරම් පෙනුමක් ලබාගන්න.

සුවිශේෂ වාසි

- සුන්දර ස්වාභාවික නිමාව
- ගින්නට ඔරොත්තු දේ
- ජලයට ඔරොත්තු දෙන අතර පහසුවෙන් සෝදා පිරිසිදු කළ හැකියි
- පුස් හා මලකඩ වලින් වැළැක්වේ
- වේයන්ගේ උවදුරු පාලනය කරයි
- දේශගුණිකව හිතකර වන අතර ඕනෑම පරිසර තත්ත්වයක් යටතේ සවිකළ හැකිවේ
- පරිසර හිතකාමී වේ

නිෂ්පාදනයේ විස්තර:

පරිමාණය	ශක්තිය	බර	වර්ණ	ඇසුරුම
► ඝනකම 8mm ► පළල 300mm ► දිග 1200mm	40 Nmm-2	5kg	► තේක්ක ► මහෝගනී ► කොස්	එක ඇසුරුමක් තුළ පැනල් 5ක් අසුරා ඇත.

රයිනෝ රූෆිං ප්‍රඩක්ට්ස් ලිමිටඩ්
752, බේස්ලයින් පාර, කොළඹ 09. දුරකථන: 0112 693 694, 0112 674 765 ෆැක්ස්: 0112 667 267
ඊ-මේල්: telemarketing@rhino.lk වෙබ්: www.rhinocolorup.com

නොමිලේ උපදේශන සේවා ලබාගැනීම සඳහා දැන්ම අමතන්න:
0115 748728/0115 748738

RHINO
CEMENT ROOFING SHEETS

වර්ෂ 2021ක්වූ පෙබරවාරි මස 17 වැනිදා බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

Sri Lanka Institute of Architects

වාර්ෂික සැසිය 2021/21

වාස්තු විද්‍යාඥයකුගේ සමාජීය මෙහෙවර

ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යාඥයෙක් වෙන්න අවම වශයෙන් අවුරුදු දෙකක්වත් පුහුණු වෙලා අත්දැකීම් ලබා ගන්න ඕනෑ

වරලත් ගෘහ නිර්මාණ ශිල්පී, වෙරන්ජන් කුරුකුලසූරිය
ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ (SLIA) සභාපති
වරලත් නගර සැලසුම්කරු නගර ගෘහ නිර්මාණ පාසලේ සභාපති

ගොඩනැගිලි හා අනෙකුත් ද්‍රව්‍යමය ආකෘතීන් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ කලාව ගෘහ නිර්මාණ කලාවයි. එපමණක් නොව මිනිසා විසින් සාදන ලද ගොඩනැගිල්ලක් අවට පරිසර සමඟ සංකලනය වීමේ සිට ඉතා සියුම් වාස්තු විද්‍යාත්මක හා ඉදිකිරීමේ විස්තරයන් ද , ඇතැම් විට ගෘහ භාණ්ඩ ද ඇතුළුව පුළුල් වපසරියක සිට ගෘහ නිර්මාණ කලාව අර්ථකථනය කළ හැකිය. වාස්තු විද්‍යාත්මක සේවාවන් සැපයීමේ වෘත්තිය ද ගෘහ නිර්මාණ ශිල්පය ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පියකු වීමේදී වඩාත් වැදගත් වන ආයතනයක් වන ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ ඉතිහාසය, ස්ථාපිත කිරීමේ අරමුණු මෙන්ම සමාජීය සේවාවන් යනාදී කරුණු කිහිපයක් පිළිබඳව ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ (SLIA) සභාපති , වරලත් නගර සැලසුම්කරු, නගර ගෘහ නිර්මාණ පාසලේ සභාපති ,වරලත් ගෘහ නිර්මාණ ශිල්පී, වෙරන්ජන් කුරුකුලසූරිය මහතා සමඟ සිදු කළ සංවාද සටහනක් මෙසේය.

ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ ආරම්භය ගැන මතක් කළොත් ?

ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය ශ්‍රී ලංකාවේ වාගේම ආසියානු කලාපයේ ප්‍රමුඛතම වෘත්තීය සංවිධානයක්. මෙම ආයතනය වසර ගණනාවක්ම රටේ ගෘහ නිර්මාණ ශිල්පයේ වෘත්තීය භාවිතයන් මෙන්ම අධ්‍යාපනය පිළිබඳව ද කටයුතු කරමින් සිටිනවා. අප ආයතනය මඟින් ශ්‍රී ලංකාවේ ඉදි කිරීම් කර්මාන්තයේ වැඩි දියුණුවක් සිදු කර තිබෙනවා වගේම ගෘහ නිර්මාණ ශිල්පයේ දියුණුවට මෙන්ම රටේ ප්‍රමිතීන් ඉහළ නැංවීමට විශාල දායකත්වයක් ලබා දීලා තිබෙනවා. විදේශීය සුදුසුකම් ලත් ගෘහ නිර්මාණ ශිල්පීන් කුඩා කණ්ඩායමක් විසින් ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය (CIA) 1956 දී පිහිටුවලා තියනවා. මෙම මුල් කණ්ඩායමට රාජකීය ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ (RIBA) සාමාජිකත්වය ද තිබෙනවා. මෙම ආයතනයේ සමාරම්භක රැස්වීම 1957 සැප්තැම්බර් 11 වන දින කොළඹ කොටුවේ ප්‍රින්ස් වීදියේ තේ ප්‍රචාරක මණ්ඩලයේදී ගෘහ නිර්මාණ ශිල්පීන් දෙළොස් දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වලා තියනවා.

බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයට අනුකූලව ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීමෙන් පසුව, CIAහි අරමුණ වූයේ RIBAහි මිත්‍ර සාමාජිකත්වය ලබා ගැනීම . 1960 දී ඔවුන් එය අත්පත් කර ගත්තා. ඒ වන විට ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ සාමාජික සංඛ්‍යාව 30 දක්වා ඉහළ ගොස් තිබුණා. CIA සංවිධානයට එවකට RIBAහි සභාපති ශ්‍රීමත් බැසිල් ස්පෙන්ස්ගේ දිරිගැන්වීම සහ එවකට ලේකම් වූ ප්‍රාග්ගේ සැලකිය යුතු සහය ලැබුණා . 1976 දී එවකට නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගේ පෞද්ගලික සාමාජිකයකුගේ යෝජනාවක් මඟින් 1976 ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ නීතිය අංක 1 නමින් හැඳින්වෙන පාර්ලිමේන්තු පනතක් මඟින් ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය (SLIA) ලෙස ස්ථාපිත වුණා.

ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය ස්ථාපිත කිරීමේ අරමුණු මොනවා ද?

ගෘහ නිර්මාණ ශිල්පය සහ එහි මූලික විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ පර්යේෂණ කිරීම, ඒ හා සම්බන්ධ කලා හා විද්‍යාවන් පිළිබඳ අධ්‍යයනය කිරීම,

ගෘහ නිර්මාණ ශිල්පීන් ලෙස සුදුසුකම් ලබා තිබෙන පුද්ගලයන් ඇතුළත් කිරීම සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සංවිධානය කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම, ආයතනයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලැබීමේ විභාග සඳහා පාඨමාලා නියම කිරීම හෝ අනුමත කිරීම, ආයතනයේ සාමාජිකයින් වෙනුවෙන් අදාළ සුදුසුකම් සහ නුසුදුසුකම් නියම කිරීම, ආයතනයේ සාමාජිකයන් නොවන ගෘහ නිර්මාණ ශිල්පීන් සහ විද්‍යාඥ බලපත්‍රලාභීන් සඳහා, ආයතනයේ සාමාජිකත්වේ වෘත්තීය හැසිරීමේ ප්‍රමිතීන් සහ එහි නඩත්තුව සුරක්ෂිත කිරීම,

ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ වෘත්තියේ තත්ත්වය, සුබසාධනය, අයිතිවාසිකම් සහ වරප්‍රසාද ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වෘත්තියට අදාළව මහජනතාවගේ අවශ්‍යතා සපුරාලීමට ගෘහ නිර්මාණ ශිල්පීන් උනන්දු කිරීම, ආයතනයේ සාමාජිකත්, නිලධාරීන් සහ සේවකයන් සඳහා අර්ථසාධක අරමුදල් සහ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම, නියාමනය, පවත්වාගෙන යෑම, මෙම ආයතනයට ඇතුළත් වන ශිෂ්‍යයින්ට මූල්‍යමය හෝ වෙනත් ආකාරයකින් ආධාර ලබා දීම යනාදී බොහෝ දෑ අරමුණු කර ගනිමින් මෙම ආයතනය පිහිටුවා තිබෙනවා.

අපේ රටේ වරලත් වාස්තු විද්‍යාඥයකු වීමට කැමැත්තක් දක්වන පුද්ගලයකුට, ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ ලියාපදිංචිවීම කොතරම් වැදගත් ද?

ඇත්තටම ඒක වරලත් වාස්තු විද්‍යාඥයෙක් වෙන්න හිතා ගෙන ඉන්න අයට ගොඩාක් වැදගත්. ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යාඥයෙක් වෙන්න අවම වශයෙන් අපේ රටේ විශ්වවිද්‍යාලයක හෝ අදාළ ආයතනයක අවුරුදු 05 ක් පමණ වාස්තු විද්‍යාව ඉගෙන ගන්න ගන්න ඕනෑ. අවුරුදු දෙකක් පමණ පුහුණු වෙලා අත්දැකීම් ලබා ගන්න ඕනෑ. ඒ විදියට අපේ රටේ වරලත් වාස්තු විද්‍යාඥයෙක් වෙන්න අවුරුදු 07ක් පමණ ගත වෙනවා. අවසාන අවුරුදු 02 අප ආයතනයෙන් ලබා දෙන වාස්තු විද්‍යාඥය කුගෙන් උපදෙස් අරගෙන තමන්ගේ අඩුපාඩු හදා ගන්න ඕනෑ. ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යාඥයෙක් හැටියට පුහුණු වීම් සිදු කිරීම සඳහා අප ආයතනයේ ලියාපදිංචි වීම අනිවාර්ය විය යුතු වෙනවා. 1976 නො 1 හි දක්වන ලද නීතියකට අනුව එය ඵලෙස සිදු විය යුතු බව සඳහන් වෙලා තියනවා. සෑම අවුරුද්දකම අපේ සාමාජිකයින්ගේ වාර්ෂික සභාවක් තියනවා. 1982 ඉඳන් සාමාජිකයින්ගේ වාර්ෂික සභාවට අමතරව, වාර්ෂික සැසියක්, වාර්ෂික ප්‍රදර්ශනයක්, ජාතික සම්මන්ත්‍රණයක් පවත්වනවා. සමාරම්භක උළෙලේදී, අප ආයතනයට අලුතින් සාමාජිකයින් (අදාළ සුදුසුකම් සපුරා තිබෙන) බඳවා ගැනීම සිදු කරනවා. එදින අපේ ආයතනයට අලුතින් ලියාපදිංචි වන සාමාජිකයින්ට සහතික පත් ලබා දෙනවා.කුමන රටක ඉගෙන ගෙන ආවත් අපේ රටේ අදාළ නීති රීති හොඳින් දැන හදුනා ගෙන , සුදුසුකම් සපුරා ගෙන පුහුණුවීම් සිදු කරන්න අවශ්‍ය වෙනවා. සමාරම්භක උළෙලෙන් පසුදින අපි ජාතික සම්මන්ත්‍රණය පවත්වනවා. සමහර කාලවලදී මෙම සමන්ත්‍රණය දින දෙකක් පවත්වනවා. ඒත් මෙවර කොවිඩ් තත්ත්වය හේතුවෙන් වෙනදා සිදු කළ ආකාරයේ දේවල් සිදු කරන්න අපහසු වෙලා තියනවා. "වාස්තු විද්‍යාඥයකුගේ සමාජීය මෙහෙවර" මෙවර සම්මන්ත්‍රණයේ තේමාව ලෙස නම් කරලා තියනවා.

ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය මඟින් සිදු කරන සමාජ සේවාවන් මොනවා ද ?

යාපනයේ පාසලක, කඩලා අයින් කරලා දාන්න තිබුණු අවුරුදු 100 කට වඩා පරණ ගොඩනැගිල්ලක් අපි සකස් කරලා, නැවත අපි ඒ පාසලට ගොඩනැගිල්ල ලබා දුන්නා. සජිත් ප්‍රේමදාස මහත්මයා අමාත්‍යවරයාව සිටි කාලයේදී එක් ප්‍රදේශයක ගමක අපි ප්‍රජා ශාලාවක් ඉදි කරලා දුන්නා. නාය යෑම්වලදී අපි අදාළ ප්‍රදේශවල මිනිසුන්ට ජංගම වැසිකිළි නිර්මාණය කර දුන්නා. ඒක ඒ මිනිසුන්ට ලොකු සහනයක් වුණා. ඊට අමතරව අපි විවිධ ප්‍රදේශවල, විවිධ උත්සව කාලවලදී මිනිසුන්ට ජංගම වැසිකිළි සකස් කර දුන්නා. ශ්‍රී ලංකාවේ ස්වභාවික ආපදා ඇතුළු විවිධ බේදවාචක තත්ත්වවලදී අපි මිනිසුන්ට අවශ්‍ය සහන, ඉදි කිරීම් තුළින් හෝ මූල්‍යමය වශයෙන් ලබා දීම සිදු කරනවා. Arcasia රටවලට කොවිඩ් අනුව ඉදි කිරීම් කටයුතු සිදු කිරීම සම්බන්ධව අපි මාර්ගෝපදේශයක් සකස් කළා. UIA යනු මුළු ලෝකයේම පිළිගත් වාස්තු විද්‍යාඥයින්ගෙන් සමන්විත සංවිධානයක්.. ඒ තුළිනුත් අපි වාස්තු විද්‍යාව, ඉදි කිරීම් සම්බන්ධ විවිධ වැඩසටහන් සිදු කරනවා. ඊට අමතරව CAA, SAARCH වැනි සංවිධාන පවතිනවා. ඒ තුළින් ලංකාවේ සහ විදේශ රටවල ඉදි කිරීම් ක්ෂේත්‍රයේ සහ වාස්තු විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා විවිධ කටයුතු සිදු කරනවා.

(වරලත් ගෘහ නිර්මාණ ශිල්පී, වෙරන්ජන් කුරුකුලසූරිය මහතාගේ අදහස් සහ SLIA වෙබ් අඩවිය ඇසුරිණි)

සටහන – මදාරා මුදලිගේ
ජායාරූප – සුදත් නිශාන්ත

LAKE HOUSE
දැන්වීම් අතිරේක අංශය
දූ: 0112 429 339,0777 270 076
සම්බන්ධීකරණය
යසිරු මුම්ටාස්

පළාත් මාර්ග සංවර්ධන,
ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක,
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

සබරගමුව පළාත් සභාව

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන "රට හදන සෞභාග්‍යයේ දැක්ම" හි විශේෂිතව දක්වා ඇති කිලෝමීටර් 100,000 කින් සමන්විත විකල්ප මාර්ග පද්ධතිය ක්‍රියාත්මක කිරීම

ලංසු කැඳවීමයි

මහා මාර්ග අමාත්‍යාංශය වෙනුවෙන් සබරගමුව පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් කෑගල්ල හා රත්නපුර යන දිස්ත්‍රික්ක දෙකෙහි පිහිටි පළාත් මාර්ග කි.මී. 200 ක් සඳහා දික්කඩ හා හරස්කඩ සැලසුම් සකස් කිරීම සඳහා එක් විධායක ඉංජිනේරු කොට්ඨාසයකට කි.මී. 25 බැගින් ඇතුළත් කොන්ත්‍රාත් පැකේජ 8 ක් යටතේ සුදුසුකම් ලත් උපාධිධාරී මිනුම්දෝරුවන්ගෙන් හෝ ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචි බලපත්‍රධාරී මිනුම්දෝරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

වැඩි විස්තර www.sg.gov.lk වෙබ් අඩවිය තුළ ඇති ආයතන තුළට ගොස් එහි ඇති පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශ වෙබ් පිටුවෙන් හෝ https://f.ls/wNDba Link එකට පිවිස ලබාගත හැක.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව,
නව නගරය, රත්නපුර.
045-2223154
2021 පෙබරවාරි 17 දින

සංචාරක අමාත්‍යාංශය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA)

ලංසු සඳහා ආරාධනයයි (IFB)

ජාතික තරඟකාරී ලංසුකරණය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහා ජාල පරිපාලනය සහ දෘඪාංග සහාය සැපයීම

කොන්ත්‍රාත් අංකය : SLTDA / ICT / NCB / NW ADMIN & HW SUPPORT/2021/05

01. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහා ජාල පරිපාලනය සහ දෘඪාංග සහාය සැපයීම සඳහා සේවා සපයන්නෙකු කුලියට ලබාගැනීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද යෝජනා කැඳවනු ලැබේ.

02. සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ව්‍යාපාර ලියාපදිංචියක් සහිතව සමාන වැඩ සම්බන්ධයෙන් වසර පහක (05) පළපුරුද්දක් තිබිය යුතුය.

03. පූර්ව ලංසු රැස්වීමක් ZOOM රැස්වීමක් මඟින් 2021 පෙබරවාරි 24 වෙනි දින පෙ.ව. 10.00 ට පැවැත්වේ.

04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) වෙතින් දුරකථන අංක : 0112426800 (දිගුව 305, 277), ඊමේල් : amilam@srilanka.travel මඟින් ලබාගත හැකි අතර, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ https://sltda.gov.lk/tender යන වෙබ් අඩවියේ ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2021 පෙබරවාරි 17 වෙනි දින සිට 2021 මාර්තු 10 වෙනි දින දක්වා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ https://sltda.gov.lk/tender යන වෙබ් අඩවියෙන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් භාගත කරගත හැකිය. ආපසු ගෙවනු නොලබන රු. 5,000/- ක ගාස්තුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය නමින් ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක 7119413 දරන ගිණුමේ තැන්පත් කළ යුතුය. (මුදල් තැන්පත් කරන ලදුපතේ තැන්පත් කරන්නාගේ විස්තර සහ තැන්පත් කිරීමේ අරමුණ ලෙස "**ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තුව**" කරුණාක සඳහන් කරන්න. තවද, ඉහත කී මුදල් තැන්පත් කළ ලදුපත ලංසු සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. ගෙවීම් මුදලින් සිදු කළ යුතු අතර, අනෙකුත් ගෙවීම් ක්‍රමවලට අවසර නොමැත)

06. මුද්‍රා තබන ලද ලංසු, 2021 මාර්තු 10 වෙනි දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි "**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, අංක 80, ගාලු පාර, කොළඹ 03**" යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මඟින් එවීමට හෝ අතින් ගෙනැවිත් භාර දීමට හැකිය. ලංසු බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහා ජාල පරිපාලනය සහ දෘඪාංග සහාය සැපයීම**" යනුවෙන් සඳහන් කළ යුතුය.

07. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 03, ගාලු පාර, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන අංශයේදී (4 වන මහලේ) එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

08. ලංසු භාරගැනීම අවසාන දිනයේ සිට දින 119 ක් ලංසු වලංගු විය යුතුය.

09. ලංසු සමඟ ශ්‍රී ලංකා රුපියල් එක් ලක්ෂ තිස්පත් දහසක (ශ්‍රී ලංකා රු. 135,000.00) වටිනාකමින් යුත් ලංසු වලංගු කාලයේ සිට දින 28 ක් වලංගු ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකරය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් විසින් නිකුත් කර තිබිය යුතුය.

10. සියලුම ලංසු සමඟ, ශ්‍රී ලංකා රජයේ 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත සහ ඉන් අනතුරුව නිකුත් කරන ලද ගැසට් නිවේදනය (PCA3 ආකෘතිය) ප්‍රකාර වූ පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද ලංසුකරුගේ ලියාපදිංචි සහතිකය අමුණා එවිය යුතුය.

11. සේවකයෙකු හෝ සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ මෙම අමාත්‍යාංශයේ පාලනය යටතේ ඇති ඕනෑම වෙනත් ආයතනයක සේවකයෙකු සමඟ පවුල් ඥාති සම්බන්ධකමක් ඇති සමාගමක් සහ / හෝ පුද්ගල ලංසු ප්‍රදානය සඳහා සුදුසුකම් නොලබයි.

12. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ. තවද, කිසිදු හේතුවක් නොදක්වා ඕනෑම ලංසුවක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතුය. ලංසු පිළියෙල කිරීම සහ ගෙනැවිත් භාරදීමේදී අපේක්ෂිත ලංසුකරුවන්ට දරන්නට සිදුවෙන යම් පිරිවැයක් හෝ වියදමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වගකියනු නොලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,
අංක 80, ගාලු පාර, කොළඹ 03.

ප්‍රසිද්ධ දැන්වීමයි

ඔබගේ **"Islamic Relief"** ආයතනය (ලියාපදිංචි අංක : FL97514), නො 240/1, කෙළිත් විදිය, අක්කරෙයිපත්තුව - 02 සිට නො. 218, කෙලිත් විදිය, අක්කරෙයිපත්තුව - 02 වෙත ගෙනගොස් ඇති බවට මහජනතාව වෙත කෙරෙන කාරුණික දැනුම්දීමයි.

පරිපාලන නිලධාරී.
Islamic Relief

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය : ව/18/71/2005

ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් පී.ඩී.ටී.සී. රාජිකා වන මා විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 33 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම රජයට අත්කර ගෙන ඇත. ඉඩමේ අයිතිය සතාථ නොවූ හෙයින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ ප්‍රකාර තාමික වන්දි මුදල් වන රුපියල් දහසක් (රු. 1,000/=) හිමිකරුවන්ට ලබාගැනීම පිණිස ගම්පහ දිස්ත්‍රික් අධිකරණයේ නඩු අංක 945/ ඉඩම් අත්පත් යටතේ බැර කර ඇති බව මෙයින් දන්වම්.

වැඩි විස්තර සඳහා වර්ෂ 2019 පෙබරවාරි 27 වන දින අංක 2112/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජරතජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය බලන්න.

පී. ඩී. ටී. සී. රාජිකා,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

දිනය : 2021.01.16

උපලේඛනය

ඉඩමේ නම	: සොයාගත නොහැක
පිඹුරු අංකය	: මූ. පි. ගම්. 3768
කැබලි අංකය	: 80
ප්‍රමාණය	: හෙක්ටයාර් 0.0188
පිහිටීම	: බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාටාගොඩ ගම
මුදල් තැන්පත් බැංකුව සහ ශාඛාව	: ජාතික ඉතිරිකිරීමේ බැංකුව - ගම්පහ ශාඛාව
ගිණුම් අංක	: 10037-07-045018

අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය : හල්/3/2/1/55

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ රජයට අත්කර ගෙන ඇති පහත සඳහන් ඉඩම් සඳහා එම පනතේ 9 වන වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණය 2021/03/03 වන දින හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා විසින් පවත්වනු ලබන බැව් මහජනයාගේ දැන ගැනීම සඳහා දන්වා සිටිමි. මෙම ඉඩම් කෙරෙහි සම්බන්ධතාවයක් ඇති අය විසින් එම පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය. වැඩි විස්තර සඳහා අංක 2214/09 හා 2021/02/08 දිනැති රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය බලන්න.

උපලේඛනය

පළාත	: ඌව
දිස්ත්‍රික්කය	: බදුල්ල
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	: හල්දුම්මුල්ල
සුළු කොට්ඨාසය	: කන්දපල්ල කෝරලේ
ග්‍රාම නිලධාරී කොට්ඨාසය	: ඌවතැන්න 158 සී
ඉඩම පිහිටි ගම	: වෙලේගම
අවසාන පිඹුරු අංකය	: අ.ග.පි. 287 හි අතිරේක අංක 13 හි පත්‍ර අංක 15
කැබලි ගණන	: 01
මුළු ඉඩම් ප්‍රමාණය	: හෙක්ටයාර් 0.4047

වී. පී. සුනෙත් පීතේන්ද්‍රසේන,
ප්‍රාදේශීය ලේකම්,
හල්දුම්මුල්ල.

2021.02.11 වන දින
හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදිය.

State Ministry of Batik, Handloom Fabrics and Local Apparel Products

Sri Lanka Handicrafts Board - LAKSALA

Calling Quotations for A Distribution System Covering Purchasing & Delivery Method.

We are a leading Government owned commercial organization dealing with uplifting of local Handicrafts & the intention of creating market opportunities & sale of handicrafts locally & catering to foreign market requirements.

Quotations are called from reputed software developing companies and experienced individuals who are authorized by the relevant principals.

A Pre-bid meeting will be held on **Monday, 22nd Feb 2021 at 10.30 a.m.** at the below mentioned address prior to submitting quotations. Interested parties are requested to participate in a pre-bid meeting which will be mandatory when submitting quotations.

Key Requirements will be discussed in the pre-bid meeting & based on the outcome sealed quotations could be submitted by interested parties by post or hand delivered on or before **03rd March 2021 at 2.30 p.m.** addressed to:

The Chairman (Procurement) Sri Lanka Handicrafts Board - Laksala No. 215, Bauddhaloka Mawatha, Thummulla, Colombo 07.

The Tender Board of Sri Lanka Handicrafts Board has the right to accept or reject any Quotations. Further information can be obtained from the Head of IT Department 070-3453970

දිනමිණ ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/05/2021/පිටු/සැ

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දූනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/ පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2021.03.05 වෙනි දින සිට 2021.03.19 වෙනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අනහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2021.03.26 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උපලේඛනය

ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර	ඉඩම්වල විස්තර	ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර
කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම කොට්ඨාසයේ 1353 වෙළුමේ 279 පත්ඉරුව	බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තුවේ සල්පිටි කෝරළේ වැවල පිහිටි "වැඩවසම් ගමගේ වත්ත" නැමැති ඉඩමට බලයලත් මානක ඩී.පී. ලියනගේ මහතා විසින් 1982.08.13 දින මැත සාදන ලද අංක 367 දරන පිඹුරේ ලොට් සී සඳහා මායිම්, උතුර : කේ. සී. පෙරේරා හිමිකම් කියන ඉඩම නැගෙනහිර : කේ. සී. පෙරේරා හිමිකම් කියන ඉඩම දකුණ : ගම්සභා පාර බස්නාහිර : කැබලි අංක බී බිම් ප්‍රමාණය : අ.00 රූ.00 ප. 10	01. ඩබ්.ඩබ්.බී.එම්. මැන්දිස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1991.05.08 දින අංක 973 දරන විකුණුම් ඔප්පුව.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
නො. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

ප්‍රසම්පාදන දැන්වීම

පශු සම්පත් ගොවිපල ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන පහත දැක්වෙන භාණ්ඩ මිලදී ගැනීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

කාර්ය අංකය	විෂය	ලංසු බැඳුම්කරය (රු.)	ආපසු නොගෙවන ලංසු ලේඛන ගාස්තුව (රු.)	ලංසු ලේඛන නිකුත් කරන කාල සීමාව	ලංසු ලේඛන භාර ගන්නා කාල සීමාව
01	කෘතිම සිංචන උපකරණ - 2021	368,000/-	එක් ලේඛනයක් සඳහා රු. 2,500/-	2021.02.17 සිට 2021.03.09 දක්වා	2021.03.10 පෙ.ව. 11.00 දක්වා

01. අදාළ ලංසු ලේඛන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මූල්‍ය) කාර්යාලයෙන් කාර්යාලීය වේලාවන්හිදී (පෙ.ව. 9.00 - ප.ව. 3.00) ලබාගත හැකිය. ලංසු ලේඛන බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ අයිතමයේ නම පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.

02. මුද්‍රා, තබන ලද ලේඛන, ලංසු ලේඛන භාර ගන්නා අවසන් දිනයට හෝ ඊට පෙර මූල්‍ය අංශයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම හෝ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම සිදු කළ හැක.

03. මිලදී ගැනීම් වලට අදාළ ලංසු ලේඛන සම්බන්ධ වැඩිදුර තොරතුරු සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ (www.daph.gov.lk) යන වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

අධ්‍යක්ෂ ජනරාල් / සභාපති (දෙ.ප්‍ර.ක.)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
අංක 1020, තැ.පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය.
දුරකථන අංක - 081-2388197 / 081-2388227 / 081-2385701
081-2388120 / 081-2388189 (දිගුව - 290/292)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ප්‍රවාහන අමාත්‍යාංශය/ ශ්‍රී ලංකා දුම්රිය සේවය

දුම්රිය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

ලංසු සඳහා ආරාධනයයි

දිනය : 2021.02.17
ණය අංකය : ADB LOAN No. SRI 3806
කොන්ත්‍රාත් අංකය : REIP/ADB/ICB/G/09

ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා Train Simulator, Train Control Console and **08** Nos. of Trainee Desks **යන්ත්‍රයක් නිපදවීම, සැපයීම, ස්ථාපිත කිරීම, භාවිතාව සඳහා සකස් කිරීම, භාරදීම සහ එම යන්ත්‍රය සවිකිරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා වන ප්‍රසම්පාදනය.**

ලංසු භාර ගැනීමේ අවසාන දිනය 2021.04.05 ප.ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන්)

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි (REIP) පිරිවැය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය මුදලක් ඉල්ලා ඇති අතර, එම ණය මුදලෙන් කොටසක් ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව යටතේ යෝග්‍ය ගෙවීම් සිදුකිරීම සඳහා යොදගනු ඇත.

2. සේවා යෝජක ("The Employer") ප්‍රවාහන අමාත්‍යාංශය / ශ්‍රී ලංකා දුම්රිය සේවාව විසින් පහත දැක්වෙන පැකේජයන් සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

ලංසු අංකය	කොන්ත්‍රාත් නාමය	ස්ථානය	කාලසීමාව (මාස)
REIP/ADB/ICB/G/09	ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා Train Simulator, Train Control Console and 08 Nos. of Trainee Desks යන්ත්‍රයක් නිපදවීම, සැපයීම, ස්ථාපිත කිරීම, භාවිතාව සඳහා සකස් කිරීම, භාරදීම සහ එම යන්ත්‍රය සවිකිරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වන ප්‍රසම්පාදනය	රත්මලාන කොළඹ, ශ්‍රී ලංකාව	12

3. ලංසුකරණය, ආසියානු සංවර්ධන බැංකුවේ නොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදනයෙහි තනි අදියර - ද්විත්ව ලියුම් කවර (Single-Stage: Two-Envelope) ලංසු පට්පාටිය ප්‍රකාරව ජාත්‍යන්තර තරඟකාරී ලංසුකරණය ක්‍රියාවලිය යටතේ සිදුකෙරෙනු ඇත. (ආසියානු ප්‍රසම්පාදන මාර්ගෝපදේශය 2.6)

4. ලංසුකරුවන් විසින් පහත දක්වෙන නිර්ණායක සපුරාලිය යුතුය :
   (i) Pending Litigation ලංසුකරුගේ කොන්ත්‍රාත් වටිනාකමින් 50% වැඩි නොවිය යුතුය.
   (ii) ආසන්නතම පසුගිය වසර 03 ඇතුළත ලංසුකරු විසින් උපයා ඇති කොන්ත්‍රාත් වටිනාකම සතුටුදායක මට්ටමක පැවතිය යුතුය.
   (iii) පසුගිය වසර තුන ඇතුළත අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම වන ඇ.ඩො. මිලියන 6 ගණනය, ආසන්නතම වසර 03 ඇතුළත යෝජිත කොන්ත්‍රාත්තුවට සමාන වුද, නිම කරන ලද හා සිදු කරමින් පවතින කොන්ත්‍රාත්තු සඳහා වන මුළු ලැබීම් මත විය යුතුය.
   (iv) මූලික ක්‍රියාකාරකම් පිළිබඳ පළපුරුද්ද (i) සමාන කොන්ත්‍රාත්තුමය පළපුරුද්ද (ii) තාක්ෂණික පළපුරුද්ද ඉහත (iv) හි සඳහන් යෝග්‍යතා නිර්ණායකයන් පිළිබඳ වැඩි විස්තර සඳහා ව්‍යාපෘති වෙබ් අඩවිය : https://csrp.lk/procurement හා දුරකථන අංක :0094-112056240-41 (දිගුව 301-302) අමතන්න.

5. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2021 පෙබරවාරි 17 දින සිට 2021 අප්‍රේල් 05 දින දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව 9.00 හා ප.ව. 3.00 අතර කාලය තුළ, පහත දක්වා ඇති ලිපිනයෙහිදී අවශ්‍ය වැඩිදුර විස්තර ලබා ගැනීමට සහ ලංසු ලේඛන පරීක්ෂාකොට බැලීමට හැකිය.

ව්‍යාපෘති අධ්‍යක්ෂ
ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (CSRP)
නො: 217, කොටා පාර, කොළඹ-08, ශ්‍රී ලංකාව.
දුරකථන: 0094-112056240-41, ෆැක්ස්: 0094-112674354
විද්‍යුත් තැපෑල : pd@csrp.lk or palitha.rail@yahoo.com
Website : www.csrp.lk

6. අභිලාෂී ලංසුකරුවන්ට, ආපසු ගෙවනු නොලබන රු. 60,000.00 ක හෝ ඇ.එ.ජ.ඩො. 330.00 (වැට් බදු ඇතුළත්ව) මුදලක් මුදලින් හෝ බැංකු අණකරයක් මගින් ගෙවීමෙන් අනතුරුව ඉහත සඳහන් ලිපිනයෙහි ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් 2021 පෙබරවාරි 17 දින සිට 2021 අප්‍රේල් 05 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පැය 09.00 සිට පැය 15.00 දක්වා කාලය තුළදී ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් ලබා ගත හැකිය.

7. ලංසු ලේඛනවල දක්වා ඇති වටිනාකමින් යුතු ලංසු සුරක්ෂණයක් සහිත මුද්‍රා, තබන ලංසු, ලිපි ලේඛන ලංසු භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර (2021.04.05 වැනි දින ප.ව 2.00) ලැබෙන සේ පහත සඳහන් ලිපිනය වෙත එවිය යුතුය. ලංසු සුරක්ෂණයට සමාන මුදල් වටිනාකම නිශ්චය කිරීම සඳහා, ලංසු භාර ගන්නා අවසන් දිනට දින 28කට පෙරාතුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත විදේශ මුදල් විකුණුම් මිල අනුපාතය අදාළ කරගනු ලැබේ.

8. ලංසු විවෘත කිරීම, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම සඳහා සහභාගි වීමට කැමති ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේදී සිදු කෙරේ.

9. පූර්ව ලංසු රැස්වීමක් 2021 මාර්තු 03 වැනි දින පැය 10.00 ට බත්තරමුල්ල, සෙත්සිරිපාය අදියර 11, 07 වැනි මහලේ ප්‍රවාහන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පැවැත්වේ . අභිලාෂී ලංසුකරුවන්ට තම වියදමින් ඒ සඳහා සහභාගි විය හැකිය.

10. ලංසු ලේඛන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධ සියලුම ගාස්තු ලංසුකරුවන් විසින් දැරිය යුතු වන අතර, ලංසුකරණ ක්‍රියාවලියෙහි ස්වරූපය හෝ එහි ප්‍රතිඵල සම්බන්ධයෙන් වගකීම හෝ වගවීම සේවා යෝජක විසින් දරණු නොලැබේ.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන අමාත්‍යාංශය
7 වැනි මහල සෙත්සිරිපාය අදියර 02,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකාව.

ලංසු සඳහා ආරාධනයයි

දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP)

වාරිමාර්ග අමාත්‍යාංශය

IFB අංකය : CRIWMP/PMU/PROC/2021/SER/01/A

ලංසු සඳහා ආරාධනයයි - වාහන කුලියට ගැනීම

01. කොළඹ 10, ටී.බී. ජයා මාවත, අංක 500, 12 වන මහල, වාරිමාර්ග අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙනුවෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් පහත විස්තර කොට ඇති පරිදි වසර දෙකක කාලයක් සඳහා වාහන කුලියට ලබාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ වාහන කුලියට ලබාදෙන සමාගම් හෝ වාහන හිමිකරුවන් වෙතින් මුද්‍රා, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. දේශගුණීත විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය, එහි මෙහෙයුම් අනුරාධපුරය, වවුනියාව, පුත්තලම,කුරුණෑගල, ත්‍රිකුණාමලය, මන්නාරම හා පොලොන්නරුව දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කොට ඇත. ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා ඇති අතර, එහි උපකාර්යාලය අනුරාධපුරයේ පිහිටුවා ඇත. පහත සඳහන් පරිදි හිමිකරු විසින් ඉන්ධන, සියලුම නඩත්තු වියදම් හා රියදුරුගේ සියලුම වියදම් සිදුකිරීම යටතේ වාහන කුලි පදනම මත ලබාගැනීමට ව්‍යාපෘතිය අපේක්ෂා කරයි.

   අ. ලොට් අංක 01 - ඩබල් කැබ් 4WD කොළඹ/අනුරාධපුර කාර්යාලයේ සිට අනෙකුත් දිස්ත්‍රික්කවලට - ගණනින් 06

   ආ. ලොට් අංක 02 - ආසන 9 සහ ද්විත්ව වායුසමීකරණ යන්ත්‍ර සහිත වෑන් රථය- කොළඹ/අනුරාධපුර කාර්යාලයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක වලට - ගණනින් 01

03. ලංසුකරු වාහන හිමිකරුවෙකු හෝ වාහන කුලියට ලබාදෙන සමාගමක් විය යුතුය. A-1 සහ A-2 යන අමුණා ඇති ආකෘතිවල සඳහන් පරිදි සම්පූර්ණ වාහන සංඛ්‍යාවට ලංසුකරුවන් ලංසු ඉදිරිපත් කළ යුතුය. **සංඛ්‍යාවෙන් කොටසක් වෙනුවෙන් ලොට් අංක 01 සඳහා ඉදිරිපත් කරනු ලබන ලංසු භාර නොගෙන ප්‍රතික්ෂේප කරනු ලැබේ.** ලොට් වශයෙන් ලංසු ඇගයීමට ලක් කෙරේ. ලොට් එකකට වඩා ප්‍රමාණයක් සඳහා ලංසු ඉදිරිපත් කරන්නේ නම් එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා හත්වන (07) ජේදයේ සඳහන් පරිදි වෙන් වෙන් වශයෙන් ලංසු ඇපකර ඉදිරිපත් කළ යුතුය. තවද, වෙන් වෙන් වශයෙන් ලැයිස්තුගත කොට ඇති එක් එක් ලොට් සඳහා සුදුසුකම්/ යෝග්‍යතා නිර්ණායකයන් විශේෂයෙන් ඇතුළත් කළ යුතුය. ලංසු ඇගයීමට ලක් කෙරෙන ක්‍රියාවලියේදී අනෙකුත් ලොට් සඳහා සාර්ථක ලංසුකරුවන් විසින් ඉදිරිපත් කළ ලංසු, ඔවුන්ගේ ඒකරාශී වූ ධාරිතාව සහ ඉතිරි සුදුසුකම්/යෝග්‍යතා නිර්ණායකයන් මත ඇගයීමට ලක් කෙරේ.

04. ජාතික තරඟකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ. http://www.treasury.gov.lk/documents/57687/174939/Procurement Manual 2006 20060817 with Sup8.pdf/5d0563ed-05b1-4629-9937-db8e160aac 29. Reference Guideline 3.2

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු ඕනෑම රාජකාරී දිනයක 0900 පැය හා 1600 පැය අතර කොළඹ 10, ටී.බී ජයා මාවත, අංක 500, 12 වන මහලේ වාරිමාර්ග අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙතින් (දුරකථන අංකය : 0112672223) ලබාගත හැකිය. ඊමේල් tendercriwmp@gmail.com

06. ලංසු ලිපිලේඛන කට්ටලයක් (ලොට් 02 කින් සමන්විත) සඳහා ආපසු ගෙවනු නොලබන රු. 4,000.00 ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව CRIWMP ව්‍යාපෘති අධ්‍යක්ෂ නමින් කොන්ත්‍රාත්කරුගේ ව්‍යාපාර ලිපිශීර්ෂයක ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මගින් කොළඹ 10, ටී.බී. ජයා මාවත, අංක 500, 12 වන මහලේ වාරිමාර්ග අමාත්‍යාංශයේ CRIWMP කාර්යාලය වෙතින් 2021.02.17 වෙනි දින සිට 2021.03.09 වෙනි දින දක්වා රාජකාරී වේලාව තුළදී (0900 පැය හා 1500 පැය අතර) ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

07. ලංසු විවෘත කරනු ලබන දිනයේ සිට දින 91 ක් ලංසු වලංගු විය යුතු අතර, (ලංසු ඇපකරය දින 119 ක් වලංගු විය යුතුය) ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගනු ලබන වාණිජ බැංකුවක් හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ලංසු සුරක්ෂණ නිකුත් කිරීම සඳහා බලය පවරන ලද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි රක්ෂණ සමාගමක් විසින් නිකුත් කරන ලද පිළිවලින් ලොට් 01 සඳහා රු. 200,000.00 ක වටිනාකමක් ඇති සහ ලොට් 02 සඳහා රු. 40,000.00 ක වටිනාකමන් යුත් (ලොට් දෙකම සඳහා රු. 240,000.00 ක්) ලංසු ඇපකර වාරිමාර්ග අමාත්‍යාංශයේ CRIWMP ව්‍යාපෘති අධ්‍යක්ෂ නමින් වූ ඉල්ලූ විට ගෙවිය හැකි සහ කොන්දේසි රහිත ලංසු සුරක්ෂණ අමුණා එවිය යුතුය. ලංසු සුරක්ෂණය සඳහා වන ආකෘතිය ලංසු ලිපිලේඛනයේ "A" ඇමුණුමට අමුණා ඇත. ලංසු සුරක්ෂණය සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

08. මුද්‍රා, තබන ලද ලංසු, 2021.03.10 වෙනි දින 1400 පැයට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑල මගින් එවීමට හෝ එම ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. ලංසු බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, "CRIWMP සඳහා වාහන කුලියට ලබාගැනීම - CRIWMP/PMU/PROC/2021/SER/01A" යනුවෙන් සඳහන් කළ යුතුය.

ව්‍යාපෘති අධ්‍යක්ෂ,
ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,
දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ
ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
12 වන මහල, අංක 500, ටී.බී. ජයා මාවත,
කොළඹ 10.

09. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීමට නියමිත අවසාන වේලාව ඉක්මවූ වහාම එම ස්ථානයේදී සියලුම ලැබුණු ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැක.

සභාපති වෙනුවෙන්,
ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,
ව්‍යාපෘති අධ්‍යක්ෂ
දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ
ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය
වාරිමාර්ග අමාත්‍යාංශය,
12 වන මහල, 500, ටී.බී ජයා මාවත,

දිනමිණ The Dinamina

ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

ප්‍රසම්පාදන දැන්වීම

දිස්ත්‍රික් මහ රෝහල - නුවරඑළිය

ගොඩනැගිලි නඩත්තු කොන්ත්‍රාත්කරුවන් ලියාපදිවි කිරීම සඳහා ආරාධනයයි

නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවෙහි සභාපති විසින් පහත සඳහන් උපලේඛණයේ දක්වා ඇති පරිද්දෙන් ශ්‍රී ලංකා ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනයේ (ICTAD) ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් වෙතින් 2021.02.17 වන දින සිට 2021.03.10 ප.ව. 12.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් කළ වහාම ඉහත ලිපිනයෙහි අධ්‍යක්ෂ කාර්යාලයේදී ලංසු විවෘත කිරීම සිදු කරනු ලබන අතර, ඒ සඳහා ලංසුකරු හෝ ලංසුකරුගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැක.

02. නුවරඑළිය මහ රෝහලෙහි ප්‍රධාන කාර්යාලයෙන් 2021.02.17 වන දින සිට 2021.03.09 වන දින තෙක් වැඩකරන දිනයන්හි පෙරවරු. 9.00 ත් හා පස්වරු 3.00 ත් අතර කාලය තුළදී ලංසු ලේඛන ලබාගත හැකි අතර, කිසිදු අයකිරීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කළ හැක. ලංසු ලේඛන ලබා ගැනීමට ලංසුකරුවන් තමාගේ සුදුසුකම් සනාථ කරන සාක්ෂි සහ ලංසු ගාස්තුව ගෙවීම වෙනුවෙන් රෝහලේ ගණකාධිකාරි විසින් නිකුත් කරන ලද ලදුපත ඉදිරිපත් කළ යුතුය.

අනු අංකය	ලිපිගොනු අංකය	අයිතමය	යෝග්‍යතාවය	ආපසු නොගෙවෙන ලංසු ගාස්තු
01.	GH/NEL/ත.කොප/01/01/2021	2021 වර්ෂය සඳහා නුවරඑළිය මහ රෝහල සඳහා ගොඩනැගිලි නඩත්තු කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම (300,000.00 ඉක්මවා නොයෙන කොන්ත්‍රාත්)	M 10 හෝ ඊට ඉහළ	රු. 1,500.00
02.	GH/NEL/ප.ප.න.කි/01/02/2021	2021 වර්ෂය සඳහා නුවරඑළිය මහ රෝහලේ පල්දේරු පද්ධතිය නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම (300,000.00 ඉක්මවා නොයෙන කොන්ත්‍රාත්)	M 10 හෝ ඊට ඉහළ	රු. 1,500.00

වැඩි විස්තර සඳහා ප්‍රධාන කාර්යාලය අමතන්න. ඕනෑම ලංසුවක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව සතුය.

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
දිස්ත්‍රික් මහ රෝහල,
නුවරඑළිය.

දුරකථන අංක : 052-2224307 / 052-2224308

ලංසු සඳහා ආරාධනයයි

දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP)

වාරිමාර්ග අමාත්‍යාංශය

ප්‍රසම්පාදන දැන්වීමයි

CRIWMP සඳහා ශ්‍රව්‍ය / දෘශ්‍ය සේවාවන් ප්‍රසම්පාදනය

1. කොළඹ 10, ටී.බී. ජයා මාවත, අංක 500, 12 වන මහල, වාරිමාර්ග අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව වෙනුවෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් වසරක කාල සීමාවක් සඳහා අනුපාතික කොන්ත්‍රාත් පදනම මත ශ්‍රව්‍ය / දෘශ්‍ය සේවාවන් ප්‍රසම්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ චිත්‍රපට / වීඩියෝ නිෂ්පාදනය කරන සමාගම් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.
2. දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය විසින් එහි මෙහෙයුම් අනුරාධපුරය, වවුනියාව, පුත්තලම, කුරුණෑගල, ත්‍රිකුණාමලය, මන්නාරම සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කොට ඇත. ව්‍යාපෘතියේ උප කාර්යාලය අනුරාධපුර නගරයේ පිහිටුවා ඇති අතර ප්‍රධාන කාර්යාලය කොළඹ 10, වාරිමාර්ග අමාත්‍යාංශයේ පිහිටා ඇත. දේශීය හා ජාත්‍යන්තර ප්‍රජාවන් අතර අවබෝධයක් ඇති කිරීම සඳහා වසරක කාලසීමාවක් සඳහා අනුපාතික කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘති කටයුතුවල ප්‍රගතිය පිළිබඳව ශ්‍රව්‍ය / දෘශ්‍ය සේවාවන් ලබාගැනීම සඳහා ව්‍යාපෘතිය අපේක්ෂා කරයි.
3. ජාතික තරඟකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ. ලංසුකරු, චිත්‍රපට / වීඩියෝ නිෂ්පාදන සමාගමක් විය යුතුය. මේ සඳහා උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වැඩිදුර තොරතුරු ඕනෑම රාජකාරී දිනක 0900 පැය හා 1600 පැය අතර කොළඹ 10, ටී.බී ජයා මාවත, අංක 500, 12 වන මහලේ, වාරිමාර්ග අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපාති අධ්‍යක්ෂ වෙතින් (දුරකථන අංකය : 011-2672223) ලබාගත හැකිය.
4. එක් ලිපිලේඛන කට්ටලයක් සඳහා ආපසු ගෙවනු නොලබන ලංකා රු. 1,000.00 ක ගාස්තුවක් ගෙවීමෙන් අනුතුරුව CRIWMP ව්‍යාපෘති අධ්‍යක්ෂ නමින් කොන්ත්‍රාත්කරුගේ ව්‍යාපාර ලිපිශීර්ෂයක ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් කොළඹ 10, ටී.බී. ජයා මාවත, අංක 500, 12 වන මහලේ වාරිමාර්ග අමාත්‍යාංශයේ CRIWMP කාර්යාලයෙන් 2021-02-17 වෙනි දින දින සිට 2021-03-09 වෙනි දින දක්වා කාර්යාල වේලාව තුළදී (0900 පැය හා 1500 පැය අතර) ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.
5. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් වාණිජ බැංකුවක් හෝ ලංසු සුරක්ෂණ නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් බලය ලබාදී ඇති ශ්‍රී ලංකාවේ ලියාපදිංචි රක්ෂණ සමාගමක් විසින් නිකුත් කරන ලද රු. 50,000.00 ක වටිනාකමින් යුත් ඉල්ලූවිට ගෙවිය හැකි හා කොන්දේසි රහිත ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය. ලංසු සුරක්ෂණය සඳහා වන ආකෘතිය "ඇමුණුම "A" හි අමුණා ඇත. සියලුම ලංසු සුරක්ෂණ, ලංසු වලංගු කාල සීමාවේ සිට අවම වශයෙන් දින 28 ක් වලංගු විය යුතුය. ලංසු සුරක්ෂණ ලෙස චෙක්පත් භාරගනු නොලැබේ.
6. මුද්‍රා තබන ලද ලංසු, 2021-03-10 වෙනි දින 1400 පැයට පෙර ලැබෙන පරිදි හතර වන (04) ජේදයේ සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ එම ලිපිනයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියේ" බහාලිය යුතුය. ලංසු බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"CRIWMP සඳහා ශ්‍රව්‍ය / දෘශ්‍ය සේවාවන් සඳහා වන ප්‍රසම්පාදනය CRIWMP/PMU/PROC/2021/SER/02"** යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසු භාර ගැනීමේ අවසාන දිනයේ සිට දින 90 ක් ලංසු වලංගු විය යුතුය.
7. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම සඳහා නියමිත අවසාන වේලාව ඉක්මවූ වහාම එම ස්ථානයේදීම ලැබුණු සියලුම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතවරුන් පැමිණ සිටිය හැකිය. පූර්ව ලංසු රැස්වීමක්, 2021-03-02 වෙනි දින 1000 පැයේදී හතරවන (04) ජේදයේ සඳහන් ලිපිනයේදී පැවැත්වේ. මෙම පූර්ව ලංසු රැස්වීමට සහභාගි වන මෙන් සියලුම අපේක්ෂිත ලංසුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

සභාපති වෙනුවෙන්,
ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,
ව්‍යාපෘති අධ්‍යක්ෂ,
දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වන,
ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය,
වාරිමාර්ග අමාත්‍යාංශය,
12 වන මහල, 500, ටී.බී. ජයා මාවත,
කොළඹ 10.

(වැවිලි අමාත්‍යාංශය/ පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදනය හා අපනයන විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යාංශය)

හලාවත වැවිලි සමාගම

පොල් ගස් අලෙවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම

වත්ත	අලෙවිකරණ		ප්‍රසම්පාදන		
	ද්‍රව්‍ය	ප්‍රමාණය	දිනය	වේලාව	ස්ථානය
තම්බපණිණී	පොල්ගස් (වැටුණු/ මැරුණු/ කණාටු)	203	2021.02.24	පෙ.ව. 10.30	තම්බපණිණී වතු කොට්ඨාසය, තම්බපණිණී වත්ත, පුත්තලම
පලුගස්වැව	පොල්ගස් (වැටුණු/ මැරුණු/ කණාටු)	120	2021.02.25	පෙ.ව. 10.30	හලාවත වැවිලි සමාගම, අංක 165, පුත්තලම් පාර, හලාවත.
දිවුලපිටිය	පොල්ගස් (වැටුණු/ මැරුණු/ කණාටු/ සර්වි)	442	2021.03.03	පෙ.ව. 10.30	දිවුලපිටිය වතු කොට්ඨාසය, කටුකෙත්ද අංක 03 වත්ත, බඩල්ගම.

1. අදාළ ප්‍රසම්පාදනපත් රුපියල් 500/= ක ගාස්තුවක් ගෙවා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සහ ප්‍රසම්පාදනපත් විවෘත කරන දිනයේ පෙ.ව. 10.15 දක්වා ඉහත සඳහන් ස්ථානවලින් ලබාගත හැක.
2. වැඩි විස්තර සඳහා දුරකථන අංක 032-5741263 තම්බපණිණී, 032-5678050 පලුගස්වැව සහ 031-5679751 දිවුලපිටිය යන වතු අධිකාරිවරුන් අමතන්න.

සභාපති - ප්‍රසම්පාදන කමිටුව,
හලාවත වැවිලි සමාගම,
165, පුත්තලම් පාර, හලාවත.

ලංසු සඳහා ආරාධනයයි (IFB - 01)

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

උතුරු පළාත

01. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන්, **දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති** විසින් පහත වගුවේ විස්තර කොට ඇති ඉදිකිරීම් කර්මාන්තය සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.
02. ලංසුකරණය **ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින්** මෙහෙයවනු ලබන අතර, පිළිවෙලින් **අංක 03/2020 සහ 03/2020 (1) හා 2020.10.09 හා 2021.01.11** දිනම දරන රාජ්‍ය මුද්දල් චක්‍රලේඛ යොදා ගනු ලැබේ.
03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛන ගත නොවූ හා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි පහත වගුවේ සඳහන් ශ්‍රේණිය සඳහා ලියාපදිංචිය ලබා තිබිය යුතුය.
04. සුදුසුකම් අවශ්‍යතා ලංසුකරණ ලිපිලේඛනයෙහි 4 වන වගන්තියෙහි දක්වා ඇත. අමතර විස්තර **ලංසුකරණ දත්ත සහ කොන්ත්‍රාත් දත්ත** (5 වන වගන්තිය) වල සඳහන්ව ඇත.
05. අභිලාෂී ලංසුකරුවන්ට වැඩිමනත් තොරතුරු **පහත 6 හි සඳහන් ලිපිනයෙන්** ලබාගත හැකි අතර, එම ස්ථානයේදීම ඕනෑම කාර්යාල දිනයක පෙ.ව. 9.00 ත් ප.ව. 4.00 ත් අතර ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
06. **2021.02.16 දින සිට 2021.03.08 දින තෙක්** පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 **දක්වා, යාපනය, පන්සල පාර, නො. 59, උතුරු පළාත, පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, පළාත් ඉඩම් කොමසාරිස් (දුරකථන 021-2220836, ෆැක්ස් - 021-2220836)** වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා රු. 14,000.00 ක ආපසු නොගෙවෙන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසු ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.
07. ලංසු (මුල්පිටපත හා අනුපිටපත) **යාපනය, පන්සල පාර, නො. 59, උතුරු පළාත, පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, පළාත් ඉඩම් කොමසාරිස්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති** වෙත 2021.03.09 දින පෙ.ව. 10.30 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලංසු අංකය ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට සහභාගි වීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කෙරේ.
08. පූර්ව ලංසු රැස්වීම 2021.03.02 දින පෙ. ව. 10.30 ට **ආරම්භව, යාපනය, පන්සල පාරේ, නො. 59, උතුරු පළාත, පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේදී පැවැත්වේ.**
09. පහත වගුවේ දී ඇති තොරතුරු පරිදි ලංසු සමග ලංසු සුරක්ෂණයක් එවිය යුතුය.

ලංසු අංකය	වැඩ විස්තරය	ඇස්තමේන්තුගත පිරිවැය / (රුපියල් මිලියන)	කොන්ත්‍රාත් කාලය	අවශ්‍ය ශ්‍රේණිය	අවශ්‍ය ලංසු සුරක්ෂණය	
					සුරක්ෂණ මුදල	වලංගු කාලය
NP/B/ KI/01(2021)	කිලිනොච්චිය, උතුරු පළාත, පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සඳහා දෙමහල් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම	62.7	දින 300	C4 හෝ C3 (ගොඩනැගිලි)	630,000.00	2021.07.06 දක්වා

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
උතුරු පළාත.

ටෙන්ඩර් දැන්වීමයි

ටෙන්ඩර් අංකය : MSI/2021/02

දැව කඳන් හා අතු කොටස් විකිණීම

දැව කඳන් හා අතු කොටස් විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

	ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල රු.
• **දැව කඳන් හා අතු කොටස්** (කැන්ද, ගැඩුම, ලුනුමිදෙල්ල, කොට්ටන්)	5,000/-

2021.02.17 දින පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා 221/1A, ලේක්හවුස් බිල්ලොක්, සරෝජිනී වත්ත, හෝකන්දර දකුණ, හෝකන්දර යන ස්ථානයේදී මෙම අයිතමයන් පරීක්ෂා කර බැලිය හැක. ටෙන්ඩර් අයදුම්පත් ආපසු නොගෙවනු ලබන රු. 250.00 මුදලක් හා ආපසු ගෙවනු ලබන රු. 5,000/- තැන්පත් මුදලක් ගෙවා කොළඹ ලේක්හවුස් ආයතනයේ මිලදී ගැනීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

මුද්‍රිත මිල ගණන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර **"දැව කඳන් හා අතු කොටස් විකිණීම"** යනුවෙන් සඳහන් කර 2021 පෙබරවාරි මස 24 දින පස්වරු 3.00 ට පෙර ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. එදිනම එසැනින් ටෙන්ඩර්කරුවන් ඉදිරියේ ටෙන්ඩර් පත්‍රිකා විවෘත කෙරේ.

සාර්ථක ටෙන්ඩර්කරු ප්‍රදානය පිළිබඳ දැනුම් දී දින 14 ක් ඇතුළත සම්පූර්ණ මුදල ගෙවා අයිතම ඉවත්කරගත යුතුය. එසේ නොකළහොත් ටෙන්ඩර් තැන්පතු මුදල් ආපසු ගෙවනු නොලැබේ.

ටෙන්ඩරය හිමිවන ටෙන්ඩර්කරු තමන්ට ලැබෙන අයිතමයන් සඳහා ඉදිරිපත් කර ඇති මුදලට බද්ද (වැට්) 8% ගෙවිය යුතුය.

පෙර දැනුම් දීමකින් තොරව ටෙන්ඩරය සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් ඉවත් කිරීම හෝ පිළිගැනීමේ පූර්ණ අයිතිය ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සතුව ඇත.

ප්‍රධානි - ප්‍රසම්පාදන
ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,
තැ.පෙ. 248,
නො. 35, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ - 10.
දුරකථන අංක : 2 429422, දිගුව 451, 452

LAKE HOUSE

කඩවත, මහර, දළුපිටිය, මිහිඳු මාවත, නො. 181/2, පදිංචි **ජාතුංග ගමගේ තඹර රේණුක** වන මා විසින් **ෆැන්සිස් කංකානම්ගේ යුරාන් තික්ෂණ** වෙත ලබාදුන් අංක 806/2016.09.06 දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රය මෙතැන් පටන් අවලංගු කරන බව දන්වමි.

නම වෙනස් කිරීම

කොළඹ දිස්ත්‍රික්කයේ වේල්ලවිදිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ G/1/A නවගම්පුර ස්ටේස් පාර කොළඹ 14 ලිපිනයේ පදිංචි **සුරේෂ් කුමාර් මනෝජන්** යන නමින් හඳුන්වූ මා මෙතැන් පටන් **හෙට්ටිගේ දොන් මනුජ සුලෝචන ගුණසේකර** යන නමින් හඳුන්වනු ලබන බව ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මෙයට,
හෙට්ටිගේ දොන් මනුජ සුලෝචන ගුණසේකර

කෝට්ටේ මිෂන් පාර අංක 18 (දැනට පදිංචි රත්මලාන, 5 වැනි පටුමග අංක 24) සුරවීර වැත්දබෝනා (ජාතික හැඳුනුම්පත් අංක 330400587V) වන මම සිසිර එදිරිසිංහ නිතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සහතික කරන ලද බෙත්තොට වරාහේන පදිංචි ධර්මවර්ධන කොලොන්නේ (ජාතික හැඳුනුම්පත් අංක 570551370V) වෙත පවරන ලද අංක 2272 හා 2017 අගෝස්තු 8 දින දරන ඇටර්නි බලපත්‍රය 17/02/2021 දින අවලංගු කරන ලදින් ඔහු විසින් කරනු ලබන කිසිම ක්‍රියාමාර්ගයක් මා විසින් වගකීම් නොකරන බව මින් දන්වමි.

afc රන් ණය සේවාව
රන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පීවිල්සී පහත සඳහන් ස්ථානවල උකස් තබන ලද 2019-11-30 දිනට කල්පිරුණු, මෙතෙක් බේරා නොගත් රන් භාණ්ඩ 2021-02-24 වන දින පෙ.ව. 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රන් ණය මධ්‍යස්ථාන

අළුත්ගම, අම්බලන්ගොඩ, අම්පාර, අනුරාධපුර, අතුරුගිරිය, අවිස්සාවේල්ල, බදුල්ල, බලංගොඩ, මඩකලපුව, චන්කනෙයි, චාවකච්චේරි, හලාවත, චුන්නක්කම්, දඹුල්ල, ගලේවෙල, මොණරාගල, හැටන්, හෝමාගම, හොරණ, ජා-ඇල, යාපනය, කඩවත, කදුරුවෙල, කඩුවෙල, කලවංචිකුඩි, කල්පිටිය, කිලිනොච්චි, කිරිබත්ගොඩ, කිරිඳිවැල, මාලබේ, මාතර, මීගමුව, නිට්ටඹුව, පානදුර, පිළියන්දල, පේදුරු තුඩුව, පූගොඩ, රත්නපුර, රිකිල්ලගස්කඩ, තිරුනෙවේලි, ත්‍රිකුණාමළය, වව්නියාව, වැලිමඩ, දෙහිඅත්තකණ්ඩිය, ගල්ගමුව, කළුතර, කෑගල්ල, කැලණිය, කුරුණෑගල, නාවලපිටිය, රාගල, රාජගිරිය, වැලල්ලවාය, කොහුවල, නුවර එලිය, නිකවැරටිය, මාතලේ, හින්ගුරක්ගොඩ, මැදවච්චිය

වෙන්දේසිය පැවැත්වෙන ස්ථානය සහ දිනය
නො 722, කෝට්ටේ පාර, රාජගිරිය
2021-02-24

වෙන්දේසිය සඳහා පැමිණෙන සියලුම දෙනා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය. දැනුම්දීමකින් තොරව වෙන්දේසිය අවලංගු කිරීමේ, කල් දැමීමේ හා ඒකාබද්ධ කිරීමේ බලය එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පී එල් සී සතුය.

ආරම්භය 1956
එලායන්ස් ෆිනෑන්ස්
කොම්පැනි පී එල් සී
සෙසභාග්‍යයට විශ්වාසනීය අඩිතාලමක්

ප්‍රධානි - රන් ණය
එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී
නො.722, කෝට්ටේ පාර, රාජගිරිය.
දුරකථන - 0115 573600

ප්‍රසම්පාදන දැන්වීමයි

සෞඛ්‍ය අමාත්‍යාංශය

මහජන සෞඛ්‍ය ආයතන සඳහා
වසර 02 ක කාලයකට ඊ - සෞඛ්‍ය ජාලය
(E-health network)
සැලසුම් කිරීම, සැපයීම හා ස්ථාපනය

කොන්ත්‍රාත් අංකය : HP/HI/H/01/2020

1. සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ "C_2", සභාපති විසින් මහජන සෞඛ්‍ය ආයතන සඳහා වසර 02 ක කාලයකට ඊ - සෞඛ්‍ය ජාලය (E-health Network) සැලසුම් කිරීම, සැපයීම හා ස්ථාපනය සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.
2. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණය මගින් මෙහෙයවනු ලැබේ. රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයේ කවර දෙකේ පද්ධතිය අනුගමනය කෙරේ.
3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛන ගත වූවකු නොවිය යුතු අතර, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නිතිගත කර ඇති හා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු වශයෙන් PCA3 සහතිකය ලබා ඇති අයකු විය යුතුය.
4. **2021.02.17 දින සිට 2021.03.02** දින දක්වා කාර්යාල දිනයන්හි **පෙ.ව. 9.30 සිට ප.ව. 2.00 දක්වා** ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන **රු. 12,500.00 ක** ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) වෙතින් අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් සකසන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ආපසු නොගෙවන **රු. 12,500.00 ක** ලිපිලේඛන ගාස්තුව ලංකා බැංකුවේ තැප්‍රොබේත් ශාඛාවේ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක 7040244 දරන ගිණුමට බැර කළ යුතු අතර, ඒ සඳහා ලබාගත්තා ලදුපතෙහි පිටපතක් ගෙවීම් කළ බව සනාථ කරලීමට ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.
5. ලංසුකරණ ලිපි ලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.
6. **තාක්ෂණික** යෝජනා හා මූල්‍ය යෝජනා (ලංසු ඉදිරිපත් කිරීමේ පෝරමය හා මිල ලේඛනය) වෙනම කවරවල ඉදිරිපත් කළ යුතුය. අදාළ ලිපිකවරවල "**තාක්ෂණික යෝජනා**" සහ "**මූල්‍ය යෝජනා**" වශයෙන් පැහැදිලිව ලකුණු කොට (රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයේ ලිපි කවර දෙකේ පද්ධතිය අනුගමනය කෙරේ) යථා පරිදි සම්පූර්ණ කළ **තාක්ෂණික** හා මූල්‍යමය යෝජනා අදාළ මුද්‍රා, තැබූ ලිපි කවරවල "**මුල් පිටපත**" හා "**අනු පිටපත**" වශයෙන් පිළිවෙලින් ලකුණු කොට එම ලිපි කවර දෙකම "(ප්‍රසම්පාදනයේ නම) ප්‍රසම්පාදනය සඳහා ලංසු" යනුවෙන් වෙන් වෙන්ව වම් ඉහළ කෙළවරේ සඳහන් කර මුද්‍රා, තැබූ එක් කවරයක බහා **2021.03.03 දින පෙ.ව. 10.00** ට හෝ ඊට පෙර කොළඹ 10, ශ්‍රී සංඝරාජ මාවත, නො. 26, මෙඩිහවුස් ගොඩනැගිල්ලේ 2 වන මහල, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. නැතහොත් එම ලිපිනයේ රැස්වීම් ශාලාවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.
7. සෑම ලංසුවක් සමගම ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි වී ඇති වාණිජ බැංකුවකින් ලබාගත් **දින 119 ක් සඳහා වලංගු රු. 665,000.00** වටිනාකමැති ලංසු සුරක්ෂණයක් එවිය යුතුය. ලංසු සුරක්ෂණය තාක්ෂණික යෝජනාව සමග ඉදිරිපත් කළ යුතුය.
8. පූර්ව ලංසු රැස්වීම, **කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ මාවත, නො. 385, සුවසිරිපාය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ, සැලසුම් අංශයේ අධ්‍යක්ෂ (සෞඛ්‍ය තොරතුරු) කාර්යාලයේදී 2021.02.25 දින පෙ.ව. 10.00** ට පැවැත්වේ.
9. යෝග්‍යතාපූර්ණ අභිලාෂී ලංසුකරුවන්ට කාර්යාල දිනයන්හිදී **පෙ.ව. 9.30 සිට ප.ව. 2.00 දක්වා** කොළඹ 10, ශ්‍රී සංඝරාජ මාවත, නො. 26, 2 වන මහල, අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) වෙතින් (දුරකථන : 011-2112713/ 011-2112717) වැඩිමනත් තොරතුරු ලබාගත හැකිය. ඉහත සඳහන් වූ ලිපිනය:

සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව "C_2",
සෞඛ්‍ය අමාත්‍යාංශය (මෙඩි හවුස් ගොඩනැගිල්ල)
2 වන මහල, නො. 26, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.

සීමාසහිත හොරොම්බාව විවිධ සේවා සමුපකාර සමිතිය

ප්‍රසම්පාදන දැන්වීමයි

සීමාසහිත හොරොම්බාව විවිධ සේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය බැංකු ගොඩනැගිලි සඳහා අවශ්‍ය විදුලි ජනක යන්ත්‍ර සැපයීමට අදාළව සුදුසුකම්ලත් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ශාඛා පවතින ලියාපදිංචි ආයතන වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ.

අනු අංකය	අයිතමය	ප්‍රමාණයන්
01	10 KVA 1 phase විදුලි ජනක යන්ත්‍ර	02
02	7.5 KVA 1 phase විදුලි ජනක යන්ත්‍ර	06

අවශ්‍ය විස්තර හා පිරිවිතරයන් හොරොම්බාව පිහිටි සමිති ප්‍රධාන කාර්යාලයට පැමිණ රු. 1,000/- ක මුදලක් ගෙවීමෙන් ලබාගත හැක. ඉහත අයිතමයන් දෙක සඳහා වෙන වෙනම මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. මිල ගණන් සමග ඊට අදාළ පසු සේවා ගිවිසුම හා අනෙකුත් කොන්දේසි ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ කරන ලද මිල ගණන් ලියාපදිංචි තැපෑලෙන් හෝ සමිති ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ තබා ඇති පෙට්ටියට 2021.03.05 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතු අතර, ටෙන්ඩර්පත් බහාලන කවරයේ ඉහළ වම් පස කෙළවරේ මිල ගණන් ඉදිරිපත් කරනු ලබන අයිතමය ද සඳහන් කළ යුතුය.

ලංසුපත් 2021.03.05 දින ප.ව. 2.30 ට විවෘත කරනු ලබන අතර, එදිනට ලංසු ඉදිරිපත් කළ අය හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගි විය හැක. ලංසු පිළිබඳ අවසාන තීරණය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

සභාපති,
සීමාසහිත හොරොම්බාව විවිධ සේවා සමුපකාර සමිතිය,
හොරොම්බාව.
2021.02.17
දු.ක. 037-2249403 / 037-4937910

ප්‍රසම්පාදන දැන්වීම

ශික්ෂණ රෝහල - කුරුණෑගල

මෙම රෝහලේ දෙවන කාන්දුකරන ඒකකයෙහි බිම් මහල ඉදිකිරීම කොන්ත්‍රාත්තුව ඉටු කිරීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2020 අනුව ICTAD/ CIDA හි වලංගු සාමාජිකත්වය දරන එහි C7 සිට C5 දක්වා ශ්‍රේණිගත කිරීම් අනුව සුදුසුකම් සම්පූර්ණ කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගෙන් 2021.03.03 දින පෙ.ව. 10.00 දක්වා ටෙන්ඩර් කැඳවනු ලබන අතර, ටෙන්ඩර් විවෘතය එදින එම වේලාවට අධ්‍යක්ෂ නිල කාර්යාලයේදී සිදු කෙරේ. එම අවස්ථාවට ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.

2021.03.01 දින ප.ව. 3.00 දක්වා සතියේ රාජකාරී දිනයන්හිදී නොමිලේ ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි අතර, එදින එම වේලාව තෙක් පහත ලිපි ලේඛන ඉදිරිපත් කර ලංසු ලේඛන ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක.

1. අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල, කුරුණෑගල වෙත ඉදිරිපත් කරන ලිඛිත අයදුම්පතක්
2. එක් වැඩ විෂයයක් වෙනුවෙන් ආපසු නොගෙවන රු. 2,500 ක මුදලක් රෝහල් මුදල් අයකැමි වෙත ගෙවා ලබාගත් රිසිට්පත
3. සහතික කරන ලද පිටපතක් සමග ICTAD/ CIDA ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත
4. පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන ඡේදය යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය (ලංසු ලේඛන නිකුත් කිරීම සඳහා පමණක් සහතිකය සඳහා ගෙවීම් සිදු කළ ලදුපත පිළිගනු ලැබේ)

ටෙන්ඩර්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි වැඩ විෂයෙහි තම පැහැදිලිව සටහන් කරන ලද ඔබගේ ටෙන්ඩර්පත **සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ශික්ෂණ රෝහල, කුරුණෑගල** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනැවිත් බහාලීමට හැකි අතර, මේ පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය වෙතොත් 037-2233906 මගින් අංක 2800 අමතා ලබාගත හැක.

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
ශික්ෂණ රෝහල, කුරුණෑගල.

ප්‍රසම්පාදන දැන්වීම

රෝහල් ආපනශාලාව පවත්වාගෙන යාම - 2021/2022

ශික්ෂණ රෝහල - කුරුණෑගල

1. කුරුණෑගල ශික්ෂණ රෝහලේ ආපනශාලාව 2021/2022 වර්ෂයට පවත්වාගෙන යාමට සැපයුම්කරුවෙකු තෝරාගැනීමට ඒ සඳහා සුදුසුකම් ඇති සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.
2. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සේවා සැපයුම්කරුවන්ගෙන් 2021.03.03 දින පෙ.ව.10.00 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. ටෙන්ඩර් විවෘතය එදින එම වේලාවට අධ්‍යක්ෂ කාර්යාලයේදී සිදු කරනු ලබන අතර, එම අවස්ථාවට ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.
3. ටෙන්ඩර් ලියකියවිලි 2021.03.01 දින ප.ව. 3.00 දක්වා රුපියල් 2,500.00 ක මුදලක් රෝහලේ මුදල් අයකැමි වෙත ගෙවා ලබාගත් රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක.
4. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි පිටපත් දෙකකින් මුල් පිටපත් හා අනු පිටපත් වශයෙන් සඳහන් කර මුද්‍රා, තබා කවරයෙහි වම් කෙළවරෙහි "**රෝහල් ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් - 2021/2022**" යනුවෙන් පැහැදිලිව සඳහන් කර "**සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය, ශික්ෂණ රෝහල කුරුණෑගල**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනැවිත් බහාලීමට හැකි අතර, මේ පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය වෙතොත් 037-2233906 මගින් අංක 2800 අමතා ලබාගත හැක.
5. රජයේ කොන්ත්‍රාත් කොන්දේසි කඩකර අසාධු ලේඛනගත කොට ඇති පුද්ගලයන් හා රජයේ සුබසාධක ආපනශාලා පවත්වාගෙන යාමේදී රජයට අයවිය යුතු ගෙවීම් පැහැර ඇති හා ගිවිසුම කඩකර ඇති අයට හෝ ඔවුන්ගේ නියෝජිතයන් වෙත ලංසුපත් නිකුත් කරනු නොලැබේ.
6. අදාළ ලංසු සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් පිළිගැනීම හෝ අසම්පූර්ණව ඉදිරිපත් කර ඇති මිල ගණන් සහිත ලංසු ලියකියවිලි ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කුරුණෑගල ශික්ෂණ රෝහලේ ප්‍රසම්පාදන කමිටු සභාපති සතුවේ.
7. ලැබෙන මිල ගණන් ඇගයීම් කමිටුවක් මගින් ඇගයීමට ලක් කිරීමෙන් අනතුරුව තෝරාගන්නා සේවා සැපයුම්කරු රෝහල සමග නඩත්තු සේවා ගිවිසුමකට එළඹිය යුතුය.
8. මේ පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය වෙතොත් දුරකථන අංක 037-2233906 අමතා දිගු අංක 2800 න් ලබාගත හැක.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
ශික්ෂණ රෝහල, කුරුණෑගල.

ශ්‍රී ලංකා හොකී සම්මේලනය, ශ්‍රී ලංකා කැරම් සම්මේලනය, ශ්‍රී ලංකා හෑන්ඩ් බෝල් සම්මේලනය හා ශ්‍රී ලංකා ගොල්ෆ් සම්මේලනයේ විධායක කමිටු නිලධාරීන් තෝරා ගැනීමේ නිලවරණය පැවැත්වීමට අනුකූලව පත් කරන ලද නිලවරණ කමිටුව හඳුන්වා දීම සහ විශේෂ මහා සභා රැස්වීම

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2021 පෙබරවාරි මස 10 වන දින නිකුත් කරන ලද අංක 2214/47 ගැසට් නිවේදනයෙන් බලය පවරා ඇති සංගම්/ සම්මේලනවල නිලවරණ කමිටුව හඳුන්වාදීම සහ තොරතුරු ලබාගැනීම සඳහා පවත්වනු ලබන විශේෂ මහා සභා රැස්වීම 2021 මාර්තු මස 02 වන දින,

01.	**ශ්‍රී ලංකා හොකී සම්මේලනය**	-	**පෙ.ව. 09.30**
02.	**ශ්‍රී ලංකා කැරම් සම්මේලනය**	-	**පෙ.ව. 11.00**
03.	**ශ්‍රී ලංකා හෑන්ඩ් බෝල් සම්මේලනය**	-	**ප.ව. 01.00**
04.	**ශ්‍රී ලංකා ගොල්ෆ් සම්මේලනය**	-	**ප.ව. 02.30**

අංක 9, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 7 පිහිටි ක්‍රීඩා අමාත්‍යාංශයේ 4 වන මහලේ පිහිටි ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

මේ සඳහා ශ්‍රී ලංකා හොකී සම්මේලනය, ශ්‍රී ලංකා කැරම් සම්මේලනය, ශ්‍රී ලංකා හෑන්ඩ් බෝල් සම්මේලනය හා ශ්‍රී ලංකා ගොල්ෆ් සම්මේලනයේ හා ඉහත සම්මේලන ව්‍යවස්ථාවන්ට අනුව අනුබද්ධ ක්‍රීඩා සමාජ/ ආයතන/ සංගම් ඇත්නම් එම අනුබද්ධ ආයතන නියෝජනය කරනු ලබන නියෝජිතයකුට ඉහත සඳහන් දින එම වේලාවට තම ක්‍රීඩා සමාජයේ අනත්‍යතාවය තහවුරු කර ගැනීමේ ලියකියවිලිද සමග මෙම විශේෂ මහා සභා රැස්වීමට සහභාගි වන මෙන් කරුණාවෙන් දන්වමි.

අධ්‍යක්ෂ ජනරාල්,
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව.

1. ජාති, ආගම් භේදයකින් තොරව සිංහල, දෙමළ, මුස්ලිම්, කිතුණු, බෞද්ධ, හින්දු ලොව සියලු දෙනාගේ සිතේ ඇතිවන්නේ සිතිවිලි.
2. එම සිතිවිලි හොඳ හෝ නරක සිතිවිලි වේ.
3. ලොව සැමදෙනාම සිතන්නේ සිතින්.
4. සිතින් සිතන දේ හොඳ හෝ නරක ක්‍රියා වේ.
5. හොඳ ක්‍රියා මොනවාද? නරක ක්‍රියා මොනවාද?
6. කුසල් අකුසල් එදිනෙදා අත් දකින්නේ, අත් විඳින්නේ කෙසේද?

මේවායේ විස්තර අඩංගු පිටු 16 ක දහම් පත්‍රිකාවක් රු: 8/- දහම් පත්‍රිකා විසිපහක් රු: 200/- දහම් පත්‍රිකා සියයක් රු. 750/- කට ලබා ගත හැක.

පහත සඳහන් පොත් සඳහා වෙළඳ වට්ටම සියයට 30% යි.

- පින් සහ පව් - කුසල් සහ අකුසල් 120/-
- චිත්ත නියාම ධර්මය 125/-
- ලොව සැමට සිත නිවාගන්න දහම් දැනුම 125/-
- සිත මනස සහ ආගම් 80/-
- හොඳ - නරක, පින් - පව්, කුසල් - අකුසල් 100/-
- සිත සහ මනසින් කුසල් අකුසල් කය වචනින් පින් පව් 100/-
- සිත ගැන දැන ගන්න 125/-
- සිතෙහි සතුට ඇති කර ගැනීමට කුසල් කරන්න අකුසලෙන් මිදෙන්න 125/-

ත්‍රිපිටකය හැදෑරීමට ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සරල බසින් සිංහල බසට නගන ලද කාණ්ඩ 8 කින් යුත් **ත්‍රිපිටක පොත්** 25% වට්ටමකට ලබා ගත හැකිය.

සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
අංක 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10. දුරකතන: (011) 2685369, 2686925,

මහජන බැංකුව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29(ඈ) වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයයි.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 29/01/2021 වන දින පවත්වන ලද තම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 20(ඇ) වගන්තිය යටතේ පහත සඳහන් වන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපනය කර ඇත්තාවූද, ලියාපදිංචි අංක PV5757 දරන සහ කොළඹ 10, ජයන්ත විරසේකර මාවත, අංක 29 දරන ස්ථානයෙහි පිහිටා ඇත්තාවූද, සමාගමක් වන ජේ.එන්.ඉන්ටීරියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී.එස්. මහවත්ත විසින් ලියා සහතික කළ 2019 දෙසැම්බර් 2 දිනැති අංක 1157 දරන උගස් බැඳුම්කර මතද 2018 ඔක්තෝබර් 1 දිනැති අංක 965 දරන උගස් බැඳුම්කර මතද සහ 2018 ඔක්තෝබර් 1 දිනැති අංක 964 දරන උගස් බැඳුම්කරය මතද අයවීමට ඇති ගෙවීම් පැහැර හැර ඇති හෙයින් රුපියල් පනස් මිලියන දෙසිය හැට එක්දහස් පස්සිය හතලිස් නවයයි ශත විස්සක (රු. 50,261,549.20) මුදලක් පොලියද සමග එකී මහජන බැංකුව වෙත මේ වන විට අයවීමට හිඟව සහ ලැබිය යුතුව තිබේ.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී.එස්. මහවත්ත විසින් ලියා සහතික කළ 2019 දෙසැම්බර් 2 දිනැති අංක 1157 දරන උගස් බැඳුම්කරය ද, 2018 ඔක්තෝබර් 1 දිනැති අංක 965 දරන උගත් බැඳුම්කර ද සහ 2018 ඔක්තෝබර් 1 දිනැති අංක 964 දරන උගස් බැඳුම්කරයද යන එකී උගස් බැඳුම්කර මගින් එකී බැංකුව වෙත උගස් කළ සහ මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය රුපියල් පනස් මිලියන දෙසිය හැට එක්දහස් පන්සිය හතලිස් නවයයි ශත විස්සක (රු. 50,261,549.20) ඉහතකී මුදල ද, 2021 ජනවාරි 15 වන දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් හතලිස් හයමිලියන එකසිය හතලිස් දහසක (රු. 46,140,000.00) මුදල මත වාර්ෂිකව සියයට දසයයි දශම පහ (වා. 16.5%) බැගින් වැඩිදුර පොලියද සහ/හෝ එකී මහජන බැංකු පනතේ 29(ඕ) වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු සහ මුදල් ද සමඟ, ඉන් අනතුරුව යම් මුදලක් ලැබී ඇත්නම් එය අඩු කොට අයකර ගැනීම පිණිස කොළඹ 8, ෆෙයාෆීල්ඩ් උද්‍යානය, අංක 6 ඒ දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් මගින් විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

ඉහත සඳහන් කළ උපලේඛනය

මධ්‍යම පළාත් මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ගඟබඩ කෝරලයේ කඩවත් සතර සහ ගඟබඩ කෝරලයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟබඩ ප්‍රාදේශීය සභාවේ අම්පිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ අම්පිටිය පල්ලේගම පිහිටි "ටිකිරිමාලීගේ වත්ත" නැමති ඉඩමට බලයත් මිත්තේරු ඩී.එම්. ජයරත්න විසින් සකස් කළ 2018 ජනවාරි 7 දිනැති අංක 1054 දරන පිඹුරේ තිරූපිත "ලොට් 1" වශයෙන් ලකුණු කළ බෙදු වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් **උතුරට :** ප්‍රාදේශීය සභා අඩි පාර සහ දිය පාර ද, **නැගෙනහිරට :** දිය පාර සහ අම්පිටිය වරිපනම් අංක V.C. 226 දරන පරිශ්‍රය ද, **දකුණට :** අම්පිටිය පාර වරිපනම් අංක V.C. 226 දරන පරිශ්‍රය ද සහ පාර (මහා මාර්ගය) ද සහ **බටහිරට :** පාර (මහා මාර්ග) ද සහ ප්‍රාදේශීය සභා අඩි පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් දසයයි දශම තුනයි බිංදුවක් (අ.0, රූ.1 යි, ප.16.30 යි) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස අංක VC226 දරන නිවසද, ටැංකියද, ලිඳ සහ "**අම්පිටිය ඔටෝ කෙයා**" නැමති ව්‍යාපාරික ස්ථානය ද සහ ඒ මත පිහිටි සියලුදේ ද සමඟ වන අතර, මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A654/130 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,
.....
සහකාර සාමාන්‍යාධිකාරී (අය කිරීම්)
මහජන බැංකුව, අය කිරීම් දෙපාර්තමේන්තුව,
10 වන මහල, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල,
අංක. 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

වර්ෂ 2021 ක්වූ ජනවාරි මස 20 වන දිනදීය.

මහජන බැංකුව
PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA (lka) Brand Finance Rating

ඉඩම් විකිණීම සඳහා මිල ගණන් කැඳවීමයි

ග්‍රාමීය බැංකු මන්දිරය, අංක 107, දඹුල්ල පාර, කුරුණෑගල යන ලිපිනයෙහි ස්ථාපිත සීමාසහිත වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයට අයත්,

පහත සඳහන් ස්ථානයන්හි පිහිටි ඉඩම් ටෙන්ඩර් කැඳවා විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

අනු අංකය	ඉඩමෙහි නම	පිහිටීම	පර්චස් ගණන
01	වැටකෙයාව වත්ත	කුරුණෑගල දිස්ත්‍රික්කයේ සඳලංකාව ප්‍රදේශයේ වැටකෙයාව ගෝතවිල ලිපිනයේ පිහිටා ඇත (වැටකෙයාව ඉන්ධන පිරවුම්හලට යාබදව)	60
02	කුඹුම්බේරිය කැලේ වත්ත	පුත්තලම දිස්ත්‍රික්කයේ වෙත්තප්පුව නගරයට ආසන්නව පිහිටා ඇත. (සී/ස. කුඩුම්බේරිය පොල් නිෂ්පාදන සමුපකාර සමිති භූමියට පිටුපස ඉඩම)	91

කොන්දේසි

- මිල ගණන් ඉදිරිපත් කරනු ලබන කවරයේ වම් ඉහළ කෙළවරේ මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ඉඩමෙහි අනු අංකය හා ඉඩමෙහි නම ඇතුළත් කළ යුතුය.
- එක් එක් අනු අංක හා ඉඩම් සඳහා වෙන් වෙන්ව ආපසු ගෙවනු ලබන රු. 50,000/= බැගින් තැන්පත් මුදල් සංගමයේ ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමි වෙත ගෙවා පාලන අංශයෙන් ලබාගත් අයදුම්පතක් සමග 2021.03.02 වන දින ප.ව. 10.00 දක්වා මිල ගණන් ඉදිරිපත් කළ හැකි අතර, අදාළ මිල ගණන් ලියාපදිංචි තැපැලෙන් ගරු සභාපති, සී/ස. වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය, ග්‍රාමීය බැංකු මන්දිරය, අංක 107, දඹුල්ල පාර, කුරුණෑගල යන ලිපිනයට එවිය හෝ පාලන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ හැක. එක් එක් ඉඩම සඳහා වෙන වෙනම මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.
- මිල ගණන් විවෘත කිරීම 2021.03.02 ප.ව. 11.00 ට සී/ස. වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයෙහි ප්‍රධාන කාර්යාලයේදී සිදු කෙරේ. මෙම අවස්ථාවට මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- මිල කැඳවීම්පත්‍ර පිළිබඳ අවසාන තීරණය සී/ස. වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයෙහි ගරු අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මේ පිළිබඳ වැඩි විස්තර දුරකථන අංක 037-2234152 මගින් සී/ස. වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයෙහි ප්‍රධාන කළමනාකරු (පාලන) වෙතින් ලබාගත හැක. 2021.02.17

ගරු සභාපති,
සීමාසහිත වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය,
ග්‍රාමීය බැංකු මන්දිරය, 107, දඹුල්ල පාර, කුරුණෑගල.
දුරකථන : 037-2234154/ 55 ෆැක්ස් : 037-2234153

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

පහත සඳහන් විභාග සඳහා වන ප්‍රවේශ පත්‍ර සහ කාලසටහන්, අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍රවල සඳහන් කළ ලිපිනයන් වෙත හෝ අදාළ ආයතන ප්‍රධානීන් වෙත තැපැල් කර යවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

	විභාගය	විභාගය පැවැත්වෙන දින	විභාගය පැවැත්වෙන ස්ථානය
01	ග්‍රාම නිලධාරී III ශ්‍රේණියේ නිලධාරී සඳහා වන පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 (II) (2021)	2021 පෙබරවාරි මස 20	දිවයින පුරා
02	කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය 2019/2020 (2021)	2021 පෙබරවාරි මස 20, 21	දිවයින පුරා

ප්‍රවේශ පත්‍ර නොලද අයදුම්කරුවන් හෝ යම් විමසීමක් කිරීමට අවශ්‍ය අයදුම්කරුවන් හෝ සිටී නම්, සම්පූර්ණ නම හා ලිපිනය සමග මෙම දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසන්න. ප්‍රවේශ පත්‍ර **www.slexamas.com** වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

දුරකථන : 0112785230 / 011-2786150
ෆැක්ස් : 011-2784232

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

5/5/2/AD/2021
ආයතනික විභාග සංවිධාන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2021 පෙබරවාරි මස 17 වන දින.

පළාත් පාලන දෙපාර්තමේන්තුව
නැගෙනහිර පළාත
2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනත යටතේ රැස්වීම් දැනුම් දීම

නැගෙනහිර පළාතේ පළාත් පාලන කොමසාරිස් නාගරාසා මණිවන්නන් වන මා විසින් 2021 ජනවාරි මාසයේ 29 වන දින අංක 2212/55 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශේෂ) හා 2021.02.02 වැනි දින නිතකරත්, දිනමිණ හා ඩේලිනිවුස් පත්තරවල පළ කරන ලද ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මන්මුනේ ප්‍රාදේශීය සභාවේ නව සභාපති තෝරා ගැනීමේ 2021.02.11 වැනි දින ප.ව. 02.30 පැවැත්වීමට තිබූ රැස්වීම නැගෙනහිර පළාත් මඩකලපුව මහාධිකරණයේ අංක HCB/WRIT/635/21 දරන අතුරු නියෝගය අනුව නොපැවැත්වෙන බව මෙයින් දන්වා සිටිමි. තවද, මේ සම්බන්ධයෙන් මා විසින් අංක 2215/5 හා 2021.02.15 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශේෂ) හි දැන්වීම් පළකර ඇති බව දන්වා සිටිමි.

එන්. මනිවන්නන්,
පළාත් පාලන කොමසාරිස්,
පළාත් පාලන දෙපාර්තමේන්තුව,
නැගෙනහිර පළාත.

ලංසු කැඳවීමේ ආරාධනයයි (IFB)

බස්නාහිර පළාත් සභාව

පළාත් ඉංජිනේරු කාර්යාංශය

1. අදාළ ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහතින් විස්තර කොට ඇති කාර්ය ඉටුකිරීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූරුණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.
2. i. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ. මෙම ප්‍රසම්පාදනයේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 50 කට අඩු හෙයින්, අංක 04/2016(ii) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛකයෙහි නියම කොට ඇති සීඩා ශ්‍රේණි ප්‍රමුඛතාව හා ප්‍රාදේශීය ප්‍රමුඛතාව අදාළ වේ.
   ii. මෙම ප්‍රසම්පාදනයට, අංක 03/2020(i) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය අදාළ වන අතර, "රජය සතු ව්‍යාපාර (SOE) විසින් ලංසු ඉදිරිපත් කරනුයේ නම් සියයට පහක (5%) ප්‍රමුඛතාව ලබා දෙනු ඇත."
3. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකනම් ලැබීමට සාර්ථක ලංසුකරුවා අපලේඛනගත වූ අයකු හෝ පැවරූ කොන්ත්‍රාත් කොන්දේසි කඩ කළ අයකු හෝ ලංසුකරුගේ පාලනයකින් තොරව ලබාදුන් කාල රාමුව තුළදී පැවරූ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ නොකළ හො නිසි කලට පෙර කාර්යයෙන් ඉවත් වූ අය ගෙවිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතු මෙන්ම වලංගු සීඩා ලියාපදිංචියද සතු විය යුතුය.

(1)	(2)	(3)	(4)	(5)	(6)	(7)	(8)
අනු අංකය	**කොන්ත්‍රාත් අංකය**	**කාර්ය විස්තරය**	**පොදු කොන්ත්‍රාත් පනතේ අවශ්‍යතාවය (අංක03)**	**සීඩා ලියාපදිංචිය**	**ආපසු නෙගෙවන ගාස්තු (රුපියල්)**	**ලංසු ඇපකරය / වලංගු කාලය රුපියල්**	**ලංසු ලේඛන නිකුත් කරන හා ලංසු භාර ගන්නා ස්ථානය, දුරකථනය ඇමතුම් අංක**
1	WP/DB/CON/21/62	වතුපිටිවල මූලික රෝහලේ වාට්ටු අංක 12 නවීරකණය කිරීම හා කාන්දු පෙරෙන එක්කය වෙත නව කොරිඩෝවක් ඉදිකිරීම.	ඔව්	C5 සහ C8	3,000.00	ලංසු ඇපකරය 200,000.00 (දින 105)	ගම්පහ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය, උසාවිය පාර, ගම්පහ. 033-2222515
2	WP/DB/CON/21/63	ගම්පහ දෙකටන පද්මාවති ම.ම. විද්‍යාලය 120'X20' ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම	නැත	C7 සහ C8	2,000.00	මුදල් තැන්පතු 25,000.00 හෝ ලංසු ඇපකරය 50,000.00 (දින 63)	
3	WP/DB/CON/21/64	මාකොළ සහතිකලත් පාසලේ (පරිවාස දෙපාර්තමේන්තුව) (බ.ප.) ක්‍රීඩා මණ්ඩපයේ ඉතිරි වැඩ	ඔව්	C7 සහ C6	2,000.00	මුදල් තැන්පතු 50,000.00 හෝ ලංසු ඇපකරය 100,000.00 (දින 105)	බියගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය, උඩුපිල පාර, මාකොළ, බියගම. 0112-963524
4	WP/DB/CON/21/65	බියගම මූලික රෝහලේ RMO/ MOIC නිල නිවාස නවීකරණය කිරීම.	ඔව්	C7 සහ C6	2,000.00	මුදල් තැන්පතු 50,000.00 හෝ ලංසු ඇපකරය 100,000.00 (දින 105)	
5	WP/DB/CON/21/66	මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ඉතිරි වැඩ (අදියර 3) ඉදිකිරීම	ඔව්	C6 සහ C5	3,000.00	ලංසු ඇපකරය 200,000.00 (දින 105)	මීගමුව බියගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය, උඩුපිල පාර, මාකොළ, බියගම. 0112-963524 අංක 75, ලුවිස් පෙදෙස, මීගමුව, 0312-232357
6	WP/DB/CON/21/67	කොරතොට ශ්‍රී සෝමානන්ද විද්‍යාලය නව වැසිකිලි ඒකකය ඉදිකිරීම	නැත	C9 සහ C8	1,000.00	මුදල් තැන්පතු 10,000.00	බත්තරමුල්ල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය, දෙපානම, පන්නිපිටිය. 011-2844354
7	WP/DB/CON/21/68	හෝමාගම පාදුක්ක සිරි පියරතන මධ්‍ය මහා විද්‍යාලය - 90'X25' තෙමහල් ගොඩනැගිල්ල ව්‍යුහමය අලුත්වැඩියාව (අදියර1) ඉතිරි වැඩ)	නැත	C7 සහ C8	2,000.00	මුදල් තැන්පතු 25,000.00	හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය, උසාවිය පාර, හෝමාගම. 011-855719
8	WP/DB/CON/21/69	හෝමාගම මායාදුන්න මධ්‍ය විද්‍යාලය - 90'X25' තෙමහල් ගොඩනැගිල්ල ඉතිරි වැඩ (බිම් මහල සම්පූර්ණ කිරීම)	නැත	C7 සහ C8	2,000.00	මුදල් තැන්පතු 25,000.00	
9	WP/DB/CON/21/70	මීගොඩ ආයුර්වේද රෝහල - පවත්නා 32'X81' මුළුතැන්ගෙය නවීකරණය කිරීම	ඔව්	C5 සහ C6	3,000.00	ලංසු ඇපකරය 200,000.00 (දින 77)	
10	WP/DB/CON/21/71	හෝමාගම පාලගම සිරි පැරකුම් කණිෂ්ඨ විද්‍යාලය - 60'X20' තනි මහලේ ගොඩනැගිල්ලේ වහල අලුත්වැඩියා කටයුතු.	නැත	C7 සහ C8	1,000.00	මුදල් තැන්පතු 10,000.00	හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය, උසාවිය පාර, හෝමාගම. 0112855719
11	WP/DB/CON/21/72	දෙහිවල බෞද්ධ බාලිකා විද්‍යාලය, වැසිකිළි අලුත්වැඩියා කටයුතු.	නැත	C7 සහ C8	2,000.00	මුදල් තැන්පතු 25,000.00	රත්මලාන ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය, අංක 25, මාළිගාව පාර, රත්මලාන. 0112-622517
12	WP/DB/CON/21/73	පිළියන්දල සෝමවිර චන්ද්‍රසිරි විද්‍යාලය - 90'X25' තෙමහල් ගොඩනැගිල්ල (අදියර 2)	නැත	C9 සහ C8	1,000.00	මුදල් තැන්පතු 5,000.00	
13	WP/DB/CON/21/74	කළුතර වලතර කණිෂ්ඨ විද්‍යාලය - 80'X20' ගොඩනැගිල්ලේ හදිසි වහල අලුත්වැඩියා කටයුතු	නැත	C7 සහ C8	1,000.00	මුදල් තැන්පතු 10,000.00	කළුතර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය, සුමංගල පාර, කළුතර උතුර. 034-2237349
14	WP/DB/CON/21/75	මතුගම - ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ඉතිරි වැඩ (අදියර3) ඉදිකිරීම.	ඔව්	C5 සහ C6	3,000.00	ලංසු ඇපකරය 250,000.00 (දින 77)	මතුගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය, ආනන්ද ශාස්ත්‍රාලය, මතුගම. 034-2237349
15	WP/DB/CON/21/76	මතුගම හඳගිරිකන්ද විද්‍යාලය - 40'X20' පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.	නැත	C7 සහ C8	2,000.00	මුදල් තැන්පතු 25,000.00 හෝ ලංසු ඇපකරය 50,000.00 (දින 63)	
16	WP/DB/CON/21/77	පානදුර - ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය ඉතිරි වැඩ (අදියර 2) ඉදකිරීම	ඔව්	C5 සහ C6	3,000.00	ලංසු ඇපකරය 200,000.00 (දින 77)	පානදුර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය, ශ්‍රී මහා වාර පාර, පානදුර. 038-2243078

4. ලංසු ලේඛනයන්හි සඳහන් ආකාරයට අදාළ සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.
5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, වගුවේ සඳහන් අදාළ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවලින් ලබාගත හැකි අතර. එම කාර්යාලවලදීම කාර්යාල වේලාවන් තුළදී, අදාළ ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කොට බැලිය හැක.
6. අදාළ ආපසු ගෙවනු නොලබන ගාස්තු ගෙවීමෙන් හා (වගුවේ අංක 09 තීරුවේ සඳහන්) අදාළ ප්‍රාදේශීය කාර්යාල වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් ඕනෑම රාජකාරී දිනයකදී 2021.02.15 දින සිට 2021.03.08 දින දක්වා 09.00 පැය හා 15.00 පැය අතර, කාලය තුළ අපේක්ෂිත ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ පත්කළ නියෝජිතයන්හට සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් මුදලින්ම කළ යුතු වේ.
7. මුද්‍රා, තැබූ ලංසු පිටපතක් සහිතව, වෙන් වශයෙන් කවරවල බහා ඒවායේ වම් ඉහළ කෙළවරේ ව්‍යාපෘති නාමය සඳහන් කොට 2021.03.09 දින පෙරවරු 10.30 ට පෙර, (වගුවේ සඳහන් පරිදි) අදාළ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වෙත ලැබීමට සැලැස්විය යුතුය. ලැබී ඇති ලංසු අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ විවෘත කරනු ලැබේ. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ.
8. සියලුම ලංසු සමග (වගුවේ සඳහන් පරිදි) ලංසු ඇපකරයක් හෝ වටිනාකම මුදලින් ඉදිරිපත් කළ යුතුය.
9. ලංසුකරුවන්, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි වී සිටිය යුතු අතර, අදාළ ලියාපදිංචි සහතිකය (වගුවේ 04 තීරයේ සඳහන් පරිදි) ඉදිරිපත් කළ යුතුය.

ප්‍රධානී, ප්‍රසම්පාදන ඒකකය, ඉංජිනේරු කාර්යාංශය (බ.ප.),
5 වන මහල, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

2021.02.15
දුරකථනය : 0112-092504
ෆැක්ස් : 0112-092505

හෙට ලොව ජය ගන්නා දරුවන් තනන
අනුරපුර ලෝටස් ජාත්‍යන්තර බෞද්ධ පාසල

පොතානේගම සෝමරතන හිමි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා හමු වූ අවස්ථාවක්.

හිටපු කථානායක කරු ජයසූරිය මහතා පොතානේගම සෝමරතන හිමිට උපහාර පුද කළ අයුරු.

ලෝටස් ජාත්‍යන්තර බෞද්ධ පාසල ආරම්භක දිනයේ ළමයින් ඇතුළත් කර ගත් අවස්ථාව.

පන්ති කාමර

රාජ්‍ය ඇමැති දුමින්ද දිසානායක මහතා පැමිණි අවස්ථාවක්.

ලෝටස් ජාත්‍යන්තර බෞද්ධ පාසලේ දු දරුවන් පිරිසක්

පන්සල මූලික කර ගත් අධ්‍යාපනයට නව පණක් දෙමින් 'ජාත්‍යන්තර බෞද්ධ පාසලක්' එතිහාසික අනුරාධපුර පුදබිමෙහි ආරම්භ විය. ඒ අනුරාධපුර, පණ්ඩුලගම ප්‍රදේශයේ පිහිටි ලෝටස් ජාත්‍යන්තර බෞද්ධ පාසලයි. ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ කර්මවාදාචාර්ය උතුරු මැද පළාත් භාවනා ගුරු උපදේශක ප්‍රවීණාචාර්ය ලෝටස් ජාත්‍ය-න්තර බෞද්ධ අධ්‍යාපන පීඨයේ නිර්මාතෘ සහ විධායක අධ්‍යක්ෂ පාරම්පරික වෛද්‍ය පොතානේගම සෝමරතන හිමිගේ මුලිකත්ව-යෙන් මෙය ආරම්භ කර ඇත.

2008.12.12 වැනි දින ශෙරියන් ලෝටස් සිරිවිර සේකරාරාම විහාරස්ථානය ඉතා කුඩා විහාරස්ථානයක් ලෙස ආරම්භ විය. පසුව එය 'ලෝටස් ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යාපන පීඨ-යක්' බවට පත් විය. පසුව මෙහි මේ වර්ෂයේ ජනවාරි මස 11 වැනිදා ජාත්‍යන්තර බෞද්ධ පාසලක් ආරම්භ කිරීමට හැකි වන්නේ පොතානේගම සෝමරතන හිමිගේ අපරිමිත වූ උත්සාහයෙනි.

මේ සඳහා උතුරු මැද පළාත් ප්‍රධාන සංඝ-නායක නෙල්ලිකුලම ශ්‍රී සම්බුද්ධ පංචසතික චාරිකාරාමාධිපති, අනුරාධපුර සිරිසඟබෝ භාවනා මධ්‍යස්ථානාධිපති ශාස්ත්‍රපති අලු-ත්ගම බෝගමුවේ සද්ධාරංසි, උතුරු මැද පළාතේ ප්‍රධාන සංඝනායක අනුරාධපුර ශ්‍රී සම්බුද්ධ ජයන්ති විහාරස්ථානයේ විහාරාධි-පති නුගේතැන්නේ පඤ්ඤානන්ද, අනුරාධ-පුර මධ්‍යම නුවර ගම් පළාත් ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී මත්තක රතනපාල, රජරට පාර්ශ්වයේ ප්‍රධාන සංඝ-නායක උළුක්කුලම සිරිසුමන මහා පිරිවෙන්හි අධ්‍යක්ෂ යටිටෝගොඩ සුමනවංශ නාහිමිව-රුන්ගේ මූලික මඟපෙන්වීම සහ ආශීර්වාදය ලැබීම මහත් ශක්තියක්වී තිබේ.

ප්‍රදේශයේ ඉගෙනුම ලබන දූ දරුවන්ට වාර්ෂිකව පාසල් උපකරණ දීම, සෑම නිදහස් දිනයකටම පොල් පැළ දහස් ගණනක් බෙදා දීම, ඇස් කණ්ණාඩි, ආයුර්වේද සහ බටහිර වෛද්‍ය සායන පැවැත්වීම ඇතුළු විවිධ සේවාවන් මේ විහාරස්ථානය හරහා සිදු කෙරේ.

පෙර පාසලේ සිට උසස් අධ්‍යාපනය දක්වා දරුවා නිර්මාණය කිරීම මේ ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යාපන පීඨයෙන් සිදු කෙරේ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් දරුවන්ට අධ්‍යාපනය ලබා දීම පමණක් නොව දරුවාගේ විනය, චර්යාව, අධ්‍යාත්මික ගුණදහම් ඉගැන්වීම මේ අධ්‍යාපන පීඨයේ අරමුණයි. සතියේ දින පහේ උදැසන 7.00 සිට 1.30 දක්වා පාසල් පැවැත්වෙන අතර විෂයානුබද්ධ ගැටලු පව-තින දූ දරුවන්ට පාසල් කාලයෙන් පසුව ද සවස 3.00 වන තෙක් අධ්‍යාපනය දෙන අතර, මෙහි පැමිණෙන දූ දරුවන් වෙනත් උපකාරක පන්තිවලට යෑමට අවශ්‍යතාවක් නොමැති අයුරින් පාසලෙන්ම අවශ්‍ය දැනුම, බුද්ධිය සහ ගුණදහම් ඉගැන්වීම මෙහි විශේෂත්වයකි.

මේ පාසලට පැමිණෙන දරුවාට පමණක් නොව ඔහුගේ මවුපියන් ඇතුළු පවුලේ සියලු දෙනාට විෂයානුබද්ධ දැනුම, බුද්ධිය දීමට ඉරිදා දින පෙරවරු 11.00 සිට පස්වරු 2.00 තෙක් වෙනම පන්තියක් පැවැත්වීමෙන් ද අපේක්ෂා කරන්නේ ඉගෙනුමට අවශ්‍ය පරි-සරය නිර්මාණය කරමින් සෑම අංශයකින්ම පිරිපුන් දරුවකු බිහි කර ගැනීමයි. මෙහි පැමිණෙන සිසුන් යම්කිසි උපකාරක පන්ති-යකට සහභාගි වුවහොත් ඔවුන් පාසලෙන් ඉවත් කිරීමට කටයුතු කෙරේ. එසේම මෙහි ඉගැන්වීම් කටයුතු සිදු කරන ගුරුභවතුන්ට ද මෙහි අධ්‍යාපනය හදාරන සිසුන් සිය උප-කාරක පන්ති සඳහා සහභාගි කරවා ගැනීමට නොහැකිය. මේ වන විට පූර්ව ළමා විය අධ්‍යාපනයේ සිට 1, 2, 3 ශ්‍රේණි ආරම්භ කර ඇති අතර, එහි දරුවන් 30ක් පමණ ඉගෙනුම ලබයි.

මේ අනුව බර වාහන පුහුණුව, පරිගණක පුහුණුව, ග්‍රැෆික් ඩිසයින්, පංච කර්ම, රූපලා-වණ්‍ය, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව, චීන කටු චිකිත්සාව, විදුලි කාර්මික, හෙද, කෘෂිකාර්මික පුහුණුව, ජෝතිෂ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව, ගුරු පුහුණු, බතික්, භූගෝලීය තොරතුරු පද්ධති ඩිප්ලෝමා පාඨමාලාව ආදී පාඨමාලා දහ අටක් පමණ මේ වන විට ලෝටස් ජාත්‍ය-න්තර බෞද්ධ අධ්‍යාපන පීඨයෙන් හැදෑරීමට හැකිය.

මේ පුදබිමෙහි පවත්වාගෙන යන ආයු-ර්වේද ප්‍රතිකාරක රෝහලෙහි දේශීය වෙදකම උගන්වන වෛද්‍ය පාසලක් තිබීම ද විශේ-ෂත්වයකි. මේ වන විටත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාව පිළිබඳව පාඨමාලා හැදෑරූ ශිෂ්‍යයන් බහුතරයක් පෞද්ගලික ආයුර්වේද වෛද්‍ය ආයතනවල සේවය කරයි. ඉරිදා දින දහම් පාසල ද ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වමින් බෞද්ධ අධ්‍යාපනය නංවාලමින් ප්‍රදේශයට විශාල සේවාවක් සිදු කරයි.

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයෙන් සිදු කරන ලද අධීක්ෂණයකට අනුව මෙවර ජාතික ඵලදායිතා තරගාවලියට ඇතුළත්ව පාසලකට හිමි එකම සම්මානය දිනා ගැනීමට මේ ජාත්‍යන්තර බෞද්ධ පාසල සමත්ව තිබේ. එසේම 2018 සහ 2019 ලංකා ජනසන්නිවේ-දකයන්ගේ සංගමයෙන් පිරිනමන මාස්කෝ සම්මානය දිනා ගැනීමට ද සමත්ව තිබේ.

මෙහි විදුහල්පති ලෙස ආචාර්ය ඒ. එන්. චන්ද්‍රසිරි මහතා කටයුතු කරන අතර, ආචාර්ය මණ්ඩලය ලෙස කාංචනා මධුමාලි, ලසිතා ලංකේෂර, සුරංජී අත්තනායක, නර්මදා රත්නායක ගුරු මහත්ම මහත්මීන් මෙහි දරු-වන්ට අධ්‍යාපනය දීමට නිරතුරුවම කැපවී කටයුතු කරයි.

සටහන සහ ඡායාරූප
අමිල ප්‍රභාත් වනසිංහ
අනුරාධපුර අතිරේක

ලෝටස් ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යාපන පීඨයේ නිර්මාතෘ පොතානේගම සෝමරතන හිමි

ඇමැති එස්. එම්. චන්ද්‍රසේන මහතා පැමිණි අවස්ථාවක්.

රාජ්‍ය ඇමැති ගෙහාන් සේමසිංහ මහතා පැමිණි අවස්ථාවක්.

රජරට වෙද ඇසපුව

ආයුර්වේද ඩිප්ලෝමා ප්‍රදානය

පාසලේ ආචාර්ය මණ්ඩලය

සමන් විජය බණ්ඩාර - මාවනැල්ල විශේෂ

දෙවනගල සංඝාවාසයේ නාමපුවරුව ගලවා වීසි කරලා

ඓතිහාසික දෙවනගල සංඝාවාසයට පිවිසෙන ස්ථානය බැතිමතුන්ට සොයා ගැනීම පහසු වීමට සවි කර තිබූ නාමපුවරුව සංවිධානාත්මක පිරිසක් විසින් කඩා ඇති බව දෙවනගල විහාරයේ භාරකාර මැදිරිගිරියේ පුඤ්ඤසාර හිමියෝ සහ දායක සභාව පවසති. එහිදී මැදිරිගිරියේ පුඤ්ඤසාර හිමි මෙසේ වදාළහ.

"වසර ගණනාවක් තිස්සේ පැවති ඓතිහාසික දෙවනගල පුදබිමේ ගැටලු කඩිනමින් නිරාකරණය කොට ජාතික උරුමයන් මෙන්ම පුරාවස්තු අනාගතයට ආරක්ෂා කර දීමට බලධාරීන් අපොහොසත් වී තිබෙනවා. මේ පූජා භූමියේ ඉපැරණි පුරාවස්තු විනාශය සහ පූජා භූමියට අයිති ඉඩකඩම් රැසක්ම විවිධ පුද්ගලයන් විසින් අල්ලාගෙන සංවර්ධන කටයුතු සිදු කරමින් පුරාවිද්‍යා වටිනාකමට හානියක් වන ලෙසත් ජාතික උරුමය විනාශ වන ලෙසත් කටයුතු කරනවා. පුදබිමේ ඉපැරණි සෙල්ලිපිවලට රසායනික යොදා ඒවා විනාශ කිරීමට කටයුතු කර තිබෙනවා. විහාරස්ථානය සතු ඉඩකඩම් අනවසරයෙන් අත්පත් කරගෙන අන්‍ය ජාතිකයන් බෞද්ධ උරුමය දවසින් දවස විනාශ කරනවා. දෙවනගල පුදබිමේ ගැටලුවත් සංඝාවාස බිමේ ගැටලුවත් පුරාවස්තු ජාතික උරුමය විනාශ වීම ගැනත් මාධ්‍ය හරහා දිගින් දිගටම හෙළිදරව් කිරීමෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අවධානය ඒ වෙත යොමු වී දෙවනගල රජමහ විහාරයේ සංඝාවාසය අවට පළමු මැනුම හැටියට අක්කර 85ක් මැන මායිම් ලකුණු කර අවසන් කළා. එම මැනීමෙන් නිවාස 400කට ආසන්න ප්‍රමාණයක් සහ බලෙන් අත්පත් කරගෙන සිටි ඉඩම් රැසක් විහාරයට අයිති වුණා. දෙවනගල පුදබිමේ දන්ත ධාතූන් වහන්සේ වරක් සමවත් සුවයෙන් වැඩසිටි ස්ථානයක් වන අතර ඓතිහාසික පූජනීය ස්ථාන අතර රැක ගත යුතුම පුදබිමකි."

වෝල්ටර් දයාරත්න - අනුරාධපුර දිසා විශේෂ

අනුරපුරයේ පොසොන් සති පිරිත් පින්කම මෙවරත්

අනුරාධපුර මහ බෝ සමිඳුන් අබියස මහමෙවුනා උයනේ වාර්ෂිකව පැවැත්වෙන පොසොන් සති පිරිත් මහා පුණ්‍යෝත්සවය සෞඛ්‍ය ආරක්ෂක පිළිවෙත්වලට අනුව පැවැත්වීමට මහ විහාර පොසොන් පිරිත් පින්කම් කමිටුව පියවර ගෙන ඇත.

ඒ පිළිබඳ මූලික සාකච්ඡා සභාව ශ්‍යාමෝපාලි මහ නිකායේ උතුරු මධ්‍යම දිසාවේ ප්‍රධාන සංඝනායක අටමස්ථානාධිපති ආචාර්ය පල්ලේගම සිරිසුමන ධම්මරක්ඛිත සිරි නිවාස නා හිමියන්ගේ ප්‍රධානත්වයෙන් මහා විහාර බෝමළුව රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

සරත් වෙලගෙදර - ඇළහැර සමූහ

'ඇළහැර පුර වරුණ' එළි දකී

කොට්ටපිටිය ශ්‍රී ආලෝකාරාමය විහාරයේ විහාරාධිපති පොලොන්නරුව තමන්කඩුව දෙපළාතේ ප්‍රධාන සංඝ නායක විශ්‍රාමික නියෝජ්‍ය විදුහල්පති ඇළහැර ශාසනාරක්ෂක බල මණ්ඩලයේ හිටපු ලේඛකාධිකාරී මාදොල සේනානන්ද හිමිපාණන් වහන්සේ විසින් රචනා කරන ලද ඇළහැර පුර වරුණ ග්‍රන්ථය දොරට වැඩීමේ මහෝත්සවය ඇළහැර ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී පසුගියදා පැවැත්විණි.

මේ අවස්ථාවට පොලොන්නරුව දිස්ත්‍රික්කයේ සංඝ නායක හිමිපාණන්වහන්සේ හා ඇළහැර ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සාමාජික සංඝයාවහන්සේ වැඩම කර සිටියහ. මහවැලි සංවර්ධන රාජ්‍ය ඇමැති සිරිපාල ගමිලත්, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන යන මහත්වරු ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

පියසේන වතුදුර - දිගාමඩුල්ල සංචාරක

වනාන්තරවල වැව් ප්‍රතිසංස්කරණය කර සතුන්ගේ ජල අවශ්‍යතාවත් සොයා බලනවා

රට පුරා වැව් 5000ක් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ කුඩා වැව් 117ක් ප්‍රතිසංස්කරණය කිරීමේ දිස්ත්‍රික් ජාතික උත්සවය නාමල්ඔය, බොඩගොල්ල ජලාශයේදී පසුගියදා පැවැත්විණි. ශ්‍රී ලංකා රාමඤ්ඤ මහ නිකායේ උතුරු, නැගෙනහිර අධිකරණ සංඝනායක බොඩගොල්ල විහාරස්ථානයේ අධිපති වාවින්නේ ප්‍රඥ්ඤාණන්ද හිමියන් පැමිණි සිටි පිරිස පන්සිල් සමාදන් කරවීමෙන් අනතුරුව වනජීවී සම්පත් රාජ්‍ය ඇමැති විමලවීර දිසානායක මහතා විසින් බැකෝ යන්ත්‍රයකින් මඩ සහ ජලජ ශාක ඉවත් කිරීමේ වැඩ ආරම්භ කරනු ලැබිය. අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඩබ්ලිව්. ඩී. වීරසිංහ, දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නිලක් රාජපක්ෂ, නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ සභාපති ඩී. එම්. පාලිත පුෂ්පකුමාර යන මහත්වරු මේ අවස්ථාවට සහභාගි වී සිටියහ.

ඉන් අනතුරුව අම්පාර මහ දිසාපති ඩී. එම්. එල්. බණ්ඩාරනායක, නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු එච්. එම්. ජුනයිට්, අම්පාර වාරිමාර්ග ඉංජිනේරු ඒ. ලියනගේ, අම්පාර ප්‍රාදේශීය ලේකම් සොයිසා සිරිවර්ධන, දිසා වන නිලධාරී ඩබ්ලිව්. එම්. විජේපාල යන මහත්වරුන් සහ ගොවිජන සේවා සහකාර කොමසාරිස් චාමනී සෝමදාස මහතා ඇතුළු නිලධාරීන් සහ ප්‍රදේශවාසී ගොවිජනතාව මෙන්ම ගම්වාසීන්ද මේ අවස්ථාවට සහභාගි වී සිටියහ.

මෙහිදී රාජ්‍ය ඇමති විමලවීර දිසානායක මහතා මෙසේ ද කීය.

"මේ වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ වනාන්තර ඇතුළත තිබෙන වැව් ප්‍රතිසංස්කරණය කර සතුන්ගේ ජල අවශ්‍යතාව ගැන ද අපි සොයා බලනවා. කොවිඩ් වසංගතය නිසා රටට බලවත් ආර්ථික හානියකට මුහුණ දීමට ද සිදු වී තිබෙනවා. වනජීවී දෙපාර්තමේන්තුවට දේශීය, විදේශීය සංචාරකයන්ගෙන් ලැබුණු ආදායම් බොහෝ සේ අහිමි වී තිබෙනවා. දිනකට රු. ලක්ෂ 42ක ආදායමක් ලැබූ මින්නේරිය ජාතික වනෝද්‍යානයේ ආදායම රු. 5000 දක්වා පහත වැටී තිබෙනවා. මේ වන විට උපාධිධාරී පත්වීම් 35,000ක් දී ඇති අතර ඉදිරි මාස 06 ගත වන විට අලුතින් 65,000කට රැකියා දීමට හැකියාව ලැබෙනවා. විශ්‍රාම ගොස් සිටින අයට විශ්‍රාම වැටුප් ගෙවීම, නොමිලේ පොහොර සැපයීම, පාරවල් සහ ජල, විදුලිය ලබා දීමද ක්‍රමයෙන් සිදු වෙනවා."

නාඋල සමූහ

නාඋල සංස්කෘතික මණ්ඩලයේ නව නිලධාරී මඬුල්ල

2021 වර්ෂය සඳහා නාඋල සංස්කෘතික බල මණ්ඩලයේ නව නිලධාරීහු පත්වෙති. පසුගියදා නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී නාඋල සංස්කෘතික නිලධාරී ඒකනායක බණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් නිල වරණය පැවැත්විණි. මෙහිදී නාඋල සංස්කෘතික බල මණ්ඩලයේ අභිනව සභාපති ලෙස ප්‍රවීණ හිටිවන කවියකු හා විරිඳු ගායන ශිල්පියකු වන වයි. එම්. එස්. බණ්ඩාර මහතා තේරී පත්විය. ලේකම් ලෙස ප්‍රවීණ ගීත රචක පී. එම්. අහංගම මහතා පත්වී ඇති අතර, භාණ්ඩාගාරික ලෙස පත්වුණේ ශ්‍රී නාග ජාතික පාසලේ රංගන ආචාර්ය ප්‍රවීණ රංගනවේදිනී අනෝමා යකුපිටිය මහත්මියයි.

මීට අමතරව නිල බලයෙන් සංස්කෘතික බල මණ්ඩලයේ විධායක සභාපති ධුරය සඳහා නාඋල ප්‍රාදේශීය ලේකම් සී. කේ. බී. ඉලංගසිංහ මහතා ද සංස්කෘතික නිලධාරිවරයා, පරිපාලන ග්‍රාමනිලධාරිවරයා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය සමාජයෝජක හිමියන්ට ද බල මණ්ඩලයේ විධායක බලතල හිමි වේ. 2021 වර්ෂය සඳහා පත්වූ නව නිල මඬුල්ල අවධාරණය කළේ නාඋල කලාපයේ සිටිනා සෙසු කලාකරුවන් ඒකරාශී කර ගැනීම, ඔවුන් සඳහා සුබසාධන වැඩසටහනක් ක්‍රියාවට නැංවීම, කලාකරුවන් ඇගයීම මෙන්ම ඔවුන්ගේ හැකියාවන් සඳහා අත හිත දීම මෙන්ම නැති වී යන සාම්ප්‍රදායික කලා කටයුතු මතු පරපුරට ආරක්ෂා කර දීම ආදි කාරණා රැසක් සම්බන්ධයෙන් ඇප කැපවී කටයුතු කරනා බවටයි.

ඒ. පී. දයාචන්ද්‍ර - උරුබොක්ක විශේෂ

බෙරලපනාතර විදුහලට ගුවන් පාලමක්

බෙරලපනාතර මහා විද්‍යාලය අසල උරුබොක්ක කොටපොළ ප්‍රධාන මාර්ගය හරහා ඉදි වූ ගුවන් පාලමේ වැඩ අවසන් කර තිබේ. බෙරලපනාතර මහා විද්‍යාලය සහ ප්‍රාථමික අංශය ප්‍රධාන මාර්ගයෙන් දෙපස පිහිටා ඇති අතර එම සිසුනට ක්‍රීඩා පිටියට යෑම සඳහා ප්‍රධාන මාර්ගය හරහා යා යුතුව තිබිණි. එබැවින් සිසුන් පාර මාරු වීමේදී අනතුරු රැසකට පසුගිය කාලයේ මුහුණපා ඇත. ඒ හේතුවෙන් ගුවන් පාලමක් ඉදි කර දෙන ලෙසට වසර ගණනාවක සිටම මව්පියන් විසින් රජයෙන් කරනා ලද ඉල්ලීමකට අනුව මේ ගුවන් පාලම ඉදි කර දී තිබේ.

ශ්‍රී ලංකා යුද හමුදාවේ ඉංජිනේරු බළකාය මඟින් ගුවන් පාලමේ ඉදි කිරීම් සිදු කර ඇති අතර ගුවන් පාලමේ දිග අඩි 60ක් හා පළල අඩි 05කි. මේ ගුවන් පාලම ඉදි කිරීම සඳහා රජය මඟින් වැය කර ඇති මුදල රුපියල් මිලියන 16.5ක් වන අතර මාස පහක පමණ කාලයකින් පාලමේ වැඩ අවසන් කිරීම විශේෂත්වයකි. පාලමේ ඉදි කිරීම් අධීක්ෂණය කිරීම පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සිදු කරන ලදී.

එස්. දියගහගේ - දකුණු පළාත් සංචාරක

කන්දකාඩු ගිහින් ඇවිත් ආයෙත් කුඩු ගහලා

කන්දකාඩු පුනරුත්ථාපන කඳවුරේ පුනරුත්ථාපනය වී පැමිණ යළිත් හෙරොයින් මිලිග්‍රෑම් 210ක් ළඟ තබාගෙන සිටියදී අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ පුද්ගලයකු රුපියල් 25,000ක මුදල් ඇපයක් සහ රුපියල් ලක්ෂ දෙකක ශරීර ඇපයක් මත මුදා හැරීමට ගාල්ල ප්‍රධාන මහෙස්ත්‍රාත් හර්ෂණ කැකුණවෙල මහතා නියෝග කළේය. මෙසේ ඇප මත මුදා හරිනු ලැබුවේ වලකන්ද කංකානම්ගේ සුජීව නමැති 44 හැවිරිදි පුද්ගලයෙකි.

මේ පුද්ගලයා හෙරොයින් පානයට ඇබ්බැහි වීම හේතුවෙන් මෙයට පෙර කන්දකාඩු පුනරුත්ථාපන කඳවුරේ පුනරුත්ථාපනය සඳහා ගොස් සිට පැමිණ ඇති අයකු බවත් ඔහු සිය නිවසේ බඩු මුට්ටු පොඩි කරමින් නිවෙසට අලාභ හානි කර ඇති බවත් පොලිසිය ප්‍රකාශ කළේය.

ගාල්ල පොලිසියේ දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ධම්මික නාගහවත්ත, පොලිස් පරීක්ෂක ප්‍රියන්ත, සැරයන්වරුන් වන මදනායක (14353) යන මහත්වරු වැටලීමට එක් වූහ.

ජේ. එම්. හාජීස් - අකුරණ සමූහ

නුවරඑළියෙන් කොවිඩ් ආසාදිතයන් 1131ක්

නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් අලුතින් කොවිඩ් ආසාදිතයන් හමුවීමත් සමඟ දිස්ත්‍රික්කයේ සමස්ත ආසාදිතයන් ගණන 1131දක්වා ඉහළ ගොස් ඇති බව නුවරඑළිය දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය අංශ ප්‍රකාශ කළේය. නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන කොවිඩ් ආසාදිතයන්ගෙන් වැඩි පිරිසක් අඹගමුව සෞඛ්‍ය වෛද්‍ය බල ප්‍රදේශයෙන් වාර්තා වී ඇත. එයින්ද වැඩි පිරිසක් එහි වතු ආශ්‍රිතව වාර්තා වී ඇති අතර නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් කොවිඩ් ආසාදිත මරණ 03ක් සිදුව ඇත.

රාගම සමූහ

නව ඉන්දියානු මහ කොමසාරිස්ට සුබ පැතුම්

අලුතින් රාජකාරිය භාරගත් සහකාර ඉන්දීය මහ කොමසාරිස් රාකේෂ් නටරාජ් මහතා හමුවූ මාතලේ ඉස්ලාමීය - දෙමළ සාහිත්‍ය සංගමයේ සාමාජිකයන් පිරිසක් සුබ පැතුම් එක් කළහ. මාතලේ ඉස්ලාමීය දෙමළ සාහිත්‍ය සංගමයේ ලේකම් එම්. එම්. පීර්මොහොමඩ් සහ විධායක සාමාජිකයන් එම අවස්ථාවේදී ඔවුන්ගේ සාහිත්‍ය ප්‍රකාශනයක් සහකාර ඉන්දීය මහ කොමසාරිස් වෙත භාර දෙන ලදි.

ආර්. එම්. විජේරත්න - හාලිඇළ සමූහ සහ මීගහකිවුල සමූහ

බදුල්ල අවට වායුගෝලයේ දත්ත විශ්ලේෂණයට මිනුම් උපකරණයක්

බදුල්ල දිස්ත්‍රික්කය ආශ්‍රිතව වායුගෝලයේ ගුණාත්මය පරීක්ෂා කිරීමට වායුගෝලීය තත්ත්ව මිනුම් උපකරණයක් (Air Quality monitoring unit) බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කිරීමට බදුල්ල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය පියවර ගෙන තිබේ. මේ උපකරණය මඟින් බදුල්ල දිස්ත්‍රික්කයේ වායුගෝලයේ පවතින සියුම් දුවිලි අංශු, කාබන්ඩයොක්සයිඩ්, උෂ්ණත්වය, ආර්ද්‍රතාව හා වායුගෝලීය පීඩනය පිළිබඳ දත්ත විශ්ලේෂණය කරනු ලබයි.

සොබාදහමේ සියලු සංරචකයන්ට යහපත් වන ආකාරයට වායුගෝලයේ සියලු සංරචක සමතුලිතව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරු මෙමඟින් ලබා ගැනීමට නියමිතය.

මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ ඒ. එම්. එල්. උදයකුමාර මහතා මෙසේ පැවසීය.

"බොහෝ රටවල පවතින අභ්‍යන්තරික සිවිල් ගැටුම් ස්වාභාවික හා ස්වාභාවික නොවන උපද්‍රව හේතුවෙන් මානව සංක්‍රමණයන් වේගයෙන් ඉහළ යමින් පවතිනවා. වායුගෝලීය දූෂණය හා පාරිසරික ගැටලු හේතුවෙන් සිදුවන සංක්‍රමණද ඒ අතර ප්‍රමුඛත්වයක් ගන්නා බව පෙනී යනවා. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමත් තවත් ජාත්‍යන්තර අධිකරණත් මේ ආකාරයෙන් ඔඩු දුවන පාරිසරික අර්බුද හමුවේ ජනතාව විශාල වශයෙන් සිදු කරන සංක්‍රමණ ක්‍රියාකාරකම් සමඟ පැටලී ඇති බවද වාර්තා වෙමින් තිබෙනවා. මීට මාසයකට පමණ පෙර ඉන්දියාවේ සිට ලංකාවේ බදුල්ල දිස්ත්‍රික්කය හා තවත් බොහෝ දිස්ත්‍රික්කයන් ආවරණය කරමින් අහස තුළ ව්‍යාප්ත වූ දුම් වලාවන් සමඟ ලත් අත්දැකීම් සමඟින් වායුගෝලයේ පවතින ගුණාත්මය අධීක්ෂණය කිරීමට අදාළ අංශවල අවධානය යොමු වුණා.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් මෙහි තාක්ෂණික ඇගයීම දිගින් දිගටම අධීක්ෂණය කරනවා. විශේෂයෙන්ම චීනයේ, බංග්ලාදේශයේ හා ඉන්දියාවේ වායුගෝලය තුළ සිදු වන විවිධ වෙනස්කම්වල බලපෑම් සෘජු ලෙසම ශ්‍රී ලංකාවේ වායුගෝලයට බලපානා හෙයින් මේ පිළිබඳ නිරන්තර අධීක්ෂණයෙන් සිටීම අනාගත අවදානම් තත්ත්ව කළමනාකරණයට ගන්නා විශේෂ ක්‍රියාමාර්ගයක්.

ඒ අනුව බදුල්ල දිස්ත්‍රික් ලේකම්වරියගේ උපදෙස් යටතේ මේ වායුගෝලීය තත්ත්ව මිනුම් උපකරණය දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කිරීමට පියවර ගනු ලැබුවා."

රාගම සමූහ

යක්කල නගරයේ මගුල් කරද ගස් 20ක් රෝපණය කරයි

73 වැනි නිදහස් සමරුව උත්කර්ෂවත් අන්දමින් සැමරීම පිණිස පැළ වෙනුවට වැඩුණු වටිනා රුක් රෝපණය කිරීමේ උත්සවයක් යක්කල නගරයේදී පවත්වන ලදි. ගම්පහ නගරාධිපති එරංග සේනානායක මහතාගේ සහ නාගරික මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගේද යක්කල පොලිසියේ පරිසර අංශයේ නිලධාරීන්ගේද සහභාගිත්වයෙන් හොඳින් වැඩුණු මගුල් කරද පැළ සිටුවීම සිදු කරන ලදි. යක්කල පොලිසියේ පරිසර අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ආර්. එම්. එස්. බණ්ඩාර මහතා ඇතුළු පරිසර අංශයේ නිලධාරීන් පිරිසක්ද මේ වැඩුණු රුක් රෝපණ අවස්ථාවට එක්ව සිටි අතර යක්කල චන්ද්‍රජෝති විද්‍යාලය දක්වා පැළ විස්සකට අධික ප්‍රමාණයක් මෙදින රෝපණය කරන ලදි. මේ වැඩුණු මගුල් කරද ගස් රැකබලා ගැනීමේ වගකීමද පරිසරයට ආදරය කරනා පිරිසකට පවරා ඇතැයි කළ විමසීමේදී යක්කල පොලිසියේ පරිසර අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක බණ්ඩාර මහතා පැවසීය.

ඇල්මැරුණු ඉඩම් නැවත වගා කළ හැකි ලෙස

ඇල්මුල්ල 2021 ඔක්තෝබර් 17 වැනිදා

ඇල්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ඉඩම් ඇල්මැරුණු තත්ත්වය

ඇල්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී වසම් 14 ක ඇල්මැරුණු ඉඩම් පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙම සමීක්ෂණය අනුව ඇල්මැරුණු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 1,250 ක් පමණ වන බව හඳුනාගෙන ඇත. මෙම ඉඩම් ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ භූමි භාවිත සිතියම් ඇසුරින් ගණනය කරන ලදී.

ඇල්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ඇල්මැරුණු ඉඩම් ප්‍රතිශතය

ඇල්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇල්මැරුණු ඉඩම් ප්‍රතිශතය ග්‍රාම නිලධාරී වසම් අනුව පහත පරිදි වේ.

ග්‍රාම නිලධාරී වසම	ඇල්මැරුණු ඉඩම් ප්‍රතිශතය
ඇල්මුල්ල නැගෙනහිර	18%
ඇල්මුල්ල බටහිර	22%
වැලිකන්ද	31%
කිරිඔය	27%
පහළ ගඟබඩ	35%
ඉහළ ගඟබඩ	29%
මැද කණ්ඩිය	24%
උතුර කණ්ඩිය	26%
දකුණු කණ්ඩිය	33%
මල්ලිගොඩ	20%
කුඹුරුවත්ත	38%
ගල්ඔය	41%
වැවිලිමුල්ල	17%
නාගස්වත්ත	15%

ඇල්මැරුණු ඉඩම් ඇතිවීමට හේතු

ඇල්මැරුණු ඉඩම් ඇතිවීමට ප්‍රධාන හේතු කිහිපයක් හඳුනාගෙන ඇත. ඒ අතර, නිසි ජල කළමනාකරණය නොමැතිකම, ඉඩම් ඛාදනය, වගා බිම් අතහැර දැමීම, ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ඉඩම් භාවිතය, සහ ගංගා ඉවුරු ආශ්‍රිත ඉඩම් ඇල්මැරීම ප්‍රධාන වේ. විශේෂයෙන්ම ගඟබඩ ඉඩම් ප්‍රමාණයක් ගංවතුර නිසා ඇල්මැරී ඇත.

ඇල්මැරුණු ඉඩම් ප්‍රතිසංස්කරණය

ඇල්මැරුණු ඉඩම් නැවත වගා කළ හැකි ලෙස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විවිධ ක්‍රියාමාර්ග යෝජනා කර ඇත. ඒ අතර, ඉඩම් ඛාදනය වැළැක්වීම සඳහා ගඟබඩ ඉඩම්වල වැටවේලි සහ පැල සිටුවීම් සිදු කිරීම, ජල කළමනාකරණ ව්‍යුහයන් ඉදිකිරීම, සහ ඇල්මැරුණු ඉඩම් වගා කිරීම සඳහා ප්‍රතිලාභීන් දිරිමත් කිරීම ප්‍රධාන වේ.

ග්‍රාම මූලික සංවිධාන සහභාගිත්වය

ග්‍රාම නිලධාරී වසම් 14 හි ග්‍රාම සංවර්ධන සංවිධාන, ගොවි සංවිධාන සහ කාන්තා සමිති ඇතුළු ග්‍රාම මූලික සංවිධාන 23 ක් ක්‍රියාකාරී ලෙස හඳුනාගෙන ඇත. මෙම සංවිධාන හරහා ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩසටහන් ප්‍රජාව තුළ ප්‍රචාරය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

ඉදිරි පියවර

ඇල්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2022 වර්ෂය තුළ හෙක්ටයාර 300 ක ඉඩම් ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කරයි. ඒ සඳහා රු. මිලියන 45 ක් ඇස්තමේන්තු කර ඇති අතර, ජාතික ජල සම්පාදන හා ඉඩම් සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ද ඇතිව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ඇල්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ඇල්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ග්‍රාම නිලධාරී වසම් 14 ක ඇල්මැරුණු ඉඩම් පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙම සමීක්ෂණය අනුව ඇල්මැරුණු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 1,250 ක් පමණ වන බව හඳුනාගෙන ඇත. මෙම ඉඩම් ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ භූමි භාවිත සිතියම් ඇසුරින් ගණනය කරන ලදී.

ඇල්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ඇල්මැරුණු ඉඩම් ප්‍රතිශතය

ඇල්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇල්මැරුණු ඉඩම් ප්‍රතිශතය ග්‍රාම නිලධාරී වසම් අනුව පහත පරිදි වේ.

ග්‍රාම නිලධාරී වසම	ඇල්මැරුණු ඉඩම් ප්‍රතිශතය
ඇල්මුල්ල නැගෙනහිර	18%
ඇල්මුල්ල බටහිර	22%
වැලිකන්ද	31%
කිරිඔය	27%
පහළ ගඟබඩ	35%
ඉහළ ගඟබඩ	29%
මැද කණ්ඩිය	24%
උතුර කණ්ඩිය	26%
දකුණු කණ්ඩිය	33%
මල්ලිගොඩ	20%
කුඹුරුවත්ත	38%
ගල්ඔය	41%
වැවිලිමුල්ල	17%
නාගස්වත්ත	15%

ඇල්මැරුණු ඉඩම් ඇතිවීමට හේතු

ඇල්මැරුණු ඉඩම් ඇතිවීමට ප්‍රධාන හේතු කිහිපයක් හඳුනාගෙන ඇත. ඒ අතර, නිසි ජල කළමනාකරණය නොමැතිකම, ඉඩම් ඛාදනය, වගා බිම් අතහැර දැමීම, ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ඉඩම් භාවිතය, සහ ගංගා ඉවුරු ආශ්‍රිත ඉඩම් ඇල්මැරීම ප්‍රධාන වේ. විශේෂයෙන්ම ගඟබඩ ඉඩම් ප්‍රමාණයක් ගංවතුර නිසා ඇල්මැරී ඇත.

ඇල්මැරුණු ඉඩම් ප්‍රතිසංස්කරණය

ඇල්මැරුණු ඉඩම් නැවත වගා කළ හැකි ලෙස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විවිධ ක්‍රියාමාර්ග යෝජනා කර ඇත. ඒ අතර, ඉඩම් ඛාදනය වැළැක්වීම සඳහා ගඟබඩ ඉඩම්වල වැටවේලි සහ පැල සිටුවීම් සිදු කිරීම, ජල කළමනාකරණ ව්‍යුහයන් ඉදිකිරීම, සහ ඇල්මැරුණු ඉඩම් වගා කිරීම සඳහා ප්‍රතිලාභීන් දිරිමත් කිරීම ප්‍රධාන වේ.

ග්‍රාම මූලික සංවිධාන සහභාගිත්වය

ඇල්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී වසම් 14 හි ග්‍රාම සංවර්ධන සංවිධාන, ගොවි සංවිධාන සහ කාන්තා සමිති ඇතුළු ග්‍රාම මූලික සංවිධාන 23 ක් ක්‍රියාකාරී ලෙස හඳුනාගෙන ඇත. මෙම සංවිධාන හරහා ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩසටහන් ප්‍රජාව තුළ ප්‍රචාරය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

ඉදිරි පියවර

ඇල්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2022 වර්ෂය තුළ හෙක්ටයාර 300 ක ඉඩම් ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කරයි. ඒ සඳහා රු. මිලියන 45 ක් ඇස්තමේන්තු කර ඇති අතර, ජාතික ජල සම්පාදන හා ඉඩම් සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ද ඇතිව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ඇල්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

2021 ඔක්තෝබර් 17 වැනිදා ඇල්මුල්ල

ඇල්මැරුණු ඉඩම් නැවත වගා කළ හැකි ලෙස

පළාත - **වයඹ**
දිස්ත්‍රික්කය - **පුත්තලම**
ප්‍රා.ලේ. කොට්ඨාසය - **වනාතවිල්ලුව**

නගේ වාඩියේ මගේ සිහිනය

වයඹ පළාතට අයත් පුත්තලම දිස්ත්‍රික්කයේ වර්ග කිලෝමීටර් 710ක භූමි වපසරියකින් යුත් භූමියකින් වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ඩිමා මාඩිමව විල්පත්තුව ජාතික වනෝද්‍යානයට දකුණු පසින් රමණීය කලා ඔය ගං කොමළිය ගලා බසී. ගලා බසින නිමිනයේ පිහිටා ඇති අති සුන්දර දෙස් විදෙස් සංචාරකයන්ගේ මනදොළ පිනවන සොඳුරු පාරාදිසයක් ලෙස ගගේවාඩිය හැඳින් වේ.

මෙහි සුවිශේෂත්වය වන්නේ මෙය නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ට එකම දිනක් තුළ එකම ස්ථානයකින් ලුණු ජලයේ සහ පිරිසුදු ජලයේ පහස විඳ ගනිමින් ජල ක්‍රීඩාවේ නිරත විය හැකි වීම සේම වන සතුන්ගේ ජීවන රටාව සහ මවුන්ගේ දින චර්යාව සුපැහැදිලි ලෙස නැරඹීමටද හැකියාව හිමි වීමය.

බාධක මැද ගලන ගගේ ලස්සන පෙණි බුබුළු නැගේ යනුවෙන් කියන ලද කතාවට අත දිඹු කරන කලා ඔය ගං කොමළිය හෝ ගානා පොකුණ සිප වැලඳ ගන්නා එකම ස්ථානයත්, ලුණු ඔය හෝ ගානා පොකුණ සිප ගන්නා එකම ස්ථානයත් ගගේවාඩියයි. මෙහි පිහිටීමෙහි සුවිශේෂත්වය හේතුවෙන් බහුතරයක් සංචාරකයන් ඇලුම් කරනු ලබන ජල ක්‍රීඩා සේම ඔවුන්ගේ සතුට විනෝදාස්වාදයට මෙය මහත් අස්වැසිල්ලක් වනු නිසැකය.

ගගේවාඩිය සංචාරක පුරවරයට පැමිණෙන බහුතරයක් දෙස් විදෙස් සංචාරකයන්ගේ නෙත් සිත් පිනවන තවත් ස්ථානයක් ලෙස වසර දහස් ගණනක් තුපුරණි බයෝබැබ් හෙවත් අළු ගස හැඳින්විය හැකිය. මෙය විල්පත්තුව ජාතික වනෝද්‍යානය තුළ කලපුවට සීමා මාඩිමව පිහිටා නිමෙන අතර, දැනට විල්පත්තුවේ පිහිටා ඇති දැවැන්තම හා පැරණිතම ශාකය ලෙස හැඳින්වේ. මෙය නැරඹීම සඳහා බෝටු ආධාරයෙන් බහුතරයක් දෙස් විදෙස් සංචාරකයන් ඒ දෙසට සංක්‍රමණය වීමේ පුවණතාවයක් දක්නට ලැබේ.

තවද, ආදම්ගේ සොහොන කුඳිරමලේ තුඩුව සහ ඉපැරැණි පුදිපාහාරය දැක බලා ගැනීමේ අවස්ථාව ගගේවාඩියට පැමිණෙන ඕනෑම සංචාරකයකුට හසුවෙන් දඳා කර ගත හැකිය.

මෙරට තුළ තිස් වසරක් පුරා පැවති කුරිරු ත්‍රස්තවාදී අරගලය හේතුවෙන් එතුරේ ජීවත් වන ජනතාවට දකුණට යන්නටත් දකුණේ ජීවත් වන ජනතාවට උතුරට යන්නටත් නොහැකි තත්ත්වයක් එකල උදා වී තිබිණි. උතුරේ එක් පසෙකින් වෙඩි හඬ ඇසෙන විට තවත් පසෙකින් මර ලනෝනි දෙමින් නඟන විලාපය එකල කන වැකුණු වාර අනන්ත අසුමාණය. ඇතැම් ස්ථානවලදී ත්‍රස්තුයන්ගේ රුදුරු කඩු පහරින් සිය දහස් ගණනක් සිවිල් වැසියන්ගේ ද ජීවිත මවුනට අහිමි කෙරිණි.

ලේ පිපාසයෙන් මත් වුණ ත්‍රස්තයන් මාඩිම ගම් ඉලක්ක කරන්නට පුරුදු මේ අවදියේය. විල්පත්තුව ජාතික වනෝද්‍යානය තුළින් මතු වූ ත්‍රස්තයින් සාපූර්ව ගමන් කරන්නේ පුළු පිරිසක් සිය ජීවිකාව ලෙස ගඟක් අසබඩ වාඩි නනා ධීවර රැකියාව සිදු කරනු ලැබූ ගමක් ඉලක්ක කර ගෙනය. ඒ ගම මෙම ගගේවාඩියය.

ගගේවාඩියට පැමිණි නාලාගිරි වෙස් ගත් කුරිරු ත්‍රස්තයන් අමානුෂික ලෙස ජීවිත ගණනක් කඩු පහරින් වනසා නැවතත් කාලයට පලා ගොස් තිබුණි. එපමණක් ද නොව පොලිස් මුරපළවල් සේම ආරක්ෂක බළඇණ සිඳ බිඳ දැමූ වාර ද නැතුවාම නොවේ.

එයට හේතුව ලෙස හඳුනාවිය හැක්කේ. ගගේවාඩිය පුරාණයේ වෙළඳ මර්මස්ථානයක් බවට නතුව තිබූ නිසාවෙනි. විජය කුමරුගේ ආගමනයත් කුවේණියගේ විවාහයත් සිදුව ඇති බවට හෙළ ඉතිහාස වංශ කතාවේ මෙම ස්ථානය ගැන අදටත් රන් අකුරින් සනිටුහන්ව තිබේ. එපමණක් ද නොව යට ගිය ප්‍රෞඪ ඉතිහාසයක් මෙන්ම කලා නිර්මාණ රැසකින් සමන්විත මෙම ස්ථානය මහරම් පරිසර පද්ධතියකට උරුමකම් කියන භෞතේදර්ශනික ලෙසට විවිධත්වයකින් ද යුක්තය.

ගගේවාඩිය පිහිටා ඇත්තේ වන දුර්ග ගිරි දුර්ගයෙන් සැලසිලෙන් පෞරාණික මෙන්ම ඓතිහාසික වැදගත්කමකින් යුත් විල්පත්තුව ජාතික වනෝද්‍යානයට දකුණු පසට මාඩිමව ගලා බසින රමණීය කලා ඔය ලුණු ඇළට එකතු වීමෙන් පසුව මුහුදට ගලා බසින සන්ධිස්ථානය ද මෙම ගගේවාඩිය වේ.

එවකට ගගේවාඩිය පිළිබඳව එතරම් සැලකිල්ලක් නොදැක්වුව ද පසු කාලීනව ගගේවාඩිය පිළිබඳව බහුතරයකගේ අවධානය සේම වැඩි කතා බහට ද ලක්වූ බව සඳහන් කළ යුතුය.

2014 වසරේ මුල් භාගයේදී විල්පත්තුව ජාතික වනෝද්‍යානයට පිවිසීම සඳහා එළවන්කුලම ප්‍රදේශයෙන් ස්ථාපිත කළ නව පිවිසුම් දොරටුවේ ආරම්භයත් සමඟ 2015 වසරේ සිට ගගේවාඩිය සංචාරක පුරවරයක් බවට පරිවර්තනය වන්නට විය.

ඒ අනුව දෙස් විදෙස් සංචාරකයින්ගේ සොඳුරු පාරාදිසයක් සේම නව හෝනාදැන්නක් ලෙස ගගේවාඩිය සංචාරක කර්මාන්තය එයට කදිම නිදසුනක් එක්කාසු කරන්නට විය. ඒ සමඟම ජාතික වනෝද්‍යානයට මාඩිමව, විල්පත්තුව ජාතික වනෝද්‍යානයට දකුණු පසට මාඩිමව ගලා බසින රමණීය කලා ඔය ලුණු ඇළට එකතු වීමෙන් පසුව මුහුදට ගලා බසින සන්ධිස්ථානය ද මෙම ගගේවාඩිය වේ.

එවකට ගගේවාඩිය පිළිබඳව එතරම් සැලකිල්ලක් නොදැක්වුව ද පසු කාලීනව ගගේවාඩිය පිළිබඳව බහුතරයකගේ අවධානය සේම වැඩි කතා බහට ද ලක්වූ බව සඳහන් කළ යුතුය.

2014 වසරේ මුල් භාගයේදී විල්පත්තුව ජාතික වනෝද්‍යානයට පිවිසීම සඳහා එළවන්කුලම ප්‍රදේශයෙන් ස්ථාපිත කළ නව පිවිසුම් දොරටුවේ ආරම්භයත් සමඟ 2015 වසරේ සිට ගගේවාඩිය සංචාරක පුරවරයක් බවට පරිවර්තනය වන්නට විය.

ඒ අනුව දෙස් විදෙස් සංචාරකයින්ගේ සොඳුරු පාරාදිසයක් සේම නව හෝනාදැන්නක් ලෙස ගගේවාඩිය සංචාරක කර්මාන්තය එයට කදිම නිදසුනක් එක්කාසු කරන්නට විය. ඒ සමඟම

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව මඟින් ගගේවාඩිය ප්‍රදේශය ඉලක්ක කර ගනිමින් විල්පත්තුව 'නේචර් රිසෝට්' නමින් දෙස් විදෙස් සංචාරකයින්ගේ සුව පහසුව සඳහා නව නිවාඩු නිකේතනයක් ස්ථාපිත කෙරිණි.

විල්පත්තුව නේචර් රිසෝට් නිවාඩු නිකේතනයේ ආරම්භයත් සමඟ ගගේවාඩිය නව මුහුණුවරකින් කරළියේ නතා බහට එක් විය. ඉන් පසු ගගේවාඩිය නැරඹීම සඳහා පැමිණි සංචාරකයන් දස දහස් ගණනින් වැඩි විණි.

පසු කාලීනව විල්පත්තුව ජාතික වනෝද්‍යානය ඉලක්ක කර ගනිමින් තවත් බොහෝ පිරිසක් විසින් මේ වන විට නිවාඩු නිකේතන 15ට ආඥාන්ත ප්‍රමාණයක් ඇතුළුව සාරි ඊප් රට 15ට ආඥාන්ත ප්‍රමාණයක් එකතු වීම නිසා මේ වන විට ගගේවාඩිය තුළ සංචාරක කර්මාන්තයක් නිර්මාණය වී තිබේ.

මෙම නිවාඩු නිකේතන ඉලක්ක කර ගනිමින් කටුනායක අන්තර්ජාතික ගුවන් තොටුපළේ සිට පැය දෙකක් වැනි කෙටි කාලයකින් විදේශීය සංචාරකයින් පසු ගිය වර්ෂයෙන්වල වැල නොකැඩී ඇදෙන්නටත්, මවුන්ගේ ආකර්ෂණය මේ ප්‍රදේශයට නොඅඩුව ලැබෙන්නටත් සුවිශේෂී වූ සාධකය ගගේවාඩියය.

කල්පිටිය අර්ධද්වීපයේ පිහිටා ඇති දූපත් වළල්ල සේම කොරල් පර, ඩොල්ෆින්, කඩොලාන නැරඹීමේ පහසුව මෙන්ම ගගේවාඩිය සංචාරක පුරවරය තුළ ජල ක්‍රීඩාව සහ වන ජීවී අත්දැකීම් මවුන්ට එක වරම ලබා ගැනීමේ හැකියාව පැවතීම විශේෂත්වයකි.

ජර්මනිය, ඔස්ට්‍රෙලියාව, එංගලන්තය, ස්විට්සර්ලන්තය, අමෙරිකාව වැනි රටවල සිටින විදේශීය සංචාරකයින් බහුතරයක් ගගේවාඩියේ සංචාරය සඳහා පැමිණීම පසුගිය කාලය තුළ නිරන්තරයෙන්ම සිදු වුණ අතර, එසේ පැමිණි සංචාරකයන් ජල සහ වනජීවී යන අත්දැකීම් සුවසේ විඳ ගත් බව පෙනෙන්නට නිබිණි.

එසේ පැමිණෙන බහුතරයක් සංචාරකයින් බෝටුවූ සාෆාරි ඔස්සේ වසර දහස් ගණනක් ඉපැරණි අළි ගස නැරඹීමට දැඩි ලෙස ප්‍රිය කරන අතර, පසුව කලා ඔය කලපුවට එක්වන ස්ථානයේ සිරි නරඹා කලා ඔයට බැස දිය නාන මොවුන් අනතුරුව විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ සංචාරය සඳහා එක්වන්නේ එළවන්කුලම පිවිසුම් දොරටුවෙනි.

එහිදී දිවියා, ඇතා, වළසා වැනි වන සතුන් ද, විශේෂිත වූ කුරුළු වර්ග, උරගයින්, සහ වෙනත් සිවුපාවුන් මෙහිදී දැක ගන්නට හැකිය. මෙලෙස

ජෙව විවිධත්වයකින් සැදුම් ලත් විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ දීර්ඝ සංචාරය සඳහා එක්වීමෙන් අප රටේ වෙනත් පරිසර පද්ධතියකින් දැක ගැනීමට නොහැකි දුර්ලභ දසුන් නෙත් මානයට හසුවීම ගගේවාඩියේදී සිදු විය හැකිය.

එපමණක් නොව ගගේවාඩියට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ට විජය කුවේනියගේ ප්‍රේම වාත්තාන්තයේ සැඟවුණ තැන් එමිනෙක සියැසින්ම දැක ගැනීමේ භාග්‍යය උදාවන්නේ හිහිරි අත්දැකීම් සම්භාරයක් ද කැටුවය. තව ද ආසියාවේ විශාලතම හුණු ගල් නිධිය පිහිටා ඇත්තේ ද ගගේවාඩියට යාබදව ඇති අරුවක්කාඩුව ප්‍රදේශයේය.

එමෙන්ම සංචාරක පක්ෂීන් සේම පර්යටන පක්ෂීන්ගෙන් සැලසිලෙන් සුවිශේෂී කුරුලු නිවහන පිහිටා ඇත්තේ ද මෙම රමණීය කලා ඔය නිමිනයේ වීමත්, දුර්ලභ ගසයේ කඩොලාන සහ කලපු පරිසර පද්ධතියට ආවේණික කවෝලාන සම්මිශ්‍රිතයින් සැදුම්ලත් සුවිශේෂී කඩොලාන පරිසරය දැකුම්කළු දර්ශනයක් බව කිව යුතුමය.

මෙහි සංචාරයේ යෙදෙන්නන්ට හෝ ගානා පොකුණේ රෑ පිට රෑ නැගෙන කිරි පැහැ දිය මත පාවෙන කුඩා මසුන්, ගොදුරු ලොබින් සැරි සරන මුහුදු උකුස්සන්ගේ පියාසර විලාසය ඇස් මන්මත් කරවන දසුන්ය.

කේ. ප්‍රියංකර කළුපහන

දිනමිණ

සාර භූමියේ හරිතානන්දය

සැඳෑය

2021 පෙබරවාරි 17 බදාදා

අස්වැන්න

ඡායාරූපය - කෞෂ් දිසානායක

බිසෝවරු දිය කෙළි

මාකෙලිය ඇල්ල

වීදිය බණ්ඩාර සෙනෙවියාගේ බිසෝවරුන් දිය කෙළින නිසාත්, වීදිය බණ්ඩාර සෙනෙවියාගේ රාජාභරණ නිදන්ව ඇතැයි පවතින ජනප්‍රවාද නිසාත් පමණක් නොව කුකුළේගඟ ජල විදුලි බලාගාරය හා යුද හමුදා නිවාඩු නිකේතනය නිසා මාකෙළිය ඇල්ල ඓතිහාසිකවත්, පාරිසරිකවත් ජනාදරය දිනා ගෙන තිබේ. කළුතර දිස්ත්‍රික්කයේ පාරිසරික සෞන්දර්යය සොයන කා අතරත් මුලින්ම කියැවෙන මාකෙළිය ඇල්ල දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය දිනා ගන්නට සමත්ව ඇත.

දක්ෂිණ අධිවේගි මාර්ගයේ වැලිපැන්න පිවිසුමෙන් හෝ ගාලු පාරේ කළුතර, මතුගම හරහා අගලවත්ත, කලවාන මාර්ගයේ ලත්පදුර හන්දියට පිවිසීම ඉතා පහසුය. වීදිය බණ්ඩාර පාලන සමයේ ප්‍රවාහන කටයුතු සිදු කළ ඓතිහාසික ඔරුව ඇතුළු පාරිසරික වට පිටාව දැක බලා පරිසර සුව විඳ කිලෝමීටර් හයක් හතක් දුරින් හමු වන මෝල්කාව නගරයට පිවිසිය හැකිය.

අගනුවර සිට 120 මාර්ගයේ හොරණටත් එතැන් සිට බුලත්සිංහල හරහා මෝල්කාව නගරයටත් ගමන් කිරීමට ඉතා දියුණු මාර්ග පද්ධතිය පහසුව සලසනු ඇත. මෝල්කාව නගරයෙන් කුකුළේ ගඟ මාර්ගයේ කිලෝමීටර් හතරක දුරක් පසු කරන විට දැනෙන සිසිලස කියා දෙන්නේ මාකෙළිය ඇල්ලේ පහස නෙත් සිත් පැහැර ගන්නා බවය.

නිරිත දිග මෝසම් වර්ෂාවෙන් වර්ෂය පුරා මිලිමීටර් 400 ක වර්ෂාපතනයක් ලබන මාකෙළිය ඇල්ලේ උස මීටර් පහළොවක් වේ. ලංකාවේ දිය ඇලි අතර ජනප්‍රියත්වයෙන් 17 වන ස්ථානය හිමි වන මාකෙළිය ඇල්ල උස අනුව 143 වන ස්ථානයේය. වර්ග කිලෝමීටර් එකොළහක ජල පෝෂක ප්‍රදේශයකින් යුතු සිංහරාජ මායිමේ ඇති මාකෙළි ඇල්ල පාරිසරික අසිරිය කියා දෙන්නේ ඇඟ කිළිපොලා යන සිසිලසත් සමඟිනි.

බස්නාහිර පළාත් පාරිසරික හා සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදනයෙන් ඉදි කර ඇති මුර කුටි, වැසිකිළි, කැසිකිළි පහසුකම් මෙන්ම ආරක්ෂිත පියගැට පෙළ ආගන්තුක පරිසර ලෝලීන්ට මහඟු සහායක් සපයනු ලබයි. කළුතර දිස්ත්‍රික්කයේ ආකර්ෂණීයම දිය ඇල්ල මාකෙළිය ඇල්ල වන අතර වැඩිම ජීවිත ප්‍රමාණයක් බිලි ගත් දිය ඇල්ල ද මෙය බව එහි යන ඔබ අමතක නොකළ යුතුය. ඒ සියලු ජීවිත බිලිව ඇත්තේ ඇල්ලේ වරදින් නොව අසංවරව, අසිහියෙන් යුතුව ඇල්ල අසල හැසිරීමෙන් වග නැවත නැවත සිහි කළ යුතුය. පාලින්ද නුවර ප්‍රාදේශීය සභාවෙන් ලබා දෙන අවසර පතින් යාන වාහනවලට රැකවරණය සැපයෙන අතරම ඇල්ලේ සිරි නැරඹීමට ලැබෙන උපදෙස් ජීවිත රැක ගැනීමට ද හේතු වේ.

ප්‍රධාන මාර්ගයේ සිට ඉතා පහසුවෙන් ඇල්ල පාමුලට බැසීමට ඇති පියගැට පෙළ අවසානයේ ඇති ඇල්ල නැරඹුම් පීඨිකාව රිසි සේ මාකෙළිය ඇල්ලේ සිහිවටන ඔබ සතු කරගැනීමට සුදුසුම ස්ථානය වේ. පීඨිකාව පහළ ගල් තලාව ලිස්සනසුළු නිසා ඉතා අනතුරුදායක බව පළමුවරට එහි යන ඔබ සිහි තබා ගත යුතුය. කුකුළේ ගඟ හරහා සිංහරාජයේ සිසිලස රැගෙන විත් ඇල්ල අසල සිටින අප මිදුමෙන් සිප සනහාලන නිසාම ඉන් මිදී යෑමට සිත් නොදේ. පසුගිය දශක කිහිපය තුළ මාකෙළිය ඇල්ල පාමුල දිය නෑමට ගිය හතළිස් දෙනකු පමණ තවමත් නැවත අප අතරට පැමිණ නැත. එම නිසා සිත් සේ දිය නෑම සඳහා පියගැට පෙළින් ආපසු ප්‍රධාන මාර්ගයට පැමිණ මීටර් තුන්සීයයක් ඉදිරියට පැමිණිය යුතුය. ගිමන් හල්, වැසිකිළි කැසිකිළි නිසි ලෙස පවිත්‍ර නොකිරීමෙන් අපවිත්‍ර වී තිබුණ ද එහි ඇති ගල්තලාව අසල නොගැඹුරු ජල තටාකය බාල මහළු සැමට රිසි සේ දිය නෑමට සොබාදහම ලබා දුන් අපූරු දායාදයකි.

මාකෙළිය ඇල්ල නරඹා දිය නෑමට එන සැමට පිරිසුදු කිතුල් හකුරු, කිතුල් පැණි, වෙනිවැල් ගැට, කෑර දලු. බට පොතු වට්ටි ඇතුළු ගමේ නිපැයුම් ලබා දෙන්නට ප්‍රදේශයේ ජනතාව බොහෝ විට සූදානමින් සිටිති. ගත සිත කුල්මත් කරන නිසාම කාලය සොරා ගන්නට මාකෙළි කොමළිය සමත්ය. ඇල්ලේ සිට ඉහළට ගමන් කර කුකුළේ ගඟ බලාගාරය මෙන්ම මාර්ගයේ කෙළවර පිහිටි ජලාශය දැක බලා ගැනීමේ අවස්ථාව මාකෙළිය ඇල්ලට එන දෙස් විදෙස් සංචාරකයන්ට උදා කර ගත හැකිය.

පී. සෝමරත්න

යක්ෂයන්ගේ වන වටුල යහිබල

වළල්ලාවිට

හඳවත බඳු වූ යගිරල රක්ෂිත වනාන්තරය ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ පිහිටි නිවර්තන වර්ෂා වනාන්තර අතරින් ඉහළම වටිනාකමක් ඇති වනාන්තරයකි. සිංහරාජය, කන්නෙලිය, රූණකන්ද වැනි වනාන්තර තුළ මෙන්ම ජෛව විවිධත්වය හා සුන්දරත්වය ඉතා ඉහළ අගයක් ගන්නා අතර විනෝදාස්වාදය සඳහා සංචාරය කිරීමට වඩා මෙම පරිසර පද්ධතිය වඩාත්ම උචිත වනුයේ අධ්‍යාපනික වශයෙන් ගවේෂණ කටයුතුවල නිරත වීමටයි.

කළුතර දිස්ත්‍රික්කයෙහි වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටියා වූ මෙම යගිරල රක්ෂිත වනාන්තරය ගලතර පරෙයිගම හරහා උතුම්ගම මාර්ගය, උතුම්ගම ගුලවිට හරහා වලල්ලාවිට මාර්ගය, අවිත්තාව වලල්ලාවිට හරහා මීගහතැන්න ප්‍රධාන මාර්ගයන්ට මෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 10 කට පමණ මායිම්ව පවතී. මෙම යගිරල වනාන්තරය 1926 වර්ෂයේ පෙබරවාරි මස 19 වන දින ශ්‍රී ලංකා ආණ්ඩුවේ අංක 7513 ගැසට් පත්‍රය මඟින් ආරක්ෂා වී ඇති වනාන්තරයක් ද වේ.

යගිරල රක්ෂිත වනාන්තරය සහ පැණියාවල මූකලාන යන නාමයන්ගෙන් හඳුන්වන මෙම රක්ෂිත වනාන්තරයේ ශාක හා සත්ව විවිධත්වය ඉතා ඉහළ මට්ටමක පවතී. වනාන්තරය එක් පසෙකින් බෙන්තර ගංගාවට මායිම් වන නිසාවෙන් ගංගාවේ පිටාර රක්ෂිතයක් ලෙස ද හැඳින්විය හැකිය. වනාන්තරය පුරා දිවෙන කුඩා ජල දහරාවන් විශාල ප්‍රමාණයක් පවතින අතර ඒවා වනාන්තරය හරහා ගලා විත් බෙන්තර ගංගාව හා එක් වීම සිදු වේ. ප්‍රකට වලල්ලාවිට තොටස් ඇල්ල ද පෝෂණය වන්නේ යගිරල රක්ෂිත වනාන්තරයෙනි. මෙම ජල දහරාවන් තුළ වෙසෙන මිරිදිය මත්ස්‍යයන්ගේ විවිධත්වය ඉහළම අගයක් ගන්නා අතර දංකොළ සාලයා, තල් කොස්සා, ගල් පාඩියා, ලේ තිත්තයා, දන්ඩියා, හල්මල් දන්ඩියා, පෙතියා, වැලිගොවිවා වැනි මත්ස්‍ය විශේෂ 22ක් වනාන්තරය ආශ්‍රිතව හඳුනාගෙන තිබෙන අතර ඉන් විශේෂ 07ක්ම ඒක දේශික වීම සුවිශේෂී වටිනාකමකි.

මත්ස්‍ය විශේෂ මෙන්ම අනෙකුත් සත්ව විශේෂයන්ගේ විවිධත්වය අතින් ද පොහොසත් මෙම වනාන්තරයේ ක්ෂීරපායී විශේෂ 36 හඳුනා ගෙන ඇති අතර කලවැද්දා, දඬුලේනා , කළු වඳුරා, මීමින්නා, ගෝනා වැනි ක්ෂීරපායින් බහුලව දැක ගැනීමට හැකියාවක් ඇත. වළි කුකුළා, කොටටෝරුවා, ඇටි කුකුළා වැනි පක්ෂීන් ඇතුළුව පක්ෂි විශේෂ 64ක් පමණ හඳුනා ගෙන ඇත. සර්ප විශේෂ 27ක් පමණ මෙහි දක්නට ලැබෙන අතර ඉන් විශේෂ 07ක්ම ශ්‍රී ලංකාවේ පමණක් දක්නට ලැබෙන විශේෂයන්ය. මෙහි වාසය කරන කටුසු විශේෂ 19ක් අතරින් විශේෂ 05 ක්ම ඒක දේශික විශේෂ වේ.

සිංහරාජයට නොදෙවෙනි ශාක විවිධත්වයක් දක්නට ලැබෙන යගිරල රක්ෂිතය බට පඳුරු, මීවන මෙන්ම රුස්ස වෘක්ෂවලින් සමන්විත වන අතර මේ වන පියස තුළ ශාක විශේෂ 152 ක් පමණ වාර්තා වී තිබේ. ඒ අතරින් හොර, ඇටඹ, වල් දෙල්, කිතුල්, දිය පර, වෙනිවැල්, බෙරලිය ආදී ශාක දක්නට හැකිය. ඉතා උස ශාක පිහිටීම, අඛණ්ඩ වියන් ස්ථරය වැනි තෙත් කලාපීය වනාන්තර ලක්ෂණ මේ වනාන්තරය තුළදී ද ඉතා පැහැදිලිව දැක බලා ගත හැකිය.

අතීතයේ යක්ෂ ගෝත්‍රිකයන් වනාන්තරය තුළ තිබූ ගල් ලෙනක වාසය කළ බව ජනප්‍රවාදයේ සඳහන් වන අතර යකුන් විසූ ගිරි ලෙන යක් ගිරි ලෙන බවට පත් වී පසුකාලීනව යගිරල වූ බව ද සඳහන් වේ. අතීතයේ හෙක්ටයාර් 5908ක භූමි ප්‍රමාණයකට හිමිකම් කියූවත් වර්තමානයේ මේ වනාන්තරයට හිමි වන්නේ හෙක්ටයාර් 3029.38 ක පමණ භූමි ප්‍රදේශයක් පමණි. වනාන්තරයේ වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 4000 පමණ වන අතර වාර්ෂික උෂ්ණත්වය 27 ^{0}C -28 ^{0}C අතර අගයක පවතී.

මෙම වනාන්තරය මතුගම අධිවන කාර්යාලය යටතේ පාලනය වන අතර යගිරල බිටිටුව, හා ගුලවිට බිටිටුව, ලෙස ප්‍රධාන ක්ෂේත්‍ර කොට්ඨාස 02කට බෙදා පාලනය වේ. කෙතරම් සුන්දරත්වයක් හා ඉහළ ජෛව විවිධත්වයක් මෙහි පැවතිය ද මිනිසුන්ගේ අයහපත් ක්‍රියාකාරකම් මේ පරිසරයට විශාල හානි ගෙන දෙමින් පවතී.

වලල්ලාවිට – අවිත්තාව ප්‍රධාන මාර්ගය යෙදී ඇත්තේ මෙම වනාන්තරය හරහා නිසාවෙන් මෙම මාර්ගය භාවිත කරන බොහෝ දෙනා නිසාවෙන් විශාල අපද්‍රව්‍ය ප්‍රමාණයක් ගංගාවට හා වනාන්තරයට එක් වේ. එමෙන්ම මස් සඳහා වන සතුන් දඩයම් කිරීම, දැව ජාවාරම, වනය තුළ අනවසර වගා කිරීම්, වනයේ ඉඩම් අල්ලා ගැනීම වැනි ජාවාරම් විශාල වශයෙන් සිදු වේ. මෙවැනි වනාන්තරයට හානි සිදුවන ක්‍රියාවන් මර්දනය කොට මතු පරපුර වෙනුවෙන් මෙන්ම වර්තමන් පරපුරට සුවදායක දිවියක් ගෙවීම සඳහා රැක ගත යුතු වටිනාම වනාන්තරයකි.

පේශල පසන් කරුණාරත්න

ඔබගේ අදහස් හා යෝජනා පමණක් නොව,
ලිපි හා ඡායාරූප ද පහත ලිපිනයට අප වෙත එවිය හැකියි.

‘පැලැස්ස’ දිනමිණ, අංක 35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10
pelessa@lakehouse.lk 0112 429 245 / 246

සංස්කරණය
චතුමි පිටිපන

පළාත - **වයඹ**
දිස්ත්‍රික්කය - **පුත්තලම**
ප්‍රා.ලේ. කොට්ඨාසය - **වනාතවිල්ලුව**

ගඟේ වාඩියේ මගේ සිහිනය

වයඹ පළාතට අයත් පුත්තලම දිස්ත්‍රික්කයේ වර්ග කිලෝමීටර් 710ක භූමි ප්‍රමාණයකින් යුත් භූමියකින් වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට සීමා වාසිවෙව විල්පත්තුව ජාතික වනෝද්‍යානය දකුණු පසින් රමණීය කලා ඔය ගං කොමළිය ගලා බසී. ගලා බසින නිම්නයේ පිහිටා ඇති අති සුන්දර දෙස් විදෙස් සංචාරකයන්ගේ මනදොළ පිනවන සොඳුරු පාරාදීසයක් ලෙස ගඟේවාඩිය හැඳින් වේ.

මෙහි සුවිශේෂත්වය වන්නේ මෙය නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ට එකම දිනක් තුළ එකම ස්ථානයකින් ලුණු ජලයේ සහ පිරිසුදු ජලයේ පානස විඳ ගනිමින් ජල ක්‍රීඩාවේ නිරත විය හැකි වීම සේම වන සතුන්ගේ ජීවන රටාව සහ ඔවුන්ගේ දින චර්යාව සුපැහැදිලි ලෙස නැරඹීමටද හැකියාව හිමි වීමය.

'බාධක මැද ගලන ගඟේ ලස්සන පෙණ බුබුළු නැඟේ' යනුවෙන් කියන ලද කතාවට අත දිගු කරන කලා ඔය ගං කොමළිය හෝ ගාන්ධා පොකුණ සිප වැලඳ ගන්නා එකම ස්ථානයත්, ලුණු ඔය හෝ ගාන්ධා පොකුණ සිප ගන්නා එකම ස්ථානයත් ගඟේවාඩියයි. මෙහි පිහිටීමෙහි සුවිශේෂත්වය හේතුවෙන් බහුතරයක් සංචාරකයන් ඇලුම් කරනු ලබන ජල ක්‍රීඩා සේම ඔවුන්ගේ සතුට විනෝදාස්වාදයට මෙය මහත් අස්වැසිල්ලක් වනු නිසැකය.

ගඟේවාඩිය සංචාරක පුරවරයට පැමිණෙන බහුතරයක් දෙස් විදෙස් සංචාරකයන්ගේ නෙත් සිත් පිනවන තවත් ස්ථානයක් ලෙස වසර දහස් ගණනක් ඉපැරණි බයෝබැබ් හෙවත් අලි ගස හැඳින්විය හැකිය. මෙය විල්පත්තුව ජාතික වනෝද්‍යානය තුළ කලපුවට සීමා වාසිවෙව පිහිටා තිබෙන අතර, දැනට විල්පත්තුවේ පිහිටා ඇති දැවැන්තම හා පැරණිතම ශාකය ලෙස හැඳින්වේ. මෙය නැරඹීම සඳහා බෝටු ආධාරයෙන් බහුතරයක් දෙස් විදෙස් සංචාරකයන් ඒ දෙසට සංක්‍රමණය වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ.

තවද, ආදම්ගේ සොහොන කුඳිරමලේ කුඩුව සහ ඉපැරැණි පුදිපාගාරය ද දැක බලා ගැනීමේ අවස්ථාව ගඟේවාඩියට පැමිණෙන ඕනෑම සංචාරකයකුට හසුවෙන්ේ උදා කර ගත හැකිය.

මෙරට කුඳ තිස් වසරක් පුරා පැවති කුරිරු ත්‍රස්ත්‍රවාදී අරගලය හේතුවෙන් උතුරේ ජීවත් වන ජනතාවට දකුණට යන්නටත් දකුණේ ජීවත් වන ජනතාවට උතුරට යන්නටත් නොහැකි තත්ත්වයක් එකල උදා වී තිබිණි. උතුරේ එක් පසෙකින් වෙඩි හඬ ඇසෙන විට තවත් පසෙකින් මර ලෝනි දෙමින් නඟන විලාපය එකල කන පැකුණු වාර අනන්ත අප්‍රමාණය. ඇතැම් ස්ථානවලදී ත්‍රස්ත්‍රයන්ගේ රුදුරු කඩු පහරින් සිය දහස් ගණනක් සිවිලි වැසියන්ගේ ද ජීවිත ඔවුනට අහිමි කෙරිණි.

ලේ පිපාසයෙන් මත් වුණ ත්‍රස්තයන් මාඩිම් ගම් ඉලක්ක කරන්නට වූයේ මේ අවදියේය. විල්පත්තුව ජාතික වනෝද්‍යානය තුළින් මතු වූ ත්‍රස්තයින් සාපුවම ගමන් කරන්නේ සුව පිරිසක් ඔවුන්ගේ ජීවිත බේරා ගැනීම සඳහා ගඟේවාඩියට ය. එහි ඔවුන් ලබා දුන් ආරක්ෂාව හේතුවෙන් ඔවුන් ගඟේවාඩිය ජීවිත බේරා ගත් ස්ථානය ලෙස සිහි කරති.

ත්‍රස්ත්‍රවාදී අරගලය අවසන් වී දශක දෙකක් ගතවී ඇති මේ වන විට ගඟේවාඩිය ඉතා ඉහළ මට්ටමේ සංචාරක ප්‍රවාහයක් ලබා ගනිමින් ඉදිරියට ගමන් කරයි. ඒ අනුව දෙස් විදෙස් සංචාරකයන්ගේ සොඳුරු පාරාදීසයක් සේම නව නෝතැන්නක් ලෙස ගඟේවාඩිය සංචාරක කර්මාන්තය එයට කදිම නිදසුනක් එක්කාසු කරන්නට විය. ඒ සමඟම ඔය ජීවිකාව ලෙස ගඟක් අසබඩ වාඩි නන ධීවර රැකියාව සිදු කරනු ලැබූ ගඟක් ඉලක්ක කර ගෙනය. ඒ ගම මෙම ගඟේවාඩියය.

ගඟේවාඩියට පැමිණි නාලාගිරි වෙස් ගත් කුරිරු ත්‍රස්තයන් අමානුෂික ලෙස ජීවිත ගණනක් කඩු පහරින් වනසා නැවතත් කැලයට පලා ගොස් තිබුණි. එපමණක් ද නොව පොලිස් මුරපළවල් සේම ආරක්ෂක වළල්ල සිද බිඳ දැමූ වාර ද නැතුවාම නොවේ.

එයට හේතුව ලෙස හැඳින්විය හැක්කේ, ගඟේවාඩිය පුරාණයේ වේළඳ මර්මස්ථානයක් බවට නතුව තිබූ නිසාවෙනි. විජය කුමරුගේ ආගමනයත් කුවේනියගේ විවාහයත් සිදුව ඇති බවට හෙළ ඉතිහාස වංශ කතාවේ මෙම ස්ථානය ගැන අදටත් රන් අකුරින් සනිටුහන්ව තිබේ. එපමණක් ද නොව යට ගිය ප්‍රෞඪ ඉතිහාසයක් නෙත්ම කලා නිර්මාණ රැසකින් සමන්විත මෙම ස්ථානය ඔනරම් පරිසර සද්ධර්මයකට උරුමකම් කියන ශෝභන්ද්‍රියාත්මක ජෛව විවිධත්වයකින් ද යුක්තය.

ගඟේවාඩිය පිහිටා ඇත්තේ වන දුර්ග ගිරි දුර්ගයෙන් සැලකිලෙන් පෞරාණික මෙන්ම ඓතිහාසික වැදගත්කමකින් යුත් විල්පත්තුව ජාතික වනෝද්‍යානයට මායිම්වය. විල්පත්තුව ජාතික වනෝද්‍යානයට දකුණු පසට මායිම්ව ගලා බසින රමණීය කලා ඔය ලුණු ඇලට එකතු වීමෙන් පසුව මුහුදට ගලා බසින සන්ධිස්ථානය ද මෙම ගඟේවාඩිය වේ.

එවකට ගඟේවාඩිය පිළිබඳව එතරම් සැලකිල්ලක් නොදැක් වුව ද පසු කාලීනව ගඟේවාඩිය පිළිබඳව බහුතරයකගේ අවධානය සේම වැඩි කැමා බහට ද ලක්වූ බව සඳහන් කළ යුතුය.

2014 වසරේ මුල් භාගයේදී විල්පත්තුව ජාතික වනෝද්‍යානයට පිවිසීම සඳහා එළවන්කුලම ප්‍රදේශයෙන් ස්ථාපිත කළ නව පිවිසුම් දොරටුවේ ආරම්භයත් සමඟ 2015 වසරේ සිට ගඟේවාඩිය සංචාරක පුරවරයක් බවට පත්වර්ධනය වන්නට විය.

ජාතික වනෝද්‍යානයට පිවිසුම් දොරටුවේ ආරම්භයත් සමඟ ගඟේවාඩිය නව මුහුණුවරකින් කැඩිය යුතු බවට එක් විය. ඉන් පසු ගඟේවාඩිය නැරඹීම සඳහා පැමිණි සංචාරකයන් දස දහස් ගණනින් වැඩි විණි.

පසු කාලීනව විල්පත්තුව ජාතික වනෝද්‍යානය ඉලක්ක කර ගනිමින් තවත් බොහෝ පිරිසක් විසින් මේ වන විට නිවාඩු නිකේතන 15ට ආසන්න ප්‍රමාණයක් ඇතුළුව සාරි ජිප් රථ 15ට ආසන්න ප්‍රමාණයක් එකතු වීම නිසා මේ වන විට ගඟේවාඩිය තුළ සංචාරක කර්මාන්තයක් නිර්මාණය වී තිබේ.

මෙම නිවාඩු නිකේතන ඉලක්ක කර ගනිමින් වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව මඟින් ගඟේවාඩිය ප්‍රදේශය ඉලක්ක කර ගනිමින් විල්පත්තුව 'නේචර් රිසෝට්' නමින් දෙස් විදෙස් සංචාරකයින්ගේ සුව පහසුව සඳහා නව නිවාඩු නිකේතනයක් ස්ථාපිත කෙරිණි.

විල්පත්තුව නේචර් රිසෝට් නිවාඩු නිකේතනයේ ආරම්භයත් සමඟ ගඟේවාඩිය නව මුහුණුවරකින් කැඩිය යුතු බවට එක් විය. ඉන් පසු ගඟේවාඩිය නැරඹීම සඳහා පැමිණි සංචාරකයන් දස දහස් ගණනින් වැඩි විණි.

පසු කාලීනව විල්පත්තුව ජාතික වනෝද්‍යානය ඉලක්ක කර ගනිමින් තවත් බොහෝ පිරිසක් විසින් මේ වන විට නිවාඩු නිකේතන 15ට ආසන්න ප්‍රමාණයක් එකතු වීම නිසා මේ වන විට ගඟේවාඩිය තුළ සංචාරක කර්මාන්තයක් නිර්මාණය වී තිබේ.

මෙම නිවාඩු නිකේතන ඉලක්ක කර ගනිමින් කටුනායක අන්තර්ජාතික ගුවන් තොටුපළේ සිට පැය දෙකක් වැනි කෙටි කාලයකින් විදේශීය සංචාරකයින් පසු ගිය වර්ෂයන්වල වැල නොකැඩී ඇදෙන්නටත්, ඔවුන්ගේ ආකර්ෂණය මේ ප්‍රදේශයට නොඅඩුව ලැබෙන්නටත් සුවිශේෂී වූ සාධකය ගඟේවාඩියය.

කල්පිටිය අර්ධද්වීපයේ පිහිටා ඇති දූපත් වළල්ල සේම කොරල් පර, ඩොල්ෆින්, කඹඩොලාන නැරඹීමේ පහසුව මෙන්ම ගඟේවාඩිය සංචාරක පුරවරය තුළ ජල ක්‍රීඩාව සහ වන ජීවී අත්දැකීම් ඔවුන්ට එක වරම ලබා ගැනීමේ හැකියාව පැවතීම විශේෂත්වයකි.

ජර්මනිය, ඔස්ට්‍රේලියාව, එංගලන්තය, ස්විඩනය, අමෙරිකාව වැනි රටවල සිටින විදේශීය සංචාරකයින් බහුතරයක් ගඟේවාඩියේ සංචාරය සඳහා පැමිණීම පසුගිය කාලය තුළ නිරන්තරයෙන්ම සිදු වුණ අතර, එසේ පැමිණි සංචාරකයන් ජල සහ වනජීවී යන අත්දැකීම් සුවසේ විඳ ගත් බව පෙනෙන්නට තිබිණි.

එසේ පැමිණෙන බහුතරයක් සංචාරකයින් බෝටු සාරි ඔස්සේ වසර දහස් ගණනක් ඉපැරණි අලි ගස නැරඹීමට දැඩි ලෙස ප්‍රිය කරන අතර, පසුව කලා ඔය කලපුවට එක්වන ස්ථානයේ සිරි නරඹා කලා ඔයට බැස දිය නාන මොවුන් අනතුරුව විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ සංචාරය සඳහා එක්වන්නේ එළවන්කුලම පිවිසුම් දොරටුවෙනි.

එහිදී දිවියා, ඇනා, වළසා වැනි වන සතුන් ද, විශේෂිත වූ කුරුළු වර්ග, උරගයින්, සහ වෙනත් සිවුපාවුන් මෙහිදී දැක ගන්නට හැකිය. මෙලෙස ප්‍රජෝ විවිධත්වයකින් සැදුම් ලත් විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ දීර්ඝ සංචාරය සඳහා එක්වීමෙන් අප රටේ වෙනත් පරිසර පද්ධතියකින් දැක ගැනීමට නොහැකි දුර්ලභ දසුන් නෙත් මානයට හසුවීම ගඟේවාඩියේදී සිදු විය හැකිය.

එපමණක් නොව ගඟේවාඩියට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ට විශය කුවේණියගේ මේ වාත්තාන්තයේ සැඟවුණ තැන් එකිනෙක සියැසින්ම දැක ගැනීමේ භාග්‍යය උදාවන්නේ මිහිරි අත්දැකීම් සම්භාරයක් ද කැටුවය.

තව ද ආසියාවේ විශාලතම නුඹු ගල් නිධිය පිහිටා ඇත්තේ ද ගඟේවාඩියට යාබදව ඇති අරුවක්කාඩුව ප්‍රදේශයේය.

එමෙන්ම සංචාරක පක්ෂීන් සේම පර්යටන පක්ෂීන්ගෙන් සැදුම් ලත් සුවිශේෂී කුරුල්ල නිවහන පිහිටා ඇත්තේ ද මෙම රමණීය කලා ඔය නිම්නයේ වීමත්, දුර්ලභ ගනයේ කඩොලාන සහ කලපු පරිසර පද්ධතියට ආවේණික කඩොලාන සම්මුතියකින් සැදුම්ලත් සුවිශේෂී කඩොලාන පරිසරය දැක්මකට දර්ශනයක් බව කිව යුතුමය.

මෙහි සංචාරයේ යෙදෙන්නන්ට හෝ ගානා පොකුණේ රැඳී පිට රැඳි නැගෙන කිරි පැහැ දිය මත පාවෙන කුඩා මසුන්, ගොදුරු ලොබින් සැරි සරන මුහුදු උකුස්සන්ගේ පියාසර විලාසය ඇස් මත්තේ කරවන දසුන්ය.

කේ. ප්‍රියංකර කළුපහන

2021 පෙබරවාරි 17 බදාදා
දිනමිණ

හෙදරීම අර්තාපල් වවන්න

හියම් කුමය මෙන්න

දිනමිණ සෞඛ්‍ය ශූර ගොවියන්ගේ රාජධානිය

අර්තාපල් වගා කිරීමට

කැමති ඕනෑම කෙනකුට කුඩා බිම් කඩක ඕනෑම දේශගුණික තත්ත්වයක් යටතේ කුලුනු වගා ක්‍රමය මඟින් බීජ අර්තාපල් නිෂ්පාදනය හෝ තම නිවෙසේ පරිභෝජනය සඳහා වගා කළ හැකි ක්‍රමයක් හඳුන්වා දී ඇති බව බණ්ඩාරවෙල කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක කේ.පී. සෝමචන්ද්‍ර මහතා පවසයි.

"අද වන විට අර්තාපල් වගා කරනුයේ විවෘත භූමිවලය. මෙයට විශාල මුදලක් වැය වේ. වගාවෙන් බීජ අර්තාපල් වෙනුවෙන් 70% ක පමණ මුදලක් වැය වේ. (බීජ අර්තාපල් කිලෝ 50ක් රුපියල් 19, 000 වුව ද බහුජාතික ආනයනකරුවන් වසරින් වසර මිල ඉහළ දැමීමක් සිදු කරයි.) එසේ වුවද බීජ අර්තාපල් ගුණාත්මක බවින් තොර වීම නිසා ගොවියා ආර්ථික අපහසුතාවට පත් වන බව නිතරම අසන්නට ලැබේ. මෙයට අමතරව පස ද විශාල වශයෙන් සෝදාපාළුවට ලක් වේ. මෙම ගැටලුවලට විසඳුම් වශයෙන් බණ්ඩාරවෙල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂිකා ලෙස සේවය කළ දර්ශිනී ජයමාන්න මහත්මිය ඇතුළු කණ්ඩායම සිදු කළ පර්යේෂණ සහ අත්හදා බැලීම්වල ප්‍රතිඵලයක් ලෙසින් කුඩා බිම් කඩක අර්තාපල් කුලුනු වගා ක්‍රමය හඳුනා ගන්නා ලදී.

මෙම වගා ක්‍රමයේ වාසි රැසකි.

* සීමිත ඉඩකින් වැඩි බීජ අස්වැන්නක් ගැනීම
* අඛණ්ඩව බීජ ගුණනය කිරීමට හැකි වීම
* පස පෙරළීමක් නොවන නිසා බෑවුම් සහිත බිම් සෝදා පාළුවකින් තොරව වගා කිරීමට හැකි වීම.
* ගෙවතු මට්ටමින් බීජ අර්තාපල් වගා කිරීමට හැකිවීම. (මේ නිසා වල් ඌරන් වැනි වන සතුන්ගෙන් වගාවට සිදු වන හානිය අවම වේ).
* කෙටිකාලීන බීජ ගබඩාවක් ලෙසට යොදා ගත හැකි වීම.
* ගෙවතු අලංකරණය
* බිම් සැකසීමට වැය වන මුදල් ඉතිරි වීම.
* අස්වැන්න නෙළීම පහසු වීම හා ශ්‍රම අවශ්‍යතා අඩුවීම.
* පරිසර හිතකාමී බව.

මෙම වගා ක්‍රමයේ යම් අවාසිදායක තත්ත්වයන් නැත්තේ ද නැත. කුලුනු සකසා ගැනීමට වැය වන මූලික වියදම හා සකසා ගත් කුලුනු පිරවීමට වගා මාධ්‍ය සැකසීම හා පිරවීම, සිටුවා ඇති අර්තාපල් පැළ සිරස්ව වර්ධනයට පුහුණු කිරීමට සිදු වීම අවාසිදායක තත්ත්වයන්ය.

කුලුනු තුළ පෙර මූලික ජී-01 හා ජී-02 බීජ අර්තාපල් නිෂ්පාදනය හෝ නිවෙසේ පරිභෝජනයට අවශ්‍ය අර්තාපල් වගා කළ හැකිය.

වගා කුලුනක් සකසා ගන්නා ආකාරය

අඩි 10 ක් දිග අඟල් 1X1 කොටු සහිත කම්බි දැලක්, සිදුරු සකසා ගත් දිග අඩි 5ක පමණ අඟල් එකහමාරේ ප්ලාස්ටික් හෝ උණ බටයක්, බයින්ඩින් කම්බි කැබලි කිහිපයක්, මතු පිට පස් මලු 3ක්, කොම්පෝස්ට් මලු 2ක්, බීජ අල හෝ පැළ 50ක්, දිරා යන කෝටු කැබලි සහ පිදුරු හෝ පරඬැල්, රසායනික පොහොර ලෙසින් ටී.එස්.පී. ග්‍රෑම් 250ක්, අළු හුණු ග්‍රෑම් 500ක්, ගඩොල් හා ගල් කැබලි මේ සඳහා අවශ්‍ය වේ.

හොඳින් හිරු එළිය ඇති ස්ථානයක පොළොව සමතලා තැනක මෙය සැකසීම වඩාත් සුදුසුය. යකඩ දැල සිලින්ඩරයක් ලෙසින් සකසා ගන්න. පොළොව සකසා ගත් ස්ථානයේ සිලින්ඩරය තබා නොසෙල්වෙන ලෙසට සිටුවන්න. ඒ සඳහා ඉනි භාවිත කරන්න. සිදුරු සහිත බටයේ එක් කෙළවරක සිදුර වතුර බැස නොයන ලෙසට පොලිතින් ආවරණ යොදන්න. එම බටයේ වතුර බැස යෑම වළකා ඇති කොටස සිටුවා ඇති දැල් සිලින්ඩරය මැද තබන්න. බටය මැදි කර සිලින්ඩරය පතුලේ ගඩොල් කැබලි හා කුඩා ගල් කැබලි අතුරන්න. එම තට්ටුව මත පරඬැල් හෝ පිදුරු තට්ටුවක් අතුරන්න.

ඉන්පසු සකසාගත් වගා මාධ්‍ය අඟල් 06 ක් පමණ පුරවන්න. කම්බි දැලේ සිදුරු තුළින් වගා මාධ්‍ය පිටතට යෑම වැළකීමට දැලේ ඇතුළු පැත්තේ පිදුරු ආවරණයක් යොදන්න. ඉන්පසු බීජ අර්තාපල් 10ක් මොටෙයියන් දාල දෙසට යොමු වන ලෙසට සිටුවන්න. දැන් පස් තට්ටුවකින් වසන්න. ඉන්පසු පෙරසේම තට්ටු සකසමින් බීජ අර්තාපල් සිටුවන්න. මෙම ප්‍රමාණයේ දැල් කුලුනක පහසුවෙන් තට්ටු 05ක් සකසා බීජ අල 50 ක් සිටුවා ගත හැකියි. ඉහළම ස්ථරය පස් තට්ටුවකින් ආවරණය කර මල් බාල්දියකින් ජලය යොදන්න. ඇල්බට ද්‍රාවණයේ ඊ.සී. 1.5 වන සේ සකසා කුලුනේ මැද සවි කර ඇති බටය හරහා වගාවට මුදා හරින්න.

අර්තාපල් පැළ වැවීමට පුහුණු කිරීම හා කප්පාදු පැළවලට සති 06ක් පමණ වන විට අඟල් 05ක් පමණ දිග කම්බි කැබලි එස් අකුරේ හැඩයට නවා ගෙන පැළවල අතු සිලින්ඩරයේ දැලට සම්බන්ධ කිරීමෙන් ගසට හොඳින් හිරුඑළිය ලැබීමට සලස්වන්න. වගාවට දින 75ක් ගත වන විට ගස් කහ පාට වන අතර, සියලුම කඳ කොටස් ඉවත් කර ජලය සැපයීම සීමා කිරීමෙන් අල හොඳින් මෝරයි.

මෙසේ එක් දැල් කුලුනක අල 50ක් වගා කිරීමෙන් සාමාන්‍යයෙන් අර්තාපල් අල 300-400ක පමණ අස්වැන්නක් පහසුවෙන් ලබා ගත හැකිය. මෙම වගා ක්‍රමය ඔස්සේ පෙර මූලික බීජ අර්තාපල් (ජී.01 ජී.02) වගා කරමින් උසස් තත්ත්වයේ බීජ අර්තාපල් තමන්ටම නිපදවා ගත හැකිය.

එසේම වගා කිරීමට කැමැත්තක් ඇතත් එයට අවශ්‍ය ඉඩකඩ නැතැයි කියා ලතවෙන ඕනෑම ප්‍රදේශයක ජීවත් වන අයකුට මෙම කුලුනු ක්‍රමයෙන් අර්තාපල් වගාවට පිවිසිය හැකි බව මනාව වැටහෙන බව නියෝජ්‍ය අධ්‍යක්ෂක කේ.පී. සෝමචන්ද්‍ර මහතා පෙන්වා දෙයි.

ආර්. රාජමන්ත්‍රී

මකර පලතුරේ නොකැඩෙන ගැට

මධ්‍යම අමෙරිකාව, මෙක්සිකෝව සහ දකුණු අමෙරිකාව නිජබිම කර ගත් ශ්‍රී ලංකාව තුළ ද යම් ප්‍රමාණයක විසිරී - පැතිරී ගිය අගනා ශාකයක් වන 'ඩ්‍රැගන් ෆෘට්' ශාකය එහි ඵලවල තිබෙන අසාමාන්‍ය ගුණ ප්‍රමාණය හේතුවෙන් මෙබඳු ශාක

වගා කරන අයගේ සැලකිල්ලට ලක් වෙමින් තිබේ. 'පිටහායා' සහ 'පිටායා' යන නම්වලින් ද හඳුන්වන මෙය හයිලෝසිරස් (Hylocereus undates) කුලයේ කැක්ටස් හෙවත් පතොක් පවුලේ සාමාජික ශාකයකි.

මේවායේ මල් රාත්‍රී කාලයට විකසිත වන අතර සුදු හෝ රෝස පැහැතිය. කෙළවර සීනු හැඩයෙන් හා අග කොටස ක්‍රමයෙන් සිහින් වී ඇති ටියුබ් එකක හැඩය ගනී. අපූරු සුවඳකින් ද යුක්ත වේ. මල ගෙඩියක් බවට පත් වූ විට එහි මෘදු මසින් යුතු මදය රතු, සුදු, කහ හෝ රෝස පැහැතිය. ඉතා කුඩා ඇට කළු පැහැතිය. මුලදී තද කොළ පැහැති ගෙඩි මකරෙකුගේ හිසක හැඩය ගන්නා නිසා දෝ මේවා 'මකර පලතුර' යන අරුත ගත් 'ඩ්‍රැගන් ෆෘට්' යනුවෙන් හැඳින් වේ. මෝරා ඉදෙන විට තරමක් රතු පැහැය ගන්නා ගෙඩිය ග්‍රෑම් 200 සිට කිලෝ ග්‍රෑම් 1 දක්වා බරින් යුක්තය. මෙම ශාකය මැනවින් වවා නඩත්තු කළහොත් වාණිජමය වටිනාකම ඉහළය. ලාභදායි ද වේ.

දැනට මෙම පලතුර වවනු ලබන රටවල් අතර ශ්‍රී ලංකාව, මැලේසියාව, වියට්නාමය, පිලිපීනය, කාම්බෝජය, තායිලන්තය, තායිවානය, ඉන්දුනීසියාව සහ බංග්ලාදේශය මුල් තැනක් ගනී. මෙය දැන් ලොව පුරා බහුල ලෙස වගා කරන පලතුරක් බව කියැ වේ.

එමෙන්ම ඩ්‍රැගන් ෆෘට් පාංශු වර්ග ගණනාවක වගා කළ හැකි, උෂ්ණ සහ අර්ධ උෂ්ණ කලාපය ප්‍රිය කරන, ඉතා අඩු ජල ප්‍රමාණයක් අවශ්‍ය වන, ආසියාතික දේශගුණයට ඔරොත්තු දෙන ශාකයකි. වගා කර දෙවැනි තෙවැනි වසරවල පල දරයි. ඇට සහ අතුවලින් පැළ කර ගත හැකිය. ඇටවලින් පැළ ලබා ගැනීමට වසර හයක පමණ කාලයක් ගත වේ. මේ නිසා අතු පැළ කර ගැනීම පහසුය. පොළොව මට්ටමේ සිට මීටර එකහමාරක් පමණ උස කම්බි කණුවක හතර පැත්තේ පැළ හතරක් සිටුවීම සුදුසුය. ආධාරක සඳහා ලී කණු වුවද භාවිත කළ හැකිය.

ඩ්‍රැගන් ෆෘට්වල අන්තර්ගත ගුණය වෙනත් පලතුරක නැති තරම්ය. වියපත්වීම පාලනය කරයි. සම පිපිරීම වළක්වයි. සමට හිත කරය. සම පැහැපත් කරයි. සමේ සෞඛ්‍යය රැක දෙයි. සමට ඇවැසි තෙතමනය සපයයි. හිසකේ වර්ධනය කරයි. සිරුරේ

බර අඩුවීම වළකයි. කොලෙස්ටරෝල් මට්ටම පාලනය කරයි, උදරයේ සංකූලතා සමනය කරයි. රුධිරයේ සීනි මට්ටම පාලනය කරයි. පපුවට ගුණදායකය. රුධිරයේ හිමොග්ලොබින් වැඩි දියුණු කරයි. සිරුරේ බර අඩුවීම වළක්වයි. ඇතැම් වර්ගවල පිළිකා වළක්වයි. ක්ලාන්ත ගතිය සමනය කරයි. සිරුරේ ප්‍රතිශක්තිය වඩවයි. සන්ධි වේදනා සමනය කරයි. ගැබිනි මාතාවන්ට ගුණදායකය. වකුගඩු රෝගවලට හිතකරය. අස්ථි රෝග තත්ත්ව සමනය කරන අතර ඩෙංගු රෝගීන්ට සහනය සලසයි. සිරුරේ දුර්වල සෛල යථා තත්ත්වයට පත් කරයි. ආහාර රුචිය වඩවයි. ඇස්වල රෝග තත්ත්වයන්ට ගුණ දෙයි. මොළයේ ක්‍රියාකාරිත්වය දියුණු කරයි. එමෙන්ම මෙම පලතුර හුස්ම ගැනීමේ අපහසුතා ද සමනය කරයි.

දැනට ඩ්‍රැගන් ෆෘට් ප්‍රභේද හතරක් පමණ ජනප්‍රිය වී තිබේ. රතු පොත්ත සහ සුදු මදය සහිත, රතු පොත්ත සහ රතු මදය සහිත, මදක් දම් පැහැති මදය සහ රතු පිට පොත්ත සහිත මෙන්ම කහ පොත්තක් සහ සුදු මදය සහිත වර්ග බහුලව වගා කෙරේ.

මෙය හිරු එළියට ලැදි ශාකයකි. වර්ෂාපතනය අඩු තත්ත්වයක් ඇවැසි වේ. අධික පින්න සහිත දේශගුණය අහිකකරය. ජලය අධික වුව හොත් මුල් කුණු වීමට ඉඩ ඇත. පස් වර්ග ගණනාවක හොඳින් වගා කළ හැකිය. හොඳින් සකසන ලද පස මෙම ශාකයට හිතකරය. ජලය වැඩියෙන් රැඳෙන ස්ථාන වගාවට සුදුසු නැත. දුර්වල පසට අවශ්‍ය තරම් වැලි කවලම් කිරීම සුදුසුය.

මෙම ශාකය ගල් බොරළු සහිත පසට ද ඔරොත්තු දෙයි. වසර අග දී වගාව ආරම්භ කිරීම සුදුසුය. ආරම්භයේදී නයිට්‍රජන් වැඩිපුර යෙදීමට නිර්දේශ කෙරේ. මල් හට ගැනෙන සහ පල දරන කාලයට පොස්ෆරස් සහ පොටෑසියම් වැඩියෙන් ඇවැසිය. පොළෝ මට්ටමේ සිට මීටර එකහමාරක් පමණ උස කම්බි කණුවක වටා පැළ හතරක් වගා කිරීම සුදුසුය.

වගාවේ වල් නෙළීම ක්‍රමවත්ව කළ යුතුය. පල දරන කාලයට කුරුල්ලන්ගෙන් සහ වෙනත් සතුන්ගෙන් ආරක්ෂා කර ගත යුතුය. පඳුරක සිට පඳුරකට ඇති දුර මීටර 3ක් පමණ අවශ්‍යය. සිටුවන කණුවක උස එය සිටුවීමෙන් පසු මීටර් එකහමාරක් පමණ විය යුතුය. සිටුවීමට තෝරා ගන යුත්තේ වසර 2ක් 3ක් පමණ වයසැති අතු කැබලි වන අතර මේවා සෙන්ටිමීටර 45-50 පමණ දිගින් යුක්ත වීමත් ඒවා සිටුවීමට මාසයකට පමණ පෙර දිලීර නාශකයක් යොදා තිබීමත් යෝග්‍යය. දළ වශයෙන් කණු 300 ක් සහිත ඩ්‍රැගන් ෆෘට් වගාවකින් වාර්ෂිකව අක්කරයකින් සැලකිය යුතු ආදායමක් ලබා ගත හැකිය.

නිමල් විජයතුංග

ඇඹිලිපිටියේ ප්‍රහාත්ගෙන් කෙසෙල්වලට අලුත් වැඩක්

ප්‍රහාත් ප්‍රසංග ජයවර්ධන

මාතර ඉඳලා අඩිවේගි මාර්ගයේ මත්තලට යනකම්ම තිබුණේ කෙසෙල් වගාවන්. මෙපමණ කෙසෙල් ප්‍රමාණයක් අපේ රටේ ඉන්න හැමෝටම දවස ගානේ බෙදුවත් වැඩියි කියලයි මට හිතුනේ. ඇඹිලිපිටිය සෙවණගල දක්වාත් කෙසෙල් වගාවන් මේ වගේමයි. මගේ කුතුහලයට හේතුව මට සොයා දුන්නේ ප්‍රහාත් ප්‍රසංග ජයවර්ධන. ඔහුට තවම අවුරුදු 26යි. අවුරුදු 20 ඉඳලා තමයි මේ කෙසෙල් වැඩේ කරගෙන යන්නේ. කඩ පිල්වල කුණු වෙවී නාස්ති වෙන කෙසෙල්වලට ඔහු අගය එකතු කිරීමක් කරලා පිටරට යවනවා. මේ නිසා ඒ පළාතේ ගොවියන් විතරක් නෙවෙයි හැමෝම කෙසෙල් වවන්න පටන් අරගෙන. කෙසෙල් වවන හැමෝටමත් හොඳ ආදායමක් ලැබෙනවා වගේම මේ වැඩේට බොහෝ පිරිසක් එකතු කරගෙන ඒ අයටත් හොඳ වැටුපක් දෙන්නත් ප්‍රහාත්ට පුළුවන් වෙලා තිබෙනවා.

● ඔබ හොඳින් ඉගෙන ගෙන හොඳ රැකියාවක් කරන්නේ නැතිව ඇයි මේ කෙසෙල් ගොඩට වැටුණේ?

මගේ තාත්තා තමයි කෙසෙල් වවන්න පටන් ගත්තේ. ඔහු කෙසෙල් තොග මිලට විකිණීම කළේ. මම කල්පනා කළා හැමෝම කරන දේ කරන්නේ නැතිව කෙසෙල්වලට කරන්න අමතර දෙයක් තිබෙනවද කියලා. ඒ පිළිබඳව සොයා බැලුවා, අත්හදා බැලීම් කළා. අන්තිමට මට හැකි වුණා මේවා ඩිහයිඩ්‍රේට් කරලා (විජලනය) කිසියම් දෙයක් කරන්න. විජලනය කරන ආහාර පිටරට යවන පිරිසකුත් මට මුණ ගැහුණා. ඉතින් මම ඒ වැඩේට බැස්සා.

● ඔබ විජලනය කරන කෙසෙල් වර්ග මොනවා ද? ඒ වගේම කෙසෙල් හැරුණාම තව පලතුරු වර්ග තිබෙනව ද?

ඇඹුල් කෙසෙල් සහ සීනි කෙසෙල් තමයි වැඩි වශයෙන් කරන්නේ. ඒ වගේම විදෙස් වෙළෙඳපොළේ වරකාවලට හොඳ ඉල්ලුමක් තිබෙනවා. මම ඉන්නේ ඇඹිලිපිටිය සෙවණගල. අපේ ප්‍රදේශයේ ගස් යට වරකා වැටිලා කුණු වෙලා විනාශ වෙලා යනවා. ඒවා මුදල් බවට පත් කරන්න පුළුවන් නම් කොපමණ හොඳයි ද කියා මට සිතුණා. මම වරකා වගේම අඹ, පැපොල් එහෙමත් විජලනය කරලා පිටරට යවනවා. අන්නාසිවලටත් ඉල්ලුමක් තිබෙනවා. ඒවා වෙනත් ප්‍රදේශවලින් ගෙන්වා ගෙන අවශ්‍ය අයට සපයනවා. ලංකාවේ කාබනික වගාවන්ට විදේශිකයන් කැමතියි. යුරෝපීය රටවල් තමයි මගේ නිෂ්පාදන බොහොමයක් මිලදී ගන්නේ. ඒ වගේම අමෙරිකාව ඉදිරියේදී ඩුබායි රටත් මේ සඳහා එකතු වේවි.

● තව මොනවද කරන්නේ?

පලතුරු බීම හදනවා. ඒවා නම් ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළටත් දානවා. සියයට සියයක් ස්වාභාවිකවයි ඒවා හදන්නේ. ඒ වගේම මෙහේ කෝමාරිකා වවන ගොවියන්ගේ කෝමාරිකා පසුගිය කාලයේ විකුණා ගන්න බැරිව අපතේ ගියා. මම ඒවාත් මිලදී අරගෙන කෝමාරිකා ඩ්‍රින්ක් එකක් හදනවා. ඒකට අපේ රටේ හොඳ ඉල්ලුමක් තිබෙනවා. කෝමාරිකා ටිකත් වැඩකට ගන්න පුළුවන් වුණා වගේම ඒ ගොවියනුත් සතුටින්.

● මේවා සකස් කරන්නේ කොහොම ද?

කෙසෙල් සහ අනෙක් පලතුරු ඩිහයිඩ්‍රේට් කරලා කැබලිවලට සහ පවුඩර් බවටත් පත් කරනවා. ඒවා ඒ ආකාරයෙන්ම ඇසුරුම් කරනවා. කිසිම කල් තබා ගන්නා රසායනික ද්‍රව්‍ය හෝ වර්ණකාරක යොදන්නේ නැහැ. ඒවායින් ඕනෑම කෑමක් හදා ගන්නත් පුළුවන් වගේම කැබලි කරන ලද කෙසෙල් සහ අනෙක් පලතුරු අයිස් ක්‍රීම් සමඟ ආහාරයට ගන්නත් පුළුවනි. පවුඩර් එක කේක් සහ ජෙලි වර්ග සකස් කරන්න යොදා ගන්නත් පලතුරු බීමක් ලෙස සකස් කරගන්නත් පුළුවනි.

● ඔබටත් කෙසෙල් වගාවක් තිබෙනව ද?

ඔව් මට අක්කර 13ක කෙසෙල් වගාවක් තිබෙනවා. ඒ වගේම මා වටා කෙසෙල් වගා කරන ගොවියන් 450ක් සිටිනවා. මම ඒ අයට වගාව සඳහා පොහොර සහ අවශ්‍ය කෘෂි උපදෙස් සහ අනෙකුත් දෑ නොමිලේ සපයා දෙනවා.

● ඔබ මේ දේවල් කිරීමෙන් සෑහීමට පත් වෙනව ද?

ඔව්. මගේ මේ වැඩපිළිවෙළ නිසා මේ ප්‍රදේශයේ 60 දෙනකුට රැකියා දීලා තිබෙනවා. ඒකත් රටේ ආර්ථිකයට ශක්තියක්. රටට විදේශ විනිමය ලැබෙනවා වගේම රටේ පලතුරු නාස්තිය අවම වී තිබෙනවා. වරකා ගෙඩිය බිම වැටී අපතේ යා නොදී මිනිස්සු මා ළඟට එය අරගෙන එනවා. ඔවුන්ටත් කිසියම් මුදලක් අතට ලැබෙනවා. මම හිතනවා මේ වැඩෙන් මටත් මා වටා සිටින අනෙක් අයටත් සතුටක් ලැබෙනවා කියා.

ඒ වගේම ගිය වසරේ අයි.ඒ.බී. ආයතනයෙන් ඌවේ හොඳම ව්‍යවසායකයාට හිමි සම්මානය Food and Beverage (ආහාර සහ පාන වර්ග) වෙනුවෙන් මට ලැබුණා. එය ලොකු මට සතුටක්.

ඔබටත් කෙසෙල් හෝ වරකා අපතේ යා නොදී ඒවාට අමතර අගයක් දීමට අවශ්‍ය නම් හෝ ඒ පිළිබඳ වෙනත් ඕනෑම උපදෙසක් ලබා ගැනීමට අවශ්‍ය නම් p.jayawardhana94@gmail.com ඊ මේල් ලිපිනය ඔස්සේ ඔහු හා සම්බන්ධ විය හැකියි.

චතුමී පිටිපන

2021 පෙබරවාරි 17 කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.